ජාතික රක්‍ෂණ භාර අරමුදල

වාර්ෂික වාර්තාව 2016

# බලය

සැමට සුරක්ෂිත අනාගතයක් තහවුරු කිරීම

බලය

## සැමට සුරක්ෂිත අනාගතයක් තහවුරු කිරීම

ජාතික රක්ෂණ භාර අරමුදල 2006 වර්ෂයේ දී ස්ථාපිත කිරීමේ සිට මේ දක්වා සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ නියැලි සියල්ලන්ටම ආරක්ෂාව සලසන අද්විතීය ප්‍රතිලාභ යෝජනාක්‍රම නිර්මාණය කිරීම පිණිස වෙහෙස නොබලා ක්‍රියාකරමින් සිටියි. ප්‍රතිරක්ෂණ ආවරණ සලසාදෙනු ලබන ශ්‍රී ලංකාවේ එකම ආයතනය වශයෙන් අපගේ ශක්තිය අති මහත් වූවකි. සෙසු රක්ෂණ ආයතන සඳහා අප විසින් සලසාදෙනු ලබන අමතර ශක්තිය අප ආයතනය දේශීය රක්ෂණ වෙළඳපොලේ කොඳුනාරටිය බවට පත්වීමට ඉඳුරාම ඉවහල් වී ඇත. වැඩවර්ජන, කැරළි කෝලහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදය හේතුවෙන් සිදුවන අනතුරු, රෝගාබාධ, මරණ, පෙර නොවූවිරූ පරිදි ආපදාවලට ලක්වන දේපල සහ ශාරීරික හෝ ද්‍රව්‍යමය හානි සඳහා විස්තීර්ණ රක්ෂණාවරණයක් සලසාදීම පිණිස අපගේ රක්ෂණ යෝජනාක්‍රම සැලසුම් කර ඇත. පීඩාවට පත්ව ඇති අවස්ථාවන්හි සිතට සහනයක් උදාකරගැනීම සඳහා අප කෙරෙහි විශ්වාසය තබා කටයුතු කරන උවදුරුවලට වඩාත් පහසුවෙන් ගොදුරු වීමේ හැකියාව සහිත ශ්‍රී ලාංකික ජන කොටස් අප විසින් ඉටුකරනු ලබන සේවාවේ ඉහළම ප්‍රතිලාභ හිමිවන පිරිස වේ. බහුතරයකගේ යහපත ප්‍රමුඛතම අරමුණ කරගනිමින්, සැමට සවිමත් අනාගතයක් උදාකරදීම තහවුරු කෙරෙන ආකාරයෙන් විශේෂයෙන් සැලසුම් කළ සියල්ලන්ම ඇතුළත් වන, දැරියහැකි මිලගණන් යටතේ සලසා දෙනු ලබන, අපගේ කාර්යක්ෂම සේවාවන් තුළින් ජන ජීවිතය ඉහළට ඔසවා තබමින්, රටේ සමාජ හා ආර්ථික සංවර්ධනය කෙරෙහි සාධනීය ආකාරයෙන් බලපෑම් කිරීමට හැකිවීම පිළිබඳව අපි මහත් අභිමානයට පත්ව සිටිමු.

# පටුන

## 03 - 45


අපගේ දැක්ම, මෙහෙවර සහ සමායතන හර පද්ධතිය 03
මූල්‍ය තත්ත්වය පිළිබඳ වැදගත් කරුණු 04
ඉතිහාසය සැකෙවින් 06
සමායතන ඉලක්ක 07
සභාපතිතුමාගේ පණිවුඩය 09
ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය 13
අධ්‍යක්ෂ මණ්ඩලය 17
අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ හැඳින්වීම 18
සමායතන හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 19
කළමනාකරණ කතිකාව හා විශ්ලේෂණය 22
වැදගත් සිදුවීම් තිරසර වාර්තාකරණය 32
තිරසර වාර්තාකරණය 35
ව්‍යවසාය පාලනය 36
ව්‍යවසායකත්ව අවදානම් කළමනාකරණය 40
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 43
විගණන කමිටු වාර්තාව 45


## 47 - 98


මූල්‍ය ප්‍රකාශ
සිදුවූ නමුත් වාර්තා නොකළ හිමිකම් හා ආධීනතා ප්‍රමාණතා පරීක්ෂණ සහතිකය ස්වාධීන 47
ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 48
මූල්‍ය තත්ත්වය ප්‍රකාශය 69
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 70
ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් පිළබඳ ප්‍රකාශය 71
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 72
මූල්‍ය ප්‍රකාශ පිළබඳ සටහන් 73
එකොළොස් වසරක අප ආ ගමන් මග 96
සමායතන තොරතුරු පසුපස කවරය ඇතුළත

# දැක්ම

# ආරක්ෂාව අවැසි සියලු අංශයන්ට රැකවරණය හා ආරක්ෂණ ජාලයක්

# මෙහෙවර


- සමාජයෙහි අගහිඟකම්වලින් පෙළෙන සියලුම අංශයන් අරභයා දැරිය හැකි කාර්යක්ෂම හා ප්‍රගතිශීලී රක්ෂණ ක්‍රම ලබාදීම.

- වෙනස් වෙමින් පවත්නා අවශ්‍යතාවන් තුළින් පැන නඟින ඉහළ අවදානම් ආවරණය කරනු පිණිස සම්පත් ඒකරාශී කිරීම හා වෙනත් වැඩ පිළිවෙළවල් තුළින් දේශීය වෙළෙඳපොළට විසඳුම් සලසාලීම.

- දේශීය රක්ෂණ වෙළෙඳපොළට අතිරේක ශක්‍යතාව සලසාලීම සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රතිරක්ෂණ වෙළෙඳපොළක් නිර්මාණය කිරීම.

තුළින් ශ්‍රී ලංකාවේ සමාජමය හා ආර්ථික සංවර්ධනයට සහභාගී වීම.


# සමායතන හර පද්ධතිය




# මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් කරුණු

| දර්ශකය | 2016 | 2015 | වර්ධනය |
|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය (ශ්‍රීලංරු. මිලි) | 6,814 | 5,063 | 35% |
| අග්‍රහාර වාරික දායකත්වය (ශ්‍රීලංරු. මිලි) | 2,004 | 1,637 | 22% |
| බෝග බදු (ශ්‍රීලංරු. මිලි) | 1,511 | 1,259 | 20% |
| ශුද්ධ ඉපයූ වාරිකය (ශ්‍රීලංරු. මිලි) | 8,851 | 7,931 | 12% |
| ආයෝජන ආදායම (ශ්‍රීලංරු. මිලි) | 967 | 802 | 21% |
| ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම් (ශ්‍රීලංරු. මිලි) | 5,543 | 3,226 | 72% |
| බදු පෙර ලාභය (ශ්‍රීලංරු. මිලි) | 2,840 | 4,391 | -35% |
| ආයෝජන අරමුදල (ශ්‍රීලංරු. මිලි) | 11,188 | 10,389 | 8% |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය (ශ්‍රීලංරු. මිලි) | 3,200 | 3,000 | 7% |


මුළු ආදායම (රු. මිලි.)





මුළු වත්කම් (රු. මිලි.)





දළ ලිඛිත වාරික (රු. මිලි.)





ශුද්ධ ඉපයූ වාරික (රු. මිලි.)




බදු පෙර ලාභය (රු. මිලි.)




බදු පසු ලාභය (රු. මිලි.)



### මුළු වත්කම්

ශ්‍රීලංරු. බිලි **20**

### ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය

**586** %

### වත්කම් මත ප්‍රතිලාභ

**14** %

### බදු පෙර ලාභය

ශ්‍රීලංරු. බිලි **2.8**

### ෆිච් ශ්‍රේණිගත කිරීම

**AA-** (LKA)

### ඒකාබද්ධ අරමුදලට දායකත්වය

ශ්‍රීලංරු. බිලි **3.2**

# ඉතිහාසය සැකෙවින්

## 2006

අනපේක්ෂිත සෞඛ්‍ය අවදානම්, පුද්ගල අනතුරු හා දේපල හානි වලට එරෙහිව ප්‍රතිලාභ හා ආරක්ෂාව සැලසීම සඳහා දායකත්ව රක්‍ෂණ යෝජනාක්‍රම මෙහෙයවනු ලැබීම සඳහා 2006 අංක 28 දරණ ජාතික රක්‍ෂණ භාර අරමුදල් පනත මගින් ජාතික රක්‍ෂණ භාර අරමුදල ස්ථාපිත කරන ලදී.

## 2007

ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී රක්‍ෂණ අරමුදල පවරාගන්නා ලදී.

## 2007

20% අනිවාර්ය ප්‍රතිරක්‍ෂණ වැඩසටහන යටතේ ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් ප්‍රතිරක්‍ෂණ ව්‍යාපාරික කටයුතු ආරම්භ කරන ලදී.

## 2009

ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් රැකියා සඳහා විදේශගත වූවන් සඳහා “විදේශ රැකියා” රක්‍ෂණ යෝජනාක්‍රමය දියත් කරන ලදී.

## 2009

ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාරික කටයුතු දක්වා සිය කටයුතු ව්‍යාප්ත කරන ලදී.

## 2013

2012 අයවැය යෝජනා අනුව කෘෂි රක්‍ෂණ යෝජනාක්‍රමය ස්ථාපිත කරන ලදී.

## 2016

ජාතික ස්වාභාවික ආපදා රක්‍ෂණ යෝජනාක්‍රමය ස්ථාපිත කිරීම තුළින් ජාතික රක්‍ෂණ භාර අරමුදල සිය ව්‍යාපාරික කටයුතු තවදුරටත් පුළුල් කරන ලදී.

## 2016

සිය මනාපය පරිදි තෝරාගත හැකි රන් හා රිදී සාමාජිකත්ව වැඩසටහන හඳුන්වාදීමත් සමඟ අග්‍රහාර රක්‍ෂණ යෝජනාක්‍රමය තවදුරටත් පුළුල් විය.

# සමායතන ඉලක්ක

- ජාත්‍යන්තර වෙළඳපොලේ පිළිගත් තරගකරුවෙක් වීම පිණිස ආයතනයේ නෛතික ව්‍යුහය ශක්තිමත් කිරීම තුළින් පස් වසරක් තුළ ජාත්‍යන්තර ප්‍රතිරක්ෂකයෙක් බවට පත්වීම.

- වර්ෂ 2017 වන විට ශ්‍රී ලංකාවේ වැඩිම මනාපය දිනූ ප්‍රතිරක්ෂකයා බවටත් වර්ෂ 2020 වන විට ආසියානු කලාපයේ ප්‍රමුඛපෙළේ ප්‍රතිරක්ෂකයෙක් බවටත් පත්වීම.

- සමාජයේ ආපදාවන්ට පහසුවෙන් ගොදුරු විය හැකි කණ්ඩායම්වල /උපකාර අවශ්‍ය ජනතාවගේ රක්ෂණ අවශ්‍යතා සපුරාලීම සහ වාණිජ අරමුණු පෙරදැරිකරගත් සාමාන්‍ය රක්ෂකයන් විසින් රක්ෂණ විසඳුම් සලසා දෙනු නොලබන අවදානම් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීම.

- රාජ්‍ය අංශයේ මෙන්ම අනෙකුත් උපකාර අවශ්‍ය කණ්ඩායම් අතර වඩාත් කාර්යක්ෂම හා සාධනීය සෞඛ්‍ය රක්ෂණ සැපයුම්කරු බවට පත්වීම.

- ජාතික රක්ෂණ භාර අරමුදල ශ්‍රී ලංකාවේ තොරතුරු කේන්ද්‍රස්ථානය සහ වෘත්තීය රක්ෂණ දැනුම් මධ්‍යස්ථානය බවට පත්කිරීම.

- වර්ෂ 2020 වන විට රු. බිලියන 50ක වටිනාකමකින් යුත් ජාත්‍යන්තර ප්‍රතිරක්ෂකයෙක් බවටත් ඍජු ප්‍රාරක්ෂකයෙක් බවටත් පත්වීම

- සියලුම රාජ්‍ය ආයතනවල ඉහළම මනාපය දිනාගත් රක්ෂණ සැපයුම්කරු බවට පත්වීම.

- ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයේ නියුතු වෘත්තීයවේදීන් සේවය කිරීමට වඩාත් ප්‍රියකරන සංවිධානය බවට පත්වීම.

- ස්වකීය ප්‍රාග්ධන ශක්තියෙන් පෝෂණයවූ තිරසර ආයතනික ව්‍යුහයක් බවට ජාතික රක්ෂණ භාර අරමුදල පරිවර්තනය කිරීම.

- පරිසරය සුරැකීම සඳහා වූ කැපවීම මැනවින් පිළිඹිබු වන හරිත සමාගමක් බවට පත්වීම තුළින් සිය සමාජ වගකීම් නොපිරිහෙලා ඉටු කරන්නෙකු වීම.

# රක්‍ෂණ හිමිකම් සඳහා ප්‍රතිචාර දැක්වීම

රක්‍ෂණ හිමිකම් ජනනය, හිමිකම් ඉදිරිපත් කිරීම සහ ව්‍යතිරේක මෙහෙයවීම් සඳහා ප්‍රතිචාර දැක්වීමට අප ගතකරන කාලය ප්‍රශස්ත මට්ටමක පැවතීම සම්බන්ධයෙන් අපි මහත් ආඩම්බර වන්නෙමු. ආපදාවකදී විපතට පත්වූවන්ට එම ආපදාව විශ්වාස කළ නොහැකි තරමේ ඛේදජනක සිදුවීමක් වීමට ඉඩ නොතබමින් ඔවුන්ට මානසික සහනය හා සැනසිල්ල උදාකර දීමට අප සමත් වන බැවින් එවැනි ආපදාවකදී ඔවුන්ගේ ජීවිත කෙරෙහි මෙමඟින් ඇති කරන බලපෑම අතිශය අර්ථාන්විත වූවකි.

# සභාපතිතුමාගේ පණිවුඩය



"ජාතික රක්‍ෂණ භාර අරමුදල සිය මෙහෙයුම් කටයුතු පවත්වා ගෙනගිය ප්‍රථම දශකයේ අවසන සමරන මේ මොහොතේ අප දේශයේ සමාජීය හා ආර්ථික සංවර්ධනය කෙරෙහි සඵලදායී ආකාරයෙන් තම දායකත්වය ලබාදිය හැකි වන පරිදි රැකවරණය අවැසි සියලු අංශ වෙත ආරක්ෂක ජාලයක් හා අර්ථාන්විත රැකවරණයක් සලසාදීමේ අපගේ කාර්යභාරය අප විසින් මනාසේ ග්‍රහණය කරගෙන සිටින බව මෙහිලා සඳහන් කරන්නේ ඉමහත් ප්‍රීතියෙනි."

# සභාපතිතුමාගේ පණිවුඩය

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශ අපගේ අගනා පාර්ශ්වකාර ඔබ වෙත පිළිගන්වන්නේ හද පිරි සතුටිනි. ප්‍රතිරක්ෂණ ක්ෂේත්‍රයෙහි හා සමාජීය වශයෙන් මෙහෙයවනු ලබන රක්ෂණ ක්ෂේත්‍රයෙහි මෙහෙයුම් කටයුතුවල නියැළී සිටින අප ආයතනය සමාලෝචිත වර්ෂය තුළ සිය දශ වර්ෂ පූර්ණය සනිටුහන් කළේය. අනේකවිධ අභියෝග හමුවේ වුවද, වර්ධනය වන ආර්ථික අවශ්‍යතාවන් මෙන්ම සීඝ්‍රයෙන් ඉහළයමින් පවතින තරගකාරී සමාජීය අවශ්‍යතාවන් සපුරාලීම පිණිස අවශ්‍යවන ශක්තිය, ඔරොත්තුදීමේ හැකියාව, සමඟ නව්‍යකරණය කෙරෙහි යොමුවූ සක්‍රීය ධාරිතාවක් පෙන්නුම් කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදලට හැකිවීම පිළිබඳව මෙහිලා සඳහන් කරනු ලබන්නේ ඉමහත් ප්‍රීතියෙනි.

### අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය

සමාලෝචිත වර්ෂය දේශීය ආර්ථිකයට මෙන්ම ශ්‍රී ලාංකේය පුරවැසියන්ට ද අතිශය දුෂ්කර අභියෝග රැසකට මුහුණ දීමට සිදුවූ වසරක් විය. දිවයිනේ බොහෝ ප්‍රදේශවල සිදුවූ අධික ජලගැලීම් ජීවිත රැසක් අවාසනාවන්ත ලෙස අහිමිකළ අතර තවත් බොහෝ පිරිසකට සිය නිවාස හා දේපළ අහිමි විය. මෙකී අහිතකර කාලගුණ තත්ත්වයන් හේතුවෙන් බොහෝ පිරිසක් අවතැන් විය. එකී කාලගුණ තත්ත්වයන්ගේ බලපෑම සමස්ත ජාතික ආර්ථිකය තුළද විද්‍යමාන වූ අතර අඩපණවූ සාර්ව ආර්ථික තත්ත්වයක් සහිත පරිසරයකට රට අවතීර්ණ විය.

2015 වර්ෂයේ 4.8% ක්ව පැවති දළ දේශීය නිෂ්පාදිතය සමාලෝචිත වර්ෂය තුළ 4.4% දක්වා පහළ ගිය අතර ප්‍රමුඛ ආර්ථික අංශවල දුර්වල වර්ධනයක් මෙන්ම උද්ධමණ පීඩනය සමනය කිරීම අරමුණු කරගත් දැඩි මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති සහ දැඩි පාලනයකට නතුවූ ණය වර්ධනයක් දක්නට ලැබුණි. මෙකී ක්‍රියාමාර්ග සමඟ බද්ධ වූ අහිතකර කාලගුණයේ බලපෑම හා බැඳි විනාශයන් හා බදු ගැලපීම් සහ ජාත්‍යන්තර වශයෙන් වෙළඳ භාණ්ඩ මිල ඉහළයාම මූලික උද්ධමණය වාර්ෂික සාමාන්‍ය අගය වූ 4% දක්වා ක්‍රමිකව ඉහළ යැම කෙරෙහි බලපෑවේය.

සැබෑ ආර්ථික තත්ත්වයන් සලකා බැලීමේදී, අහිතකර කාලගුණ තත්ත්වයේ දරුණුතම බලපෑම කෘෂි අංශයෙන් සෘජුවම වාර්තා වූ අතර පෙර වර්ෂයේ නිරීක්ෂණය වූ 4.8%ක පහළයාමට සාපේක්ෂව 2016 වර්ෂයේදී 4.2% ක පහළයාමක් එම අංශයේ දක්නට ලැබුණි. මෙම සෘණාත්මක කාර්යසාධනය කෙරෙහි ශ්‍රී ලංකාවේ නිරිතදිග ප්‍රදේශවල ඇතිවූ විනාශකාරී ජල ගැලීම් යම් පමණකට හේතුවූ අතර දිවයිනේ මධ්‍යම හා උතුරු පළාත්වල අඛණ්ඩව පැවති නියඟය එම තත්ත්වය වඩාත් අහිතකර බවට පත් කළේය.

පැවති සාර්ව ආර්ථික හා කාලගුණ තත්ත්වයන් හමුවේ සේවා අංශයේ වර්ධනය කෙරෙහි එපරිද්දෙන්ම බාධා එල්ලවූ අතර පෙර වර්ෂයේ 5.7%ක්ව පැවති සේවා අංශයේ වර්ධනය හා සැසඳීමේදී 2016 දී සේවා අංශය 4.2%ක මන්දගාමී වර්ධනයක් පෙන්වීය. මූල්‍ය සේවා ක්‍රියාකාරකම්වල සිදුවූ සැලකිය යුතු ව්‍යාප්තිය මෙන්ම ප්‍රවාහන අංශයේ සිදුවූ සංවර්ධනය සේවා අංශයේ වර්ධනය කෙරෙහි මූලිකව හේතුසාධක වූ අතර තොග හා සිල්ලර වෙළඳාම, තොරතුරු තාක්ෂණ හා වෘත්තීය සේවා උප-අංශවල සැලකිය යුතු පසුගාමී බවක් මෙම කාල පරිච්ඡේදය තුළ දක්නට ලැබුණි.

මේ අතර, ප්‍රතිඇගයීම් කාල පරිච්ඡේදය අවසානයේදී ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් නැවත වැඩ ආරම්භ කිරීමත් සමඟ රටේ කර්මාන්ත අංශය සැලකිය යුතු ව්‍යාප්තියක් වාර්තා කළ අතර 2015 වසරේ පෙර වර්ෂයට සාපේක්ෂව වාර්තාවූ 2.1%ක වර්ධනය 2016 වසරේදී 6.7% දක්වා ඉහළ ගියේය.

### උනන්දුකරවන කර්මාන්ත කාර්යසාධනය

දේශීය ආර්ථිකය තුළ ක්‍රය ශක්තිය සීමා කරවූ එමෙන්ම වාණිජ හා නිවාස දේපළ විශාල ප්‍රමාණයක් බරපතල ලෙස හානියට පත්වීම හේතුවෙන් රක්ෂණ වන්දි ඉල්ලීම් විශාල ලෙස ඉහළ යාමට පාදක වූ ඉහත කී අභියෝග හමුවේ වුවද, දේශීය රක්ෂණ කර්මාන්තය ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ යන දෙඅංශයෙන්ම කැපී පෙනෙන සාධනීය වර්ධනයක් ලඟාකර ගැනීමට සමත් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස දළ ලිඛිත වාරික අගය 16.3% ක වාර්ෂික වර්ධන අනුපාතයක් වාර්තා කරමින් රු. බිලියන 143 දක්වා සමස්ත වර්ධනයක් ලඟාකර ගත්තේය.

ඒ පරිද්දෙන් රක්ෂණ කර්මාන්ත අංශයේ සමස්ත වත්කම් අගය රු. බිලියන 527 දක්වා 13%ක වාර්ෂික වර්ධනයක් වාර්තා කරමින් රක්ෂණ කර්මාන්තයේ සමස්ත වත්කම් සම්බන්ධයෙන් කැපී පෙනෙන ඉහළ යාමක් දැකගත හැකි විය.

යම් ආයතනයක් විසින් ගතහැකි අවදානම් ප්‍රමාණය පිළිබඳව ඵලදායී ලෙස සීමා පැනවූ අවදානම් පාදක ප්‍රාග්ධන ආකෘතියක් හඳුන්වා දීමත් සමඟ රක්ෂණ කර්මාන්තය සැලකියයුතු ප්‍රතිව්‍යුහගත කිරීමකට ලක් වූ අතර රක්ෂණ කර්මාන්තය තුළ විචක්ෂණශීලී කළමනාකරණයේ ඉහළම ප්‍රමිති පවත්වා ගැනීම එමඟින් යථාර්ථයක් කරනු ලැබීය. එකී සංවර්ධනයන් මඟින් රක්ෂණ කර්මාන්තයේ සමස්ත ස්ථායිතාව කැපී පෙනෙන අයුරින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### තිරසරකත්වය සහ සමාජීය භර අතර ලාභදායිත්ව තුලනය කිරීම

ජාතික රක්ෂණ භාර අරමුදල සිය මෙහෙයුම් කටයුතු පවත්වා ගෙනගිය ප්‍රථම දශකයේ අවසානය සමරන මේ මොහොතේ අප දේශයේ සමාජීය හා ආර්ථික සංවර්ධනය කෙරෙහි සඵලදායී ආකාරයෙන් තම දායකත්වය ලබාදිය හැකි වන පරිදි රැකවරණය අවැසි සියලු අංශ වෙත ආරක්ෂක ජාලයක් හා අර්ථාන්විත රැකවරණයක් සලසාදීමේ අපගේ කාර්යභාරය අප විසින් මනාසේ ග්‍රහණය කරගෙන සිටින බව මෙහිලා සඳහන් කරන්නේ ඉමහත් ප්‍රීතියෙනි.

සමාලෝචිත වර්ෂය තුළ ජාතික රක්ෂණ භාර අරමුදලේ කාර්යභාරය සැලකියයුතු පරිදි පුළුල්වීමක් දක්නට ලැබුණි. විස්තීර්ණ ප්‍රතිරක්ෂණ සේවාවන් සැලසීමට අමතරව, අග්‍රහාර වෛද්‍ය හා සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රාජ්‍ය අංශයේ සේවකයින්, ඔවුන්ගේ කලත්‍රයන්, දරුවන්, සහ අවිවාහක සේවකයන්ගේ දෙමාපියන් සඳහා වෙන්වූ රක්ෂණාවරණය තවදුරටත් පවත්වා ගනිමින්ද එහි ගැඹුර හා ගුණාත්මය තවදුරටත් ව්‍යාප්ත කරමින්ද කටයුතු කරන අතරම වැඩවර්ජන,

**"ස්ථාපිත කිරීමේ සිට ගෙවුනු දස වසර තුළ ජාතික රක්ෂණ භාර අරමුදල සිය භූමිකාව අඛණ්ඩව ව්‍යාප්ත කරගනිමින් සිටින අතර අද වන විට ශ්‍රී ලංකාවේ විවිධ වූ ජන කොටස් සඳහා අතිශය වැදගත් වන්නාවූ රැකවරණ සලසන්නා බවට පත්ව සිටී. අපගේ නිෂ්පාදන සහ සේවාවල විචක්ෂණභාවය හා ගුණත්වය වර්ධනය කිරීම කෙරෙහි අප අඛණ්ඩව අවධානය යොමුකර සිටින අතර අපගේ ආයතනයේ ස්ථායිතාව තහවුරු කිරීම වෙනුවෙන් නව හවුල් ව්‍යාපාර ගොඩනගා ගැනීම පිණිස නිරන්තරයෙන් ක්‍රියාකරමින් සිටී. මෙකී ව්‍යාප්ත කිරීම් තුළින් අපගේ ප්‍රතිලාභීන්ගේ රැකවරණය තවදුරටත් සුරක්ෂිත වනු ඇත."**

කැරලි කොලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල (SRCC & T Fund) කළමනාකරණය කිරීම ද අප ආයතනය විසින් සිදු කරනු ලබයි. අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය එහි ප්‍රතිලාභීන් අතර තවදුරටත් ජනප්‍රිය වෙමින් පවතින අතර මේ වන විට රාජ්‍ය සේවයේ සේවකයින් 825,000ක් පමණ මෙම රක්ෂණාවරණය යටතේ ආවරණය වී සිටිති. තවද, රාජ්‍ය සේවයෙන් විශ්‍රාමගන්නා සේවකයන් සඳහාද මෙම යෝජනාක්‍රමය ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් දැනටමත් ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

දිවයිනේ අතිරේක දේශීය රක්ෂණ ධාරිතාවක් ස්ථාපිත කිරීමේ අභිලාශයෙන් රටේ ප්‍රතිරක්ෂණ වෙළඳපොලේ පරිමාව ඉහළ නංවන අතරම, ශ්‍රී ලාංකික සමාජය තුළ රාජ්‍ය අංශයේ සහ පහළ මධ්‍යම ආදායම්ලාභී ජන කොටස්වල අවශ්‍යතා සපුරාලනු පිණිස මෙකී අමිල සේවාවන් දැරියහැකි මිලකට, කාර්යක්ෂම හා ප්‍රගතිශීලි ආකාරයෙන් පවත්වාගෙන යමින්, ශක්තිමත් ලාභදායිත්වයක් පවත්වා ගැනීමේ සිය හරයාත්මක ප්‍රගම්‍ය කාර්යභාරය සමාලෝචිත වර්ෂය තුළ නිසි තුලිතතාවෙන් යුතුව පවත්වා ගැනීමට ද ජාතික රක්ෂණ භාර අරමුදල සමත් විය.

මෙකී වාතාවරණය තුළ, සිය දළ ලිඛිත වාරික අගය (GWP) රු. බිලියන 5.1 සිට රු. බිලියන 6.8 දක්වා වර්ධනය කරගනිමින් ජාතික රක්ෂණ භාර අරමුදල 2016 වසරේ නිමාව සනිටුහන් කළ බව සඳහන් කිරීමට කැමැත්තෙමි. එහිදී සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයෙන් ලැබුනු දායකත්වය රු. බිලියන 1.6 සිට රු. බිලියන 2 දක්වා ද, බෝග රක්ෂණ ගාස්තු රු. බිලියන 1.3 සිට රු. බිලියන 1.5 දක්වා ද ඉහළ ගියේය. පොදු ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ පුළුල් පරාසයක විහිදුනු විවිධ අනු අංශ පිළිගැනීම සහ සාමාන්‍ය රක්ෂණ වෙළඳපොලේ දක්නට ලැබුනු කැපී පෙනෙන වර්ධනය කරන කොට, ප්‍රතිරක්ෂණ වාරික ආදායම රු. බිලියන 3.3ක් දක්වා පසුගිය වසරට සාපේක්ෂව 35.6%කින් වර්ධනය විය.

ගෙවුනු වසර තුළ ආයතනයේ ප්‍රමුඛ පෙළේ කාර්යසාධනය සඳහා සිය දායකත්වය දෙගුණයක් ඉක්මවමින් සලසා දුන් කුඩා වුවද දිනෙන් දින සාර්ථක වන නුමුහුන් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික කටයුතුවලද ජාතික රක්ෂණ භාර අරමුදල නියුක්තව සිටීමද සැලකිල්ල යොමුවිය යුතු කරුණකි. මේ සඳහා රජයේ ආයතනවල සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික කටයුතු පවරා ගැනීම මූලිකවම හේතුසාධක විය.

ජාතියේ අභිවෘද්ධිය පිණිස හේතුවන අතිශය වැදගත් වූද, කාලීනවූද සංවර්ධන කාර්යයක් ලෙස, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමයේ (NNDIS) මෙහෙයුම් ආරම්භ කරන ලදී. 2016 අප්‍රේල් මාසයට පෙර ස්වාභාවික ආපදා වින්දිතයන් සඳහා සෘජුව වන්දි ගෙවනු ලැබූවේ භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලින් වන අතර මෙම නවතම සාමාන්‍ය රක්ෂණ යෝජනාක්‍රමය ආරම්භවීමත් සමඟ රු. බිලියන 10ක මුළු වටිනාකමකින් සෑම එක් නිවසක් සහ ක්ෂුද්‍ර හා කුඩා ව්‍යාපාරික ස්ථානයක්ම සඳහා රක්ෂණාවරණයක් ලබාදීමට හැකි වනු ඇත. අදාළ රක්ෂණ ඔප්පුව රජය විසින් මිලදී ගනු ලැබූ අතර ඒ අනුව, ජාතික රක්ෂණ භාර අරමුදල සමස්ත ජාතියේම රක්ෂකයා ලෙස කටයුතු කරනු ඇත. මෙම රක්ෂණ ඔප්පුවේ ප්‍රතිරක්ෂකයා ලෙස අලියාන්ස් එස්ඊ ආයතනයේ මූලිකත්වයෙන් යුත් ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට පාත්‍රවූ, මණ්ඩලයක් තෝරාගෙන ඇති අතර ඊට මියුනිච් රී හා ලොයිඩ්ස් යන ආයතනද ඇතුළත් වේ. ඊට අනුගාමීව,රු. මිලියන 500ක අඩු කිරීමකට අමතර වශයෙන් රක්ෂණ ඔප්පුවේ 20%ක සම-ප්‍රතිරක්ෂණ කොටසක්ද ජාතික රක්ෂණ භාර අරමුදලට හිමිවිය.

මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම කාලීන අවශ්‍යතාවක් වන අතර එහි සාධනීය බලපෑම එය ක්‍රියාත්මක වීමත් සමඟ නොබෝ කලකින් 2016 වසරේ මැයි මාසයේ සිදුවූ දිවයිනටම බලපෑ දරුණු ජලගැලීම් තත්ත්වය හමුවේ සැමටම වහා අවබෝධ විය. මෙම තත්ත්වය සමාලෝචිත වර්ෂය තුළ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ගෙවිය යුතු රක්ෂණ වන්දි හිමිකම් අති මහත් සංඛ්‍යාවක් ඉදිරිපත් වීමට බලපෑ අතර ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය යටතේ රක්ෂණය නොවූ මහජනතාවගේ රු. බිලියන 3.5ක්වූ අනේකවිධ ජලගැලීම් ආශ්‍රිත රක්ෂණ වන්දි හිමිකම් ගෙවීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් මෙවැනි වැඩසටහනක් ක්‍රියාත්මකව තිබීම රටටත් රහි පුරවැසියන්ටත් කැපී පෙනෙන ධනාත්මක ප්‍රතිලාභ රැසක් අත්කර දීමට ඉවහල් විය. අලුතින් ස්ථාපනය කළ ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය යටතේ ගෙවූ රක්ෂණ වන්දි වලට අමතරව,

# සභාපතිතුමාගේ පණිවුඩය

රු. බිලියන 3.3 ක වටිනාකින් යුත් ප්‍රතිරක්ෂණ හිමිකම් ගෙවීමට ද ජාතික රක්ෂණ භාර අරමුදලට සිදු විය. 30% අනුගම්‍ය ප්‍රතිරක්ෂණ වැඩසටහන ආරක්ෂා කරගැනීම පිණිස ප්‍රතිරක්ෂණාවරණයක් (ප්‍රත්‍යාවර්ථන) 2016 වර්ෂය ආරම්භයේදී පමණ හඳුන්වාදෙනු ලැබූ බව මෙම කරුණට අදාළව සඳහන් කිරීම වැදගත් වේ.

දේශීය වෙළඳපොලේ පවත්නා අභියෝග හමුවේ මෙන්ම ඉහත කී පරිදි ඉදිරිපත් කෙරෙන රක්ෂණ හිමිකම් ප්‍රමාණය සැලකිය යුතු සේ ඉහළයාමට බලපෑ ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය ආරම්භ කිරීම හමුවේ පසුගිය වසරේ වාර්තා වූ රු. බිලියන 4.4ක ලාභය හා සැසඳීමේදී රු. බිලියන 2.8ක බදු ගෙවූ පසු ලාභයක් උපයා ගැනීමට ජාතික රක්ෂණ භාර අරමුදලට හැකිවීම ඉහළින් අගය කළ යුතු කරුණකි.

### අපගේ දේශයට දීප්තිමත් ආරක්ෂිත අනාගතයක්

ස්ථාපිත කිරීමේ සිට ගෙවුනු දස වසර තුළ ජාතික රක්ෂණ භාර අරමුදල සිය භූමිකාව අඛණ්ඩව ව්‍යාප්ත කරගනිමින් සිටින අතර අද වන විට ශ්‍රී ලංකාවේ විවිධ වූ ජන කොටස් සඳහා අතිශය වැදගත් වන්නාවූ රැකවරණ සලසන්නා බවට පත්ව සිටී. අපගේ නිෂ්පාදන සහ සේවාවල විචක්ෂණභාවය හා ගුණාත්වය වර්ධනය කිරීම කෙරෙහි අප අඛණ්ඩව අවධානය යොමුකර සිටින අතර අපගේ ආයතනයේ ස්ථායිතාව තහවුරු කිරීම වෙනුවෙන් නව හවුල් ව්‍යාපාර ගොඩනගා ගැනීම පිණිස නිරන්තරයෙන් ක්‍රියාකරමින් සිටී. මෙකී ව්‍යාප්ත කිරීම් තුළින් අපගේ ප්‍රතිලාභීන්ගේ රැකවරණය තවදුරටත් සුරක්ෂිත වනු ඇත.

රක්ෂණායතන නියාමක සමඟ ඉතා සමීප සහයෝගයෙන් යුතුව කටයුතු කරමින් අපගේ ආයතනය සිය පාලන හා අවදානම් කළමනාකරණ රාමුව ස්ථිරසාර ලෙස ශක්තිමත් කරගැනීමට කටයුතුකර ඇති අතර හැකි ඉහළම සේවා ප්‍රමිති ලඟාකරගැනීමේ අරමුණ පෙරදැරිව අපගේ සේවා නියුක්තිකයන් හා මෙහෙයුම් සම්බන්ධයෙන් නිරන්තරයෙන් ආයෝජන සිදු කිරීමටද ක්‍රියා කර ඇත. වානිජමය පරමාර්ථ පෙරදැරිව ව්‍යාපාරික කටයුතු කරන රක්ෂණායතන ආවරණය සැලසීමට පසුබට වන ආර්ථිකයේ වඩාත් පහසුවෙන් උවදුරුවලට ගොදුරු විය හැකි ජන කොටස් සඳහා රක්ෂණ සේවා සලසාදෙමින් ද ආයතනය තුළ ශක්තිමත් ලාභදායිත්වයක් හා ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීම තුළින් අපගේ වානිජමය ස්වශක්තතාව පවත්වා ගනිමින් ද දේශීය වෙළඳපොලේ හිඩැස් සම්පූර්ණ කිරීම අපගේ ප්‍රාථමික කාර්යභාරය වන බව ජාතික රක්ෂණ භාර අරමුදල පිළිගනී.

2016 වර්ෂය තුළ අප ආයතනයේ මෙහෙයුම් කටයුතු ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පැවති අතර එම අමාත්‍යාංශය භාර ගරු අමාත්‍යතුමා වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා වෙත මාගේ හදපිරි කෘතවේදීභාවය පුදකර සිටිමි. එසේම අප වෙත නිතැතින් ලබාදුන් අමිල මගපෙන්වීම් හා සහයෝගය වෙනුවෙන් රාජ්‍ය අමාත්‍යතුමාටත්, නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, අමාත්‍යංශ ලේකම්තුමාටත් අපගේ අවංක කෘතවේදීතාව පුදකර සිටිමු.

අපගේ දේශයටත් එහි ජීවත්වන පුරවැසියන්ටත් එකසේ ප්‍රතිලාභදායී ආකාරයෙන් අඛණ්ඩව කටයුතු කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදලට මහත් අනුබලයක් වූ මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා ඇතුළු එහි සියලුම කාර්ය මණ්ඩලය සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සියලුම කාර්ය මණ්ඩලය විසින් අප වෙත නිබඳවම ලබාදුන් අතිශය අගනා සහයෝගය පිළිබඳව ද අපි කෘතවේදී වන්නේමු. අවසන් වශයෙන්, අප වෙත පැවරී ඇති කාර්යභාරය ඉටුකිරීම පිණිසත්, එළඹෙන ඉදිරි දශකය තුළ අප ආයතනය රක්ෂණ ක්ෂේත්‍රයේ හිනි පෙත්තටම ඔසවා තැබීම පිණිසත් අප්‍රතිහත කැපවීමෙන් වෙහෙස නොබලා ක්‍රියාකිරීම වෙනුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයටත්, සෙසු කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම කෘතඥතාව පළකර සිටිමි.



**මංජුල ද සිල්වා**
*සභාපති*

25-01-2019

# ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය



"ආරම්භයේදී සඳහන් කළ පරිදි, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අර්ධ රාජ්‍ය අංශයේ සේවක පිරිස් හා විශ්‍රාමිකයන් සඳහා ද අග්‍රහාර සෞඛ්‍ය රක්‍ෂණ යෝජනාක්‍රමය වැනි රක්‍ෂණ යෝජනාක්‍රම ව්‍යාප්ත කිරීම හරහා ස්වකීය රක්‍ෂණ නිමැවුම් සහ සේවා කළඹ පුළුල් කිරීමට අමතරව, ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් නව්‍යකරණයෙන් යුතුව අතිශය ජාතික වැදගත්කමකින් යුත් නව හඳුන්වාදීමක් වූ ජාතික ස්වාභාවික ආපදා රක්‍ෂණ යෝජනාක්‍රමය දියත් කරන ලද පසුබිම තුළ මෙම වර්ෂය ජාතික රක්‍ෂණ භාර අරමුදලට අතිශය වැදගත් වර්ෂයක් විය."

# ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

## හැඳින්වීම

පැවති ඉහළ තරගකාරිත්වය හමුවේ වුවද, ජාතික රක්ෂණ භාර අරමුදල සහ සමස්තයක් ලෙස රක්ෂණ කර්මාන්තය 2016 වර්ෂය තුළ පොදුවේ සාර්ථක වර්ධනයක් පෙන්නුම් කළේය. ඒ වන විට රක්ෂණ කර්මාන්තය සංයුක්ත රක්ෂකයන් 12 දෙනෙක් ද ඇතුළුව රක්ෂණ සමාගම් 29කින් සමන්විත වූ අතර ඉහත කී සංයුක්ත රක්ෂකයන් 12 දෙනාගෙන් 9 දෙනෙකුම ගතවූ වර්ෂය තුළ සිය ව්‍යාපාරික කටයුතු සාර්ථකව වියුක්ත කරගනිමින් සංයුක්ත රක්ෂකයන් ලෙස තවදුරටත් කටයුතු කරන මුළු රක්ෂකයන් සංඛ්‍යාව 03 දක්වා අවම වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය රක්ෂණ කර්මාන්තයට සුවිශේෂ වර්ෂයක් විය.

ස්ථාවර මධ්‍ය-ආදායම්ලාභී රටක තත්ත්වයට පත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අඛණ්ඩ ප්‍රගතියක් අත්කර ගනිමින් සිටින පසුබිමක, යම් ආපදාවක් සිදුවූ අවස්ථාවක බහුතර පුරවැසියන් වැඩිවැඩියෙන් විශ්වාසය තබා කටයුතු කරන ජාතික සමාජ ආරක්ෂක ජාලය ඌනපූරණය කිරීමේ උත්තුංග කාර්යභාරය අපගේ රක්ෂණ කර්මාන්තය විසින් නිසැකවම ඉටුකරනු ලබනු ඇත. අතීතයේදී, සාමාන්‍ය පුරවැසියන් සිය දෛනික වියහියදම් පිළිබඳව බලවත් සැලකිල්ලක් දක්වන ලද අතර අත්‍යවශ්‍යම කාරණා සඳහා පමණක් වියදම් දැරීමට පෙළඹුනි. ඒක පුද්ගල ආදායම ඉහළ යාමේ ප්‍රවනතාවට සමගාමීව ඉහළ ගිය සමෘද්ධිමත් බව හේතුවෙන් සිය සෞඛ්‍යය හා දේපල පිළිබඳව දිගුකාලීන කෝණයකින් බැලීමට ශ්‍රී ලාංකිකයන් හුරුවී ඇත. මෙම ආකල්පමය පරිවර්තනය රක්ෂණ කර්මාන්තය සඳහා පැහැදිලි ව්‍යාපාරික අවස්ථා උදාකරන අතර රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සක්‍රීය සහභාගිත්වය උනන්දුකරවනසුළු ශ්‍රී ලංකාවේ වත්මන් දෙමුහුන් ව්‍යාපාරික ආකෘතිය අඛණ්ඩව සංවර්ධනය කිරීම තුළින් සමාජ ආරක්ෂණය තවදුරටත් සංවර්ධනය කිරීමේ අත්‍යවශ්‍යතාව මොනවට ප්‍රදර්ශනය කරයි.

ඊට අමතරව, රටේ වත්මන් ජනගහනයේ ගතික ස්වභාවයන් මගින් මහලු ජනගහනයේ ඉහළ යාමක් පෙන්වා දෙනු ලබන අතර වර්ෂ 2021 වන විට සමස්ත ජනගහනයෙන් ආසන්න වශයෙන් 16.7%ක් වයස අවුරුදු 60 ඉක්මවූවන් බවට පත්වනු ඇති බවට පුරෝකථනය කර ඇත. එක් අතකින් මහලු ජනගහනය වැඩි වීම සමෘද්ධිමත්භාවයේ, ඉහළ යන ජීවන තත්ත්වයේ හා ඉහළ යන සාමාන්‍ය අපේක්ෂිත ආයු කාලයේ ප්‍රතිඵලයක් වන අතර ශ්‍රී ලාංකාවේ සමාජ හා ආර්ථික සංයුතියේ මෙකී මූලික වෙනස්කම් සඳහා එම තත්ත්වය ඉවහල් වී ඇත.

## කර්මාන්තයේ පැවති තත්ත්වය

2015 වර්ෂයේ වර්ධන අනුපාතිකය 16.2%ක් ව පැවති සාමූහික දළ ලිඛිත වාරික අගය පෙර වර්ෂයට සාපේක්ෂව රු. බිලියන 143 දක්වා 16.3%කින් වර්ධනය වූ අතර එය රක්ෂණ ව්‍යාපාරයේ ජීවිත හා සාමාන්‍ය යන රක්ෂණ දෙඅංශයේම සාධනීය වර්ධනයක් වාර්තා වීමට හේතු සාධක විය.

දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ පෙර වර්ෂයේ පැවති 20.4%ක් වූ වාර්ෂික වර්ධන අනුපාතය 2016 වර්ෂයේදී 18.3% දක්වා පහළ ගිය අතර ඊට ඉඳුරාම වෙනස් ආකාරයෙන් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ පෙර වර්ෂයේ පැවති 13.2 %ක් වූ වාර්ෂික වර්ධන අනුපාතය වර්ෂ 2012 න් පසුව වාර්තා වූ ඉහළම වර්ධන අනුපාතය වාර්තා කරමින් 2016 වර්ෂයේදී 14.7% දක්වා ඉහළ ගියේය.

රක්ෂණ කර්මාන්තය තුළ සාධනීය වර්ධන අනුපාතිකයක් දක්නට ලැබුන ද, 2016 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රක්ෂණ වාරික මට්ටම් 1.21% ක් වූ පහළ අගයක් ගත් අතර පෙර වර්ෂයේ පැවති 1.12%ක් වූ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රක්ෂණ වාරික මට්ටම සමඟ සැසඳීමේදී එහි සුළු වර්ධනයක් පෙන්වා ඇත. සමාලෝචිත වර්ෂය තුළ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දිගු කාලීන රක්ෂණ වාරික මට්ටම 0.54% ක් වූ අතර සාමාන්‍ය රක්ෂණ වාරික මට්ටම 0.67%ක් විය. මෙකී පහළ අගයන් මගින් සියලු ශ්‍රී ලාංකිකයන්ට ඉහළ මට්ටමේ සමාජ ආරක්ෂණයක් සලසාදීමට හැකිවන පරිදි රක්ෂණ ආවරණය දිවයින පුරා තිරසර ලෙස ව්‍යාප්ත කිරීමේ අනිවාර්ය අවශ්‍යතාව තවදුරටත් පෙන්වා දෙනු ලබන අතර එය මූල්‍යමය හා සමාජීය වශයෙන් පුරවැසියන් බලගැන්වීම සඳහා උපකාරී වන්නා සේම අවසානයේ දී සමස්තයක් ලෙස ජාතික ආර්ථිකය තුළ ධනාත්මක ප්‍රතිලාභ ජනිත කරවීමට ද හේතු වනු ඇත.

රක්ෂණ කර්මාන්තයේ වටිනාකමේ ප්‍රමුඛස්ථානය හිමිකර ගැනීමට දිගු කාලීන රක්ෂකයන් තවදුරටත් සමත්ව සිටින අතර එහි වටිනාකම රු. බිලියන 345.8 ක් විය. කෙසේවුවද 2015 වසරේ 26.6%ක්ව පැවති දිගු කාලීන රක්ෂණ වත්කම් අගයේ වර්ධන අනුපාතය 2016 වසරේදී 10.5% දක්වා සැලකියයුතු අඩුවීමක් වාර්තා විය. ඊට ප්‍රතිවිරුද්ධව 2015 දී 13%ක්ව පැවති සාමාන්‍ය රක්ෂණ වත්කම් වර්ධන වේගය වර්ෂ 2016 දී 16% දක්වා වර්ධනය විය.

ගෙවුනු වසර තුළ සාර්ථකව ක්‍රියාත්මක වූ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය රු. මිලියන 63,495 ක දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කළේය. පසුගිය වසරේදී රු. මිලියන 20,934ක් වූ දිගුකාලීන රක්ෂකයන් විසින් ගෙවනු ලැබූ හිමිකම් අගය 2016 දී රු. මිලියන 22,622 දක්වා 8%කින් වර්ධනය විය. සමස්ත දිගු කාලීන හිමිකම් ගෙවීම් අතර විශාලතම අගය වාර්තා කරමින් කල්පිරීම් ප්‍රතිලාභ ගෙවීම් රු. බිලියන 12.7 ක් විය. සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද මුළු දුබලතා ප්‍රතිලාභ වර්ෂය අවසානය වන විට රු. මිලියන 591 දක්වා 37%ක වාර්ෂික වර්ධනයක් අත්කරගැනීම මෙහිලා සඳහන් කිරීම වැදගත් වේ.

මේ අතර පැවති ධෛර්යමත් වෙළඳපොල තත්ත්වයෙන් ප්‍රතිලාභ ලැබූ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ 62%ක දළ ලිඛිත වාරික අගයක් වාර්තාකර ගනිමින් එම අංශයේ ප්‍රමුඛත්වය මෝටර්රථ රක්ෂණ ව්‍යාපාරික අංශය විසින් හිමිකර ගන්නා ලදී. කාර්යසාධනය සලකා බැලීමේදී ඉතා සාධනීයව පැවති මෙම අංශය 2015 වසරේ වාර්තා කරගත් 19.1%ක වාර්ෂික වර්ධන අනුපාතය හා සැසඳීමේදී සමාලෝචිත 2016 වර්ෂයේදී සමස්තයක් ලෙස 15.6% දක්වා පහළයාමක් පෙන්වීය.

## අපගේ කාර්යසාධනය

ආරම්භයේදී සඳහන් කළ පරිදි, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අර්ධ රාජ්‍ය අංශයේ සේවක පිරිස් හා විශ්‍රාමිකයන් සඳහා ද අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය වැනි

**"සමාලෝචිත වර්ෂය තුළ අග්‍රහාර රන් හා රිදී සාමාජිකත්ව මනාපය යටතේ නවතම ප්‍රතිලාභීන් කාණ්ඩ අලුතින් එක් කිරීම මඟින් මේ වන විට විශ්‍රාමිකයන්ද ඇතුළත් වන අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය සැලකියයුතු පරිදි ව්‍යාප්ත කිරීමකට ලක්ව ඇත. රෝහල් ගාස්තු, සැත්කම් හා බරපතල රෝගාබාධ ආවරණය ඇතුළු විශාල පරාසයක විහිදුනු උපරිම ප්‍රතිලාභ ලබාදීම පිණිස රට පුරා පිහිටි ප්‍රමුඛපෙළේ රෝහල් සමඟ දැනටමත් ඇතිකරගෙන ඇති එමෙන්ම අලුතින් ඇතිකර ගනු ලබන සහයෝගිත්ව තුළින් මෙම ව්‍යාප්තකිරීමේ උපායමාර්ගය තවදුරටත් ශක්තිමත් වනු ඇත."**

රක්ෂණ යෝජනාක්‍රම ව්‍යාප්ත කිරීම හරහා ස්වකීය රක්ෂණ නිමැවුම් සහ සේවා කළඹ පුළුල් කිරීමට අමතරව, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් නව්‍යකරණයෙන් යුතුව අතිශය ජාතික වැදගත්කමකින් යුත් නව හඳුන්වාදීමක් වූ ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය දියත් කරන ලද පසුබිම තුළ මෙම වර්ෂය ජාතික රක්ෂණ භාර අරමුදලට අතිශය වැදගත් වර්ෂයක් විය.

සභාපතිතුමා විසින් විස්තර කරන ලද පරිදි, අපගේ දේශයේ සමාජ හා ආර්ථික සංවර්ධනය උදෙසා සඵලදායී ලෙස දායකවිය හැකි ආකාරයෙන් උපකාර අවශ්‍ය සියල්ලන් වෙනුවෙන් අර්ථාන්විත රැකවරණය සලසාදෙනු ලබන ජනතා විශ්වාසය දිනූ රක්ෂණ ආයතනයක් ලෙස සිය කාර්යභාරය තවදුරටත් පුළුල් කරගැනීමට මෙකී මූලාරම්භනයන් මඟින් ශක්තිමක් වූ අලුතින් එක්කළ අපගේ ශක්‍යතා තුළින් ජාතික රක්ෂණ භාර අරමුදලට අවශ්‍ය හැකියාව හිමි වී ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදලේ මෙහෙයුම් හා කාර්යභාරය තුළ කාවද්දා ඇති සඵලදායී සමාජ සේවය කෙරෙහි වන දැඩි අවධානය සැලකිල්ලට ගනිමින්, ලාභදායිත්වය සහ දැරියහැකි මිල හා සඵලත්වය අතර සමබරතාව පවත්වාගැනීම කෙරෙහි අපි අඛණ්ඩව අවධානය යොමු කළෙමු.

2015 වර්ෂයේ වාර්තා වූ රු. බිලියන 5.1 ක දළ ලිඛිත වාරික අගයට සාපේක්ෂව මේ වසරේ රු. බිලියන 6.8 ක් දක්වා දළ ලිඛිත වාරික අගය වර්ධනය වුවද, 2015 වසරේ රු. බිලියන 4.3ක් වූ ආයතනයේ බදු පසු ලාභය සමඟ සැසඳීමේදී මේ වසරේ එම ලාභය රු. බිලියන 2.8ක් ලෙස වාර්තා කරමින් එහි පහළයාමක් පෙන්වීය. සභාපතිතුමා විසින් සඳහන් කරන ලද පරිදි, මෙම වසරේ ලාභදායිත්වයේ සිදුවූ පහළයාම කෙරෙහි බලපෑ වැදගත් සාධකයක් වන්නේ ශ්‍රී ලංකාවට දැඩි බලපෑම් එල්ල වූ මහා පරිමාන ජලගැලීම් සහ ඒ සමඟ ඇතිවූ නායයෑම් හා චණ්ඩ මාරුත ආදී ස්වාභාවික ව්‍යසන සිදුවූ වාර ගණන සහ එවායේ ප්‍රබලත්වය අඛණ්ඩව ඉහළයාම යි.

මෙම තත්ත්වය හමුවේ, 2016 වසරේ අප්‍රේල් 01 දින දියත් කරන ලද ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය සඳහා මුලපිරීම සැබවින්ම අතිශය කාලෝචිත පියවරකි.

මෙම යෝජනාක්‍රමය යටතේ මූලිකව සියලුම නිවාස සහ රු. මිලියන 10ට අඩු වාර්ෂික පිරිවැටුමක් සහිත කුඩා කර්මාන්ත ව්‍යාපාරික පරිශ්‍ර ආවරණය වන අතර සියලුම පුරවැසියන් සඳහා රු. 100,000/-ක පුද්ගල අනතුරු ආවරණයක් සහ අවාසනාවන්ත ලෙස ජීවිත අහිමි වීමකදී ධීවරයන් සඳහා රු. මිලියනයක ආවරණයක් ද සලසා දෙනු ලැබේ.

තවද, ස්වාභාවික ආපදා මඟින් අවතැන් වන තැනැත්තන් සඳහා තවදුරටත් ලබාදෙන හදිසි සහන වියදම් දීමනාවලට අමතරව, ආපදාවට ලක්වූ එක් එක් පරිශ්‍රයේ පිහිටි දේපල වලට සිදුවූ හානි වෙනුවෙන් රු. මිලියන 2.5 දක්වා රක්ෂණ ආවරණය සැලසෙන අතර 2016 වසර අවසානයේදී ශ්‍රී ලංකා රජය නමින් රක්ෂණය කරන ලැබූ මුළු රක්ෂිත මුදල රු. බිලියන 10ක් විය. මෙම රක්ෂණ ඔප්පුව සඳහා ප්‍රතිරක්ෂණය ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධානත්වයෙන් යුත් අලියාන්ස් එස් ඊ මියුනික් රි සහ ලොයිඩ්ස් (Allianz SE, Munich Re and Lloyds) යන ජාත්‍යන්තර කීර්තියට පත් ආයතනවලින් සමන්විත මණ්ඩලයක් වෙත පවරා දී ඇති අතර ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අදාළ ප්‍රතිරක්ෂණයේ 20%ක පංගුවක් හිමිකරගෙන ඇත.

මෙම රක්ෂණ යෝජනාක්‍රමය ආරම්භකර මාසයක් ගතවීමත් සමඟ ඇතිවූ ධාරානිපාත වර්ෂාව හේතුවෙන් සිදුවූ අධික ජලගැලීම් මඟින් ශ්‍රී ලාංකිකයන් 100කට අධික පිරිසක් මියගිය අතර තවත් දහස් සංඛ්‍යාත පිරිසක් අවතැන් විය. මෙකී ඛේදවාචකයෙන් අනතුරුව ඉදිරිපත් වූ රු. බිලියන 15 ඉක්මවූ රක්ෂණ හිමිකම් මඟින් රක්ෂණ කර්මාන්තයට දැඩි පහරක් එල්ල වූ අතර එකී හිමිකම් වලින් 30%ක ප්‍රතිරක්ෂණ වගකීම ජාතික රක්ෂණ භාර අරමුදල සතුවිය. ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය යටතේ හදිසි සහන සඳහා ඉදිරපත් වූ මූලික හිමිකම් ප්‍රමාණය රු. මිලියන 131ක් වූ අතර 2016 වසර අවසානය වන විට ආසන්න වශයෙන් රු. බිලියන 3.5ක මුළු පිරිවැයක් මත නිවාස 64,552ක් වෙනුවෙන් රු. 10,000/-ක අත්තිකාරම් මුදලක් බැගින් ගෙවීම් කරන ලදී.

මෙකී ආපදා තත්ත්වයන් හමුවේ ජාතික රක්ෂණ භාර අරමුදලට දැරීමට සිදුවූ මූල්‍ය

# ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

පිරිවැය ඉහළ වුවද, ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් ආරම්භකිරීමට යෙදුන ජාතික ස්වාභාවික ආපදා රක්‍ෂණ යෝජනාක්‍රමය මඟින් සැලකිය යුතු පරිදි වේගවත් වූ ප්‍රතික්‍රියා කාලයක් තුළ සිය ආපදා සහන සැලසීමේ ක්‍රියාන්විතය දෙස දැඩි අවධානයක් යොමු කිරීමට රජයට හැකිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස ආපදාවන්ට පහසුවෙන් ගොදුරුවිය හැකි ජන කොටස් සඳහා ශක්තිමත් ආරක්ෂාවක් සලසා දීමට හැකිවූ අතර ජාතික අයවැය මත අධික බරක් පැටවීම අවම විය. මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා තවත් බොහෝ ක්‍රියාමාර්ග ගත යුතුව ඇති අතර, ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් ජාතික ස්වාභාවික ආපදා රක්‍ෂණ යෝජනාක්‍රමය ආරම්භ කිරීමේ පටන් එහි සාධනීය කාර්යසාධනය මඟින් අපි බෙහෙවින් උද්යෝගයට පත්ව සිටින අතර ශ්‍රී ලාංකික ජනතාවගේ ඉදිරි ගමන වෙනුවෙන් වඩාත් යහපත් ආකාරයෙන් සේවය කිරීම පිණිස මෙම යෝජනාක්‍රමය තවදුරටත් ප්‍රසාදනය කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

අග්‍රහාර සෞඛ්‍ය රක්‍ෂණ යෝජනාක්‍රමය එහි ආරම්භයෙන් පසුව 20 වන සංවත්සරය සැමරීය. ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව විසින් මූලිකව ක්‍රියාත්මක කරන ලද මෙම යෝජනාක්‍රමය පසුව 2006 ජනවාරි මාසයේදී ජාතික රක්‍ෂණ භාර අරමුදල වෙත පවරාදෙන ලද අතර ගෙවුනු දශකය තුළ පිරිනැමූ මූලික ආවරණය සම්බන්ධයෙන් පමණක් නොව එහි සංකීර්ණතාව ශක්තිමත් කිරීම තුළින් ද යෝජනාක්‍රමය වේගයෙන් ව්‍යාප්තවී ඇති බව අපි අභිමානයෙන් සඳහන් කරමු. එහි ප්‍රතිඵලයක් ලෙස, අග්‍රහාර සෞඛ්‍ය රක්‍ෂණ යෝජනාක්‍රමය රජයේ සේවකයන් හා ඔවුන්ගේ පවුල් සඳහා විශ්වසනීය ආරක්‍ෂක ජාලයක් වශයෙන් තවදුරටත් සැමට ඉහළින් වැජඹෙමින් සිටියි.

සමාලෝචිත වර්ෂය තුළ අග්‍රහාර රන් හා රිදී සාමාජිකත්ව මනාපය යටතේ නවතම ප්‍රතිලාභීන් කාණ්ඩ අලුතින් එක් කිරීම මඟින් මේ වන විට විශ්‍රාමිකයන්ද ඇතුළත් වන අග්‍රහාර සෞඛ්‍ය රක්‍ෂණ යෝජනාක්‍රමය සැලකියයුතු පරිදි ව්‍යාප්ත කිරීමකට ලක්ව ඇත. දෘෂ්ටි විශේෂඥ උපදේශන හා ආශ්‍රිත වියදම් ප්‍රතිපූරණය කිරීමට අමතරව, රෝහල් ගාස්තු, සැත්කම් හා බරපතල රෝගාබාධ ආවරණය ඇතුළු විශාල පරාසයක විහිදුනු උපරිම ප්‍රතිලාභ ලබාදීම පිණිස රට පුරා පිහිටි ප්‍රමුඛ පෙළේ රෝහල් සමඟ දැනටමත් ඇතිකරගෙන ඇති එමෙන්ම අලුතින් ඇතිකර ගනු ලබන සහයෝගිත්ව තුළින් මෙම ව්‍යාප්තකිරීමේ උපායමාර්ගය තවදුරටත් ශක්තිමත් වනු ඇත.

## අපගේ කාර්ය මණ්ඩලය

ජාතික රක්‍ෂණ භාර අරමුදල මෑත භාගයේදී අංශ ගණනාවකින් අත්කර ගැනීමට සමත් වූ අඛණ්ඩ ප්‍රගතිය දිවයින පුරා සේවයේ නියුක්තව සිටින අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ චිරස්ථායී ශක්තිය හා කැපවීමෙහි සෘජු ප්‍රතිඵලයක් බව කිව යුතුමය. එබැවින් උපරිම මට්ටමෙන් තම සේවය ඉටුකිරීම සඳහා කාර්ය මණ්ඩලය උනන්දු කරවීමට අප ආයතනය නිරන්තරයෙන් ක්‍රියා කරයි. මෙම වර්ෂයට අදාළව කුකුලේගඟ, ලයා රෙසෝට්හි පැවැත්වූ සේවා ස්ථානයෙන් බැහැරව පවත්වනු ලබන පුහුණු වැඩසටහනට අමතර වශයෙන්, සමාලෝචිත වර්ෂය තුළ ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් බහුවිධ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් රැසක් සංවිධානය කරන ලදී.

ජාතික රක්‍ෂණ භාර අරමුදලේ ඉදිරි ගමන්මග සාධනීය ආකාරයෙන් මෙහෙයවීමට හැකියාව උදාකරන වගකිවයුතු ඉහළ තනතුරුවලට උසස්වීම් ලැබීමට සමතුන් බවට කාර්ය මණ්ඩලය පත්වන අයුරින් අප ආයතනය තුළ නව නායකත්ව පරපුරක් බිහිකිරීම අරමුණුකර ගනිමින් බහුවිධ නායකත්ව පුහුණු වැඩසටහන් රැසක් ද පවත්වන ලදී.

## සමාප්තිය

සමාලෝචිත වර්ෂය ජාතික රක්‍ෂණ භාර අරමුදලට අතිශය වැදගත් වර්ෂයක් වූ අතර දිගු කාලයක් පුරා සිදුවන කාලගුණික විපර්යාස හා බැඳි අනවරත ස්වාභාවික ආපදා අවදානම් වලට අමතරව, ශ්‍රී ලංකාවේ වත්මන් දුෂ්කර සාර්ව ආර්ථික වාතාවරණය තුළ පවතින සීමාකිරීම් හමුවේ පවා ආයතනයේ ඉදිරි ගමන තුළ ධනාත්මක මෙන්ම ශක්තිමත් අභිවෘද්ධියක් උදාවනු ඇතැයි අපි අපේක්‍ෂා කරමු. මෙකී තත්ත්වයන් රක්‍ෂණ කර්මාන්තයට සුවිශාල අභියෝග රැසක් අනිවාර්යයෙන් ගෙනදෙනු ඇත. කෙසේ වුවද, ශ්‍රී ලාංකික සමාජය තුළ උපකාර වැඩි වශයෙන් අවශ්‍ය වන ජන කොටස් සඳහා රක්‍ෂණාවරණ මෙන්ම මූල්‍ය බලගැන්වීම් සැලසෙන බව තහවුරු කිරීමේ ස්වකීය අචල හා ස්ථාවර කැපවීම ජාතික රක්‍ෂණ භාර අරමුදල සහ එහි කාර්ය මණ්ඩලය නැවත නැවතත් අවධාරණය කර සිටියි. සමාජ ආරක්‍ෂණ ජාලය ආරක්‍ෂා කරගැනීම හා වැඩි දියුණු කර ගැනීම මඟින් අවසානයේ දී අපගේ සමාජයේ හා අපගේ ආර්ථිකයේ ගුණාත්මක බව වර්ධනය වනු ඇත.

ශ්‍රී ලංකාවේ රක්‍ෂණය සඳහා යොමුවීම ඉතා අඩු මට්ටමක නොවෙනස්ව පවතින බැවින් ඒ පිළිබඳව දැනුවත් කිරීම වහා විසඳුම් සෙවිය යුතු අතිශය තීරණාත්මක ගැටලුවක් බව අපි විශ්වාස කරමු. රක්‍ෂණය පිළිබඳව සහ රක්‍ෂණ සේවාවන් මඟින් ජනතාවට අත්වන ප්‍රතිලාභ පිළිබඳව අවබෝධය ඉහළනැංවීම තුළින් ශ්‍රී ලංකාව පුරා සමස්තයක් ලෙස රක්‍ෂණය සඳහා යොමුවීම වර්ධනය කිරීමට බොහෝ දේ සිදුකළ හැකි බවට අපි විශ්වාසය පළ කරමු.

මාගේ සමාලෝචනය සමාප්ත කරමින්, ජාතික රක්‍ෂණ භාර අරමුදල කෙරෙහි අඛණ්ඩව විශ්වාසය තබා කටයුතු කරන අපගේ පාරිභෝගික භවතුන් වෙත මාගේ හෘදයාංගම කෘතඥතාව පළකර සිටිමි. තවද, වාණිජමය වශයෙන් ලාභදායී ව්‍යාපාරික ආයතනයක් වශයෙන් අප ආයතනය පවත්වාගනිමින්, ජාතික සමාජ ආරක්‍ෂණ ජාලය පුළුල් කිරීමට අනවරත ප්‍රයත්නයක නිරතව සිටින අපගේ සේවයට කැපවූ කාර්ය මණ්ඩලය වෙත මාගේ අවංක ස්තූතිය පුදකර සිටිමි. අවසන් වශයෙන්, ජාතික රක්‍ෂණ භාර අරමුදල ජයග්‍රහනයෙන් විජයග්‍රහනය කරා රැගෙන යාම පිණිස නිරන්තරයෙන් ලබාදුන් මගපෙන්වීම්, උපදෙස් සහ වෘත්තීයමය ඥානය වෙනුවෙන් අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට ද, සභාපතිතුමාට ද අධ්‍යක්‍ෂ මණ්ඩලයට ද ස්තූතිවන්ත වෙමි.



**සනත් සී. ද සිල්වා**
*ප්‍රධාන විධායක නිලධාරී*

25-01-2019

# අධ්‍යක්ෂ මණ්ඩලය



01

**මංජුල ද සිල්වා මහතා**
*(සභාපති)*



02

**ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා**
*(අධ්‍යක්ෂ මණ්ඩල සමාජික)*



03

**අසේන්ද්‍ර සිරිවර්ධන මහතා**
*(අධ්‍යක්ෂ මණ්ඩල සමාජික)*



04

**රෝහණ ද සිල්වා මහතා**
*(අධ්‍යක්ෂ මණ්ඩල සමාජික)*



05

**චන්දන කුමාරසිංහ මහතා**
*(අධ්‍යක්ෂ මණ්ඩල සමාජික)*



06

**ඩී. පී. විමලසේන මහතා**
*(අධ්‍යක්ෂ මණ්ඩල සමාජික)*

# අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ හැඳින්වීම

### මංජුල ද සිල්වා මහතා

*(සභාපති)*

මංජුල ද සිල්වා මහතා 2015.04.06 දින ජාතික රක්ෂණ භාර අරමුදලේ සභාපති වශයෙන් පත් කරන ලදී. එසේ සභාපති ලෙස පත් වීමට ප්‍රථම HNB ඇෂුවරන්ස් පීඑල්සී සමාගමෙහි කළමණාකාර අධ්‍යක්ෂ වශයෙන් ඔහු සේවය කළේය.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යා ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය ලබාගත් මංජුල ද සිල්වා මහතා එක්සත් රාජධානියේ ලන්ඩන් බිස්නස් ස්කූල් ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනපති (MBA) උපාධිය ද ලබා ඇත. වරලත් කළමනාකරණ ගණකාධිකාරී අධිසාමාජිකත්වය (එක්සත් රාජධානිය) ලබා ඇති ඒ මහතා වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරීවරයෙක් (CGMA) වේ.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශයේ උපදේශකයකු ලෙස ද සේවය කළ මංජුල ද සිල්වා මහතා 2015ට පෙර HNB ඇසුවරන්ස් පීඑල්සී සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂ ලෙස පුරා වසර 09 ක් ද, එහි ප්‍රධාන විධායක නිලධාරී ලෙස තවත් වසර 02 ක් ද කටයුතු කර ඇත. ඔහු (එන්ඩිබී වෙල්ත් මැනේජ්මන්ට් යනුවෙන් දැන් හඳුන්වන) ඊගල් එන්ඩිබී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමේ සාමාන්‍යාධිකාරී ලෙස ද, (ඒඅයිඒ ඉන්ෂුවරන්ස් යනුවෙන් දැන් හඳුන්වන) සීමාසහිත ඊගල් ඉන්ෂුවරන්ස් සමාගමේ සංයුක්ත ව්‍යාපාර හා මානව සම්පත් සාමාන්‍යාධිකාරී ලෙසද, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්ද සේවය කර ඇත.

වරලත් කළමණාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ශ්‍රී ලංකා කමිටු සභාපති ලෙස කටයුතු කර ඇති ඔහු පසුව එහි මෙසානා ප්‍රාදේශීය මණ්ඩලයේ ද කටයුතු කර ඇත. ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩලයේ කමිටු සාමාජිකයකු වශයෙන් ක්‍රියා කළ මංජුල ද සිල්වා මහතා එම මණ්ඩලයේ රක්ෂණ මෙහෙයුම් කමිටු සභාපති වශයෙන් ද ක්‍රියා කළේ ය.

### ඒ. ආර්. දේශප්‍රිය මහතා

*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*

ඒ. ආර්. දේශප්‍රිය මහතා 2015.04.08 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස පත්කරන ලදී. 2015 වසරේ දී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළ ඒ මහතා දැනට මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වශයෙන් කටයුතු කරයි.

### කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර මහතා

*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*

සිය ධුරයෙන් ඉල්ලා අස්වූ ඒ. ආර්. දේශප්‍රිය මහතා වෙනුවට කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර මහතා 2016.08.12 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස පත්කරන ලද අතර 2016 අගෝස්තු මාසයේ සිට ඒ මහතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගී විය. 2016 වර්ෂය තුළ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළ ඒ මහතා දැනට කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කරයි.

### රෝහණ ද සිල්වා මහතා

*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*

රෝහණ ද සිල්වා මහතා 2016.05.05 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස පත් කරන ලද අතර, 2016 අගෝස්තු මාසයේ සිට ඒ මහතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගී වේ. 2016 වර්ෂය තුළ ඒ මහතා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙක් ලෙස සේවය කරයි.

### ඩී. පී. විමලසේන මහතා

*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*

ඩී. පී. විමලසේන මහතා (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය - 1 වන පන්තිය) 2015.12.14 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කරන ලද අතර, 2016 වර්ෂය තුළ ඒ මහතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගී වී ඇත. 2015 වර්ෂයේ මුදල් අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස සේවය කර ඇති විමලසේන මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිධාරියෙක් වන අතර කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධියද හිමිකරගෙන සිටී. ගණකාධිකරන හා විගණන ක්ෂේත්‍රවල වසර 25ක් ඉක්මවූ පළපුරුද්දක් ඔහු සතුවේ.

### අසේන්ද්‍ර සිරිවර්ධන මහතා

*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*

දැනට නීතීඥයකු ලෙස කටයුතු කරන අසේන්ද්‍ර සිරිවර්ධන මහතා 2015.04.02 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කරන ලදී.

### චන්දන කුමාරසිංහ මහතා

*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*


චන්දන කුමාරසිංහ මහතා 2015.12.14 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත්කරන ලදී. 2016 වසරේදී රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශයේ අධක්ෂවරයෙක් ලෙස සේවය කළේය.

### ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා

*(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)*

ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා 2015.04.08 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරන ලද අතර වර්ෂ 2015 සිට ඒ මහතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගී වේ. ඔහු HSBC බැංකුවේ සේවයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාව වන විට එහි නියොජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී ලෙස සේවය කළේය. තවද, දැනට AMW කැපිටල් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගමේ (ඩුබායි හි පිහිටා ඇති අල් ෆුටායිම් ව්‍යාපාර සමූහයේ සාමාජික) සභාපති ලෙස ද, යූනියන් බැංකුවේ විධායක නොවන අධ්‍යක්ෂ ලෙසද, (ඉන්දියාවේ ටාටා සමූහයේ සාමාජික) ඩව් ලංකා ට්‍රේලර් මැනිෆැක්චරින් ලිමිටඩ් හි විධායක නොවන අධ්‍යක්ෂ ලෙසද ප්‍රනාන්දුපුල්ලේ මහතා සේවය කරයි.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම


01
**සනත් සී. ද සිල්වා මහතා**
*ප්‍රධාන විධායක නිලධාරී*


02
**ජේ. ඒ. ඩී. සිරිවර්ධන මහතා**
*සහකාර සාමාන්‍යාධිකාරී - මුල්‍ය*


03
**නිමාලි පතිරණ මිය**
*සහකාර සාමාන්‍යාධිකාරී - රක්ෂණ*


04
**පී. ආර්. ඒ. ලසන්ත යූ. කුමාර මහතා**
*මානව සම්පත් හා පරිපාලන දෙපාර්තමේන්තු ප්‍රධානී*


05
**නිමාලි පෙරේරා මිය**
*අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශාඛා ප්‍රධානී*


06
**ධම්මිකා වීරකෝන් මිය**
*මුල්‍ය අංශ ප්‍රධානී*


07
**ආර්. එස්. ගුණසේකර මහතා**
*පර්යේෂණ හා විශ්ලේෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී*


08
**කාවින්ද ජයසිංහ මහතා**
*තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී*


09
**උපේක්ෂා ඒකනායක මිය**
*මෝටර්රථ ප්‍රාරක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී*


10
**අනුර සමරකෝන් මහතා**
*අග්‍රහාර දෙපාර්තමේන්තු ප්‍රධානී*


11
**දේශානි නානායක්කාර මිය**
*ප්‍රතිරක්ෂණ හා SRCC දෙපාර්තමේන්තු ප්‍රධානී*


12
**රන්දිමා ඩී. එම්. මානගේ මෙනෙවිය**
*සාමාන්‍ය හිමිකම් දෙපාර්තමේන්තු ප්‍රධානී*

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



13

**නිමේෂා සහබන්දු මිය**
*කුසුද රක්‍ෂණ දෙපාර්තමේන්තු ප්‍රධානී*



14

**ටී. පී. ලක්ෂ්මන් මහතා**
*මෝටර්රථ හිමිකම් දෙපාර්තමේන්තු ප්‍රධානී*



15

**සිතාර අසංක ජයලත් මහතා**
*පරිපාලන අංශ ප්‍රධානී*



16

**ගයාත්‍රි සොයිසා මිය**
*අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු ප්‍රධානී*



17

**නාමල් කාංචන මහතා**
*ආයෝජන අංශ ප්‍රධානී*



18

**එස්. ආර්. පී. උදාරි ප්‍රියභාෂිණී මිය**
*නීති අංශ ප්‍රධානී*



19

**ගයනි සියඹලාගොඩ මිය**
*විධායක ලේකම්*



20

**ශමාල් සුමුදු සේනාරත්න මහතා**
*අනුරාධපුර ශාඛා ප්‍රධානී*



21

**එම්.එන්.කේ. පාඬිගමගේ මහතා**
*හම්බන්තොට ශාඛා ප්‍රධානී*

# ප්‍රතික්‍රියාව

සිදුවූ හානිය දේපල සම්බන්ධයෙන් වූවක් ද නැතහොත් වෛද්‍ය ස්වභාවයේ ගැටලුවක් ද යන්න නොසලකා අපගේ ජනතාවට සිදුව ඇති හානියේ ප්‍රමාණයටම හැකි උපරිම ආකාරයෙන් හානිපූර්ණය කිරීම අපගේ සේවාවේ මූලික ලක්ෂණයයි. මේ සම්බන්ධයෙන් අපගේ කාර්යක්ෂමතාව ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමටත්, ජාතියේ ආරක්ෂක ජාලය වශයෙන් අපගේ ස්ථානය සුරැකිව පවත්වා ගැනීමටත් නවතම තාක්ෂණය හඳුන්වාදීම වෙනුවෙන් අපි ආයෝජනය කර ඇත්තෙමු.

# කළමනාකරණ කතිකාව හා විශ්ලේෂණය

### ගෝලීය ආර්ථික වාතාවරණය

මෙම වර්ෂය ගෝලීය ආර්ථිකය තුළ පොදුවේ උදාසීන ආර්ථික ක්‍රියාකාරිත්වයක් පැවති තවත් එක් වර්ෂයක් විය. කෙසේ වුවද, 2016 වර්ෂය මුළුල්ලේ දියුණු වූ ආර්ථිකයන්හි වෙළෙඳපොලවල නිරන්තරයෙන් පැවති පෙර නොවූවිරූ සමාජ-දේශපාලනික වෙනස්කම් හමුවේ පවා එකී ආර්ථිකයන්හි ඉහළ ගිය වර්ධනයක් වාර්තා වීමට 2016 වර්ෂයේ දෙවන භාගය පුරා සුළු වශයෙන් ඉහළ ගිය ආර්ථිකයේ සැලකිය යුතු ක්‍රියාකාරිත්වය හේතු සාධක විය.

යුරෝපා හවුල සහ ජපානය වැනි දියුණු ආර්ථිකයන්හි පැවති පෙර නොවූවිරූ වෙනස්වනසුළු ස්වභාවය මෙන්ම මැද පෙරදිග කලාපයේ පැවති තදබල භූ-දේශපාලනික අවිනිශ්චිතතාවන් මගින් අඩපනවූ 2016 වර්ෂයේ ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයේ සාමාන්‍ය වර්ධනය වර්ෂය ආරම්භයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රක්ෂේපිත 3.1%ක් වූ වර්ධන අනුපාතයට බොහෝ පහළ අගයක් ගනිමින් 2.5%ක් බවට පත් වුවද, චීනය හා ඉන්දියාව වැනි තරමක් විශාල ආර්ථිකයන්හි පැවති ප්‍රත්‍යාස්ථ වර්ධනය සහ එක්සත් ජනපදයේ මූල්‍ය ප්‍රතිපත්තිය අඛණ්ඩව සාමාන්‍යකරණය වීම මගින් මෙම තත්ත්වය යම් පමණකට සමනය විය.

දියුණු ආර්ථිකයන්හි ආර්ථික හා වෙළඳ ප්‍රතිපත්තියේ සිදුවූ සැලකියයුතු විපර්යාස වර්ෂයේ සිදුවූ වඩාත් කැපී පෙනෙන සිදුවීම් අතර විය. එකී සිදුවීම් මගින් විශේෂයෙන් නැගීඑන ප්‍රත්‍යන්ත වෙළඳපොලවල් තුළ සැලකියයුතු අනිශ්චිතතාවන් ජනිත කරවීය. බොරතෙල් මිලගණන් ද ඇතුළු ජාත්‍යන්තර පාරිභෝගික භාණ්ඩ මිලගණන් ඉතිහාසයේ වාර්තා වූ අඩුම මට්ටමට පැමිණි පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ ප්‍රමුඛ පාරිභෝගික භාණ්ඩ මිලගණන්වල සුළු ඉහළ යාමක් දක්නට ලැබුණි.

2016 දී බොරතෙල් මිලගණන් වසර13කට පසුව වාර්තාවූ අඩුම මිල වූ බැරලයක් ඇ.එ.ජ. ඩොලර් 26ක් දක්වා පහළගිය බොරතෙල් මිලගණන් පසුව බැරලයක් ඇ.එ.ජ. ඩොලර් 50-55 අතර මිලගණන් දක්වා ඉහළ ගියේය. මෙකී ප්‍රවනතාවන් ලොව පුරා උද්ධමනීය බලපෑමක් ඇතිවීමට හේතු වූ අතර ආයාත මත පදනම් වූ ආර්ථිකයන්ට එම තත්ත්වය වඩාත් දැඩිව බලපෑවේය.

### ශ්‍රී ලංකාවේ ආර්ථික වාතාවරණය

සීමිත, අස්ථාවර ආර්ථික තත්ත්වයක් පැවති කාල පරිච්ඡේදයකින් පසුව, 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා ආර්ථිකය යම් ස්ථාවරභාවයකට පත්වීමේ ලකුණු ප්‍රකට කළ අතර ඩොලරයේ අගය යථා තත්ත්වයට පත්කරගැනීමේ ප්‍රයත්නයන් සමඟ එකාබද්ධ වූ ජාත්‍යන්තර වෙළඳපොලවල අඛණ්ඩව පැවති අනිශ්චිතතා මගින් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පාරිභෝගික භාණ්ඩ මිලගණන් ඉහළයාම මගින් ආර්ථික වර්ධනයට දැඩි බාධා එල්ල විය.

පැවති අහිතකර කාලගුණ තත්වයන් හේතුවෙන් රට පුරා විශාල වශයෙන් හානි සිදු විය. මෙකී විනාශ වීම් රටේ කෘෂිකර්මාන්ත අංශය තුළ සැලකිය යුතු බාධාවන් රැසක් ජනිතකරමින් පෙර වර්ෂයේ 4.6%ක්ව පැවති ආර්ථික වර්ධන අනුපාතය සමඟ සැසඳීමේදී 2016 වර්ෂයේදී එම අනුපාතය 4.4%ක් දක්වා පහළ යාමට හේතුවී ඇත.

දැඩි පිස්කල් හා මූල්‍ය ප්‍රතිපත්ති හමුවේ වුවද, වසරේ දෙවන කාර්තුවේ සිට කාර්තුමය වර්ධනයේ ඒකාකාර වේගවත් බවක් නිරීක්ෂණය විය. ඉදිකිරීම් අංශය විශේෂ කොට, සිදුවූ ආයෝජන පිරිවැය ඉහළ යාම වර්ෂය තුළ ආර්ථික වර්ධනය ඉහළ නැංවූ අතර හඳුන්වාදුන් ප්‍රතිපත්ති වලට ප්‍රතිචාරාත්මකව පාරිභෝගික පිරිවැය ඉහළ යාම මන්දගාමී විය. වසරේ මුල් මාස හතර තුළ පහළ මට්ටමක පැවති උද්ධමනය, 2016 වසරේ වාර්ෂික සාමාන්‍ය අගය 4%ක් ලෙස වාර්තා කරමින් පසුව ඉහළ ගියේය.

ආර්ථික වර්ධනය සඳහා 6.7%ක වාර්ෂික වර්ධන අනුපාතයක් වාර්තා කළ කර්මාන්ත අංශය ප්‍රධාන වශයෙන් දායක වූ අතර පිළිවෙලින් 14.9%ක හා 14.4%ක වාර්ෂික වර්ධන අනුපාතයක් වාර්තාකළ ඉදිකිරීම් හා පතල් කර්මාන්ත එම අංශයේ ප්‍රමුඛත්වය හිමිකර ගනිමින් එකී කර්මාන්ත අංශ දෙක එකාබද්ධව දළ දේශීය නිෂ්පාදිතයට 10.0%කින් දායක විය.

දිවයිනේ දළ දේශීය නිෂ්පාදිතයට 56.5%ක දායකත්වයක් සලසන සේවා අංශය 4.2%ක වාර්ෂික වර්ධන අනුපාතයකින් වර්ධනය වූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ 12.4%ක වාර්ෂික වර්ධන අනුපාතයක් පෙන්වූ බැංකු හා මූල්‍ය සේවා අංශවල කැපී පෙනෙන ව්‍යාප්තිය ප්‍රධාන වශයෙන් බලපෑවේය. මේ අතර, ඉහත කී අහිතකර කාලගුණ තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස 2016 දී කෘෂිකාර්මික අංශය 4.2%ක වාර්ෂික අනුපාතයකින් සංකෝචනය විය. අහිතකර කාලගුණ තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස රබර් හා තේ වගාවට සිදුවූ විනාශය මගින් ද මෙම වසරේ ශ්‍රී ලංකාවේ අපනයන කාර්යසාධනය තවදුරටත් දුර්වල විය.

ජාත්‍යන්තර වෙළඳපොලේ තේ සඳහා පැවති සාමාන්‍ය මිල තේ ආනයනය කරන ප්‍රධාන රටවල පැවති අඩු ඉල්ලුම හමුවේ පුළුල් ලෙස එකතැන පල්වන තත්ත්වයක් පෙන්වූ අතර සමස්තයක් ලෙස අඩුකරන ලද ඉන්ධන මිලගණන් හේතුවෙන් ස්වාභාවික රබර් සඳහා ජාත්‍යන්තරව පැවති අවම මිලගණන් මත රබර් කිරි කපන ලද බිම් ප්‍රමාණය මෙන්ම කිරි කපන දින ගණන පහළයාම සමඟ පසුගිය වසර 50 තුළ වාර්තාවූ පහළම අගය දක්වා රබර් නිෂ්පාදනය පහළ ගියේය.

මහ බැංකුවේ මැදිහත්වීම්වල ප්‍රතිඵලයක් ලෙස රුපියලේ අගය පහළයාමේ පීඩනය යම් පමණකට අවමකර ගැනීමට හැකිවූ අතර එ.ජ. ඩොලරයට සාපේක්ෂව ජාතික විනිමය ඒකකය වර්ෂ අවසානයේදී 3.8%කින් අවප්‍රමාණ වී තිබුනි. 2016 වසරේදී රටේ ගෙවුම් ශේෂයේ එ.ජ. ඩොලර් මිලියන 500ක හිඟයක් වාර්තා වූ අතර පෙර වර්ෂයේ එ.ජ. ඩොලර් බිලියන 7.3ක් ලෙස පැවති විදේශ සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 6 දක්වා පහළ ගියේය.

### රක්ෂණ කර්මාන්තය පිළිබඳ සමාලෝචනය

2016 වසරේ සමස්තයක් ලෙස ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය උද්යෝගිමත් අඛණ්ඩ වර්ධනයක් වාර්තා කළ අතර ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික අංශවල සාමූහික දළ ලිඛිත වාරික අගය පසුගිය වර්ෂයේ වාර්තා වූ 16.2%ක වාර්ෂික වර්ධන අනුපාතයට සාපේක්ෂව 16.3%ක වාර්ෂික වර්ධනයක්

පෙන්වමින් රු. බිලියන 143 දක්වා වර්ධනය විය. මෙම ඉහළගිය කාර්යසාධනය සඳහා මූලිකවම සිය පාර්භෝගිකයන් සඳහා ගුණාත්මක සේවාවක් ලබාදීම තහවුරු කිරීම පිණිස ස්වකීය මෙහෙයුම් ක්‍රියාවලි වැඩි දියුණු කිරීමට කර්මාන්තයේ සියලුම අංශවල අඛණ්ඩ ප්‍රයත්නයන් මෙන්ම විශේෂයෙන් නවීන තාක්ෂණික ශක්‍යතාවන් මඟින් ඔප් නැංවුනු රක්ෂණ නිපැයුම් ඇතුළු පවත්නා රක්ෂණ නිමැවුම් යෝග්‍ය පරිදි නැවත සැලසුම්කිරීම ද හේතු විය.

දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරික අංශයේ 20.4% ක්ව පැවති වාර්ෂික වර්ධන අනුපාතිකය 2016 දී 18.3% දක්වා පහළ ගියේය. ඊට ඉඳුරාම වෙනස්වූ ආකාරයෙන් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික අංශයේ 13.2%ක්ව පැවති වාර්ෂික වර්ධන අනුපාතිකය 2016 දී 14.7% දක්වා වර්ධනය විය. එය 2012 වර්ෂයෙන් පසුව වාර්තා වූ ඉහළම වර්ධන අනුපාතිකයයි.

රක්ෂණ කර්මාන්තය තුළ සාධනීය වර්ධන අනුපාතයක් දක්නට ලැබුනද, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රක්ෂණ කර්මාන්තය ගත් කල පෙර වර්ෂයේ 1.12%ක්ව පැවති එම ප්‍රතිශතය සමඟ සැසඳීමේදී 2016 දී 1.21%ක් ලෙස ආන්තික වර්ධනයක් දැකගත හැකි විය. සමාලෝචිත වර්ෂය තුළ දිගු කාලීන රක්ෂණය සඳහා යොමුවීම 0.54%ක් වූ අතර සාමාන්‍ය රක්ෂණය සඳහා යොමුවීම 0.67%ක් විය. මෙම පහළ අගයන් මඟින් පෙනීයන්නේ සියලුම ශ්‍රී ලාංකිකයන් සඳහා වඩාත් පුළුල්වූ සමාජ ආරක්ෂණ මට්ටමක් ඇති කිරීම පිණිස දිවයින පුරා රක්ෂණාවරණය ව්‍යාප්ත කළ යුතු බවත්, අවසානයේදී සමස්තයක් ලෙස ජාතික ආර්ථිකයට එමඟින් සාධනීය ප්‍රතිඵල උදාවනු ඇති බවත් ය.

ඒ සම්බන්ධයෙන් සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ පෙර වර්ෂයේ රු. බිලියන 466.7ක් වූ රක්ෂණ කර්මාන්තයේ ඒකාබද්ධ වත්කම් වටිනාකම ආසන්න වශයෙන් 13% ක වාර්ෂික වර්ධනයක් පෙන්වමින් 2016 දෙසැම්බර් 31 වන විට රු. බිලියන 527.2 ක් සේ පැවතීමයි.

රක්ෂණ කර්මාන්තයේ ඒකාබද්ධ වත්කම් වටිනාකමේ බහුතර දායකත්වය දිගු කාලීන රක්ෂණ අංශය තවදුරටත් හිමිකර ගෙන සිටින අතර, එම අගය රු. බිලියන 345.8ක් විය. කෙසේවුවද, 2015 පෙර වර්ෂයේ පැවති 26.6% ක ප්‍රතිශතය සමඟ සැසඳීමේදී, 2016 වසරේදී එම ප්‍රතිශතය 10.5% දක්වා සැලකිය යුතු පරිදි පහළයාම මෙහිදී සැලකිල්ලට ගැනීම වැදගත් වේ. ඊට සපුරා වෙනස් වූ ආකාරයෙන් සාමාන්‍ය රක්ෂණ අංශයේ වත්කම් වටිනාකම 13%ක පහළ වර්ධන අනුපාතයක සිට 2016 දී 16%ක ඉහළ වර්ධන අනුපාතයක් ලඟාකර ගැනීමට සමත් විය.

දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරික අංශය මෙම වසර තුළ සාර්ථක කාර්යසාධනයක් ලඟාකර ගනිමින් රු. බිලියන 63.5ක දළ ලිඛිත වාරික වටිනාකමක් උත්පාදනය කළේය. දිගු කාලීන රක්ෂකයන් විසින් 2016 වසරේදී ගෙවන ලද හිමිකම් ප්‍රමාණය රු. බිලියන 22.6ක් වූ අතර 2015 පෙර වර්ෂයේ ගෙවන ලද රු. බිලියන 20.9 හා සැසඳීමේදී එය 8%ක වර්ධනයකි. දිගු කාලීන රක්ෂණ අංශයේ ගෙවන ලද සමස්ත හිමිකම් ප්‍රමාණය තුළ රු. බිලියන 12.7ක් වූ කල් පිරීම් ප්‍රතිලාභ ඉහළම අගය වාර්තා කළ අතර මෙම වර්ෂය තුළ ගෙවන ලද දුබලතා ප්‍රතිලාභ වටිනාකම වසර අවසානයේදී රු. මිලියන 591කට ලඟාවෙමින් 37%ක වාර්ෂික වර්ධන අනුපාතිකයක් වාර්තා කිරීම මෙහිලා සඳහන් කිරීම වටී.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශයේ විශාලතම පංගුව මෝටර්රථ රක්ෂණ ක්ෂේත්‍රය අඛණ්ඩව හිමිකරගෙන සිටින අතර එය දළ ලිඛිත වාරික වටිනාකමින් 62% කි. බෙහෙවින් සාධනීය කාර්යසාධනයක් පෙන්වූ මෙම අංශයේ වාර්ෂික වර්ධන අනුපාතය 2015 දී වාර්තා වූ 19.1% හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී 15.6% දක්වා පහළ ගියේය.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය (ශ්‍රීලංරම) විසින් පළකරන ලද නවතම සංඛ්‍යාලේඛන වලට අනුව ජීවිත රක්ෂණ කර්මාන්තය වර්ෂ 2015 දක්වා පසුගිය පස් වසර තුළ 11%ක සංයුක්ත වාර්ෂික වර්ධන අනුපාතයක් වාර්තාකර ඇත. අප කලාපයේ සෙසු වෙළඳ පොලවල් සමඟ සැසඳීමේදී ශ්‍රී ලංකාවේ ජීවිත රක්ෂණ සඳහා යොමුවීම ඉතා පහළ මට්ටමක තිබීම හේතුවෙන් එම වර්ධන අනුපාතිකය ඉදිරියටත් නොවෙනස්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. උදාහරණයක් ලෙස ශ්‍රීලංරම විසින් පළකළ සංඛ්‍යාලේඛන වලට අනුව ශ්‍රම බලකායෙන් කවර හෝ ආකාරයේ රක්ෂණයක් ලබා සිටින ප්‍රතිශතය 2014 වර්ෂයේ පැවති 30% සමඟ සැසඳීමේදී මේ වර්ෂයේ එය 33% ලෙස වාර්තා වීම දැක්විය හැක.

### මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වැදගත් කරුණු

ජාතික රක්ෂණ භාර අරමුදල යනු එක් අතකින් ශ්‍රී ලංකාවේ සංවර්ධනය සහ සමාජ ආරක්ෂණ ජාලය වඩාත් ශක්තිමත් කිරීම සහ අනෙක් අතින් ලාභදායිත්වය තිරසර ආකාරයෙන් පවත්වා ගැනීම අතර තිරසර සමතුලිත බවක් ඇතිකර ගැනීම උදෙසා නිරන්තර උත්සාහයක යෙදෙන ආයතනයක් වන බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය කාර්යසාධනය, සැම විටම එහි සෘජු හා වක්‍ර ව්‍යාපාරික කටයුතු තුළින් ඇතිකෙරෙන සාධනීය සාමාජීය හා ආර්ථික බලපෑමට සාපේක්ෂව සැලකිල්ලට භාජනය කළ යුතු ය.

එම පසුබිම තුළ, අභියෝගාත්මක මෙහෙයුම් වාතාවරණය සහ සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කළ ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය වැනි අතිශය වැදගත් වැඩසටහන් ක්‍රියාවට නැංවීම හරහා අලුතින් වගකීම් භාරගැනීම හමුවේ පවා ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පවත්වාගනු ලබන ශක්තිමත් මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳව කළමනාකාරිත්වය ඉතා තෘප්තිමත් බවින් යුතුව මෙහිලා සඳහන් කර සිටී.

මෙම කාල පරිච්ඡේදය තුළ, දළ ලිඛිත වාරික අගය පසුගිය 2015 වසරේ පැවති රු. බිලියන 5.06 සිට රු. බිලියන 6.81 දක්වා සැලකියයුතු පරිදි වර්ධනය කර ගැනීමටත්, වර්ෂ අවසානය වන විට අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමයේ දායකත්වය රු. බිලියන 1.6 සිට රු. බිලියන 2 දක්වා වර්ධනය කර ගැනීමටත්, ජාතික රක්ෂණ භාර අරමුදල සමත් විය. වගා රක්ෂණ යෝජනාක්‍රමය හරහා රැස්කරගත් වගා බදු ප්‍රමාණය ද වර්ධනය වූ අතර ඉහළ කාර්යසාධනය සඳහා පසුගිය වසරේ වාර්තා වූ රු. බිලියන 1.26 ක දායකත්වයට සාපේක්ෂව මේ වසරේ රු. බිලියන 1.5 කින් දායක වී ඇත.

# කළමනාකරණ කතිකාව හා විශ්ලේෂණය

රු. බිලියන 7.96 ක් ව පැවති ශුද්ධ ලිඛිත වාරික අගය සමාලෝචිත වර්ෂයේදී රු. බිලියන 9.57 දක්වා වර්ධනය වූ අතර ශුද්ධ උපයාගත් වාරික අගය ද ඒ අයුරින් රු. බිලියන 7.93ක සිට රු. බිලියන 8.85ක් දක්වා ප්‍රශංසනීය වර්ධනයක් වාර්තා කළේය. මේ අතර ගාස්තු හා කොමිස් ආදායම රු. මිලියන 6.6 සිට 2016 අවසානයේදී රු. මිලියන 4.7 දක්වා සැලකියයුතු පහළයාමක් පෙන්විය. කෙසේවුවද ආයෝජන ආදායම් හා වෙනත් ආදායම් ප්‍රශංසනීය වර්ධනයක් වාර්තාකර ගනිමින් 2015 වාර්තා වූ රු. මිලියන 850 සමඟ සැසඳීමේදී මෙම වර්ෂ අවසානයේදී රු. මිලියන 984 ක ආදායමක් වාර්තා කළේය.

සමාලෝචිත වර්ෂයේදී ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය ආරම්භකිරීමත් සමඟ ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය කාර්යසාධනය කෙරෙහි සෘජු හා සැලකියයුතු බලපෑමක් එල්ල කළ අහිතකර කාලගුණික උවදුරුවල තියුණු ඉහළයාමක් පෙන් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වර්ෂයේ රු. බිලියන 3.23ක් වූ ගෙවූ දළ ප්‍රතිලාභ හා හිමිකම් ප්‍රමාණය රු. බිලියන 5.76ක් දක්වා ඉහළ යමින් තියුණු වර්ධනයක් වාර්තා කළේය. එකී විශාල පිරිවැය ආයතනයට අමතර වැයබරක් වන නමුත් එම යෝජනාක්‍රමය මඟින් ඒ වන විටත් ශ්‍රී ලාංකික ප්‍රජාව, පුද්ගලයන්, සහ ව්‍යාපාර මත ඇතිකළ සාධනීය බලපෑම, ජාතියට වඩාත් විස්තීර්ණ සමාජ ආරක්ෂණ ජාලයක් සලසාදීමේ සිය කාර්යභාරයට අනුව යමින් ස්වාභාවික ආපදාවලට ගොදුරුවූවන්ට වන්දි ලබාදීමේ වැයබරින් මහා භාණ්ඩාගාරය මුදවාලමින් ජාතික රක්ෂණ භාර අරමුදලට ඒකණෝහිම දැරීමට සිදුවූ එකී පිරිවැය තුලනය කිරීමක් වන ලෙස කළමනාකාරිත්වය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

එම තත්ත්වය මත, පසුගිය වර්ෂය තුළ ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය කාර්යසාධනයේ සිදුවූ තවත් එක් වැදගත් සිදුවීමක් වූයේ අරමුදලේ සමස්ත වත්කම් පදනම තවදුරටත් පුළුල් වීමයි. එකී වත්කම් අගය 2015 පැවති රු. බිලියන 12.2 හා සැසඳීමේදී වර්ෂ අවසානයේදී රු. බිලියන 19.52 දක්වා සැලකියයුතු පරිදි වර්ධනය වී ඇත.

ඉහත කී ගතිකයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. බිලියන 2.84ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර පෙර වර්ෂයේ වාර්තා වූ රු. බිලියන 4.39 හා සැසඳීමේදී සමස්තයක් ලෙස අඩු වීමක් දක්නට ලැබුනි. පෙර වසරේ වාර්තා වූ රු. බිලියන 4.3ක බදු පසු ලාභය සමාලෝචිත වර්ෂය තුළ රු. බිලියන 2.84 දක්වා පහළ ගියේය.

2016/12/31 දිනට ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය 586% ක් ලෙස පැවති අතර 120%ක් වන යාමිත නුබුන්වත් මට්ටමට සහ බලාත්මක කිරීමේ සීමාව වන 160%ට වඩා ඉහළින් එය පැවතුනි. එලෙසින්, ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටමක් පවත්වාගත් අතර අරමුදලේ ශේෂ පත්‍රය මුළුමණින්ම ආරක්ෂිත තත්ත්වයක පැවතුනි.

### ආංශික විවරණය

#### අග්‍රහාර

අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය යනු ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පිරිණමනු ලබන සුවිශේෂිත රක්ෂණ යෝජනාක්‍රමයක් වන අතර රජයේ නිලධාරීන්, රාජ්‍ය සේවකයන් සහ පළාත් මට්ටමේ රජයේ නිලධාරීන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින් 1997 වර්ෂයේ මුලින් හඳුන්වාදුන් මෙම යෝජනාක්‍රමයට දායකවූවන් විසින් නාමික රක්ෂණ වාරිකයක් මාසිකව කරනු ලැබීමේ පදනමින් එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මෙහෙයවීම යටතේ ආරම්භ කරන ලද මෙම යෝජනාක්‍රමය විශ්‍රාමවැටුප් හිමි රජයේ නිලධාරීන්ගේ වැටුපෙන් අයකරගනු ලබන නාමික වාරික පදනම් කරගනිමින් මෙහෙයවනු ලබන රක්ෂණ ආකෘතියක් බවට ක්‍රමිකව විකාශය විය. මෙම යෝජනාක්‍රමය මෙහෙයවීමේ වගකීම පසුව ශ්‍රී ලංකා රජය වෙත පැවරුණු අතර ඉන් අනතුරුව මෙම යෝජනාක්‍රමය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සහයෝගිතාව මත මෙහෙයවීමේ වගකීම ජාතික රක්ෂණ භාර අරමුදල වෙත පවරා දෙන ලදී. වර්තමානය වන විට අග්‍රහාර යෝජනාක්‍රමය මඟින් 825,000 ක් ඉක්මවූ සාමාජිකයන් සංඛ්‍යාවක් සඳහා රක්ෂණාවරණ සැලසෙන අතර ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ද ඇතුළු ආසන්න වශයෙන් මිලියන 2.2 ක් පමණ ශ්‍රී ලාංකිකයන් සඳහා ආවරණය සැලසේ.

අග්‍රහාර යෝජනාක්‍රමයේ සාමාජිකයන්ට සැලසෙන ප්‍රතිලාභවල විෂයපථය හා පරිමාව තවදුරටත් ව්‍යාප්ත කිරීමේ අරමුණින් බහුවිධ මූලික පියවරයන් රැසක් 2016 වසරේදී ක්‍රියාවට නංවන ලද අතර ඒ අතුරින් වඩාත් කැපී පෙනෙන කරුණ වන්නේ රන් හා රිදී සාමාජිකත්ව මනාපය හඳුන්වාදීමත් 2016.01.01 දින සිට විශ්‍රාමලත් රජයේ සේවකයන් ද රක්ෂණ ප්‍රතිලාභ විෂයපථයට ඇතුළත් කරමින් අග්‍රහාර රැකවරණ වැඩසටහන හඳුන්වාදීමත් ය.

එම නව යෝජනාක්‍රමයේ අංගයක් වශයෙන් හඳුන්වාදුන් රු. 600/- හා රු. 300/- ආදී වශයෙන් වැඩි අගයකින් යුත් වාරිකයක් ගෙවීමට මනාපය පළ කරන ප්‍රතිලාභීන්ට පිළිවෙලින් රන් හා රිදී යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ලබාගැනීමට අවස්ථාව උදාවේ. එයින් අග්‍රහාර රන් හා රිදී සාමාජිකයන්ට අග්‍රහාර සාමාන්‍ය රක්ෂණ යෝජනාක්‍රමයට සාපේක්ෂව පහත සඳහන් ප්‍රතිලාභ අත්වනු ඇත.

| සාමාජිකයන්ට හා ඔවුන්ගෙන් යැපෙන පවුලේ සාමාජිකයන්ට (පවුල් ඒකකය සඳහා) | අග්‍රහාර යෝජනාක්‍රමය -සාමාන්‍ය උපරිම හිමිකම | අග්‍රහාර යෝජනාක්‍රමය - රන් උපරිම හිමිකම | අග්‍රහාර යෝජනාක්‍රමය - රිදී උපරිම හිමිකම |
|---|---|---|---|
| වාර්ෂික සීමාව | රු. 150,000.00 | රු. 250,000.00 | රු. 350,000.00 |
| **(01) පෞද්ගලික රෝහලක රෝහල්ගත වීම**<br><br>කාමර ගාස්තු සඳහා<br>ඖෂධ, සැත්කම්, ශල්‍යාගාර ගාස්තු<br><br>වෛද්‍යවරුන්ගේ ගාස්තු<br>වෛද්‍ය පරීක්ෂණ සඳහා | (රු. 120,000.00 එක් රෝහල්ගත වීමකට උපරිමය)<br><br>රු. 3,000.00 (දිනකට)<br>රු. 50,000.00<br><br>රු. 20,000.00<br>රු. 20,000.00<br><br>රු. 150,000.00 (වර්ෂයකට) | (රු. 160,000.00 එක් රෝහල්ගත වීමකට උපරිමය)<br><br>රු. 5,000.00 (දිනකට)<br>රු. 60,000.00<br><br>රු. 35,000.00<br>රු. 30,000.00<br><br>රු. 250,000.00 (වර්ෂයකට) | (රු. 200,000.00 එක් රෝහල්ගත වීමකට උපරිමය)<br><br>රු. 8,000.00 (දිනකට)<br>රු. 80,000.00<br><br>රු. 50,000.00<br>රු. 40,000.00<br><br>රු. 350,000.00 (වර්ෂයකට) |
| **(02) පෞද්ගලික ආයුර්වේද රෝහලකින් ඉහත සඳහන් බාණ්ඩ යටතේ නේවාසික ප්‍රතිකාර ලබාගැනීම සඳහා (පෞද්ගලික ආයුර්වේද රෝහල අදාළ විෂය භාර දේශීය අමාත්‍යාංශයේ ලියා පදිංචි වී තිබිය යුතු ය.)** | | රු. 160,000.00 (වර්ෂයකට) | රු. 200,000.00 (වර්ෂයකට) |
| **(03) රජයේ රෝහලක රෝහල්ගත වීම**<br><br>නේවාසික දීමනාව<br><br>ඖෂධ වර්ග සඳහා<br><br><br><br><br>වෛද්‍ය පරීක්ෂණ සඳහා | <br><br>රු. 500.00 (දිනකට)<br><br>රු. 50,000.00 (විශේෂඥ වෛද්‍ය නිර්දේශය මත රෝහල්ගතව සිටින කාලය සඳහා පමණී)<br><br>රු. 20,000.00 (විශේෂඥ වෛද්‍ය නිර්දේශය මත රෝහල්ගතව සිටින කාලය සඳහා පමණී)<br><br>රු. 5,000.00 (උපරිමය දින 10ක් සඳහා පමණී) | <br><br>රු. 1,000.00 (දිනකට)<br><br>රු. 60,000.00 (විශේෂඥ වෛද්‍ය නිර්දේශය මත රෝහල්ගතව සිටින කාලය සඳහා පමණී)<br><br>රු. 30,000.00 (විශේෂඥ වෛද්‍ය නිර්දේශය මත රෝහල්ගතව සිටින කාලය සඳහා පමණී)<br><br>රු. 10,000.00 (උපරිමය දින 10ක් සඳහා පමණී) | <br><br>රු. 3,000.00 (දිනකට)<br><br>රු. 80,000.00 (විශේෂඥ වෛද්‍ය නිර්දේශය මත රෝහල්ගතව සිටින කාලය සඳහා පමණී)<br><br>රු. 40,000.00 (විශේෂඥ වෛද්‍ය නිර්දේශය මත රෝහල්ගතව සිටින කාලය සඳහා පමණී)<br><br>රු. 30,000.00 (උපරිමය දින 10ක් සඳහා පමණී) |
| **(04) රජයේ ආයුර්වේද රෝහලක රෝහල්ගත වීම**<br>නේවාසික දීමනාව | <br><br>රු. 500.00 (දිනකට)<br><br>රු. 5,000.00 (උපරිමය දින 10ක් සඳහා පමණී) | <br><br>රු. 1,000.00 (දිනකට)<br><br>රු. 10,000.00 (උපරිමය දින 10ක් සඳහා පමණී) | <br><br>රු. 3,000.00 (දිනකට)<br><br>රු. 30,000.00 (උපරිමය දින 10ක් සඳහා පමණී) |

# කළමනාකරණ කතිකාව හා විශ්ලේෂණය

| සාමාජිකයන්ට හා ඔවුන්ගෙන් යැපෙන පවුලේ සාමාජිකයන්ට (පවුල් ඒකකය සඳහා) | අග්‍රහාර යෝජනාක්‍රමය -සාමාන්‍ය උපරිම හිමිකම | අග්‍රහාර යෝජනාක්‍රමය - රන් උපරිම හිමිකම | අග්‍රහාර යෝජනාක්‍රමය - රිදී උපරිම හිමිකම |
|---|---|---|---|
| **(05) දරු උපත් සඳහා පෞද්ගලික රෝහලක රෝහල්ගතවීම** | | | |
| සිසේරියන් සැත්කමකින් දරු උපත් සඳහා | රු. 40,000.00 | රු. 60,000.00 | රු. 100,000.00 |
| ස්වාභාවික දරු උපත් සඳහා | රු. 10,000.00 | රු. 25,000.00 | රු. 50,000.00 |
| රජයේ රෝහලක රෝහල්ගත වීම<br>සිසේරියන් සැත්කමකින් දරු උපත් සඳහා<br>ස්වාභාවික දරු උපත් සඳහා<br>මළ දරු උපත් සඳහා<br>ගබ්සාවීමක් සඳහා | රු. 500.00 (දිනකට) (උපරිම දින 5ක් සඳහා පමණි) | රු. 1,500.00 (දිනකට) (එක් රෝහල්ගත වීමක් වෙනුවෙන් උපරිම දින 5ක් සඳහා පමණි) | රු. 3,000.00 (දිනකට) (එක් රෝහල්ගත වීමක් වෙනුවෙන් උපරිම දින 5ක් සඳහා පමණි) |
| **(06) පවුලේ සාමාජිකයන්ගේ හෘද සැත්කම්** | රු. 100,00.00 | රු. 150,00.00 | රු. 200,00.00 |

| සාමාජිකයන්ට හිමිවන ප්‍රතිලාභ | අග්‍රහාර යෝජනාක්‍රමය - සාමාන්‍ය උපරිම හිමිකම | අග්‍රහාර යෝජනාක්‍රමය-රජත උපරිම හිමිකම | අග්‍රහාර යෝජනාක්‍රමය-ස්වර්ණ උපරිම හිමිකම |
|---|---|---|---|
| 01. හෘද සැත්කම් සඳහා<br>කන්තුක අපහරණය සඳහා (RF Ablation) | රු. 500,000.00<br>රු. 225,000.00 | රු. 800,000.00<br>රු. 350,000.00 | රු. 1,000,000.00<br>රු. 500,000.00 |
| 02. වකුගඩු බද්ධ කිරීම සඳහා | | රු. 800,000.00 | රු. 1,200,000.00 |
| 03. මොළයේ සැත්කම් සඳහා | | රු. 800,000.00 | රු. 1,200,000.00 |
| 04. පිළිකා රෝග සඳහා | රු. 200,000.00 | රු. 400,000.00 | රු. 600,000.00 |
| 05. දණහිස් බද්ධ කිරීම සඳහා | | රු. 150,000.00 | රු. 250,000.00 |
| 06. උකුල් අස්ථි බද්ධ කිරීම සඳහා | | රු. 150,000.00 | රු. 250,000.00 |
| 07. ශ්‍රවණ ආධාරක සඳහා | රු. 50,000.00 | රු. 75,000.00 | රු. 100,000.00 |
| 08. ඇස් කණ්නාඩි සඳහා | රු. 3,500.00 | රු. 3,500.00 | රු. 5,000.00 |
| 09. පුද්ගල අනතුරු හා ස්වාභාවික මරණ හිමිකම<br>අනතුරු මඟින් සිදුවන මරණ සඳහා<br>ස්වාභාවික මරණ සඳහා | රු. 600,000.00<br>රු. 150,000.00 | රු. 1,000,000.00<br>රු. 400,000.00 | රු. 2,000,000.00<br>රු. 700,000.00 |
| 10. පුද්ගල අනතුරු ආවරණය | රු. 600,000.00 | රු. 1,000,000.00 | රු. 1,500,000.00 |

ඊට අමතරව, සිය සාමාජිකයන්ට හැකි උපරිම ප්‍රතිලාභ සලසාදීමේ අරමුණින් ජාතික රක්ෂණ භාර අරමුදල සහ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛපෙළේ පෞද්ගලික රෝහල් 11ක් අතර අවබෝධතා ගිවිසුම් අත්සන් තබන ලද අතර සමාලෝචිත වර්ෂය තුළ ජාතික රක්ෂණ භාර අරමුදල එසේ නව අවබෝධතා ගිවිසුම්වලට එළැඹි රෝහල්වල ලැයිස්තුවක් පහත දැක්වේ:

1. සීමාසහිත හේමාස් හොස්පිට්ල්ස් (පෞද්ගලික) සමාගම
2. ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී සමාගම
3. නවලෝක හොස්පිට්ල්ස් පීඑල්සී සමාගම
4. නොදර්න් සෙන්ට්‍රල් හොස්පිට්ල්ස් ලිමිටඩ්
5. සිංහ හොස්පිට්ල්ස් ලිමිටඩ්
6. නිව් ෆිලිප්ස් හොස්පිට්ල්ස් ලිමිටඩ්
7. ඔස්රෝ හොස්පිට්ල්ස් ලිමිටඩ්

8. සීමාසහිත ගාල්ල සමුපකාර රෝහල් සංගමය
9. නාවින්න මෙඩිකෙයා හොස්පිට්ල්ස් (පෞද්ගලික) සමාගම
10. බ්‍රවුන්ස් හෙල්ත්කෙයා (පෞද්ගලික) සමාගම
11. ආසිරි හොස්පිට්ල්ස් හෝල්ඩින්ඩින්ග්ස් පීඑල්සී සමාගම

### අග්‍රහාර යෝජනාක්‍රමය පිළිබඳ තොරතුරු

| ශ්‍රීලංරු | 2016 ශ්‍රීලංරු | 2015 ශ්‍රීලංරු |
|---|---|---|
| සාමාජික දායක මුදල් | 1,454,436,602 | 1,236,567,419 |
| මහා භාණ්ඩාරයේ දායකත්වය | 550,000,000 | 400,000,000 |
| මුළු දායක මුදල | 2,004,436,602 | 1,636,567,419 |
| හිමිකම් පිරිවැය | (2,047,583,576) | (1,580,712,410) |
| අතිරික්තය/(හිඟය) | (43,146,974) | 55,855,009 |

| හිමිකම | මුළු හිමිකම් | | ගෙවූ හිමිකම් | | ගෙවියයුතු හිමිකම් | |
|---|---|---|---|---|---|---|
| | 2016 | 2015 | 2016 | 2015 | 2016 | 2015 |
| මරණ | 1,954 | 1,649 | 1,834 | 1,413 | 77 | 213 |
| දුබලතා | 209 | 198 | 182 | 152 | 20 | 42 |
| දරු උපත් | 10,668 | 10,851 | 9,934 | 9,829 | 492 | 662 |
| පිළිකා | 670 | 529 | 617 | 449 | 38 | 55 |
| හෘද රෝග | 932 | 783 | 920 | 757 | 6 | 16 |
| ඇස්කණ්නාඩි | 68,512 | 72,672 | 62,303 | 65,434 | 1,409 | 2,341 |
| වෙනත් රෝගාබාධ සඳහා රජයේ රෝහල් ගාස්තු | 32,525 | 31,777 | 30,269 | 28,745 | 1,331 | 2,044 |
| වෙනත් රෝගාබාධ සඳහා පෞද්ගලික රෝහල් ගාස්තු | 21,688 | 19,497 | 18,361 | 15,779 | 1,305 | 1,823 |
| වකුගඩු | 10 | 5 | 10 | 5 | 0 | - |
| අංශබාග | 2 | 1 | 2 | - | 0 | - |
| එකතුව | 137,170 | 137,962 | 124,432 | 122,563 | 4,678 | 7,196 |

### වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදල

අමාත්‍ය මණ්ඩලය විසින් ගනුලැබූ තීරණයකට අනුව, වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදල (SRCC&TF) 1987 දී ස්ථාපිත කරන ලද අතර ජාතික රක්ෂණ භාර අරමුදල සංස්ථාපිත කිරීමත් සමඟ වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදල භාරයේ තිබූ සියලු අරමුදල් ජාතික රක්ෂණ භාර අරමුදල යටත්ට පත්කරන ලදී. අනතුරුව, එම මුදල් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමකට මාරු කරන ලදුව මෙම අරමුදලේ කළමනාකරණය දැනට ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ පවතී.

වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී ක්‍රියා මඟින් පැනනගින අවදානම් හේතුවෙන් සිදුවන දේපල හානි සහ පුද්ගල මරණ හා තුවාලවීම් සඳහා රක්ෂණ ආවරණය සැලසීම පිණිස මෙම වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී වන්දි අරමුදල පිහිටුවන ලදී. වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී ක්‍රියා අවදානම් ප්‍රාරක්ෂණය සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් සලසාදෙනු ලබන අතර වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී ක්‍රියා අවදානම් වලට අදාළ වාරික මුදල ජාතික රක්ෂණ භාර අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.

වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී ක්‍රියා අවදානම් වලට අදාළව සාමාන්‍ය රක්ෂණ සමාගම් වලට ඉදිරිපත් කෙරෙන හිමිකම් පිළිබඳව ක්‍රියාකාරී කමිටු මාසික රැස්වීමේදී සාකච්ඡාකර හිමිකම් ගෙවීම සම්බන්ධයෙන් තීරණය කරනු ලැබේ.

# කළමනාකරණ කතිකාව හා විශ්ලේෂණය

තවද, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී ක්‍රියා අවදානම් සඳහා ප්‍රතිරක්ෂණාවරණයක් ලබාගෙන ඇත.

| | 2016 ශ්‍රීලංරු. | 2015 ශ්‍රීලංරු. |
|---|---:|---:|
| දළ ලිඛිත වාරික | 3,533,324,423 | 3,018,417,937 |
| පොළී ආදායම් | 599,542,870 | 550,349,604 |
| වෙනත් ආදායම් | - | 3,198,218 |
| මුළු ආදායම් | 4,132,867,293 | 3,571,965,759 |

### ප්‍රතිරක්ෂණය

ජාතික රක්ෂණ භාර අරමුදල ජාතියේ ප්‍රතිරක්ෂකයා වේ. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ සමාගම්වල ප්‍රතිරක්ෂණ අවදානම් භාරගැනීම ජාතික රක්ෂණ භාර අරමුදල විසින් වර්ෂ 2008 දී ආරම්භ කරන ලදී. 2012 අංක 27 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනත යටතේ 2012. 12.31 දිනැති ගැසට් නිවේදනයට අනුව ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ සමාගම්වල මුළු ප්‍රතිරක්ෂණ ව්‍යාපාරික වටිනාකමින් 30%ක් ජාතික රක්ෂණ භාර අරමුදලින් ලබාගැනීම අනිවාර්ය කර ඇත.

2016 වර්ෂයේදී, ජාතික රක්ෂණ භාර අරමුදලේ කළමනාකාරිත්වය විසින් ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ සිදුවිය හැකි හිමිකම් ඉල්ලීම් අධික ලෙස ඉහළයාමේ අවදානමට මුහුණ දීමට හැකිවනු පිණිස එම අවදානම් ප්‍රතිරක්ෂණය කිරීමට පියවර ගන්නා ලදී.

සාමාන්‍ය රක්ෂණයට අදාළ 30%ක අනිවාර්ය වගකීම ආවරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිරක්ෂණ ලබාගැනීමට ජාතික රක්ෂණ භාර අරමුදල කටයුතු කළේය.

| | 2016 ශ්‍රීලංරු. | 2015 ශ්‍රීලංරු. |
|---|---:|---:|
| දළ ලිඛිත වාරික | 2,397,372,589 | 1,737,839,949 |
| පොළී ආදායම් | 240,949,250 | 186,086,647 |
| වෙනත් ආදායම් | 6,144,709 | 23,719,435 |
| මුළු ආදායම් | 2,644,466,548 | 1,947,646,031 |

### සාමාන්‍ය රක්ෂණය - රථවාහන

රජයේ පූර්ණ හිමිකාරීත්ව සහිත ආයතනයක් වන ජාතික රක්ෂණ භාර අරමුදලේ මෝටර් රථ අංශය මගින් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවලට දැරිය හැකි වාරික මුදලකට පූර්ණ සහ තෙවන පාර්ශ්වීය රක්ෂණ ආවරණ සපයනු ලබයි. මෙම අංග සම්පූරණ රක්ෂණ ආවරණය යටතේ ගින්නෙන්, සොර සතුරු, තෙවන පාර්ශ්වයකට සිදුවන මරණ හා තුවාලවීම් ද ඇතුළුව ගංවතුර, වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී ක්‍රියා නිසා වන හානි ද ආවරණය කරනු ලබයි.

සෙසු තරඟකාරී රක්ෂණ සමාගම් සමඟ උරෙනුර ගැටෙමින්, ජාතික රක්ෂණ භාර අරමුදල දිවයින පුරා ආවරණය වන පරිදි අනතුරු හානි තක්සේරුව කඩිනමින් ඉටුකිරීම, රක්ෂිතයා නම්කරනු ලබන ගරාජයක් මගින් අලුත්වැඩියා කර ගැනීමට හැකියාව සලසා දීම, අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කර දින 03ක් ඇතුළත වන්දි ගෙවීම ඇතුළු අගය එකතු කළ සේවාවන් රැසක් ක්‍රියාත්මක කර ඇත. මීට අමතරව, රජයේ සේවයේ දිවයින පුරා සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරීන් පරිහරණය කරන මෝටර් සයිකල් ද ආවරණය වන පරිදි මෙම රක්ෂණ යෝජනාක්‍රමය තවදුරටත් ව්‍යාප්ත කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදල පියවර ගෙන ඇත.

මීට අමතරව, ගංවතුර ආරක්ෂණය, තෙවන පාර්ශවයේ දේපල හානි ආවරණය, තීරුබදු නිදහස් නැව්ගත කිරීමේ ආවරණය, කුලීපිට මිලදී ගැනීම් ආවරණය, වායු ආරක්ෂන ආවරණය, ඇදගෙන යෑමේ ගාස්තු ආවරණය, ඉදිරිපස ප්‍රධාන වීදුරු ආවරණය, රියදුරු පුහුණු ආවරණය, සේවක වන්දි ආවරණය, මාර්ගස්ථ මගීන් හා භාණ්ඩ පිළිබඳ නෛතික බැඳීම් ආවරණය ආදී රක්ෂණ ආවරණ සලසාදීම ද ජාතික රක්ෂණ භාර අරමුදල සිදු කරයි.

සමාලෝචිත වර්ෂය තුළ, පැය 24 පුරා ක්‍රියාත්මක සෘජු ඇමතුම් මධ්‍යස්ථාන පවත්වා ගැනීමට සමගාමීව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ක්‍රියාත්මක ශාඛා කාර්යාල සංඛ්‍යාව හරහා වන්දි ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීමටත්, වන්දි ගෙවීම් කඩිනම් කිරීමටත් කටයුතු කර ඇත. දක්ෂ තක්සේරු නිලධාරී කණ්ඩායමක් දිවයින පුරා සේවයේ යොදවා සිටීම මගින් වන්දි ගෙවීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට ද අනතුරු වන්දි හිමිකම් පිළිබඳව විමසීම් ඉදිරිපත් කරන සේවාලාභීන් සඳහා කඩිනම් සේවාවක් ලබා දීමටද පියවර ගෙන ඇත.

සමාලෝචිත වර්ෂය තුළ ජාතික රක්ෂණ භාර අරමුදලේ මෝටර් රථ රක්ෂණ ව්‍යාපාර අති සාර්ථක කාර්යසාධනයක් වාර්තාකළ අතර රජයේ සේවකයන් සතු පෞද්ගලික මෝටර් රථ සඳහා විශේෂ ආවරණයක් සැලසෙන රජයේ සේවකයන් සඳහා හඳුන්වාදුන් අග්‍රහාර මෝටර් රථ රක්ෂණය වැනි නව රක්ෂණ යෝජනාක්‍රම දියත් කිරීම ඒ සඳහා මහෝපකාරී විය. ගෙවුණු වසර තුළ මෙම නව රක්ෂණ යෝජනාක්‍රම සඳහා පාරිභෝගිකයන් වෙතින් ඉහළ ප්‍රතිචාරයක් හිමිවූ අතර, දිවයින පුරා සිදු කරන ලද රජය සතු හෝ මූල්‍ය පහසුකම් සැපයූ යතුරුපැදි වෙනුවෙන් රක්ෂණ ඔප්පු අලුත්කිරීම් ද මෙම අංශයේ විකුණුම්/ආදායම් හා ශුද්ධ ආදායම් මට්ටම්වල කාර්යසාධනය සාධනීය බලපෑමක් ඇති කිරීමට හේතු විය.

රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම අපගේ ශක්තිමත් පාර්භෝගික පදනම ඒ සඳහා සහාය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස විශේෂයෙන් රජයේ රක්ෂණ ඔප්පු මඟින් උපයාගත් වාරික ආදායම තවදුරටත් වර්ධනය විය.

| කාණ්ඩය | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| | හිමිකම් සංඛ්‍යාව | මුදල (ශ්‍රීලංරු. මිලි.) | හිමිකම් සංඛ්‍යාව | මුදල (ශ්‍රීලංරු. මිලි.) |
| පෞද්ගලික මෝටර් රථ | 327 | 40.24 | 258 | 33.02 |
| යතුරුපැදි | 1912 | 29.09 | 966 | 13.89 |
| බස්රථ | 170 | 15.46 | 91 | 9.52 |
| ලොරි/ඉඩම් වාහන | 69 | 3.30 | 51 | 4.34 |
| ද්විත්ව කාර්ය වාහන | 391 | 42.06 | 220 | 26.51 |
| එකතුව | 2869 | 130.14 | 1,586 | 87.27 |

| | 2016 ශ්‍රීලංරු. | 2015 ශ්‍රීලංරු. |
|---|---|---|
| දළ ලිඛිත වාරික | 382,196,410 | 242,090,517 |
| පොළී ආදායම් | 55,729,178 | 34,621,732 |
| වෙනත් ආදායම් | 7,111,199 | 21,181,827 |
| මුළු ආදායම් | 445,036,786 | 297,894,076 |

සමාලෝචිත වර්ෂය තුළ මෝටර් රථ රක්ෂණ අංශයේ ශුද්ධ ආදායම 49.4%ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළ අතර දළ ලිඛිත වාරික අගයේ 57.9%ක වර්ධනය ඒ සඳහා හේතු සාධක විය. ජාතික රක්ෂණ භාර අරමුදලේ මෝටර් රථ රක්ෂණ ඔප්පුවල සහනදායී වාරික මුදල පිළිබඳව දැනුවත් කිරීම සඳහා විශේෂයෙන් සැලසුම් කර වැඩි වැඩියෙන් ක්‍රියාවට නංවන ලද අලෙවිකරණ හා ප්‍රවර්ධන වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස මෙකී වර්ධිත කාර්යසාධනය උදාකර ගතහැකි විය. බඳවාගැනීම් ඉහළ නැංවීම මඟින් සේවා සැලසීම වර්ධනය කරගැනීමට ද මෙම අංශය සමත් විය.

තවද, රක්ෂණ සහතිකය වෙනුවට ප්ලාස්ටික් රක්ෂණ කාඩ් පතක් ලබාදීමට මෙම අංශය ක්‍රියා කළ අතර සමාලෝචිත වර්ෂය තුළ ආදායම හා සේවා සැලසීම ඉහළ නංවාගැනීමට එය රුකුළක් විය.

### වාරික සංසන්දනය

| මාසය | 2016 | 2015 | වෙනස % |
|---|---|---|---|
| ජනවාරි | 50,275,170 | 37,902,016 | 32.65% |
| පෙබරවාරි | 23,703,504 | 36,849,114 | -35.67% |
| මාර්තු | 17,389,957 | 18,570,307 | -6.36% |
| අප්‍රේල් | 14,278,860 | 13,945,909 | 2.39% |
| මැයි | 17,620,992 | 17,603,522 | 0.10% |
| ජූනි | 35,327,247 | 8,027,946 | 340.05% |
| ජූලි | 30,236,152 | 9,437,312 | 220.39% |
| අගෝස්තු | 14,351,075 | 5,303,052 | 170.62% |
| සැප්තැම්බර් | 34,384,107 | 18,532,648 | 85.53% |
| ඔක්තෝබර් | 20,799,214 | 21,314,569 | -2.42% |
| නොවැම්බර් | 31,226,371 | 22,506,409 | 38.74% |
| දෙසැම්බර් | 58,341,682 | 28,070,106 | 107.84% |

# කළමනාකරණ කතිකාව හා විශ්ලේෂණය

### සාමාන්‍ය රක්ෂණය (මෝටර්රථ නොවන)

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි සාමාන්‍ය රක්ෂණ (මෝටර් රථ නොවන) කටයුතු ගිනි, මුහුදු, වෛද්‍ය හා විවිධ යන උප කාණ්ඩවලට බෙදා ඇති අතර එම උප කාණ්ඩවලට සේවකයන් සඳහා කම්කරු වන්දි ගෙවීම, පුද්ගල හදිසි අනතුරු, සංචාර, සොරකිය, කොන්ත්‍රාත්කරුගේ පිරියත හා යන්ත්‍රෝපකරණ රක්ෂණය, නාවුක යාත්‍රා රක්ෂණය, මාර්ගස්ථ මුදල් රක්ෂණය, විද්‍යුත් උපකරණ රක්ෂණය, මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය සහ බැංකු ආශ්‍රිත හානි රක්ෂණය යනාදී රක්ෂණ ක්‍රම ආවරණය ආදී නව රක්ෂණ යෝජනා ක්‍රම ඇතුළත් වේ.

ජාතික රක්ෂණ භාර අරමුදලේ සාමාන්‍ය රක්ෂණ අංශයේ ශක්තිය එම අංශයේ සේවයේ නියුතු කුසලතා පූර්ණ සේවක මණ්ඩලයේ කැපවීමේ ප්‍රතිඵලයක් මෙන්ම සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ඉදිරිපත් වන සෑම හිමිකම් ඉල්ලීමක් සඳහා ක්ෂණිකව අවධානය යොමු කර, ඉදිරි ක්‍රියාමාර්ග ගෙන, කඩිනමින් නිරවුල් කිරීමට හැකියාව සහිත දක්ෂ අලාභ තක්සේරුකරුවන්ගේ දායකත්වය මතය. සමාලෝචිත වර්ෂය තුළ දළ ලිඛිත වාරිකයේ, ආයෝජනවල හා මුළු ආදායමේ ඇතිවූ සැලකිය යුතු වර්ධනයෙන් පිළිබිඹුවන පරිදි ජාතික රක්ෂණ භාර අරමුදලේ මෝටර් රථ වාහන නොවන සාමාන්‍ය රක්ෂණ අංශයේ ව්‍යාප්තිය සඳහා මෙකී කරුණු මහත් පිටුවහලක් විය.

| ශ්‍රීලංරු. | 2016 ශ්‍රීලංරු. | 2015 ශ්‍රීලංරු. |
|---|---:|---:|
| දළ ලිඛිත වාරික | 182,864,533 | 36,599,503 |
| පොළී ආදායම් | 8,196,862 | 6,516,870 |
| වෙනත් ආදායම් | - | 38,087 |
| මුළු ආදායම් | 191,061,395 | 43,154,460 |

### කෘෂිකාර්මික ණය සුරැකුම් රක්ෂණ යෝජනාක්‍රමය සහ වගා රක්ෂණ යෝජනාක්‍රමය

කෘෂිකාර්මික ණය ලබාදීමේ නියුක්තව සිටින බැංකු හා මූල්‍ය ආයතන වලින් ගොවීන් බොහෝ දෙනෙක් ණය පහසුකම් ලබා ගනිති. නියගය, ජලගැලීම් හෝ අලින් විසින් පහරදීම් ආදිය නිසා වගාවන් හානියට පත්වීම හේතුවෙන් එසේ ණයට දුන් මුදලෙන් සැලකිය යුතු වාරික සංඛ්‍යාවක් ආපසු අයකර ගැනීමට ණය දෙන ආයතන අසමත් වේ. එහෙයින්, ඔවුන් සඳහා රැකවරණ සලසාදීමට මෙම රක්ෂණ යෝජනා ක්‍රමය සැලසුම්කර ඇත.

වගා රක්ෂණ යෝජනාක්‍රමය යටතේ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් නියගය, ජලගැලීම් හෝ අලින් විසින් පහරදීම් ආදිය නිසා විනාශයට පත්වන වී වගාව සඳහා කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් රක්ෂණ ආවරණය සලසා දෙනු ලැබේ.

බැංකු, මූල්‍ය සමාගම්, සහ රක්ෂණ සමාගම් ඇතුළු ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතනවල බදු පසු ලාභයෙන් 1%ක් යෙදවීම මඟින් වගා රක්ෂණ යෝජනාක්‍රමය මූල්‍යනය කරනු ලැබේ.

### ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය

2016 වසරේ අයවැය යෝජනාවක් ලෙස මෙම ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් ආරම්භ කරන ලදී.

රක්ෂණ යෝජනා ක්‍රමයේ වාරිකය වශයෙන් ශ්‍රීලංරු. මිලියන 300ක අයවැය ප්‍රතිපාදන 2016 වසරේදී ජාතික රක්ෂණ භාර අරමුදලට ලැබුණු අතර මෙම රක්ෂණ යෝජනාක්‍රමය යටතේ නියග හැර, සුළිසුළං, කුණාටු, චණ්ඩ මාරුත, ජලගැලීම්, නායයෑම්, සැඩසුළං, භූමි කම්පා, සුනාමි, සැඩ සුලං නිසා ගස් කඩාවැටීම්, පැති බැමි කඩාවැටීම් හා එවැනි ස්වාභාවික උවදුරු ආදියට එරෙහිව වර්ෂයකට රු. බිලියන 10 ක සමුච්චිත සීමාවක් දක්වා සියලු නිවාස හා වාර්ෂික පිරිවැටුම රු. මිලියන 10 නොඉක්මවන ව්‍යාපාරික ආයතන විශේෂකොට, ජීවිත හා රක්ෂණය නොකළ දේපල සඳහා පූර්ණ රැකවරණය සැලසේ. විශාල ව්‍යාපාරික ආයතනවල සහ යම් රක්ෂණ සමාග මක රක්ෂණාවරණ ලබා ඇති දේපලවලට සිදුවන හානි මේ යටතට නොගැනේ.
ධීවර කටයුතුවල යෙදී සිටින විට අනතුරු වලින් මියයන ධීවර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සියලු ධීවරයන් රු. මිලියනයක් දක්වා ආවරණය කෙරෙන අතර ස්වාභාවික ආපදාවලට ලක්වන සෙසු වින්දිතයන් සඳහා රු. 100,000/- බැගින් වූ පුද්ගල අනතුරු රක්ෂණ ආවරණය යටතේ ආවරණය වේ.
ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය සඳහා ප්‍රතිරක්ෂණ ආවරණය ජාතික රක්ෂණ භාර අරමුදල ක්ෂුද්‍ර රක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ලබාගන්නා ලදී. මෙම ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙල යටතේ රක්ෂණය නොකළ දේපල වෙනුවෙන් ආවරණය Allianz SE සමාගමේ ප්‍රධානත්වයෙන් යුත් ප්‍රතිරක්ෂණ මණ්ඩලයකින් ලබාගෙන ඇත.

### මානව සම්පත්

ජාතික රක්ෂණ භාර අරමුදලේ තාක්ෂණික හා මෙහෙයුම් ධාරිතාව වර්ධනය කිරීමට අදාළව ශක්තිමත් හා සාධනීය ප්‍රතිඵල උදා කර ගැනීම පිණිස සැලසුම් කළ පුහුණු හා බඳවා ගැනීමේ ප්‍රතිපත්ති හරහා ආයතනයේ කුසලතා සපිරි කාර්ය මණ්ඩලය නැවත පුහුණු කරවීම හා ප්‍රසාදනය කිරීම ඉලක්ක කරගත් ප්‍රගතිශීලී පියවරයන් ගණනාවක් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත. ඒ අයුරින් දිවයින පුරා අනර්ගතම පාරිභෝගික සේවාවක් සලසා දීමට තමන් සතු හැකියාව තවදුරටත් පවත්වා ගනිමින් ද වඩ වඩාත් ඉහළ නංවා ගනිමින්ද ජාතික රක්ෂණ භාර අරමුදල සුවිශාල ජයග්‍රහණයක් අත්කර ගෙන සිටියි. සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ සේවාවන් හා රක්ෂණ ඔප්පු සඳහා ඉහළ යන ඉල්ලුමට සමගාමීව මෙහෙයුම් ධාරිතාව තවදුරටත් ශක්තිමත් කරගැනීම සඳහා දක්ෂ සේවක පිරිස් බඳවා ගැනීමට කටයුතු කරන ලදී.
එම ක්‍රියාවලිය පුරාවටම කිසිවෙකුට හෝ වෙනස්කොට නොසැලකීමේ ප්‍රතිපත්තියක් අප ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන අතර ස්ත්‍රී පුරුෂභාවය, ජාතිය, ජනවර්ගය, කුලය හෝ ආගම නොසලකා දක්ෂ හා සේවයට කැපවූ වෘත්තිකයන් අප ආයතනයේ සේවයට එක්කර ගැනීමට අපි සූදානමින්

සිටිමු. එපරිද්දෙන්, සාධරණත්වය, විනිවිදභාවය, විවිධත්වය ගරුකරන ආයතනික පසුබිමක් තුළ සේවය කිරීම සඳහා ක්ෂේත්‍රයේ අග්‍රගන්‍ය වෘත්තිකයන් ආකර්ෂණය කරගැනීමට ජාතික රක්‍ෂණ භාර අරමුදල සමත් වී සිටී. ශ්‍රී ලංකාවේ සමාජ ආරක්‍ෂණ ජාලය වඩාත් ශක්තිමත් කිරීමත්, අවසානයේදී වඩාත් සෞභාග්‍යමත් වූ ද ආරක්ෂිත වූ ද සමාජයක් හා ආර්ථිකයක් උදාකරලීම සඳහා පහසුකම් සැලසීමත් උදෙසා සාධනීය ආකාරයෙන් දායක විය හැකි රක්‍ෂණ යෝජනාක්‍රම හා සේවාවන් අඛණ්ඩව සලසා දීමට ජාතික රක්‍ෂණ භාර අරමුදල සතු ශක්තිය වන්නේය.


### බඳවාගැනීම්

2015 වර්ෂයට සාපේක්‍ෂව 2016 වර්ෂය තුළ සැලකිය යුතු බඳවාගැනීම් සංඛ්‍යාවක් සිදුකරනු ලැබූ අතර, එම බඳවාගැනීම් පිළිබඳ සංඛ්‍යාලේඛන සැකෙවින් පහත දක්වා ඇත:

| | 2016 | 2015 |
|---|---|---|
| විධායක නොවන | 25 | 12 |
| විධායක | 3 | 3 |

2016 වර්ෂයේ දී සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය හා ආයතනික කටයුතු, සහකාර සාමාන්‍යාධිකාරී - රක්‍ෂණ, සහ මානව සම්පත් හා පරිපාලන කළමනාකරු යන තනතුරු සඳහා බඳවාගැනීම් සිදුකරන ලදී.

### ස්ත්‍රී පුරුෂ සමායෝජනය



| | |
|---|---|
| පුරුෂ | 79 |
| ස්ත්‍රී | 126 |
| සාමාන්‍ය වයස (වර්ෂ) | 31 |

# වැදගත් සිදුවීම්

### 2016 පෙබරවාරි 28

### පාරිභෝගික සේවා විශිෂ්ටතා වැඩසටහන

ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් සිය කාර්ය මණ්ඩලය වෙනුවෙන් පාරිභෝගික සේවා විශිෂ්ටතා වැඩසටහක් සංවිධානය කරන ලදී. 2016 පෙබරවාරි මස 28 වන දින ජාතික වාණිජ මණ්ඩල පරිශ්‍රයේදී පවත්වන ලද එම වැඩසටහනේ අරමුණ වුයේ පාරිභෝගික භවතුන්ගේ තෘප්තිමත් බව ඉහළ නංවන අකාරයෙන් හා මෙහෙයුම් කාර්යක්‍ෂමතාව වර්ධනය වන ආකාරයෙන් අපගේ පාරිභෝගික සේවාව තවදුරටත් ශක්තිමත් කිරීමත්, ප්‍රමිතිගත කිරීමත් ය.

පාරිභෝගිකයන්ගේ ගැටලු සම්බන්ධයෙන් ඵලදායී ආකාරයෙන් මැදිහත්වීමට හා විසඳාලීමට අවශ්‍ය තාක්‍ෂණය පිළිබඳව මෙම වැඩසටහනේ ප්‍රමුඛ අවධානය යොමු විය. පාරිභෝගික අපේක්‍ෂා සැමවිටම මල්ඵල ගැන්වෙන බවට වග බලාගනිමින් එකී ගැටලු වලට කාර්යක්‍ෂමව හා දක්‍ෂ ලෙස වඩාත් සාර්ථක විසඳුම් සොයාගන්නේ කෙසේද? යන්න සම්බන්ධයෙන් සේවකයන් පුහුණු කරන ලදී. මෙම වැඩසටහන අතිසාර්ථක වැඩසටනක් ලෙස සලකනු ලැබූ අතර සෑම පාරිභෝගිකයකුටම සෑම දිනකම උත්කෘෂ්ඨ සේවාවල් ලබාදීම තහවුරු කිරීම තුළින් ජාතික රක්‍ෂණ භාර අරමුදලේ පාරිභෝගික සේවාවේ අඛණ්ඩ වර්ධනය සඳහා කැපී පෙනෙන අයුරින් දායක වනු ඇතැයි අපේක්‍ෂා කෙරේ.

මෙම වැඩසටහන SIPCOM-1 (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්‍ෂක හා උපදේශක, ධම්මික කලපුගේ මහතා විසින් මෙහෙයවන ලදී.





### 2016 අප්‍රේල් 18

### ජාතික රක්‍ෂණ භාර අරමුදලේ සිංහල හා හින්දු අලුත් අවුරුදු සැමරුම 2016

සිංහල හා හින්දු අලුත් අවුරුදු සැමරුම, 2016 අප්‍රේල් 18 දින ජාතික රක්‍ෂණ භාර අරමුදල් කාර්යාල පරිශ්‍රයේදී පවත්වන්නට යෙදුනි. සභාපති, මංජුල ද සිල්වා මහතා සහ ප්‍රධාන විධායක නිලධාරී, සනත් සී. ද සිල්වා මහතා ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ සෙසු කාර්ය මණ්ඩලය මෙම අවස්ථාව වර්ණවත් කරමින් ඊට සහභාගී විය.



### 2016.05.24

### ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් ආපදා හදිසි සහන සඳහා රු. මිලියන 145ක් ගෙවීම

2016 මැයි මාසයේ සිදුවූ ජලගැලීම් හා නායයාම් හේතුවෙන් අවතැන්වූ 400,000කට අධික ජනතාව සඳහා හදිසි සහන සැලසීම වෙනුවෙන් දරන ලද පිරිවැය පියවාගැනීම පිණිස ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් රු. මිලියන 145ක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ලබාදෙන ලදී.

ඒ සියලු ගෙවීම් 2016 අප්‍රේල් මාසයේ සිට අලුතින් දියත් කළ ජාතික ස්වාභාවික ආපදා සහ හදිසි සහන රක්‍ෂණ යෝජනාක්‍රමයට අනුව සිදු කරන ලදී. ස්වාභාවික ආපදා හේතුවෙන් දැඩි බලපෑමට ලක්වූ රක්‍ෂණාවරණයක් අහිමි ශ්‍රී ලාංකිකයන්ට ආරක්‍ෂාව හා සත්කාර සේවා සලසා දීමේ අරමුණින් ස්ථාපිත කළ මෙම යෝජනාක්‍රමය එවැනි ජනතාව සඳහා ඉතා සඵලදායී අයුරින් සමාජ ආරක්‍ෂණය සලසාදීමේ ක්‍රමවේදයක් බවට දැනටමත් සනාථවී ඇති අතර ආපදා සහන රක්‍ෂණ ප්‍රකාශිත කාර්යය සඳහාම පමණක් අධිකාරී බලය හිමිවූ අරමුදලක් ස්ථාපිත කිරීම මඟින් රජයටත්, ජාතික ආර්ථිකයටත් මහත් අස්වැසිල්ලක් ගෙනදී ඇත. ජලගැලීම් හා නායයාම් මඟින් හානියට පත් නිවාස හා ව්‍යාපාරික පරිශ්‍ර ප්‍රතිසංස්කරණය කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ පිරිවැය පියවීමට ජාතික රක්‍ෂණ භාර අරමුදල සූදානමින් සිටී.

ලොව විශාලතම ප්‍රතිරක්‍ෂණ සමාගම්වල අනුබලය යටතේ වර්ෂයකට රු. බිලියන 10ක සමුච්චිත රක්‍ෂණාවරණයක් මෙම රක්‍ෂණ යෝජනාක්‍රමය මඟින් ලබාදේ. අනෙකුත් රක්‍ෂණ සමාගම් සඳහා සලසාදෙනු ලබන තම අනිවාර්ය ප්‍රතිරක්‍ෂණ පංගුව මත විශාල ප්‍රමාණයේ හිමිකම් ඉදිරිපත් වෙනු ඇති බවට අපේක්‍ෂා කෙරේ. ආයතනයේ මූල්‍ය ශක්තිය සහ ජාත්‍යන්තර ප්‍රතිරක්‍ෂකයන්ගේ අනුබලය හේතුවෙන් සිය මූල්‍ය තත්ත්වයට දැඩි අහිතකර බලපෑමකින් තොරව, එවැනි හිමිකම් පියවීමට ජාතික රක්‍ෂණ භාර අරමුදල සමත් වනු ඇත.

## 2016 ජුනි 15

### ප්‍රතිරක්‍ෂණ පුහුණු වැඩසටහන

ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් ප්‍රතිරක්‍ෂණය මඟින් තිරසරබව කළමනාකරණය කරගන්නේ කෙසේද යන මැයෙන් පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී. ප්‍රධාන විධායක නිලධාරී, සනත් සී. ද සිල්වා මහතා විසින් මෙහෙයවන ලද එම වැඩසටහන 2016 ජුනි මස 15 දින කොළඹ, සිනමන් ලේක්සයිඩ් හෝටලයේ ඩියුක් කෝර්ට් ශාලාවේදී පවත්වන ලදී.

සී/ස සමූපකාර රක්‍ෂණ සමාගම, සී/ස MBSL රක්‍ෂණ සමාගම, සී/ස ඔරියන්ට් රක්‍ෂණ සමාගම, සී/ස සෙලින්කෝ ජෙනරල් රක්‍ෂණ සමාගම, අමානා ටකෆුල් රක්‍ෂණ සමාගම, සී/ස LOLC රක්‍ෂණ සමාගම, ජනශක්ති රක්‍ෂණ සමාගම, ඒසියන් එලායන්ස් රක්‍ෂණ සමාගම, සී/ස කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම, සී/ස ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව, සී/ස සනස රක්‍ෂණ සමාගම, සී/ස පීපල්ස් රක්‍ෂණ සමාගම, සී/ස එලයන්ස් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම, HNB ජෙනරල් රක්‍ෂණ සමාගම ආදි දේශීය රක්‍ෂණ සමාගම්වල නියෝජිතයන් විශාල පිරිසක් සහ ජාතික රක්‍ෂණ භාර අරමුදලේ කාර්ය මණ්ඩලය මේ සඳහා සහභාගී විය.



## 2016 අගොස්තු 5

### ජාතික රක්‍ෂණ භාර අරමුදල සහ බ්‍රවුන්ස් හෙල්ත්කෙයාර් (පෞද්ගලික) සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම

2016 අගොස්තු 5 දින ජාතික රක්‍ෂණ භාර අරමුදල සහ බ්‍රවුන්ස් හෙල්ත්කෙයාර් (පෞද්ගලික) සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ජාතික රක්‍ෂණ භාර අරමුදල වෙනුවෙන් එහි ප්‍රධාන විධායක නිලධාරී සනත් සී. ද සිල්වා මහතා ද, බ්‍රවුන්ස් හෙල්ත්කෙයාර් (පෞද්ගලික) සමාගම වෙනුවෙන් එහි ප්‍රධාන විධායක නිලධාරී, වෛද්‍ය කේ.ටී. අයිරාවන් මහතා ද එම අවබෝධතා ගිවිසුමට ජාතික රක්‍ෂණ භාර අරමුදලේ සභාපති, මංජුල ද සිල්වා මහතා සහ බ්‍රවුන්ස් හෙල්ත්කෙයාර් (පෞද්ගලික) සමාගමේ මෙහෙයුම් ප්‍රධානී, චරිත ජයසිංහ මහතා ඉදිරියේ අත්සන් තැබූහ.



## 2016 ඔක්තෝබර් 25

### ප්‍රතිරක්‍ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන

ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් ගිවිසුම් සැලසුම් කිරීමේ වැඩසටහන යන මැයෙන් පුහුණු වැඩසටහනක් 2016 ඔක්තෝබර් සම 25 දින කොළඹ, සිනමන් ලේක්සයිඩ් හෝටලයේ දී පවත්වන ලදී.

ඉන්දියාවේ ආදිත්‍ය බිර්ලා රක්‍ෂණ තැරැව්කාර සමාගමේ සහයෝගිතාව මත සංවිධානය කරන ලද එම වැඩසටහනේ එම සමාගමේ ප්‍රතිරක්‍ෂණ ව්‍යාපාර ප්‍රධානී, නිටින් වෛද්‍යා මහතා විසින් පුහුණුකිරීම් සිදුකරන ලදී. එම පුහුණු වැඩසටහනට ජාතික රක්‍ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී, සනත් සී. ද සිල්වා මහතා සහ කාර්ය මණ්ඩලය මෙන්ම ආරාධිත ආයතන නියෝජිතයින් සහභාගී වූහ.



# වැදගත් සිදුවීම්

### 2016 දෙසැම්බර් 2

### ජාතික රක්‍ෂණ භාර අරමුදල සහ ආසිරි රෝහල අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම

ජාතික රක්‍ෂණ භාර අරමුදල සහ ආසිරි රෝහල් සමූහය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ උත්සවය 2016 දෙසැම්බර් 2 දින ජාතික රක්‍ෂණ භාර අරමුදල් පරිශ්‍රයේදී පැවැත්වුණි. ජාතික රක්‍ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී, සනත් සී. ද සිල්වා මහතා සහ ආසිරි රෝහල් සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී, වෛද්‍ය මංජුල කරුණාරත්න මහතා එම අවබෝධතා ගිවිසුමට ජාතික රක්‍ෂණ භාර අරමුදලේ සභාපති, මංජුල ද සිල්වා මහතා සහ ආසිරි රෝහල් සමූහයේ මෙහෙයුම් අධ්‍යක්‍ෂ, වෛද්‍ය සමන්ති ද සිල්වා මිය ඉදිරියේ අත්සන් තැබූහ.



# තිරසර වාර්තාකරණය

ජාතික රක්‍ෂණ භාර අරමුදල ස්වකීය පාර්ශ්වකරුවන් සියල්ලන් සඳහාම දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීමේ පියවරක් ලෙස සමාජීය වගකීම් සහිත ආයතනයක් වශයෙන් ක්‍රියාකිරීමේ වැදගත්කම අවබෝධ කරගෙන සිටියි. ඒ සඳහා ආයතනයේ ප්‍රමුඛ සාමායතන හර පද්ධති ස්ථාපිත කර ඇති චර්යාධර්ම සංග්‍රහයක් හඳුන්වාදී ඇති අතර සියලුම මට්ටම්වල ව්‍යාපාරික කටයුතු එකී චර්යාධර්ම පද්ධතිය පදනම්කර ගනිමින් ක්‍රියාත්මක කෙරේ. මෙය ජාතික රක්‍ෂණ භාර අරමුදලේ සාර්ථකත්වයේ ප්‍රධානතම සාධකයයි. ජාතික රක්‍ෂණ භාර අරමුදලේ දැක්ම හා මෙහෙවරට අනුකූලව මෑත භාගයේදී එහි අභිලාෂය වූයේ සමාජයේ අඩුම වරප්‍රසාද හිමි ජන කොටස් සඳහා සේවය සලසන අතර රටේ සමාජ හා ආර්ථික සංවර්ධනය උදෙසා දායකත්වය ලබාදීමයි. ඒ අනුව, ජාතික රක්‍ෂණ භාර අරමුදල එහි පදනම වී ඇති දියුණුව කරා පා නගන ජනතාවට තමන් උපයාගන්නා ලාභයෙන් පෙරළා සහන ලබාදීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අපේක්‍ෂා කරයි. මෙම අභිලාෂය පෙරදැරිව, සිය රක්‍ෂණ යෝජනාක්‍රමවල වටිනාකම් තවදුරටත් නංවාලීම පිණිස ජාතික රක්‍ෂණ භාර අරමුදල සෙසු ආයතන සමඟ සහයෝගීතාවෙන් යුතුව කටයුතු කරමින් සංධාන ගොඩ නගා ගැනීමට ක්‍රියාකර ඇත. ජනතාව, ලාභය, හා අපගේ ලෝකය යන තෙවැදෑරුම් ප්‍රමුඛතාවන් කෙරෙහි සැලකියයුතු අවධානයක් යොමුකරමින් ජනතාවට සහාය වීමටත් අපගේ ලාභය ඔවුන් වෙත සහන වශයෙන් පෙරළා ලබාදීමටත් අපි නිරන්තරයෙන් අපේක්‍ෂා කරමු.

2016 සමාලෝචිත වර්ෂය තුළ ජාතික රක්‍ෂණ භාර අරමුදල සිය දැක්ම හා මෙහෙවරට අනුකූලව සමායතන සමාජ වගකීම් ඉටුකිරීම වෙනුවෙන් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළ අතර ඉන් කිහිපයක් පහත දක්වා ඇතඃ

### මහරගම පිළිකා රෝහලට වෛද්‍ය උපකරණ ප්‍රදානය

ජාතික රක්‍ෂණ භාර අරමුදලේ සුභසාධක සංගමය විසින් "සතුට උදාවන්නේ අප ලබන දෙයින් නොව අප දෙන දෙයිනි" යන මැයෙන් වෛද්‍ය උපකරණ පිරිනැමීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන මඟින් මහරගම පිළිකා රෝහලට වෛද්‍ය උපකරණ ප්‍රදානය කිරීමට අවස්ථාව ජාතික රක්‍ෂණ භාර අරමුදලට හා එහි කාර්ය මණ්ඩලයට හිමි විය. එම අවස්ථාව සැමරීම වෙනුවෙන් සැප්තැම්බර් 1 දින රෝහල් පරිශ්‍රයේ පැවති උත්සවයට රෝහල් අධ්‍යක්‍ෂ, වෛද්‍ය එම්.වයි.කේ. විල්ෆ්‍රඩ් මහතා සහ සුභසාධක සංගමයේ සාමාජිකභවතුන් සහභාගී වූහ.



### ජාතික රක්‍ෂණ භාර අරමුදල විසින් සංවිධානය කළ ලේ පරිත්‍යාග කිරීමේ කඳවුර

2016 ජුනි මස 17 දින යෙදුනු පොසොන් පොහොය දින සමරනු වස් ජීවිතය රැකගැනීමට ලේ බිඳක් ඉල්ලා සිටින ඉතා අසාධ්‍ය තත්ත්වයේ පසුවන රෝගීන් වෙනුවෙන් උපකාර කිරීමේ අරමුණින් ජාතික රක්‍ෂණ භාර අරමුදලේ සුභසාධක සංගමය විසින් ලේ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ජාතික රක්‍ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී, සනත් සී. ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් අරමුදල් පරිශ්‍රයේදී පවත්වන ලදී.



# ව්‍යවසාය පාලනය

යහපත් සමායතන පාලනය කල් පවත්නා දිගුකාලීන වටිනාකම්වල ඵලයක් වන බව ජාතික රක්ෂණ භාර අරමුදල පිළිගන්නා අතර අරමුදලේ මැනවින් ස්ථාපිත සමායතන පාලන රාමුව නිරන්තරයෙන් ප්‍රසාදනය කිරීමට කටයුතු කරයි. ස්වකීය සියලුම මෙහෙයුම්, ක්‍රියාවලි හා ව්‍යාපාරික කටයුතු වලට අදාළව නියමිත ඉහළම පාලන ප්‍රමිති ඇගයීමටත්, සම්පාදනය කිරීමටත් අරමුදල අඛණ්ඩව ක්‍රියාකරන අතර යහ පාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සහ සමායතන පාලනය පිළිබඳ අනෙකුත් සියලු මාර්ගෝපදේශ හා නිර්දේශිත විශිෂ්ඨ භාවිතාවන් ඇතුළු එහෙත් ඒවාට සීමා නොවන රක්ෂණ කර්මාන්තයට අදාළ උචිත බාහිර නියාමන අවශ්‍යතා සියල්ලටම ද, සමායතන පාලන පිළිබඳ විශිෂ්ඨ භාවිතාවන් වලටද දැඩි අනුකූලතාව පවත්වාගනී.

ඊට අමතරව, වෘත්තීය හා පෞද්ගලික ආචාරධර්ම වලට අදාළ ඉහළම ප්‍රමිති පවත්වාගැනීම පිළිබඳ දැඩි අවධානයක් යොමු කරන අනුල්ලංඝනීය චර්යාධර්ම පද්ධතියකට අනුගතව ක්‍රියාකිරීම ජාතික රක්ෂණ භාර අරමුදලේ කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට නියමවී ඇත. ඒ අයුරින්, සිය පාර්ශ්වකරුවන් එනම්, ගණුදෙනුකාරභවතුන්, සේවකයන්, රජය සහ ශ්‍රී ලාංකික මහ ජනතාවගේ විශ්වාසය හා පිළිගැනීම, සියලු කල්හී ආරක්ෂා වන බව තහවුරු කෙරෙන ආකාරයෙන් ස්වකීය සමස්ත මෙහෙයුම් ක්‍රියාවලියම කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ජාතික රක්ෂණ භාර අරමුදල අනලස්ව කැපවී සිටී.

යහ පාලනයේ වැදගත් පූර්ව අවශ්‍යතාවක් වන අභ්‍යන්තර පාර්ශ්වකාර කණ්ඩායම් අතර ප්‍රබල, පාරදෘශ්‍ය, සහ සඵලදායක සන්නිවේදනයක් පවත්වාගැනීමේ අරමුණින් අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි ආශ්‍රිත කමිටු ඔවුනොවුන් අතර සහ සේවක පිරිස සමඟ සඵලදායක, කාර්යක්ෂම හා විස්තීර්ණ සහයෝගිතාවක් සහ සන්නිවේදනයක් පවතින බව තහවුරු කිරීම සඳහා සෑම ප්‍රයත්නයක්ම ගනු ලැබේ.

යහ පාලන මෙන්ම අවදානම් කළමනාකරණ පියවරක් වශයෙන්, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2016 වර්ෂය තුළ අවදානම් පාදක ප්‍රාග්ධන ප්‍රවේශයක් සහ ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතිකයක් උපයෝගීකරගත් අතර ණය ශ්‍රේණිගතකිරීම් අතර ඉහළ ස්ථානයක් දිනාගැනීමට ද කටයුතු කරන ලදී.

වර්ෂ 2016 සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අවදානම් පාදක ප්‍රාග්ධන නියමයන්ට අනුකූලව කටයුතු කිරීමටත්, (ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යනුවෙන් පෙර හැඳින් වූ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමටත් කටයුතු කරන ලදී.

ෆිච් රේටිංග්ස් සමාගමෙන් AA-(lka) ණය ශ්‍රේණිගත කිරීමක් ලබාගැනීමට ජාතික රක්ෂණ භාර අරමුදල සමත් වූ අතර එමගින් ජාතික රක්ෂණ භාර අරමුදලේ යහපත් මූල්‍ය තත්වය විදහා දක්වනු ලැබේ. 2016/12/31 දින වන විට ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතිකය 586% මට්ටමේ පැවති අතර එය 120%ක් වූ නියමිත අවම නුබුන්වත් තත්ත්වයට මෙන්ම 160%ක් වූ බලාත්මක කිරීමේ මට්ටමට ඉහළින් මැනවින් පවත්වාගැනීමකි. එබැවින්, ප්‍රමාණවත් ප්‍රාග්ධන තත්වයක් පවත්වා ගැනීමට ජාතික රක්ෂණ භාර අරමුදල සමත් වූ අතර එහි ශේෂපත්‍රය සමුපූර්ණයෙන් ආරක්ෂාකාරී වේ.

### අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සමායතනික පාලනයේ හරය වන අතර ඒ අනුව යමින් ජාතික රක්ෂණ භාර අරමුදලේ ඉලක්ක ගත අරමුණු සාක්ෂාත් කරගැනීම තහවුරු කෙරෙන ආකාරයෙන් පවත්නා නෛතික හා ව්‍යවස්ථාමය අවශ්‍යතාවන්ට අනුකූලව ජාතික රක්ෂණ භාර අරමුදල කාර්යක්ෂමව කළමනාකරණය කරනු ලබන බව සහතික කිරීම සම්බන්ධයෙන් ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයෝ එහි සියලු පාර්ශ්වකරුවන් වෙත වගකීමට බැඳී සිටිති.

ආයතනය තුළ යෝග්‍ය පාලන පද්ධතියක් ස්ථාපිත කර ඇති බව සහතික කිරීම ද එකී ක්‍රියාදාමය තුළ අන්තර්ගත වේ. 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතට අනුව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා පත්කරනු ලැබ ඇත. පවත්නා නියාමන සහ නෛතික රාමුව තුළ ආයතනයේ ව්‍යාපාරික කටයුතු මෙන්ම අනෙකුත් කාර්යයන් සාදාචාරාත්මක අයුරින් මැනවින් පාලනය කෙරෙන බව සහතික කරමින් දිගුකාලීන තිරසර වටිනාකම් නිර්මාණයකර දායාද කරවීම සම්බන්ධයෙන් අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය ස්වකීය සියලු පාර්ශ්වකරුවන් වෙත වගකීමට බැඳේ. මේ සම්බන්ධයෙන් වන අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් අතර කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන අරමුණු, සමස්ත ව්‍යාපාරික සැලැස්ම පිළිබඳ මඟපෙන්වීම, නිශ්චිතව සැලසුම්කළ සහ මැනවින් අර්ථ නිරූපිත මානව සම්පත් කළමනාකරණය, ව්‍යවස්ථාමය අනුකූලතාව පිළිබඳ මඟපෙන්වීම්, අභ්‍යන්තර විගණනය සහ අවදානම් කළමනාකරණ මඟපෙන්වීම් සම්බන්ධයෙන් ව්‍යවසායකත්ව නායකත්වය සහ උපායමාර්ගික මෙහෙයවීම මෙන්ම ව්‍යාපාරය තුළ විශාල ප්‍රමාණයේ ආයෝජන සමාලෝචනය ද ඇතුළත් වේ.

සමාලෝචිත කාලය තුළ ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11ක් පවත්වා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින් ඒ සඳහා සහභාගී වීම තුළින් සිය වගකීම ඉටු කිරීමට ඇති අවංක කැපවීම මනාව ප්‍රදර්ශනය කර ඇත. ජාතික රක්ෂණ භාර අරමුදල විසින් එහි මූල්‍ය තත්ත්වය, ව්‍යාපාරික දියුණුව, අරමුණු ළඟා කර ගැනීම අවදානම් සඳහා නිරාවරණයවීම සහ ව්‍යවස්ථාපිත අනුකූලතාව යනාදී සියලු කරුණු පිළිබඳව සිය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම් කර ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ පැමිණීම් - 2016

ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රවර්තන ව්‍යාපාරික කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම පිණිසත්, අවශ්‍ය යැයි හැඟීයන අවස්ථාවලදීත් අධ්‍යක්ෂ මණ්ඩලය රැස්විය. රැස්වීම්වලට පැමිණීමට නොහැකි අවස්ථාවලදී ඒ පිළිබඳව පූර්ව දැනුම්දීම මත වාර්තා තබා ගනු ලැබූ අතර රැස්වීම්වලට පැමිණීමට නොහැකි වූ සාමාජිකයින් සඳහා රැස්වීමේ සාකච්ඡාවූ කරුණු පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් ලබාදීම මඟින් ඔවුන් දැනුවත් කරන ලදී. ඉදිරිපත් කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා පිළිබඳව කාර්යක්ෂම සහ සාධනීය

සාකච්ඡාවක් සිදුකරනු ලබන බව සහතික කරනු වස් එම පත්‍රිකා කල් ඇතිව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර බෙදා හැරීමට කටයුතු කරන ලදී. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11ක් පවත්වන ලදී.

### පැමිණීම් සටහන

| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව | රැස්වීමට පැමිණි සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව | ගණපූරණය |
|---|---|---|---|
| ජනවාරි | 07 | 05 | 05 |
| මාර්තු | 07 | 05 | 05 |
| අප්‍රේල් | 07 | 06 | 05 |
| මැයි | 07 | 07 | 05 |
| ජූනි | 07 | 05 | 05 |
| ජූලි | 07 | 06 | 05 |
| අගෝස්තු | 07 | 06 | 05 |
| සැප්තැම්බර් | 07 | 05 | 05 |
| ඔක්තෝබර් | 07 | 07 | 05 |
| නොවැම්බර් | 07 | 07 | 05 |
| දෙසැම්බර් | 07 | 07 | 05 |

### අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ කාර්යභාරය

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස ගයනි සියඹලාගොඩ මහත්මිය කටයුතු කරන අතර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ වාර්තා කිරීම හා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් මැනවින් සංවිධානය කිරීම තුළින් ඇය අධ්‍යක්ෂක මණ්ඩලය සමග මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යයි.

### මූල්‍ය ප්‍රකාශන

ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සහ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ නියමයන්ට අනුකූලව සකස් කරනු ලැබ ඇත.

### ප්‍රසම්පාදන කටයුතු

මෙම ප්‍රසම්පාදන කටයුතු රජයේ රීති හා රෙගුලාසි සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ක්‍රියාත්මක කරන ලදී. ප්‍රසම්පාදනයේ වටිනාමක පදනම්කර ගනිමින්, අවස්ථාවෝචිත පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ (CAPC), අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සහාය මත සියලු ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත.

### විගණන කමිටුව

අරමුදලේ සියලු විගණන කාර්යයන්ට අදාළ නිරවද්‍යතාව සහ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් ගතයුතු පියවර රාශියක් සම්පාදනය කිරීම හා බලාත්මක කිරීමේ වගකීම විගණන කමිටුවට පැවරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන විසින් නිකුත්කර ඇති විගණන කමිටු සඳහා වන විශිෂ්ඨ භාවිතාවන් සංග්‍රහයට අනුව එකී කාර්යයන් අර්ථ නිරූපණය කරනු ලැබ ඇත. 2016 වසර තුළ දී විගණන කමිටුවේ විෂය පථය සහ පැවරී ඇති වගකීම් පහත සඳහන් පරිදි ස්ථාපිත කරන ලදී.

- වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය කර ස්ථාපනය කිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය සහ ඇගයීමට ලක් කිරීම.
- පිරිවැය සඵලතාව සහ නිෂ්කාර්ය වියදම් අවම කර ගැනීමේ ද්විත්ව අරමුණු පෙරදැරිව විවිධ ඒකකවල කාර්යසාධනය වරින් වර සමලෝචනය කිරීම.
- විගණකවරුන්ගේ කළමනාකරණ ලිපි වලට අදාළව විගණකාධිපති විමසමින් නිරන්තර පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම.
- අණපනත්, රෙගුලාසි සහ චක්‍රලේඛ විධිවිධානයන්ට අනුකූලතාව තහවුරු කිරීම පිණිස ක්‍රමවත් පරීක්ෂාවන් සිදු කිරීම.
- මූල්‍ය වාර්තා සහ කාර්යසාධනය සමාලෝචනය කිරීම
- දෝෂයන් හා ඒ සඳහා ගනු ලැබූ පිලියම් ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා මෙන්ම කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම
- කමිටු නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම
- කාර්යසාධනය / රීති හා රෙගුලාසි වලට අනුකූලතාව පරීක්ෂා කිරීම

2016 වර්ෂය තුළ විගණන කමිටුව සිව් වතාවක් රැස්වී ඇත. සමාලෝචිත මෙම වර්ෂය තුළ අභ්‍යන්තර පාලනය හා සම්බන්ධ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ වර්ෂයකි. අභ්‍යන්තර විගණන වාර්තා මාසිකව සකස් කරන ලද අතර සියලු දෝෂ හා ගැටලු හඳුනාගැනීම පිණිස සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. හඳුනාගත් අඩුපාඩු සකස්කර

# ව්‍යවසාය පාලනය

ගැනීම පිණිසත්, පාලන ක්‍රියාමාර්ගවල කාර්යක්ෂමතාව හා සඵලතාව වැඩිදියුණු කිරීම පිණිසත් වැඩිදියුණු කළ යුතු පාලන හා මෙහෙයුම් ක්‍රමවේදයන් පිළිබඳව හඳුනාගත් අවදානම් පාදක කර ගනිමින් තීරණය කර ඇත. අමතර වැඩ පිළිවෙලක් වශයෙන්, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් නියමකර ඇති නීති හා රෙගුලාසි වලට අනුකූලව රක්ෂණ සමාගම්වල කටයුතු සිදු වන්නේ ද යන්න පරීක්ෂා කිරීමේ ප්‍රයත්නයක් ලෙස අභ්‍යන්තර විගණන කණ්ඩායම රක්ෂණ සමාගම් කීපයකටම ගොස් ස්ථානීය පරීක්ෂණ පවත්වා ඇත.

| විගණන කමිටුවේ සාමාජිකයන් | පැමිණීම |
|---|---|
| ඩී.ආර්. දේශප්‍රිය මයා (සභාපති)<br>*(01/01/2016 - 13/07/2016)* | 2 |
| කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර මයා (සභාපති)<br>*(12/08/2016 - 30/12/2016)* | 2 |
| ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මයා | 3 |
| අසේන්ද්‍ර සිරිවර්ධන මයා | 3 |

### බාහිර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාර බාහිර විගණක වශයෙන් විගණකාධිපතිවරයා පත් කර ඇති අතර රාජ්‍ය සංස්ථා, ව්‍යාපාර හෝ කිසියම් ලිඛිත නීතියක් යටතේ රජයට අයිතිය හිමි වෙනත් ව්‍යාපාරවල ගිණුම් විගණනය කිරීම ද විගණකාධිපතිවරයාට නියම වී ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) ව්‍යවස්ථාව ප්‍රකාර, විගණකාධිපතිවරයා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව 2016 දෙසැම්බර් 31ක දිනෙන් අවසන් වර්ෂය සඳහා වන අරමුදලේ මූල්‍ය වාර්තා පිළිබඳ වාර්ෂික විගණනය සිදු කරන ලදී.

### ආයෝජන කමිටුව

ආයෝජන කමිටුවේ වගකීම් ප්‍රධාන අංශ දෙකකට වර්ග කර ඇති අතර ඒවා නම්, වඩා ස්ථිර ආයෝජන ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම සහ ජාතික රක්ෂණ භාර අරමුදලේ මාර්ගෝපදේශයන්ට හා ආයෝජන ප්‍රතිපත්ති නිර්ණායකයන්ට අනුකූලව එය කාර්යක්ෂමව ක්‍රියාත්මක කරමින් උපරිම ප්‍රතිලාභ උපයා ගැනීමයි. සමාලෝචිත වර්ෂය ජාතික රක්ෂණ භාර අරමුදලේ ආයෝජන කළඹ කළමනාකරණය, වත්කම් වෙන් කිරීම් හා වත්කම් වගකීම් ගැලපීම් කළමනාකරණය පිළිබඳ සියුම්ව සොයා බලා නව ආයෝජන අවස්ථා සොයා ගත් වසරක් ලෙස පෙන්වාදිය හැක. මෙම සමාලෝචිත වර්ෂය තුළ එක් ආයෝජන කමිටු රැස්වීමක් පවත්වා ඇත.

| ආයෝජන කමිටුවේ සාමාජිකයන් | පැමිණීම |
|---|---|
| ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මයා (සභාපති) | 1 |
| අසේන්ද්‍ර සිරිවර්ධන මයා | 1 |
| ඩී.ජේ.ඩී. ඩයස් මයා | 1 |

### ක්‍රියාකාරී කමිටුව

වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අවදානම්වලට අදාළව හිමිකම් ගෙවීම් සම්බන්ධව සාකච්ඡා පවත්වා තීරණයන්ට එළැඹීම සඳහා වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලේ (SRCC&TF) ක්‍රියාකාරී කමිටුව ස්ථාපිත කර ඇත. සාමාන්‍ය රක්ෂණ සමාගම්වල ජ්‍යෙෂ්ඨ රක්ෂණ නිලධාරීන්ගෙන් සැදුම්ලත් මෙම ක්‍රියාකාරී කමිටුව මාසිකව රැස්වී හිමිකම් ගෙවීම් සම්බන්ධ තීරණ ගන්නා අතර එම තීරණ SRCC&T අරමුදලේ තාක්ෂණික උපදේශක කමිටුවක් වෙත යවනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාකාරී කමිටු රැස්වීම් 4ක් පවත්වා ඇත.

### තාක්ෂණික උපදේශ කමිටුව

සාමාන්‍ය රක්ෂණ සමාගම්වල ප්‍රධානීන්ගෙන් සැදුම්ලත් වැඩ වර්ජන, කැරළි කෝලහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී (SRCC&T) අරමුදලේ තාක්ෂණික උපදේශක කමිටුව SRCC&T අරමුදල සම්බන්ධයෙන් සාමූහික උපායාමාර්ගික තීරණ ගැනීම සඳහා පිහිටුවන ලදී. තාක්ෂණික උපදේශක කමිටුව විසින් එසේ සාමූහිකව ගනු ලබන තීරණ පසුව ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කරනු ලැබේ. 2016, සමාලෝචිත වර්ෂය තුළ තාක්ෂණික උපදේශක කමිටු රැස්වීමක් 7ක් පවත්වා ඇත.

### මානව සම්පත් පාලනය

අතිශය ක්‍රියාශීලී කර්මාන්තයක් වන රක්ෂණ ක්ෂේත්‍රය තුළ, අපගේ සේවක මණ්ඩලයේ හැකියාව, කාර්ය සාධනය හා කැපවීම අපගේ සාර්ථකත්වයේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාව ලෙස හැඳින අවබෝධ කොටගෙන ඇත්තෙමු. ඔවුන්ගේ වෘත්තීමය විශේෂඥතාව හා නව්‍යතා වැළඳ ගැනීමේ කැමැත්ත අපගේ ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට රුකුලක් වනවා සේම ඉහළම තත්ත්වයට පත්වීම සඳහා උපායමාර්ගික මානව සම්පත් සැලසුමක අවශ්‍යතාව අපි අවබෝධ කරගෙන සිටිමු. එසේ පුහුණු කිරීම සහ පුද්ගල සංවර්ධනය හා කාර්යසාධනය දියුණු කිරීම සඳහා ආකර්ෂණීය අවස්ථාවන් ඇති කිරීමත් ඒ තුළින් විශේෂඥතාවයන් අඛණ්ඩව පවත්වා ගැනීමත් ජාතික රක්ෂණ භාර අරමුදලේ අරමුණයි.

මානව සම්පත් අංශය සතුව මේ සඳහා විස්තීර්ණ ධාරිතා සංවර්ධන වැඩසටහන් සැලසුම්කර ඇති අතර අදාළ අංශයන් පිළිබඳ මනා පුහුණුවක් ලබාදීමට අභ්‍යන්තර හා බාහිර පුද්ගල සම්පත් දායකත්වයෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. කාර්යාල ආශ්‍රිත මෙරට මෙන්ම පිටරට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සේවක මණ්ඩලයේ සෑම මට්ටමක් සඳහාම අදාළ තාක්ෂණික දැනුම හා නිපුණතාවය ලබාදීමට කටයුතු කර ඇත. අපගේ පහළ කළමනාකරුවන් වෙනුවෙන් කළමනාකාරීත්වය සංවර්ධන වැඩසටහන් ලබා දෙමින් ඔවුන්ගේ වෘත්තීය දිවිය තුළ වර්ධනයක් හා කාර්යඵලයක් ලැබීමට අවස්ථාවන් උදා කර දී ඇත. අපගේ ව්‍යාපාර දැක්ම හා උපායමාර්ගික

පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහිලා ජාතික රක්ෂණ භාර අරමුදල විසින් වඩා ශක්තිමත් නායකත්වයක් ඉදිරියට ගෙන යාම උදෙසා මානව සම්පත් සාර්ථකව සැලසුම් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. ඉඩ ප්‍රස්ථා අරමුණු කර ගනිමින් සේවක මණ්ඩලයේ සෑම මට්ටමක් සඳහාම තම දුක්ගැනවිලි ඇත්නම් රහස්‍ය ලෙස ඉදිරිපත් කිරීමට අවකාශ සලසා දී ඇති අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මණ්ඩලයේ අනුමැතිය හිමිවූ ක්‍රමවේදයක් ද සකසා ඇත.

සේවක සමානාත්මතාව ඉහළින් අගය කරන ආයතනයක් වශයෙන් අපගේ සේවක බඳවා ගැනිම්වලදී ජන වර්ගය, සංස්කෘතිය, ස්ත්‍රී පුරුෂභාවය හෝ කුලය අනුව කිසිදු ආකාරයේ වෙනස්කමකට ලක් කිරීමක් කරනු නොලැබේ. සියලුම සේවකයන්ට සේවා ස්ථානය තුළ උසස් කිරීම්, ප්‍රතිලාභ පුහුණු හා වන්දි ලබාදීම් ඇතුළු සෑම අංශයකම සමාන අවස්ථා ලබාදී ඇත. සියලුම සේවකයන් හා ඔවුන්ගේ පවුල් විස්තීර්ණ රක්ෂණ ඔප්පුවක ආවරණය හිමිකර දී ඇති අතර සේවා ස්ථානයෙන් බැහැරව සුහද හමු සහ චාරිකා ආදිය වර්ෂය තුළ සංවිධානය කිරීම පිණිස සුහසාධක කමිටුවක් ද පිහිටුවා ඇත.

මානව සම්පත් පිළිබඳව යොමුකර ඇති අපගේ දැඩි අවධානය අපගේ සමායතනික හර පද්ධතියේ ප්‍රමුඛ අංගයක් වේ. එබැවින් අනුකූලතාව හා තිරසර බව කැටිවූ රාමුවක් තුළ උත්කෘෂ්ට කාර්යසාධනයක් අත්කර ගැනීම සඳහා අපගේ කාර්ය මණ්ඩලය මහත් වෙහෙසක් ගෙන ක්‍රියා කරන බව තහවුරු කෙරෙන පිළිගත් කාර්යසාධන කළමනාකරණ පද්ධතියක් අප විසින් ස්ථාපිත කර ඇත. 2016 වර්ෂය තුළ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් කාර්යාලගත මෙන්ම කාර්යාලයෙන් බැහැරව විවිධ පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලද අතර ඒ සඳහා පහසුකම් සැලසීම ද ඉටු කරන ලදී. එම පුහුණු වැඩසටහන් අතර විශ්ව සෞඛ්‍ය ආවරණය පිළිබඳ ජාතික සෞඛ්‍ය රක්ෂණ රැස්වීම සහ 3වන ආසියානු කෘෂි රක්ෂණ සමුළුව ඇතුළු දේශීය පුහුණු වැඩසටහන් 39ක් ද, විදේශීය පුහුණු වැඩසටහන් 2ක් ද විය. තවද, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් වාර්ෂිකව කාර්යාලයෙන් බැහැරව පවත්වනු ලබන පුහුණු වැඩසටහන 2016 මෙම වර්ෂයේදී කුකුලේගඟ, ලයා ලේෂර් හෝටලයේදී පවත්වන ලදී.

### තොරතුරු තාක්ෂණය පාලනය

පාලනය හා සම්බන්ධ මෙම අංශය දැනට භාවිතයට යොදාගැනෙන තාක්ෂණය පිළිබඳව මෙන්ම ව්‍යාපාරික අභිමතාර්ථ මුදුන් පමුණුවා ගැනීමට ඉවහල් වන තාක්ෂණය පිළිබඳව ද අවධානය යොමු කරයි. ජාතික රක්ෂණ භාර අරමුදල සතුව පවත්නා පුළුල් ජාල පද්ධතියක් මගින් ප්‍රධාන ඒකකයන් වන රක්ෂණය, ප්‍රතිරක්ෂණය, මූල්‍ය, කළමනාකරණ ගණකාධිකරණය, ප්‍රසම්පාදනය, මානව සම්පත් භාණ්ඩාගාර හා ආයෝජන ආවරණය කෙරේ. ජාතික රක්ෂණ භාර අරමුදල හා සම්බන්ධ සියළු කාර්යයන් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ස්වයංක්‍රීය හා දිවයින පුරා ජාලගත පද්ධතියක් පවතින අතරම එම භාවිතා කරන්නාගේ මුහුණත හා පාලනයන් ව්‍යාපාර අවධානම් අවම කරමින් ආරක්ෂිතව සැලසුම් කොට තිබීම මෙන්ම පාරිභෝගිකයාට කාර්යක්ෂම හා සඵලදායී සේවයක් වේගය වැඩි දියුණු කිරීම තුලින් ලබාදීම, සිදුවේදැයි තහවුරු කර ගැනීමට ජාතික රක්ෂණ භාර අරමුදල් කළමනාකාරීත්වය විශාල පරිශ්‍රමයක් දරයි.

# ව්‍යවසායකත්ව අවදානම් කළමනාකරණය

ජාතික රක්ෂණ භාර අරමුදලේ සාර්ථකත්වයේ රහස වන්නේ අවදානම් අධීක්ෂණය සහ විශ්ලේෂණය කර ඒ සඳහා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමට ජාතික රක්ෂණ භාර අරමුදල සතු සුවිශේෂී හැකියාව යි. අවදානම් අවමකර ගැනීම සඳහා සඵලදායක පියවර ගැනීම මඟින්, අවිනිශ්චිතතාවේ ඍණාත්මක ප්‍රතිඵල මගහරවා ගැනීමට පමණක් නොව, බොහෝ අවස්ථාවලදී රක්ෂණ ව්‍යාපාරය තුළ වටිනාකම් නිර්මාණය කිරීමේ අවස්ථා අලුතින් උදාකර ගැනීමට ද හැකි වන්නේය. කාර්යසාධක අවදානම් විශ්ලේෂණ හා කළමනාකරණ උපායමාර්ගයක ඇති වැදගත්කම සැලකිල්ට ගනිමින්, මූල්‍ය හා මෙහෙයුම් ඉලක්ක වලට අදාළව ව්‍යාපාරික කටයුතු කෙරෙහි මෙන්ම සියලු පාර්ශ්වකරුවන් කෙරෙහි ද සෘජුව හා වක්‍රව බලපෑමක් කළ හැකි සෑම අකාරයකම පුරෝකථනය කළහැකි අවදානම් තත්ත්වයන් පිළිබඳව දැඩි සැලකිල්ල යොමු කෙරෙන ප්‍රගතිශීලී අවදානම් කළමනාකරණ උපායමාර්ග අඛණ්ඩව ප්‍රසාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව දැඩි අවධානය යොමු කිරීමට අරමුදල ක්‍රියාකර ඇත. එක් අතකින් ලාභදායිත්වය හා ව්‍යවසායකත්ව පීවගුණය ද අනෙක් අතින් සමාජමය වශයෙන් සවිඥානක ව්‍යාපාරයක් වශයෙන් ද ජාතික රක්ෂණ භාර අරමුදල නිරන්තරයෙන් පවත්වා ගැනීමට උත්සුක වන සමබරතාව පිලබඳව සැලකිල්ල යොමු කිරීමේදී අරමුදලේ අඛණ්ඩ සාර්ථකභාවය සඳහා ප්‍රගාමී, සඵලදායී අවදානම් කළමනාකරණ උපායමාර්ගයක ඇති වැදගත්කම මොනවට පැහැදිලි වේ.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය විශේෂයෙන් අරමුදලේ සෘජු හා වක්‍ර ගණුදෙනුකාර ජාලය මෙන්ම අනෙකුත් පාර්ශ්වකාර කණ්ඩායම් සියල්ලන් ද බලගැනිවීම කෙරෙහි එකසේ බලපාන බැවින් අරමුදලේ එක් එක් ව්‍යාපාරික ඒකකයක් දක්වාම විහිද යන අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුළ ඉදිරි ව්‍යාපාරික කටයුතු වර්ධනය කිරීම සඳහා පවත්නා අවස්ථා සක්‍රියව හඳුනාගනිමින්, අරමුදල මෙන්ම එහි කාර්යයන් පිළිබඳව සාමුහික අදහසක් දරමින් ක්‍රියාකිරීමට අමතරව, ඒ එක් එක් ඒකකයේ කාර්යයන් හා බැඳි අවදානම් හඳුනාගැනීමත්, අවම කිරීමත් අරමුණුකර ඇත.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ආයතනයේ සෑම මට්ටමකම තරයේ ක්‍රියාවට නංවා ඇති අතර ක්‍රියාවලිය ඇගයීමේ හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ අවසන් වගකීම නිපුණ අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. ක්‍රමවත් ඇගයීම් සිදු කිරීමෙන් අනතුරුව, අදාළ සියලු අවදානම් සාධකයන් විමසීමට ලක්කරමින් ව්‍යාපාර සැලසුම් සම්පාදනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරෙන මීළඟ කාර්යයයි. ඉන් අනතුරුව, ප්‍රමුඛ අවදානම් ප්‍රතිපත්ති, අධිකාරී බලතල හා අවදානම් නොසලකා හැරීමේ සීමාවන් ආදිය හඳුනාගැනීම සහ අනුමත කිරීම මඟින් මෙන්ම දැඩි අනුකූලතාව තහවුරු කිරීම පිණිස ක්‍රමවත් ඇගයීම්වලට අදාළ පසුවිපරම් මඟින් ව්‍යාපාරික උපායමාර්ග පුළුල්ව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේ කාර්යය විගණන කමිටුවට පැවරී ඇත.

විගණන කමිටුවට පැවරී ඇති කාර්යයන් අතර, අරමුදලට ලැබෙන අවදානම් පිළිබඳ සියලු තොරතුරුවල අදාළත්වය තහවුරු කිරීම උදෙසා යටිතල පහසුකම්, කාර්ය මණ්ඩලයේ හැකියාවන්, තාක්ෂණය හා සන්නිවේදන ක්‍රම ඇගයීම සඳහා ක්‍රමවේද සකස්කොට ක්‍රියාත්මක කිරීමද වේ. පිළිගත හැකි අවදානම් රාමුවක් තුළ කාර්යක්ෂමව හා ආරක්ෂිතව මෙහෙයුම් ප්‍රවර්ධනය කෙරෙන ආකාරයෙන් අවදානම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු වන බව තහවුරු කිරීමට ඒකාකාර කාල පරාසයන් තුළ ස්වාධීන විගණන සිදු කරනු ලැබේ.

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් තමන් මුහුණ දෙන සියලු අවදානම් පිළිබඳ සාකල්‍ය අදහසක් ගොඩනගා ගැනීම පිණිස ව්‍යාපාරික අවදානම් කළමනාකරණ ආකෘතියක් ක්‍රියාත්මක කළ අතර එමඟින් අවදානම් පිළිබඳ ප්‍රශස්ත බුද්ධි තොරතුරු ලබාගැනීමේ ප්‍රතිලාභයයන්හී වාසිය සැමටම අත්කර දීමට ජාතික රක්ෂණ භාර අරමුදලට හැකිවී තිබේ. එකී බුද්ධි තොරතුරු ලබාගැනීම තවදුරටත් ශක්තිමත් කිරීම මඟින් ප්‍රශස්ත තොරතුරු හා දත්ත ලබාදීමටත් එමඟින් පාර්ශ්වකාර වටිනාකම් ඉහළ නංවාලීම සඳහා එම දත්ත විශ්ලේෂණයකර ඒ අනුව කටයුතු කිරීමට විගණන කමිටුවටත්, අධ්‍යක්ෂ මණ්ඩලයටත් හැකියාව ලැබී ඇත.

උපායමාර්ගික අවදානම් කළමනාකරණ අරමුණු කරා ළඟාවීම තහවුරු කර ගැනීමේ අරමුණින් ජාතික රක්ෂණ භාර අරමුදලේ කළමනාකාරීත්වය විසින් දේශපාලනික, තාක්ෂණික, සමාජීය, සංස්කෘතික, හා ආර්ථික පරිසරයෙහි වෙනස්කම් පිළිබඳව මෙන්ම රක්ෂණ ක්ෂේත්‍රයේ තම තරගකරුවන්ගේ සහ ගණුදෙනු කරුවන්ගේ ගතික ස්වභාවයන් ද ඉතා ප්‍රවේශමෙන් අධීක්ෂණය කරනු ලබයි.

ජාතික රක්ෂණ භාර අරමුදලේ අවදානම් වර්ගීකරණය තෙවැදෑරුම් වේ. වළක්වා ගත හැකි අවදානම් වර්ගයට ආයතනය තුළින් හට ගන්නා බොහෝකොට කළමනාකරණය කරගත හැකි අවදානම් අයත් වේ. මෙම අවදානම් නීති හා රෙගුලාසි වලට අනුකූලතාව දැක්වීම තුළින් කළමනාකරණය කර ගත හැකි වේ. එහෙත්, උපායමාර්ගික හා බාහිර අවදානම් කළමනාකරණය පිණිස එවැනි අවදානම් ඇතිවීමේ අවදානම අවම කිරීමටත්, පිරිවැය කාර්යක්ෂම ලෙස එම අවදානම් මැඩපැවැත්වීමටත් වෙනස් වූ පිවිසුමක් අවශ්‍ය වේ.

### වළක්වා ගත හැකි අවදානම්

#### ආර්01 - කීර්තිනාමය පිළිබඳ අවදානම

තම සන්නාමය, හරයන් හා අවංකභාවය සියලු කල්හී ආරක්ෂා වන බවත්, වඩ වඩාත් ශක්තිමත් වන බවත්, තහවුරු වන අන්දමින් වෙළඳපොල තුළ කීර්තිනාමය කළමනාකරණය කිරීමේ වැදගත්කම ජාතික රක්ෂණ භාර අරමුදල පිළිගනී. මෙම මූලධර්මයට අනුව, සාධනීය සන්නාම කළමනාකරණය ජාතික රක්ෂණ භාර අරමුදල කෙරෙහි පාරිභෝගිකයන්, පාර්ශ්වකරුවන් හා පොදු මහජනතාව තුළ පවතින විශ්වාසය හා පිළිගැනීම අඛණ්ඩව පවත්වාගැනීම සහතික කිරීම සඳහා අතිශය වැදගත් වේ. අරමුදලේ සියලුම අංශවල මෙන්ම සියලු ව්‍යාපාරික ක්‍රියාවලීන් තුළ කාවද්දා ඇති යහ පාලනය සහ මූල්‍ය වගකීම පිළිබඳ ප්‍රතිපත්තිවලට අනුකූලතාව හා සක්‍රීය පාලනය තුළින් ආයතනයේ කීර්තිනාමය සියලු කල්හී ආරක්ෂා වන පරිදි සමායතන සංස්කෘතියක් පවත්වාගැනීමටත්, ශක්තිමත් කිරීමටත්, ජාතික රක්ෂණ භාර අරමුදල අඛණ්ඩව ක්‍රියාකරයි.

### ආර්02 - වංචා අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදල ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් හා ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපිත කර ඇත. ජාතික රක්ෂණ භාර අරමුදලට ඵලදායී අභ්‍යන්තර විගණන අංශයක් පවතින අතර එමගින් ආයතනය තුළ වංචනික කටයුතු සිදුවීම අවම කර ගැනීම සඳහා මනා අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක වෙයි. ක්‍රමානුකූලව සැලසුම් කළ මෙහෙයුම් ක්‍රියාවලියක් සහ පිළිවෙත් තුළින් සහ නිරවුල් සන්නිවේදන මාර්ග සහතික කිරීම මඟින් කල් ඇතිව අවදානම් හඳුනා ගැනීමට ද හැකියාව ඇත.

## උපායමාර්ගික සහ මෙහෙයුම් අවදානම

### ආර්03 - ප්‍රාරක්ෂණ අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදල ස්වකීය විචක්ෂණශීලී, ප්‍රගාමී හා සඵලදායී අවදානම් කළමනාකරණය කිරීමේ හා අවම කිරීමේ සාර්වත්‍ර මූලධර්ම වලට අනුකූලව අරමුදලේ අවදානම් පාත්‍රතාව තුලනාත්මක සහ පිළිගත හැකි මට්ටමකින් සියලු කල්හී පවත්වාගනු ලබන බව තහවුරු කර ගනියි. විධිමත් හිමිකම් ඉල්ලීම් අනුමත කිරීමේ ක්‍රියාවලියක් සහ විචක්ෂණශීලී අවදානම් පාත්‍රතා සහ ආවරණ සීමාවන් පවත්වා ගැනීම තුළින් එකී උපායමාර්ගය සාක්ෂාත් කරගනු ලැබේ. ඊට අමතරව අලාභ අවබෝධකර ගැනීම පිණිසත්, අනුභූතිය පවත්වා ගැනීම පිණිසත් අරමුදල විසින් අඛණ්ඩ අධීක්ෂණය සහ ඇගයීම සිදු කරනු ලබයි. අවදානම් කළමනාකරණය සඳහා ක්‍රමවත් ප්‍රවේශයක් අනුගමනය කිරීම මඟින් ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රාරක්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බවටත්, අභ්‍යන්තර විගණනය විසින් සියලුම මාර්ගෝපදේශ තරයේ පිළිපැදීම තහවුරු කරන බවටත් සහතික වීමට ජාතික රක්ෂණ භාර අරමුදලට හැකි වී තිබේ. අභ්‍යන්තර පුහුණුව ලබාදීම තුළින් ප්‍රාරක්ෂණය තුළ නිරවද්‍ය අවදානම් මට්ටම් හඳුනාගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් කුසලතා කාර්ය මණ්ඩලය තුළ ජනිත කරවිය හැකිය.

### ආර්04 - ප්‍රතිරක්ෂණ අවදානම

සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ දී ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2017 වර්ෂයේ තම ප්‍රතිරක්ෂණ කළඹ ආවරණය කිරීම පිණිස ඉහළ මූල්‍ය හා ගෝලීය නිපුනතාවයන් ඇති ප්‍රතිරක්ෂණ ආයතන වලින් විශේෂිත වූ දෙවන ප්‍රතිරක්ෂණ ආවරණයක් සාධාරණ පිරිවැයකට ලබා ගැනීමට සැලසුම් කර ඇත. 2016 වර්ෂයේදී ලොක්ටන් ප්‍රතිරක්ෂණ තැරැව්කාර සමාගමේ මැදිහත්වීම මත ස්කෝර් රිඉන්ෂුවරන්ස් ඒසියා පැසිෆික් ප්‍රයිවේට් ලිමිටඩ් සමාගමේ මූලිකත්වයෙන් දෙවන ප්‍රතිරක්ෂණ ගිවිසුමක් සහ ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය සඳහා ක්‍රේසන්ට් ග්ලෝබල් යුකේ ලිමිටඩ් සමාගමේ මැදිහත්වීම මත විලයන්ස් එස්ඊ සමාගමේ මූලිකත්වයෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුමක් සකස් කරන ලදී. තවද, 2016 වර්ෂය තුළ ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය, වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදල හා වගා රක්ෂණය මෙන්ම දෙවන ප්‍රතිරක්ෂණ වැඩසටහන සම්බන්ධයෙන් 2017 වර්ෂය සඳහා ප්‍රතිරක්ෂණ ගිවිසුම් සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

### ආර්05 - සංචිත ප්‍රමාණාත්මකභාවය පිළිබඳ අවදානම

වගකීම් ගෙවීමට සිදු වූ විට ඒ සඳහා සංචිත අරමුදලෙහි පවත්නා වත්කම් ප්‍රමාණවත් වන බව තහවුරු කරගැනීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල අඛණ්ඩ සමාලෝචන සිදු කරයි.

### ආර්06 - ණය අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදල, අඛණ්ඩව අධීක්ෂණය කිරීම තුළින් ආයතන සහ පුද්ගලයින්ගේ ණය ගෙවීමේ හැකියාව සහ මූල්‍ය ස්ථායිතාවය තහවුරු කර ගනු ලබයි. ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය ඒවායෙහි ප්‍රමාණය, ව්‍යාපාරික වර්ගය අනුව සැලසුම් කර ගොඩනගා ඇත. කාර්ය මණ්ඩලයට මඟ පෙන්වීම සඳහා ණය ප්‍රතිපත්තියක් හඳුන්වාදී ඇත. ජාතික රක්ෂණ භාර අරමුදල ගෙවීම් සහ වාරික අය කර ගැනීම් සඳහා ඍජු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් ඒවා නොගෙවා සිටි විටදී දැඩි ක්‍රියාමාර්ග ගැනීම තහවුරු කර ඇත.

### ආර්07 ද්‍රවශීලතා අවදානම

හිමිකම් ගෙවීම්, ප්‍රති රක්ෂණ ගෙවීම්, භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීම ආදී ගෙවීම් සිදුකිරීමට නොහැකිවීමේ ද්‍රවශීලතා අවදානම හෝ ගිවිසුම්ගත බැඳීම් නිරවුල් කිරීමට නොහැකිවීමේ අවදානම, ප්‍රති මිලදී ගැනීම්, විවිධ වූ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සහ ණයකර ආදී විවිධ කල්පිරීම් කාල සහිත බහුවිධ ආයෝජන තුළින් අවමකර ගැනීමට ක්‍රියාකර ඇත. ජාතික රක්ෂණ භාර අරමුදල හිමිකරගෙන සිටින AA-(lka) ෆිච් ශ්‍රේණිගත කිරීම මඟින් අරමුදලේ ද්‍රවශීලතාවේ ශක්තිමත්භාවය සැලකියයුතු මට්ටමකින් නිරූපණය කරයි.

ජාතික රක්ෂණ භාර අරමුදල තම සියලු අරමුදල් විවිධ වූ කල්පිරීම් සහිත රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන අතර ඉන් සැලකිය යුතු ප්‍රමාණයක් කෙටිකාලීන ආයෝජන සහ ප්‍රති මිලදී ගැනීම් ගිවිසුම්වල තැන්පත්කර ඇත. සුරැකුම්පත්වල කල් පිරීම් පිළිබඳ විශ්ලේෂණය මගින් වගකීම් හා බැරකම් සහ ද්‍රවශීලතා ප්‍රමාණවත් බව අතර විශාල නොගැලපීමක් නොමැති බව තහවුරු කර ගත හැකිය.

### ආර්08 - තොරතුරු ආරක්ෂණ පද්ධති අවදානම

පරිගණක පද්ධති කඩා වැටීම හෝ කවර හෝ සයිබර් ප්‍රහාරයක් නිසා අලාභයන් සිදු නොවන බව තහවුරු කිරීම පිණිස, අරමුදලේ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති හා යටිතල පහසුකම් සංවර්ධනයට ජාතික රක්ෂණ භාර අරමුදල අඛණ්ඩව ආයෝජන සිදු කරයි. එසේම නිවැරදි පරිගණක පද්ධති ආශ්‍රිත ක්‍රියාවලි පිළිබඳව අභ්‍යන්තර කාර්ය මණ්ඩලයම නිරන්තර පුහුණු කිරීම්වල යොදවන අතර තොරතුරුවල රහස්‍යභාවය සහ විශ්වසනීයත්වය සහතික කරනු වස් මනා පාලන යාන්ත්‍රණයක් ක්‍රියාවට නංවා ඇත

### ආර්09 - ව්‍යාපාරික අවිච්ඡින්නතාව පිළිබඳ අවදානම

අරමුදලේ කෙටිකාලීන හා දිගුකාලීන ව්‍යාපාරික පැවැත්ම තහවුරු කිරීම පිණිස ජාතික රක්ෂණ භාර අරමුදල සතුව අවිනිශ්චිතතා සැලැස්මක් ඇති අතර ඊට ආයතනික ආපදා ප්‍රකෘතිමත් කිරීමේ හා ව්‍යාපාර ප්‍රකෘතිමත් කිරීමේ සැලසුම ද එහි කාර්ය මණ්ඩලයට සහ සම්පත් වලට අදාළව පවතියි. මෙම සැලසුම් මගින් දීර්ඝකාලීනව මෙහෙයුම් කඩා වැටීම වළක්වා මනා ක්‍රියාකාරීත්වය තහවුරු කරයි.

# ව්‍යවසායකත්ව අවදානම් කළමනාකරණය

### බාහිර අවදානම්

මෙම අවදානම් වර්ගය වැඩි වශයෙන් ආයතනයේ පාලනයෙන් තොර වුව ද ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රගතිශීලී ආකාරයෙන් ක්‍රියාමාර්ග ගැනීම තුළින් ව්‍යාපාරික කටයුතුවලට ඇතිවියහැකි බලපෑම තක්සේරු කිරීම මගින් ඊට ඇති අවදානම මඟහරවා ගනී.

### ආර්10 කේන්ද්‍රගතවීම පිළිබඳ අවදානම

ප්‍රමාණවත් පරිදි විවිධාංගීකරණය නොවූ ආයෝජන වත්කම් කළඹක් පැවතීම අලාභය ඉහළ යාමේ අවදානම හා බැඳී පවතී. ජාතික රක්ෂණ භාර අරමුදල රජයේ රීති හා රෙගුලාසි වලට අනුව රජයේ සුරැකුම්වල වැඩි වශයෙන් ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමුකරයි. කෙසේ වෙතත් එවන් ආයෝජන අවදානම් විරහිත ඉස්තරම් වර්ගයේ ආයෝජන වන බැවින් මෙහිදී කිසිදු ගැටලුවක් ඇති නොවේ.

### ආර්11 - හානි පූර්ණ ගෙවීම් අවදානම

වංචනික ක්‍රියා, නීතිමය හා තාක්‍ෂණික කරුණු, හේතුවෙන් ඇතිවිය හැකි ආරාවුල් හා බැඳි අවදානම් පාලනය සඳහා වඩා දැඩි රෙගුලාසි හඳුන්වාදීම මගින් ඉදිරිපත් වන හිමිකම් අනුමත කිරීම විධිමත් කිරීම සහ අයදුම්පත් සැකසීමේ ක්‍රියාවලිය ක්‍රමිකව රාජකාරී බෙදීමකට ලක් කිරීම සිදු කර ඇත.

### ආර්12 - වෙළඳපොළ අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සුපැහැදිලි ආයෝජන මාර්ගෝපදේශ සකස් කර ඒ සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. මෙම මාර්ගෝපදේශ මගින් අරමුදලේ ආයෝජන ඵලදායී ලෙස කෙසේ කළමනාකරණය කළ යුතු ද යන්න නිශ්චිතව දක්වා ඇත. කළමනාකරණ වාර්තා ආදිය ආයෝජන කමිටුවට ලබාදීම තුළින් වෙළඳපොල අවදානම ප්‍රමාණවත් පරිදි අවම කර ගැනීමට හැකියාව ඇත.

### ආර්13 - නියාමන සහ අනුකූලතා අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදල සියලුම නියාමන වෙනස්කම් හා විකාශනයන් අඛණ්ඩ පදනමකින් සමීපව අධීක්‍ෂණය කරනු ලබන අතර ඒවායෙහි අඛණ්ඩ සංවර්ධනයන් ආදිය කර්මාන්තයේ ඇති අදාළ වැඩමුළු සහ සම්මන්ත්‍රණවලට සහභාගීවීම තුළින් ලබා ගනියි. ඒ තුලින් අදාළ ව්‍යාපාරික පරිසරයේ පවතින නව ප්‍රවනතාවන්ට අනුකූලවීමත් ප්‍රතිපත්තීන් හා ක්‍රියා පිළිවෙත් කාලීනව සමාලෝචනය ද ඒවා ආයතනයෙහි අභ්‍යන්තර සම්බන්ධිත පාර්ශව අතර හුවමාරු කර ගැනීම සිදු කරයි.

### ආර්14 - ව්‍යාපාරික අවදානම

මෙම ව්‍යාපාරික අවදානම අවම කර ගැනීමට විවිධ වූ උපාය මාර්ගික ව්‍යාපාර ඒකක එනම් වැඩ වර්ජන, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී හානි රක්‍ෂණය, මෝටර් රථ රක්‍ෂණය අග්‍රහාර රක්‍ෂණය, ස්වාභාවික විපත් රක්‍ෂණය සහ ප්‍රතිරක්‍ෂණය යනාදී අංශ තුළ ව්‍යාපාරය පුළුල් කිරීම මගින් අවදානම අඩු කර ගත හැකි වේ.

### ආර්15 විදේශ විනිමය අවදානම

විදේශ විනිමය ගණුදෙනුවලට අදාළ අවදානම පිටුදැකීම සඳහා ප්‍රතිරක්‍ෂණ ගිවිසුම්වලට එළැඹි ඒවායෙහි ප්‍රතිරක්‍ෂණ වාරික දේශීය මුදලින් ගෙවීම් කිරීම කරනු ලබයි.

### ආර්17 ආයෝජන ණය අවදානම

ආයෝජන ණය අවදානම අවම කර ගැනීම සඳහා අවදානම් නොමැති ආයෝජන එනම් භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීම් සහ භාණ්ඩාගාර බැඳුම්කර ආදිය රජයේ බැංකු මාර්ගයෙන් සිදු කිරීම කරනු ලබයි.

### ආර්19 මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම වළක්වා ගැනිම මෙහෙයුම් ක්‍රියාකාරකම් පරිගණක ගත කිරීම මගින් සිදු කර ඇත. වැඩ වර්ජන, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල අංශ විගණනය කරනුයේ ජාතික රක්‍ෂණ භාර අරමුදලෙහි අභ්‍යන්තර විගණන අංශය මගිනි. එමගින් වාරික අයකර ගැනීම හා හිමිකම් ගෙවීම් වලට අදාළව සිදු වන වැරදි හා වෙනස්කම් අවම කර ගැනීමට හැකි වී ඇත. තව ද සියලුම කාර්යාල මෙහෙයුම් කටයුතු පරිගණක ගත කිරීම තුළින් ගණුදෙනුවල වැරදීම්වලින් තොර සැකසුම් ක්‍රියාවලියක් ඇති කර ඇත.

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් සාමාජිකයින් හත් දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් මගින් ජාතික රක්ෂණ භාර අරමුදල පාලනය වෙයි.

(අ) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙක්
(ආ) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී
(ඇ) සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙක්
(ඈ) රාජ්‍ය පරිපාලන විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙක් සහ
(ඉ) මූල්‍ය, බැංකු, රක්ෂණ කළමණාකරණය හෝ නීතිය පිළිබඳ සුදුසුකම් ලද හෝ ඒ පිළිබඳ විශේෂඥ දැනුමැති පුද්ගලයන් අතරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තිදෙනෙක්.

මණ්ඩලයේ එක් සාමාජිකයකු සභාපතිවරයා ලෙස පත් කිරීමට අමාත්‍යවරයාට බලය හිමි වේ. පනතට අනුව, පත්වීමේ සිට පුරා වසර 05 ක කාලයක් මණ්ඩලයේ සාමාජිකයන් සිය ධූර දැරිය යුතුය. 2016 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11ක් පවත්වා ඇති අතර මණ්ඩලයේ සාමාජිකයන්ගේ සහභාගීත්වයද උසස් මට්ටමක පැවතී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පැමිණීම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් | 2016 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම | | | | | | | | | | | අධ්‍යක්ෂවරුන් ලෙස පත්වූ දිනය | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ | | |
| මංජුල ද සිල්වා මයා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | 06/04/2015 | - |
| ඒ.ආර්. දේශප්‍රිය මයා | ✓ | ✓ | ✓ | ✓ | නොපැ | - | - | - | - | - | - | 08/04/2015 | 13/07/2016 |
| ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මයා | ✓ | ✓ | ✓ | ✓ | නොපැ | ✓ | ✓ | නොපැ | ✓ | ✓ | ✓ | 08/04/2015 | - |
| අසේන්ද්‍ර සිරිවර්ධන මයා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | 02/04/2015 | - |
| ඩී.පී. විමලසේන මයා | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | නොපැ | ✓ | ✓ | ✓ | 14/12/2015 | |
| එච්.ඒ.සී. කුමාරසිංහ මයා | නොපැ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | නොපැ | ✓ | ✓ | ✓ | ✓ | 14/12/2015 | - |
| රෝහණ ද සිල්වා මයා | - | - | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | 05/05/2016 | - |
| කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර මයා | - | - | - | - | - | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | 12/08/2016 | 30/12/2016 |

ආයතනය ලඟාවී ඇති භෞතික හා මූල්‍ය ඉලක්ක සහ අනුමත කර ඇති ව්‍යාපාරික සැලැස්මට පදනම්ව සුදුසු පරිදි ව්‍යාපාරය පවත්වාගෙන යෑම තහවුරු කිරීම සඳහා ආයතනයේ පාර්ශව කරුවන්හට අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වෙයි.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරික සමාලෝචනය

2016 වර්ෂයේ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රධාන කටයුතු වුයේ රජයේ නිලධාරීන් සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය (අග්‍රහාර), අනිවාර්ය ප්‍රතිරක්ෂණ යෝජනා ක්‍රමය, පාර්ලිමේන්තු සාමාජිකයින් සඳහා රක්ෂණ යෝජනා ක්‍රමය, මෝටර් රථ වාහන රක්ෂණ ක්‍රමය (රජය සතු මෝටර් රථ සඳහා) ක්‍රියාත්මක කිරීමයි. සාමාන්‍ය රක්ෂණ කටයුතු, කෘෂිකාර්මික ණය ආරක්ෂණය, වැඩ වර්ජන, කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදල කළමනාකරණය ද මීට ඇතුළත් වේ.

### මූල්‍ය ප්‍රතිඵල

2015 වර්ෂයේ වාර්තා කළ රු. මිලියන 5,062 ක දළ ලිඛිත වාරික වටිනාකමට සාපේක්ෂව 2016 වර්ෂයේදී ජාතික රක්ෂණ භාර අරමුදල රු. මිලියන 6,814 ක දළ ලිඛිත වාරික වටිනාකමක් වාර්තා කර ඇත. මෙම දළ ලිඛිත වාරික අගය 2015 වසරට සාපේක්ෂව සුළු වැඩිවීමක් නිරූපනය වීමට හේතුවී ඇත්තේ ප්‍රතිරක්ෂණ ආවරණයේ හා වැඩ වර්ජන, කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදලේ සිදුවූ වර්ධනයයි. 2015 පෙර වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 4,303ක් වූ බදු පසු ලාභයට සාපේක්ෂව 2016 වර්ෂය තුළ දී රු. මිලියන 2,840 ක් උපයාගැනීමට ජාතික රක්ෂණ භාර අරමුදල සමත්වී ඇත.

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

### කාර්ය මණ්ඩලය

2015 වර්ෂ අවසානයේදී 186ක් ලෙස පැවති සමස්ත කාර්ය මණ්ඩලය 2016 වර්ෂය අවසානය වන විට 206 ක් විය.

### විගණකවරුන්

1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන අනුව මණ්ඩලයේ 2016 වර්ෂයේ මූල්‍ය වාර්තා විගණකාධිපති විසින් විගණනයට ලක් කර ඇත.

### විගණන කමිටුව

2016 වසර තුළ දී විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් වනම් කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර මහතා, (සභාපති) (අධ්‍යක්ෂ ජනරාල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව) ටෙව්වින් ප්‍රනාන්දුපුල්ලේ මහතා සහ අසේන්ද්‍ර සිරිවර්ධන මහතා යන මහත්වරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය. කමිටුවේ ආරාධනයෙන් නිරීක්ෂකවරයෙක් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා පත් කළ විගණන අධිකාරීවරයා ද කමිටු රැස්වීම් සඳහා සහභාගී වී ඇත. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ කමිටු රැස්වීම් වාර හතරක් පවත්වා ඇත. කමිටු රැස්වීම්වල කටයුතු ප්‍රමාණවත් විස්තර සමග වාර්තා කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිතිපතා යොමු කර ඇත.

### ආයතනික පාලනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ආයතනික පාලන ප්‍රශස්ත භාවිතාවන් සංග්‍රහයේ සහ යහ පාලන හා ආයතනික පාලන භාවිතතාවන් පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සංග්‍රහයේ අදාළ විධිවිධාන වලට නිසි අවධානය යොමු කරමින් ආයතනික පාලන කටයුතු සිදු කර ඇත.

**මංජුල ද සිල්වා**
*සභාපති*

**ගයනි සියඹලාගොඩ**
*අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්*

කොළඹ

# විගණන කමිටු වාර්තාව

2016 වසර තුළ දී විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් එනම් කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර මහතා, (සභාපති) (අධ්‍යක්ෂ ජනරාල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව) ට්‍රේවින් ප්‍රනාන්දුපුල්ලේ මහතා සහ අසේන්ද්‍ර සිරිවර්ධන මහතා යන මහත්වරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය. ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් නම් කළ විගණන අධිකාරීවරයා ද ආරාධනය පරිදි විගණන කමිටු සඳහා සහභාගී විය. විගණන කමිටුවේ කාර්යයන් සඳහා අභ්‍යන්තර විගණක සහාය වූ අතර ජාතික රක්ෂණ භාර අරමුදලේ ඉහළ නිලධාරීන් කරුණු පැහැදිලිකර ගැනීම සඳහා වරින් වර විගණන කමිටුව හමුවට කැඳවන ලදී.

### විගණනයේ විෂය පථය

2016 වර්ෂය තුළ දී විගණන කමිටුව විසින් පහත සඳහන් කාර්යයන් ද ඇතුළුව එහි විගණන විෂය පථය යටතේ ඇති කාර්යයන් ඉටුකරන ලදී:

1. අභ්‍යන්තර විගණන ඒකකයෙහි වගකීම් නිශ්චය කිරීම සහ වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනයට ලක් කිරීම.
2. ජාතික රක්ෂණ භාර අරමුදලේ සියලුම ක්‍රියාකාරකම්වලට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමට ලක් කිරීම හා සමාලෝචනය කිරීම.
3. වියදම් ඵලදායීව සහ නිෂ්පල වියදම් වැළැකීමේ අරමුණින් අඛණ්ඩ කාල පරාසයක් තුළ ක්‍රියාකාරකම් සමලෝචනය.
4. බාහිර විගණක සමඟ සමීපව ක්‍රියා කිරීම සහ විගණකාධිපතිගේ බාහිර විගණක කළමනාකරණ ලිපිවලට අදාළව පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම.
5. අණපනත්, රෙගුලාසීන්, නීති සහ චක්‍රලේඛ ආදියට අනුකූලතාවය දක්වා ඇති බවට තහවුරු කර ගැනීම.
6. ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලතාව තහවුරු කර ගැනිම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
7. අභ්‍යන්තර විගණන / බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි ආදිය සමාලෝචනය කර අවශ්‍ය නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීම.
8. රජයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ නියෝගයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය.

### විගණන කමිටුවේ රැස්වීම්


2016 වසර තුළදී විගණන කමිටුව සිව්වරක් රැස්වී ඇති අතර කමිටුවෙහි සභා වාර පිළිබඳව ප්‍රමාණවත් විස්තර සහිතව අවශ්‍ය තොරතුරු අඛණ්ඩව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා ගත කර ඇත. 2016 වසරේ සිව්වන කාර්තුව සඳහා වූ විගණන කමිටු රැස්වීම 2017 ජනවාරි මාසයේ පවත්වන ලදී.

### අභ්‍යන්තර විගණනය

ජාතික රක්ෂණ භාර අරමුදලේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කරන ලදුව, විගණන කමිටුව විසින් එය සමාලෝචනය කර, විගණන කමිටුවේ අදහස් ද ඊට එක් කිරීමෙන් පසුව එම සැලැස්ම අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යයන් නිරන්තර සමාලෝචනයට හා අධීක්ෂණයට ලක් කරන ලද අතර අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදු කරන ලදී.

### බාහිර විගණනය

විගණන අධිකාරීගේ අදහස් දැක්වීම් හා යෝජනා විගණන කමිටුව විසින් සැලකිල්ලට ගන්නා ලද අතර බාහිර විගණන කළමනාකරණ ලිපි සමාලෝචනය ද සිදු කරන ලදී. ඒවා මත පදනම් වෙමින් සුදුසු තීරණගෙන ඒ පිළිබඳව විගණන පවත්වා, ගෙන සුදුසු ක්‍රියාකාමාර්ග ගැනීම සඳහා කළමනාකාරීත්වය මෙහෙයවීම ද සිදු කරන ලදී.



**කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර**
*සභාපති*
විගණන කමිටුව

# මූල්‍ය ප්‍රකාශ


සිදුවූ නමුත් වාර්තා නොකළ හිමිකම් හා
ආධීනතා ප්‍රමාණතා පරීක්ෂණ සහතිකය 47
ස්වාධීන විගණකගේ වාර්තාව 48
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 69
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 70
ස්කන්ධ ප්‍රාග්ධනයේ සිදුවූ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය 71
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 72
මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් 73
එකොළොස් වසරක අප ආ ගමන්මග 96

# සිදුවූ නමුත් වාර්තා නොකළ හිමිකම් හා බැරකම් ප්‍රමාණතා පරීක්ෂණ (IBNR and LAT) සහතිකය

nmg CONSULTING

2 June 2017

To the shareholders of National Insurance Trust Fund

## National Insurance Trust Fund 31 December 2016 Net IBNR and LAT Certification

I hereby certify that the undiscounted Central Estimate IBNR Provision of LKR 294,347,415 including CHE is adequate in relation to the Net Claim Liability reserves of National Insurance Trust Fund as at the 31 December 2016, net of reinsurance. This IBNR provision, together with the Case Reserves held by the Company, is expected to be adequate to meet the future liabilities, including the claims handling expenses, in respect of the Company's incurred claims obligations as at 31 December 2016, in many but not all scenarios of future experience.

At the end of each reporting period, companies are required to carry out a Liability Adequacy Test (LAT) as laid out in SLFRS 4. The LAT is performed to assess the adequacy of the carrying amount of the Unearned Premium Reserve (UPR). I hereby certify that the UPR provision of LKR 2,158,114,195 set by the Company, net of reinsurance, is adequate in relation to the unexpired risks of National Insurance Trust Fund as at 31 December 2016, in many but not all scenarios of future experience. As such, there is no premium deficiency to be recognised by the Company.

The results have been determined in accordance with internationally accepted actuarial principles.

I have relied upon information and data provided by the management of the Company and I have not independently verified the data supplied, beyond applying checks to satisfy myself as to the reasonability of the data.

Matthew Maguire
Fellow of the Institute of Actuaries of Australia (FIAA)
For and on behalf of NMG Financial Services Consulting
Dated 2 June 2017

T: +65 6325 9855 F: +65 6325 4700 E: contact@NMG-Group.com
www.NMG-Group.com
30 Hill Street, #03-02A, Singapore 179360

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටිආර්ඊ/සී/එන්අයිටීඑෆ්/එෆ්එස්/2016 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 මැයි // දින.

සභාපති,

ජාතික රක්ෂණ භාර අරමුදල.

**ජාතික රක්ෂණ භාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 17 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අරමුදලේ සභාපති වෙත 2017 ඔක්තෝබර් 16 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12

ප්‍රමිතයේ 77 ඡේදය පරිදි ආයතනයක සාමාන්‍ය ක්‍රියාකාරකම් තුළින් ඇතිවන ලාභය මත හඳුනා ගන්නා ලද බදු වියදම් ලාභ අලාභ ගිණුමේ වෙනම දැක්විය යුතු වුවද අරමුදල විසින් සමාලෝචිත වර්ෂයට අදාලව හඳුනාගෙන තිබුණු රු.195,609,935 ක බදු වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21

විදේශ ව්‍යවහාර මුදලින් වූ මූල්‍ය අයිතම් සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම අවසාන අනුපාතිකය යොදාගනිමින් පරිවර්තනය කළ යුතු වුවද අරමුදලේ ගිණුම් 02 ක ශේෂය එසේ පරිවර්තනය නොකිරීම හේතුවෙන් ගිණුමේ ශේෂය හා පරිවර්තන ශේෂය අතර රු. 22,663,676 ක වෙනස්කම් පැවතුණි. ඒ අනුව මෙම අයිතම අතර වූ රු. 22,663,676 ක විනිමය ලාභය ගිණුම්ගත වී නොතිබුණු අතර ඊට සමාන ප්‍රමාණයකින් එම වත්කම්ද මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් නිරූපනය වී තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බදු බැරකම් ගණනය කිරීමේදී තක්සේරු වර්ෂයේ පාරිතෝෂිත දීමනා වියදම අඩු කිරීමට ආදායම් බදු පනතින් ඉඩ නොදෙන බැවින් අරමුදල පාරිතෝෂිත දීමනා වියදම වශයෙන් සේවක මණ්ඩල වියදම තුළ ඇතුළත් රු.3,603,644 ක් බද්දට යටත් ආදායමට එකතු කිරීම වෙනුවට, පාරිතෝෂික වියදම හා ආයුගණන ලාභය (Actuarial gain) අතර වෙනස වූ රු. 1,137,249 ක් බද්දට යටත් ආදායමට එකතු කර තිබුණි. ඒ හේතුවෙන් බද්දට යටත් ආදායම රු. 2,466,395 ක් අඩුවෙන් ගණනය වී ඇති බවත්, ඊට අනුරූපී බදු බැරකම වූ රු.690,591 ක්ද අඩුවෙන් ගණනය කර තිබුණි.

(ආ) ප්‍රතිරක්ෂණ අංශයේ ලැබිය යුතු වාරික ආදායම් පාලන ගිණුම තුළ වූ රු.29,579,065 ක හා ඇමරිකානු ඩොලර් 8,756 ක හරපත් ද රු.10,000,593 ක බැරපත්ද 2015 වර්ෂයේදී නිරවුල් කර තිබියදී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ ශේෂයෙන් ඉවත් කර නොතිබුණි.

(ඇ) ප්‍රතිරක්ෂණ අංශයේ 2016 දෙසැම්බර් 31 දිනට රු. 424,430,802 ක් වූ ලැබිය යුතු ශේෂය තුළ රු. 39,502,102 ක බැර ශේෂ ඇතුළත්වීම හේතුවෙන් ඊට සමාන ප්‍රමාණයකින් මූල්‍ය ප්‍රකාශන තුළ ලැබිය යුතු වාරික ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) අනෙකුත් මූල්‍ය වගකීම්වල ඇතුළත් රජයේ නිලධාරීන්ට ලබා දුන් මෝටර් සයිකල් රක්ෂණ වාරික, ලැබුණු අත්තිකාරම් ගිණුමක් තුළ රඳවා තිබුණු අතර එම එක් එක් රක්ෂණ ගිවිසුම වෙනුවෙන් ඉතිරි වාරික මුදල් ලද පසු ඒවාද ඇතුළු මුළු වාරික මුදල ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය විය. 2016 දෙසැම්බර් 31 දිනට එම ලැබුණු අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 21,750,002 ක් වූ අතර එම ශේෂයට අදාල ඉතිරි මුදල් නොලැබීම මත එය වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) අරමුදලේ කාර්ය පටිපාටි සංග්‍රහය අනුව, ඉන්වොයිස් කළ දින සිට දින 60 ක් ඇතුළතදී ණයගැති ශේෂ පියවිය යුතු වුවත් රක්ෂණ ව්‍යාපාර පන්ති දෙකක 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය තුළ දින 90 ඉක්මවූ එකතුව රු.1,049,204,598 ක ශේෂ පැවතුණද විචක්ෂණ සංකල්පයට අනුව අරමුදල විසින් බොල් හා අඩමාන ණය වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

(ඊ) මෝටර් රථ රක්ෂණ හිමිකම් ගෙවීම් රු.5,634,178 ක් මෝටර් රථ රක්ෂණ හිමිකම් ගෙවීම් ගිණුමට ගිණුම්ගත කිරීම වෙනුවට මෝටර් රථ රක්ෂණ හිමිකම් වෙන් කිරීමේ ගිණුමට ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම ගිණුම් දෙකේ වටිනාකම පිළිවෙලින් රු. 5,634,178 කින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

2015 දෙසැම්බර් 31 දිනට ප්‍රතිරක්ෂණ අංශයේ ලැබිය යුතු ශේෂයට අදාළව ඉදිරිපත් කළ උප ලේඛනයේ හා 2016 දෙසැම්බර් 31 දිනට 2015 දෙසැම්බර් 31 දිනට අදාල ශේෂ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ උපලේඛනයේ පෞද්ගලික ආයතනයකට අයත් හරපත් හා බැරපත් වටිනාකම් වූ පිළිවෙලින් රු.36,836,958 ක බැර හා රු.30,702,859 ක හර ශේෂ අතර වෙනසක් වූ අතර එම වටිනාකම් නිරවුල් කළ බවටද සාක්ෂි නොවීය.

### 2.2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිවයක් ලෙස ගෙවීම් කරමින් පැවති වැඩවර්ජන, කැරලි කෝලාහල හා සිවිල් අරගල අංශයේ (SRCC & TR) කොමිස් ගෙවීම 2008 වර්ෂයේ සිට නවතා තිබුණද 2016 වර්ෂයේ සිට නැවත ගණනය කර ලාභයෙන් වෙන් කිරීම් සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.89,809,561 ක් වූ මෙම ගෙවීමට අදාල නෛතික පදනම විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අංක 88/01 දරන 2012 ඔක්තෝබර් 31 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අනුමැතිය මත අරමුදලේ නිලධාරීන් වෙත රු. මිලියන 3 දක්වා සේවකයාගෙන් සියයට 3.5 ක් හා සේව්‍යයාගෙන් පිළිවෙලින් සියයට 7.5, 5 හා 2.5 ක පොලී අනුපාතිකයන් යටතේ කාණ්ඩ 03 ක් ලෙස දේපල ණය ලබා දී තිබුණි. මේ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් හෝ වෙනත් යම් චක්‍රලේඛ උපදෙසක් හෝ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. 2012 වර්ෂයේ සිට අරමුදලේ නිලධාරීන් 17 දෙනෙක් සඳහා මේ යටතේ දේපල ණය ලබා දී තිබුණු අතර මේ වෙනුවෙන් අරමුදල විසින් වර්ෂය තුළදී දරා තිබූ පොලී වියදම රු. 3,854,638 ක් විය.

(ඇ) ඉහත (ආ) හි දේපල ණයට අමතරව ඉහත කී පරිදි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් අරමුදල විසින් රාජ්‍ය බැංකුවක් හරහා නිලධාරීන්ට පුද්ගලික ණය ලබා දී තිබුණු අතර විධායක ශ්‍රේණීන් සඳහා රු. මිලියන 1.5 ක්ද විධායක නොවන ශ්‍රේණීන්

සඳහා රු. 500,000 ක්ද උපරිම සීමාවක් නියම කර ගෙවීමේ හැකියාව මත විධායක නොවන ශ්‍රේණීන්ගේ එම ණය සීමාව රු. 500,000 සිට රු. 750,000 දක්වා වැඩි කර තිබුණි. මෙම ණය ලබා දීමේදීද ගෙවිය යුතු පොළිය සේවකයා හා අරමුදල අතර බෙදී යන බව විගණනයේදී නිරීක්ෂණය විය. 2016 දෙසැම්බර් 31 දින වන විට අරමුදලේ විධායක නොවන සේවකයින් 128 දෙනෙක්ද, විධායක සේවකයින් 13 දෙනෙකුද රජයේ බැංකුවකින් පෞද්ගලික ණය ලබාගෙන තිබුණි. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් ඒ සඳහා ගෙවිය යුතු මුළු පොළී ප්‍රමාණය රු. 18,711,687 ක් විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෝටර් රථ සාමාන්‍ය රක්ෂණ වටිනාකම වූ රු. 123,534,491 කට අදාළව ණයගැති කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් නොවිය.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වනවිට ස්වාභාවික ආපදා රක්ෂණ වැඩසටහනට අදාලව, ප්‍රතිරක්ෂණ ආයතන වෙතින් ලැබිය යුතු රු.5,528,802,851 ක් අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද මේ සම්බන්ධයෙන් ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. 2018 අප්‍රේල් 26 දිනැති අංක එන්අයිටීඑෆ්/එෆ්අයිඑන්/02/2016 දරන කළමනාකරණ නියෝජන ලිපිය අනුව, ඉන් රු.3,468,019,881 ක් තවදුරටත් ලැබිය යුතු තත්ත්වයේ පවතින බව කළමනාකරණය විසින් විගණනය වෙත දන්වා තිබුණි. කෙසේ වුවද ඉහත ලිපිය අනුව, එම වැඩසටහනට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ප්‍රතිරක්ෂණ ආයතනවලින් ලැබිය යුතු වූ රු.535,040,194 ක් කළමනාකරණ නියෝජන ලිපිය මගින්ද තහවුරු කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රතිරක්ෂණ අංශයේ ලැබිය යුතු වාරික ආදායම් ශේෂය තුළ වූ රු. 9,053,364 ක ශේෂයක් හඳුනා ගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ජාතික රක්ෂණ භාර අරමුදල, විවිධ ආපදා තත්ත්වයන් සඳහා ඇස්තමේන්තු ලබා ගැනීමකින් තොරව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත හා අනෙකුත් ආයතනයන් වෙත ආපදා අරමුදල් මුදාහැර තිබීම හේතුවෙන් ඉතිරි වූ රු.14,928,705 ක ශේෂ 2016 දෙසැම්බර් 31 දින වනවිටත් ආපසු ලබාගෙන නොතිබුණි.

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

(ඇ) වැඩවර්ජන, කැරලි කෝලාහල සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදල් (SRCC & TR) අංශයේ 2016 මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක 10.1 ට අදාළ සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු වාරික ආදායම් ලෙස දක්වා ඇති රු. 3,462,112 ක ශේෂය, 2014 වර්ෂයේ සිට පැවත එන අතර එම ශේෂය විගණිත දිනය වූ 2017 ජූලි 14 වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට වගා රක්ෂණයට අදාළව ගිණුමට බැර කර තිබූ රු. මිලියන 42.5 කට අදාළව කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (AAIB) දැනුවත් කර අදාල ලේඛන ගෙන්වා ගැනීමෙන් පසු කඩිනමින් ගෙවීම් කිරීමට කටයුතු කරන බව විගණනයට දන්වා තිබුණද, විගණිත දිනය වූ 2017 ජූලි 31 වන විටත් එම ශේෂය නිරවුල් කර නොතිබුණි.

(ඉ) ප්‍රතිරක්ෂණ අංශයේ ලැබිය යුතු වාරික ආදායම තුළ වාරික මුදල් ලැබී තිබුණු එක් රක්ෂණ සමාගමකින් ඊට අදාළ එකතු කළ අගය (VAT) හා ජාතිය ගොඩ නැගීමේ බදුවල (NBT) එකතුව රු. 5,005,761 ක් 2017 දෙසැම්බර් 31 දක්වා නිරවුල් කර නොතිබුණි.

**2.4 ශේෂ පත්‍ර දිනට පසුව සිදුව ඇති සිද්ධීන්හි බලපෑම**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සටහන් අංක 2.3.8 අනුව, අරමුදලෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳ කළමනාකරණය විසින් තක්සේරුවක් කර තිබුණද, රු. බිලියන 15 ක් වූ ස්වාභාවික ආපදා සඳහා වූ ජාතික රක්ෂණාවරණයෙහි 2017 වර්ෂයට අදාළ ප්‍රතිරක්ෂණාවරණය ලබාගැනීම ප්‍රමාදවීම, ඒ අතර කාලය තුළ සිදුවූ ආපදා වෙනුවෙන් රක්ෂණ වන්දි භාර අරමුදලේ අරමුදල් වලින් ගෙවීමට සිදු වී තිබීම හා 2016 ජූනි 09 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රක්ෂණ පන්ති අතර අරමුදල් හුවමාරු කිරීමට සිදු වීම හේතුවෙන් පසුගිය වර්ෂවලට සාපේක්ෂව අරමුදල මූල්‍යමය පිරිහීමකට පත් වී ඇති බව විගණනයේදී අනාවරණය විය. එසේම, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ අලාභයක් ඇති වී නොතිබුණද 2017 මැයි 31 වන විට අරමුදලේ බදු පෙර අලාභය රු.552,501,540 ක් වී තිබීම හා රඳවා ගත් ඉපයුම් සංචිතයද 2016 දෙසැම්බර් 31 දිනට සාපේක්ෂව 2017 අගෝස්තු 31 දින වන විට රු. 2,543,773,950 ක වටිනාකමකින් අඩු වී තිබුණු බව නිරීක්ෂණය විය. එසේම, 2016 දෙසැම්බර් 31 දින වන විට අරමුදල සතු ජංගම නොවන වත්කම් වන දේපල පිරියත හා උපකරණ වටිනාකම රු. 37,802,741 ක් හා එදිනට වූ ආයෝජන වත්කම් වටිනාකම රු. 11,195,999,167 ක් විය. එම ආයෝජන වටිනාකම 2017 අගෝස්තු 31 දින වන විට රු.8,300,859,568 ක් දක්වා අඩු වී තිබුණු අතර එය තවදුරටත් අඩුවෙමින් පැවතීම හේතුවෙන් අරමුදල අවදානම්කාරී තත්ත්වයකට ලක්වී ඇති බව නිරීක්ෂණය විය.

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ<br>27 වෙනි වගන්තිය | රක්ෂණ ව්‍යාපාරයේ එක් එක් අනුපන්තිය සම්බන්ධයෙන් වෙනම ගිණුම් පවත්වාගත යුතු වුවද, අරමුදල විසින් වැඩ වර්ජන, කැරළි කෝලාහල සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදල (SRCC & TR) හැර අනෙකුත් අංශ සඳහා ආංශික මූල්‍ය ප්‍රකාශන හෝ ඊට අදාළ ගිණුම් වාර්තා පිළියෙල කර නොතිබියදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අභ්‍යන්තර දෙපාර්තමේන්තු අතර රු. 2,308,114 ක් වූ ගෙවිය යුතු ශේෂයක් දක්වා තිබුණි. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | |
| | 114 වගන්තිය | 2015 වර්ෂයට අදාළව 2016 ජනවාරි මාසයේදී, උපයන විට බදු සඳහා බැඳියාවක් පවතින නිලධාරීන් වෙත ගෙවන ලද රු.871,427 ක් වූ නිවාඩු දින දීමනා සඳහා උපයන විට ගෙවීම් බදු අඩු කර නොතිබුණු අතර 2016 වර්ෂයේ පෙබරවාරි සිට ජූලි මාසය දක්වා මාණ්ඩලික නොවන නිලධාරීන් අතුරින් උපයන විට බදු බැඳියාවක් පවතින නිලධාරීන් හඳුනාගෙන නොතිබුණි. |

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

---------------------------------------

| | |
|---|---|
| (i) 8.3.8 වගන්තිය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව පරිත්‍යාග හා ත්‍යාග (Donations and Gifts) ලබා දිය නොහැකි බව සඳහන් වුවද, අරමුදල විසින් රු.1,159,220 ක් පරිත්‍යාග ලෙස විවිධ ආයතන හා පුද්ගලයන් වෙත ලබා දී තිබුණි. |
| (ii) 9.14.1 පරිච්ඡේදය | අරමුදල සඳහා අනුමත මානව සම්පත් කළමනාකරණයට අදාල පරිපාලන අත්පොතක් නොතිබුණු අතර 2016 අගෝස්තු 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යවන ලද අංක එන්අයිටීඑෆ්/ඕසී/03/2014 දරන ලිපියෙන්, ආයතනික අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන යාවත්කාලීන කර සම්පූර්ණයෙන් සකස් කර අවසන් වූ පසු එම අත්පොත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බව දැනුම් දී තිබුණද මේ දක්වා කිසිදු ඉදිරි පියවරක් ගෙන නොතිබුණි. |

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---------------------------------------

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 396 | ආයතනයේ ජංගම ගිණුම් 03 කට අදාළව එකතුව රු.976,585 ක් වන නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ චෙක්පත් 33 ක් සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**2.6 අරමුදල් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පූර්ව ඇස්තමේන්තුවක් නොමැතිව අරමුදල විසින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට 2016 ඔක්තෝබර් මාසයේදී රු.මිලියන 100 ක් "කෙතට අරුණ පොහොර දිරිය රක්ෂණ වැඩසටහන" සඳහා ලබාදී තිබූ අතර ඉන් රු.59,401,901 ක් පමණක් ප්‍රවර්ථන වර්ෂය තුළ වියදම් කර තිබුණි. ඉතිරිය වූ රු.40,598,098 ක මුදල, 2017 මාර්තු 31 දින ආපසු අරමුදලට එවා තිබුණි.

(ආ) 2015 ජුලි 29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව, අග්‍රහාර සාමාජික මුදල් එකතු කිරීමේ අරමුණින් ආරම්භ කළ අග්‍රහාර එකතු කිරීමේ ගිණුම් ශේෂය 2016 දෙසැම්බර් 31 දිනට රු. 14,750 ක් වූ අතර ලිපිගොනු අනුව, 2015 නොවැම්බර් සිට කිසිදු බැර කිරීමක් මෙම ගිණුමට සිදුවී නොතිබීම නිසා ගිණුම ආරම්භ කළ අරමුණ ඉටු වී නොතිබුණි.

## 2.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල, සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමයෙහි (SVAT) ලියාපදිංචි ආයතනයක් බැවින් ලියාපදිංචි ගැණුම්කරුවෙකු සඳහා සේවාව ලබාදී මාසයකට පසු දින 15 ක් ඇතුළතදී, බැර වවුචර්පත් (Credit Voucher) අදාළ ලියාපදිංචි සේවා සැපයුම්කරු වෙත ඉදිරිපත් කල යුතු වුවද, ලියාපදිංචි ගැණුම්කරුවකු වූ ලංකා මිනරල් සැන්ඩ්ස් සමාගමෙන් SVAT ඉන්වොයිස් පත් සඳහා බැර වවුචර්පත් අරමුදලට ලැබී නොතිබීම හේතුවෙන් එම ඉන්වොයිස්වලට අදාල VAT රහිත ලැබිය යුතු අගයන් අරමුදල වෙත ලැබී තිබුණද එම SVAT අගයන් නිවැරදි ලෙස හඳුනා ගැනීමට ක්‍රියාකර නොතිබුණි. එකී හේතුවෙන් සාමාන්‍ය රක්ෂණ (මෝටර් නොවන) අංශයේ ණයගැති කාල විශ්ලේෂණයේ දින 90 ඉක්මවූ ලැබිය යුතු ශේෂ තුළ රු.35,806 ක්වූ නිරවුල් නොවූ අගයන් ඇතුළත් වී තිබුණි.

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 25 වන වගන්තියට අනුව, බදු නියම කල හැකි ආදායම නිශ්චය කිරීමේදී ඉඩ දිය යුතු අඩු කිරීමක් වන ක්ෂය දීමනා (Capital Allowance), ආදායමෙන් අඩු කිරීම වෙනුවට ගිණුම්කරණ ක්ෂය මුළු වටිනාකම ඉන් අඩුකර තිබුණි. විගණනයේදී කළ ගණනය කිරීම් අනුව ක්ෂය වීම සඳහා වූ දීමනාව රු.7,730,203 ක් වුවද, ගිණුම්කරණ ක්ෂය වටිනාකම රු.7,056,814 ක් ආදායමින් අඩුකර දක්වා තිබුණි.

(ඇ) 2016 /2017 තක්සේරු වර්ෂයට අදාළ සංස්ථාපිත ආදායම් බදු වාර්තාව සඳහා උපදෙස් මාලාවේ කොටුව 30 (Cage 30)හි උපවගන්ති අංක 2.2 අනුව, මතිමාත්‍ර බැර කිරීම් (Notional Tax Credit) බද්දට යටත් වන ආදායමින් අඩු කර ගැනීම සඳහා බාහිර විගණකවරයෙකුගේ සහතිකය ආදායම් බදු වාර්තාව සමග ඉදිරිපත් කළ යුතු වුවද 2016 වර්ෂයේ මෙන්ම ඊට පෙර වර්ෂයන්හිදීද මෙම සහතිකය බාහිර විගණකවරයෙකු වෙතින් ලබා ගැනීමට අරමුදල කටයුතු කර නොතිබුණි.

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,839,751,855 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,303,897,565 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,464,145,710 ක පිරිහීමක් විය. දළ වාරික ආදායම රු.919,020,772 කින් වැඩිවී තිබුණද, ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම් ගෙවීම් සහ ලියාහැරීම්, රු.2,534,277,747 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂයේ පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු. 2,083,023,166 ක් වූ අතිරික්තය 2014 වර්ෂය දක්වා වාර්ෂිකව උච්ඡාවචනය වී තිබූ අතර 2015 වර්ෂයේදී එය රු.4,562,029,897 වී තිබුණි. 2016 වර්ෂයේදී එය රු. 2,839,751,855 ක් දක්වා පහත වැටී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු. 2,165,850,389 ක් වූ අරමුදලේ දායකත්වය 2014 වර්ෂය දක්වා ක්‍රමයෙන් වැඩි වී තිබුණද, 2015 වර්ෂයේ සිට එය නැවතත් අඩු වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එය රු. 3,011,061,987 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

---------------

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 12(අ) වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ අරමුණු අනුව මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන දායක රක්ෂණ යෝජනා ක්‍රමයක් මගින්, අවස්ථාවෝචිත පරිදි, අනපේක්ෂිත සෞඛ්‍ය අවදානම, පෞද්ගලික හදිසි අනතුරු හා දේපල හානි සම්බන්ධයෙන්

- රාජ්‍ය නිලධරයන්, පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්, පළාත් පාලන සේවයේ නිලධරයන් සහ රාජ්‍ය සේවයෙන්, පළාත් රාජ්‍ය සේවයෙන් හා පළාත් පාලන සේවයෙන් විශ්‍රාම ලැබ අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුවෙන්, පළාත් සභාවෙන් හෝ පළාත් පාලන සේවයෙන් දැනට විශ්‍රාම වැටුපක් ලබන තැනැත්තන් සඳහා,

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

- 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනතට අනුකූලව සමෘද්ධි ප්‍රතිලාභීන් සහ ඔවුන්ගේ පවුල් සඳහා,
- ගොවීන්, ධිවරයින් සහ ස්වයං රැකියාවල නියුක්ත තැනැත්තන් සඳහා,
- මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් කලින් කල හඳුනාගනු ලැබිය හැකි අවශ්‍යතාවයන් ඇති තැනැත්තන් හෝ තැනැත්තන් කණ්ඩායම් සඳහා, ප්‍රතිලාභ සහ ආරක්ෂණ සැපයීම දක්වා තිබුණි.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2005 (vi) චක්‍රලේඛය මගින් දායකත්වය ස්වකැමැත්ත මත වන රක්ෂණ යෝජනා ක්‍රම දෙකක් යටතේ තවදුරටත් රජයේ සේවකයින් සඳහා වන රක්ෂණාවරණය පුළුල් කිරීමට කටයුතු කර තිබුණි. මේ වන විට ආයතන 1750 ක සාමාජිකයින් ලක්ෂ 02 කට ආසන්න සංඛ්‍යාවක් මෙම නව ක්‍රමය යටතේ එකඟතාවය පල කර ලියාපදිංචි වී ඇති නමුත් එයින් දැනට පද්ධතියට ඇතුළත් කර තිබුණේ ආයතන 650 කට අදාළ දත්ත පමණි. එසේම, මෙම ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන රන්, රිදී හා සාමාන්‍ය රක්ෂණ ක්‍රමයට අදාළව වාරික මුදල් ලැබීම් වෙන් වෙන්ව හඳුනාගත හැකි වන පරිදි ගිණුම්ගත කිරීමක්ද සිදු කර නොතිබුණි.

(ආ) මූල්‍ය හා රක්ෂණ ආයතනවල ලාභයෙන් සියයට 1 ක් වශයෙන් වූ වගා බද්ද මගින් ලැබෙන අරමුදල්, අවශ්‍යතාවය අනුව වගා හානි ගෙවීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ලබා දීමට තීරණය කර තිබුණි. තවද, අංක 16/0525/706/017 හා 2016 අප්‍රේල් 07 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් මෙම වගා බදු මුදලම භාවිතා කරමින් "කෙතට අරුණ පොහොර දිරිය" වැඩසටහන යටතේ පොහොර සහනාධාරය ලබන ගොවීන් සඳහා කෘෂිකාර්මික ණය සුරැකුම් ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමටද අනුමැතිය ලබා ගෙන තිබුණි. එහෙත් ප්‍රගති සමාලෝචන වාර්තා අනුව, මෙම ණය ආරක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වර්ෂය තුළ කිසිදු කාර්යයක් සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රතිරක්ෂණාවරණය සැපයීම පිණිස 2016 වර්ෂයේදී අරමුදල විසින් පුද්ගලික සමාගමක් තෝරා ගෙන තිබූ අතර, 2016 වර්ෂයට අදාළ ප්‍රතිරක්ෂණ ගිවිසුම 2016 අප්‍රේල් 01 දින සිට 2017 අප්‍රේල් 01 කාල සීමාව දක්වා වලංගු විය. එකි

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

වර්ෂය සඳහා රු. මිලියන 84 බැගින් වන කාර්තුමය වාරික 04 කින් රු. මිලියන 336 ක් ප්‍රතිරක්ෂණාවරණයේ ශුද්ධ පිරිවැය වශයෙන් අරමුදල විසින් ප්‍රතිරක්ෂණකරුවන් වෙත ගෙවීම් සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) එම්එන්පීර්/2016/35 අංක දරන 2016 මැයි 20 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අනුව, මෙම ප්‍රතිරක්ෂණාවරණය ලබාගැනීමේ අපේක්ෂිත අරමුණ වූයේ මෙවැනි ස්වාභාවික ආපදා මඟින් පැන නැගිය හැකි අසාමාන්‍ය හානි හේතුවෙන් ආයතනයේ මූල්‍ය තත්ත්වයට විය හැකි අවාසි සහගත බලපෑමෙන් ආරක්ෂා වීමයි. එසේ වුවද, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2016 වර්ෂයේදී ආපදා සහන ලෙස රු.3,750,798,782 ක් ගෙවා තිබියදී මෙම ප්‍රතිරක්ෂණාවරණ ආයතනයෙන් ඒ වෙනුවෙන් රු.153,326,181 ක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව ප්‍රතිරක්ෂණාවරණයෙන් ආවරණය වී තිබුණේ මුළු ආපදා සඳහා ගෙවීම්වලින් සියයට 4 ක් පමණක් බැවින් එම අරමුණ ඉටුවේද පිළිබඳ ගැටළුවක් විගණනයේදී පැන නැගිණි.

(ii) 2017/2018 වර්ෂයන්ට අදාල ප්‍රතිරක්ෂණය සඳහාද ඉහත සඳහන් ආයතනයම තෝරා ගෙන තිබුණු අතර අරමුදල ඊට අදාල ගිවිසුමට එළඹෙනුයේ 2017 මැයි 26 දින එනම්, 2017 මැයි 25 දින ගංවතුර හදිසි ආපදා තත්ත්වය ඇති වූ දිනට පසු දින වූ බැවින් ඒ වන විට පැරණි ගිවිසුම අවලංගු වී මාස 02 කට ආසන්න කාලයක් ගත වී තිබුණි. ඒ හේතුවෙන් ආයතනයේ අරමුදල් භාවිතයට ගනිමින් මෙම ආපදා හානි ආවරණය කිරීමට අරමුදලට සිදු වී තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව 2017 සැප්තැම්බර් 19 දින වන විට එම ආපදාවට අදාලව රු. 1,482,908,152 ක් ආපදා හානි ලෙස ආයතනය විසින් සිය අරමුදල් මඟින් ගෙවා තිබුණි.

## 4.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අංක 4/2016 හා 2016 මැයි 30 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ද ඇතිව අරමුදල විසින් 2016 ජූලි 12 දින සිට වසර 5 ක කාලයක් සඳහා වාහන දෙකක් මෙහෙයුම් කල්බදු පදනම මත ලබාගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ

මාර්ගෝපදේශ අතිරේක 28 අනුව, කල්බදු සම්බන්ධ ප්‍රසම්පාදනයකදී ප්‍රසම්පාදනයේ මුළු පිරිවැය ලෙස මුළු කල්බදු වටිනාකම හෝ මුළු කල්බදු කාලය සැලකිය යුතු වූ අතර ඒ අනුව ඉහත වාහන දෙක සඳහා වසර 5 ක් තුළ ගෙවිය යුතු මුළු වටිනාකම රු.16,650,000 ක් වී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක 28 හි 2.14.1 අනුව මෙම ප්‍රසම්පාදනය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක නිර්දේශය මත සිදුකළ යුතු වුවද අරමුදලේ ප්‍රසම්පාදන වලට අදාළව 2016 වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් පත්කර නොතිබුණි.

(ii) අරමුදලේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරියා හා කළමනාකරු (මුදල්) යන සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක සාමාජිකයින් දෙදෙනෙකු විසින් පමණක් මෙම ප්‍රසම්පාදනය සඳහා අනුමැතිය ලබාදී තිබූ අතර එක් සාමාජිකයෙකු විසින් "මෙය ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2016 මගින් දක්වා ඇති ප්‍රසම්පාදනයෙන් බැහැරවීමක්" ලෙස දක්වා අනුමැතිය ලබා දී නොතිබුණි.

(iii) ඉහත අංක 4/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා ඊට අනුබද්ධිත අංක 01/2016 හා 2016 මාර්තු 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය අනුව, මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීමේදී භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පෙර ඇගැයීම් කමිටුවක නිර්දේශය ලබාගත යුතු වූ අතර, වාහනය අත්පත් කර ගැනීමට පෙර මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ද ලබාගත යුතු විය. කෙසේ වුවද, 2016 ජූලි 08 දින ලබා ගත් මෙම වාහන සඳහා ඉහත කී නිර්දේශය මෙන්ම භාණ්ඩාගාරයේ අනුමැතිය ද ලබාගෙන ඇත්තේ වාහනය ලබා ගැනීමෙන් පසු එනම් 2016 ඔක්තෝබර් 15 දිනදී වන අතර එම අනුමැතිය ඉල්ලා තිබුණේ 2016 සැප්තැම්බර් 30 දිනදීය.

(iv) අංක 1/2016 හා 2016 මාර්තු 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව, වාහන ලබා ගැනීමේදී තරඟකාරී ලංසු කැඳවීම මගින් වාහන ලබාගත යුතු වුවද, වෙළඳපොලේ මේ සඳහා පිළිගත් මූල්‍ය ආයතන 03 ක් පමණක් ඇති බව දක්වමින් තරඟකාරී ලංසු කැඳවීමෙන් අරමුදල බැහැර වී

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

තිබුණි. කෙසේ වුවද, ඉහත චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව, සුදුසුකම් ලබන සැපයුම්කරුවන් කාණ්ඩ 03 ක් යටතේ දක්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී මාතර ප්‍රදේශයේ ශාඛා කාර්යාලයක් ඉදි කිරීමට කටයුතු කර තිබුණු අතර එම ඉදි කිරීම හා ඊට අදාළ කාර්යයන්වල ඇස්තමේන්තුගත වියදම් එකතුව රු.1,688,882 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 4.3.1 හා 4.3.2 අනුව, මිලදී ගැනීම් ආයතනය වන අරමුදල විසින් පළමුව සියලු සම්බන්ධිත වියදම් ඇතුළත් කර මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් කළ යුතු වුවද, සියලු සම්බන්ධිත වියදම් මුළු පිරිවැය ඇස්තමේන්තුවට ඇතුළත් නොකොට අරමුදල විසින් ප්‍රසම්පාදන 3 ක් ලෙස මිල කැඳවීම් කර සැපයුම්කරුවන් තෝරා ගෙන තිබුණි.

(ii) මෙම කාර්යය සැලසුම් කිරීමේ සිට තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලබා ගැනීම දක්වා විශාල කාල පරාසයක් ගත කර ඇති බව එනම් වසරක් පමණ ගත වී ඇති බව නිරීක්ෂණය විය.

(iii) 2016 ජුනි 01 දිනැති මාතර දිස්ත්‍රික් ලේකම්ගේ අංක ඩීඑස්එම්/ඒඩීඑම්/පීඕවීබියු/08/01 දරන ලිපිය අනුව, ලේකම් කාර්යාලය ඉදිරිපස පිහිටි ගොඩනැගිල්ල අළුත්වැඩියා කර පවත්වා ගෙන යාම සඳහා අරමුදල වෙත භාර දී තිබුණද දිස්ත්‍රික් ලේකම්ගේ එකඟතාවක් හෝ නීත්‍යානුකූල ගිවිසුමක් නොමැතිව නව ඉදි කිරීම් සිදු කර තිබුණි.

(ඇ) 2016 අයවැය යෝජනාව මගින් ස්වාභාවික විපත් සඳහා සමස්ත රටම ආරක්ෂා කිරීම උදෙසා රක්ෂණ යෝජනා ක්‍රමයක් යෝජනා කර තිබුණු අතර ඒ අනුව ඒකපුද්ගල රක්ෂණාවරණය රු.මිලියන 2.5 ක්ද ආපදාවන්ට ලක්වන එක් පුද්ගලයෙකු වෙනුවෙන් උපරිමය රු. ලක්ෂයක ආවරණයක්ද, හිමිවන පරිදි රු.මිලියන 10,000 ක (රු.බිලියන 10 ක) සමස්ත රක්ෂණාවරණයක් හා සමුද්‍රෙහි ධීවර කර්මාන්තයෙහි යෙදී සිටිනා අතරතුර හදිසි අනතුරුවලට මුහුණ දෙන ධීවරයින් වෙනුවෙන් රු.මිලියන 01 ක හදිසි අනතුරු මරණ රක්ෂණාවරණයක්ද හඳුන්වා දීමට යෝජනා කර තිබුණි. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිණිස අයවැය මගින් රක්ෂණ වාරික ලෙස 2016 වර්ෂයේදී රු.මිලියන 300 ක්ද, 2017 වර්ෂයේදී රු. මිලියන 500 ක්ද

ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර අරමුදල මේ සඳහා ප්‍රතිරක්ෂණාවරණයක් ලබා ගැනීමට කටයුතු කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා ඊට අදාළව සිදු කළ සංශෝධනවලට අනුව, රු. මිලියන 200 ට වඩා වැඩි ප්‍රසම්පාදන අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ප්‍රසම්පාදන කමිටුවක (CAPC) නිර්දේශය මත සිදුකළ යුතු වුවද, මෙම ප්‍රතිරක්ෂණාවරණයේ මුළු වටිනාකම රු. මිලියන 420 ක් වුවද අරමුදල එසේ කටයුතු කර නොතිබුණි. වෙනත් ප්‍රතිරක්ෂණාවරණයක් (Retrocession) සඳහා පත්කළ ප්‍රසම්පාදන කමිටු අදාල කර ගනිමින් මීට අදාළ ප්‍රසම්පාදන කටයුතු අරමුදල විසින් සිදුකර තිබුණි.

(ii) මෙම ප්‍රතිරක්ෂණාවරණය ජාත්‍යන්තර A අනුපාතික ආයතනවලින් ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණද ඊට අදාළ දැන්වීම දේශීය පුවත්පතක හා අරමුදලේ වෙබ් අඩවියේ පමණක් පල කර තිබුණි.

(iii) ප්‍රතිරක්ෂණාවරණ සඳහා වාරික ගෙවීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තෝරා ගත් සමාගම සඳහා 2016 මැයි 30 දින අමාත්‍ය මණ්ඩල යටතේ ආවරණ අනුමැතියක් පමණක් ලබාගැනීමට අරමුදල ක්‍රියාකර තිබුණි. කෙසේ වුවද, මෙම අනුමැතිය ලබා ගන්නා අවස්ථාව වන විටත් එනම් 2016 අප්‍රේල් 06 දින වන විටත් අදාළ ප්‍රතිරක්ෂකයා සමග අරමුදල ගිවිසුමකට එළඹ තිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2016 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්ය මණ්ඩල 269 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 210 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 59 ක් විය.

# ස්වාධීන විගණකගේ වාර්තාව

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ආ) 2016 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අරමුදල ප්‍රතිව්‍යුහගතකරණය සඳහා එවකට පැවති කාර්ය මණ්ඩලයේ එකතුව වූ 197, සියයට 37 කින් එනම් 269 දක්වා වැඩි කර තිබුණද අරමුදලේ ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු මේ වන විටත් මූලික අදියරේ පැවතුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින ස්ථිර ද්විතීයික මට්ටමට අයත් (කළමනාකරණ සහකාර/ දුරකථන ක්‍රියාකරු හා පිළිගැනීමේ නිලධාරී) තනතුරු 22 ක් හා ප්‍රාථමික මට්ටමට අයත් (කාර්යාල සහායක) තනතුරු 07 ක් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම් සිදු කර තිබුණි.

(ඈ) 2016 වර්ෂය තුළදී අරමුදල විසින් අනුමත කාර්ය මණ්ඩලය තුළ වූ ඉහළ කළමනාකරණ තනතුරු 03 ක් හා මධ්‍ය මට්ටමේ තනතුරු 13 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා සාමාජිකයින් පත් කිරීම විධිමත්ව සිදු කර නොතිබුණි.

(ii) පුවත්පත් දැන්වීමක් පල කර 2015 දෙසැම්බර් 28 දිනට පෙර අයදුම්පත් කැඳවා තිබුණු, කළමනාකරු (සාමාන්‍ය රක්ෂණ) තනතුර සඳහා මේ දක්වා බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

(iii) තනතුරු 02 ක් සඳහා විධිමත් හා විනිවිදභාවයෙන් තොරව සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීම් සිදු කර තිබුණි. 2016 නොවැම්බර් 15 දින බඳවා ගෙන තිබුණු තවත් තනතුරක් සඳහා අනුමත බඳවා ගැනීම් පරිපාටියෙන් බැහැරව අයදුම්පත් කැඳවා තිබුණි.

(ඉ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 05 තුළ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරක්, කළමනාකරු තනතුරු 03 ක් හා අභ්‍යන්තර විගණන තනතුරක් ඇතුළත් විය. අනුමත අභ්‍යන්තර විගණන තනතුරද මේ දක්වා පුරප්පාඩුව පැවතීම හා ඉහත කී තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට ක්‍රියා නොකර වැඩ බැලීමේ පදනම මත තනතුරු පිරවීමට අනුමැතිය ලබා දී තිබුණි.

(ඊ) තෘතියික හා ද්විතීයික මට්ටම්වල පුරප්පාඩු අතුරින් තනතුරු 50 ක් විගණිත දිනය වූ 2017 අගෝස්තු 30 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදයට අනුව, මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2017 නොවැම්බර් 01 දිනදීය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 11 සිට සියයට 239 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

### 5.3 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල විසින් Zillione Cash book පරිගණක මෘදුකාංගය භාවිතා කරමින් මුදල් පොත හා බැංකු සැසඳුම සකස් කිරීම සිදු කෙරෙමින් පැවතුණද, ලෙජර් ගිණුම් පවත්වාගෙන යාම හා අවසාන ගිණුම් සකස් කිරීම සඳහා Sage accpacc ගිණුම්කරණ මෘදුකාංගය භාවිතා කර තිබුණි. මෘදුකාංග අතර දත්ත හුවමාරුව විධිමත් අභ්‍යන්තර පාලනයක් සහිතව සිදු කරන බවක් නිරීක්ෂණය නොවුණු අතරම එම දත්ත සම්ප්‍රේෂණය තොරතුරු තාක්ෂණ අංශය මගින් සිදුකරන බවත් ඒ සඳහා ගිණුම් අංශයේ සහභාගීත්වයක් නොමැති බවත් නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් මාසිකව බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී, මුදල් පොතේ මාසයක් අවසානයේ ඇති ශේෂයන් හා බැංකු සැසඳුම සකස් කිරීමේදී සලකා ඇති මුදල් පොතේ මාසික අවසාන ශේෂ අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) මෙම මෘදුකාංගයේ ගිණුම් කටයුතු කිරීමේදී මුරපද (Password) පාලනය ඉතා දුර්වල මට්ටමක පවතින බැවින් ගිණුම් පද්ධතිය වෙත ඕනෑම නිලධාරියෙකුට ඇතුළු වීමේ අවධානමක් පැවතුණි.

# ස්වාධීන විගණකගේ වාර්තාව

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඈ) පෞද්ගලික විගණන සමාගමක් වෙත රු. 1,150,000 ක් ගෙවා 2016 මැයි සිට ජුනි දක්වා කාලපරිච්ඡේදය සඳහා අරමුදලේ පද්ධති විගණනයක් සිදුකර තිබුණි. එහිදී පෙන්වා දී ඇති පරිදි අග්‍රහාර අංශයේ දත්ත පද්ධතියේ ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වන විටත් කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | විගණන නිරීක්ෂණ |
|---|---|---|
| (අ) මූල්‍ය පාලනය | (i) | චෙක්පත් අංක, මුදල් පොතට ඇතුළත් කිරීම නිවැරදිව සිදු කර නොතිබීම. |
| | (ii) | විගණනයට ඉදිරිපත් කර ඇති බැංකු සැසඳුම් පිළියෙල කළ දිනය සඳහන් නොවීම. |
| | (iii) | මාසික හා කාර්තු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඇතැම් වියදම් මුදල් පදනමට ගිණුම්ගත කර තිබීම. |
| | (iv) | සුළු මුදල් පොත් ශේෂ හා භෞතික ශේෂ අතර විචලනයක් පැවතීම, සුළු මුදල් වවුචර් සහතික නොකිරීම හා අනුමත නොකිරීම, විධිමත් ලෙස වවුචර් අංක යොදා නොතිබීම. |
| | (v) | අරමුදලේ SRCC & TR අංශය සඳහා යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| | (vi) | ආපදා ණය ලේඛනය විධිමත්ව නඩත්තු නොකිරීම. |
| | (vii) | අවශ්‍යතාවය අනුව, නිවැරදි ඇස්තමේන්තු සකස් කර අත්තිකාරම් ලබාදී නොදීම. |

(viii) ජ'නල් සටහන් යෙදීමේදී ජ'නල් වවුචර පිළියෙල කර අනුමත කර නොතිබීම හා Sage Accpacc වෙත යාවත්කාලීන කරන ද්විත්ව සටහනේ මුද්‍රිත පිටපතක් ලබාගෙන එහි සකස් කිරීම, පරීක්ෂා කිරීම, අනුමත කිරීමට අදාළ නිලධාරීන් අත්සන් යොදා තිබුණු අවස්ථා පමණක් නිරීක්ෂණය වීම.

(ix) ආයතනයෙන් තැපැලට යොමු කරන සියලුම චෙක්පත් අදාළ ලේඛනයේ සටහන්ව නොතිබීම.

(ආ) ගිණුම්කරණය

(i) සාමාන්‍ය රක්ෂණය - මෝටර් නොවන අංශයයේ විකුණුම් ඉන්වොයිස් පෙර අංක යෙදූ පිළිවෙලින් පරිගණක ගත පද්ධතියක් ඇසුරින් ජනනය නොකෙරුණු නිසා පරිගණක පද්ධතියෙන් ලබා ගන්නා ණයගැති ශේෂ ලැයිස්තුවෙහි ඇතුළත් ඉන්වොයිස් අංක හා අදාළ අංශයෙහි පවත්වාගෙන යන ඉන්වොයිස් ලේඛනයෙහි සඳහන් අංක අතර වෙනස්කම් නිරීක්ෂණය වීම.

(ii) සියලු මුදල් හෝ චෙක්පත් ලැබීම් සඳහා ලදුපතක් නිකුත් නොකිරීම.

(iii) ජ'නල් සටහන් අනුමත කිරීමේ සීමාවන් (Limits) තීරණය නොකිරීම.

(iv) ජර්නල් සටහන් නිසි අනුමැතියකින් යුතුව ගිණුම්කරණ පද්ධතියට ඇතුළත් නොකිරීම හා ඊට අදාළ සාක්ෂි ලෙස අදාළ උපයෝගී ලේඛනවලට යොමුවක් නොදැක්වීම.

(ඇ) මානව සම්පත් කළමනාකරණය

(i) අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව බඳවා ගැනීම් සිදු නොකිරීම.

(ii) සම්මුඛ පරීක්ෂණ මණ්ඩල විධිමත්ව පත් නොකිරීම.

# ස්වාධීන විගණකගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

(ඇ) ශාඛා කළමනාකරණය

(i) චක්කම් කළමනාකරණයේ අඩුපාඩු පැවතීම.

(ii) ප්‍රධාන කාර්යාලයෙන් ලැබෙන තාවකාලික රක්ෂණ ආවරණ පොත් (cover note) හා මුද්‍රිත ආකෘති පත්‍ර පිළිබඳ විධිමත් ලේඛන නොමැති වීම.

(iii) ඒවා අස්ථානගතවීම්වලට අදාළ විධිමත් සාක්ෂි නොමැති වීම.

(iv) තාවකාලික රක්ෂණ ආවරණ පොත් (Cover Note Book) භාවිතය විධිමත් නොවීම.

(v) අබලි ද්‍රව්‍ය හා රක්ෂණ කාඩ්පත් වලට අදාළව විධිමත් ලේඛනයක් නොමැති වීම

(vi) සුළු මුදල් පාලනය සම්බන්ධ ගැටළු පැවතීම.

(vii) පැමිණීම, පිටවීම, නිවාඩු හා බැහැරයාමේ ක්‍රමයක් විධිමත් නොවීම.

(viii) උප කාර්යාලවල එකතු කරන ලද මුදල් බැංකුවේ තැන්පත් කිරීමේදී ප්‍රමාදයන් සිදුවීම.

(ix) අග්‍රහාර අයදුම්පත් ස්කෑන් (Scan) කිරීමේදී අයදුම්පත් විධිමත්ව භාරනොගැනීම හා ස්කෑන් කරන ලද අයදුම්පත් විධිමත්ව බැහැර නොකිරීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| අස්පෘශ්‍ය වත්කම් | 7 | - | - |
| දේපළ, පිරියත හා උපකරණ | 8 | 43,058,543 | 34,125,797 |
| මූල්‍ය වත්කම් | 9 | 11,187,844,373 | 10,388,972,726 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ | | 5,528,802,851 | - |
| ලැබිය යුතු වාරික | 10 | 1,340,840,446 | 1,060,898,025 |
| මෘදු ණය | 11 | 67,081,271 | 129,244,611 |
| වෙනත් මූල්‍ය නොවන වත්කම් | 12 | 159,891,434 | 32,307,438 |
| විලම්බිත කොමිස් | 13 | 482,908,910 | 421,132,953 |
| අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල | 14 | 705,205,727 | 166,785,332 |
| **මුළු වත්කම්** | | **19,515,633,556** | **12,233,466,883** |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| රඳවා ගත් ඉපයුම් | | 7,831,705,609 | 8,744,382,870 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ අනෙකුත් අංග | | (266,847,481) | (88,871,109) |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය** | | **7,564,858,128** | **8,655,511,761** |
| **වගකීම්** | | | |
| රක්ෂණ ගිවිසුමේ වගකීම් | 18 | 9,795,236,509 | 3,257,914,116 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 19 | 15,090,870 | 16,458,008 |
| වෙනත් වගකීම් | 15 | 1,865,533,436 | 303,582,998 |
| බැංකු අයිරා | 14 | 274,914,611 | - |
| මුළු වගකීම් | | 11,950,775,427 | 3,577,955,122 |
| **මුළු ස්කන්ධ ප්‍රග්ධනය හා වගකීම්** | | **19,515,633,555** | **12,233,466,883** |

අරමුදලේ මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරමි.

**මූල්‍ය නිලධාරි**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 73 සිට 95 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශ වල අනුකල අංගයන් වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබා ඇත.

**අධ්‍යක්ෂ** | **අධ්‍යක්ෂ**

2017 නොවැම්බර් 01
කොළඹ

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31න් අවසන් වර්ෂය | සටහන් | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය | 1 | 6,813,757,955 | 5,062,685,701 |
| අග්‍රහාර සඳහා ලද දායක මුදල් | 1 | 2,004,436,602 | 1,636,567,419 |
| රැස්කළ වගා රක්ෂණ බදු | | 1,511,302,032 | 1,259,134,207 |
| ප්‍රතිරක්ෂණ වාරික අගය | | (760,552,873) | - |
| **ශුද්ධ ලිඛිත වාරිකය** | | **9,568,943,716** | **7,958,387,326** |
| නොඉපයූ වාරික සඳහා සංචිතයන්හි ශුද්ධ වෙනස | | (718,437,265) | (26,901,647) |
| **ශුද්ධ වාරික ඉපයුම්** | | **8,850,506,451** | **7,931,485,679** |
| | | | |
| **වෙනත් මෙහෙයුම් වලින් ලද ආදායම්** | | | |
| ගාස්තු සහ කොමිස් අදායම් | 2 | 4,704,803 | 6,596,760 |
| ආයෝජන සහ අනෙකුත් ආදායම් | 3 | 983,984,377 | 849,786,808 |
| **අනෙකුත් ආදායම්** | | **988,689,180** | **856,383,568** |
| | | | |
| දළ ප්‍රතිලාභ හා හිමිකම් ගෙවීම් | 4 | (5,761,417,865) | (3,227,140,119) |
| ප්‍රතිරක්ෂකයින් වෙත පැවරූ හිමිකම් | 4 | 6,868,180,969 | - |
| ගිවිසුම් ගත වගකීම් හි දළ වෙනස | 4 | (6,649,917,802) | 1,562,913 |
| ප්‍රතිරක්ෂණ ගිවිසුම් ගත වගකීම් හි වෙනස | 4 | - | - |
| **ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම්** | | **(5,543,154,699)** | **(3,225,577,206)** |
| | | | |
| ප්‍රාරක්ෂණ සහ අත්පත්කර ගැනීමේ පිරිවැය (ප්‍රතිරක්ෂණ ඇතුළුව) | 5 | (1,068,320,881) | (946,632,594) |
| | | | |
| අනෙකුත් මෙහෙයුම් හා පරිපාලන වියදම් | 6 | (387,968,196) | (224,939,681) |
| | | | |
| **මුළු ප්‍රතිලාභ, හිමිකම් හා අනෙකුත් වියදම්** | | **(6,999,443,776)** | **(4,397,149,482)** |
| **බදු පෙර ලාභය /(අලාභය)** | | **2,839,751,855** | **4,390,719,765** |
| ආදායම් බදු වියදම | | - | (86,822,200) |
| **වර්ෂයේ ලාභය / (අලාභය)** | | **2,839,751,855** | **4,303,897,565** |
| | | | |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | | |
| අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් වල ශුද්ධ වෙනස | | (182,717,265) | (261,686,342) |
| පාරිතෝෂික තක්සේරුව මත ආයුගණක ඉපයීම් | | 4,740,893 | |
| **වසර සඳහා අනෙකුත් විස්තීරණ වියදම්, බදු පසු** | | **(177,976,372)** | **(261,686,342)** |
| **මුළු විස්තීරණ ආදායම** | | **2,661,775,484** | **4,041,637,990** |

# ස්කන්ධ ප්‍රාග්ධනයේ සිදුවූ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | රඳවාගත් ඉපයුම් රු. | විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් රු. | මුළු ස්කන්ධ ප්‍රාග්ධනය රු. |
|---|---|---|---|
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **6,949,244,214** | **17,624,148** | **6,966,868,362** |
| වර්ෂයේ ලාභය | 4,582,655,586 | - | 4,582,655,586 |
| අනෙකුත් විස්තීරණ ආදායම් | | | |
| විකිණීමට ඇති මූල්‍ය ආයෝජනවල ශුද්ධ වෙනස | - | 155,191,084 | 155,191,084 |
| මෝටර් වාහන සමුච්චිත ක්ෂය ගැලපුම් | 14,558,589 | - | 14,558,589 |
| ලාභ කොමිස් නැවත ලිවීම හා නැවත අයකර ගැනීම - ප්‍රති රක්ෂණ අංශය | 12,287,375 | - | 12,287,375 |
| වැ.කැකෝ.සි.අ.තු.ක්‍රි. ගෙවියයුතු හා ප්‍රතිරක්ෂණ වාරික නිවැරදි කිරීම් | (10,268,621) | - | (10,268,621) |
| 2013 ට අදාළ ක්ෂය | (511,780) | - | (511,780) |
| ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවුම් පද්ධති ආදායම් නිවැරදි කිරීම් | 2,055,047 | - | 2,055,047 |
| සේ.භා.අ. සහ මුද්දර බදු නිවැරදි කිරීම | 199,305 | - | 199,305 |
| ඒකාබද්ධ අරමුදලට මාරුකල මුදල් | (4,000,000,000) | - | (4,000,000,000) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,550,219,714** | **172,815,232** | **7,723,034,946** |
| වර්ෂයේ ලාභය | 4,303,897,565 | - | 4,303,897,565 |
| විකිණීමට ඇති මූල්‍ය ආයෝජනවල ශුද්ධ වෙනස | | (261,686,342) | (261,686,342) |
| ඇපකර වට්ටම් ක්‍රමක්ෂය | 50,321,582 | - | 50,321,582 |
| කපා හරින ලද ප්‍රතිරක්ෂණ ලදුපත් හා ණයපත් | (92,421,039) | - | (92,421,039) |
| වාර්ෂික ගාස්තු හා සෙස් බදු | (24,370,817) | - | (24,370,817) |
| නොගෙවූ ප්‍රතිරක්ෂණ නිවැරදි කිරීම | (60,170,679) | - | (60,170,679) |
| මෝටර් වාහන නොවන වාරික කපා හැරීම | (1,995,673) | - | (1,995,673) |
| ක්ෂය නිවැරදි කිරීම් | (583,958) | - | (583,958) |
| මෝටර් වාහන වාරික නිවැරදි කිරීම | 4,668,666 | - | 4,668,666 |
| වාරික නැවත ලබාදීමේ ගැලපුම් | 2,574,100 | - | 2,574,100 |
| දේ.පි.උ. සමුච්චිත ක්ෂය ගැලපුම් | 11,643,799 | - | 11,643,799 |
| වියදම් හා වෙනත් පියවීම් ප්‍රතිපූර්ණය | 599,610 | - | 599,610 |
| ඒකාබද්ධ අරමුදලට මාරුකල මුදල් | (3,000,000,000) | - | (3,000,000,000) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **8,744,382,870** | **(88,871,109)** | **8,655,511,761** |
| වර්ෂයේ ලාභය | 2,839,751,855 | - | 2,839,751,855 |
| විකිණීමට ඇති මූල්‍ය ආයෝජනවල ශුද්ධ වෙනස | - | (182,717,265) | (182,717,265) |
| පාරිතෝෂික තක්සේරුව මත ආයුගණක | - | 4,740,893 | 4,740,893 |
| කපා හරින ලද ප්‍රතිරක්ෂණ ලදුපත් | (34,714,833) | - | (34,714,833) |
| ඒකාබද්ධ අරමුදලට මාරුකල මුදල් | (3,200,000,000) | - | (3,200,000,000) |
| 2012/13 සඳහා ගෙවියයුතු ආදායම් බදු | (578,674,926) | - | (578,674,926) |
| ඇපකර වට්ටම් ක්‍රමක්ෂය | 47,663,316 | - | 47,663,316 |
| ක්ෂය ගැලපීම් | 2,614,431 | - | 2,614,431 |
| වාරික ආපසු ගෙවීම් ගැලපුම් | 7,306,615 | - | 7,306,615 |
| ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවුම් ආදායම් මෝටර් වාහන නොවන | 22,500 | - | 22,500 |
| මෝටර් වාහන රක්ෂණ වාරික | (75,000) | - | (75,000) |
| කපා හළ තැන්පතු ගෙවීම් | (392,000) | - | (392,000) |
| ප්‍රතිරක්ෂණ වාරික ගැලපීම් | 3,869,230 | - | 3,869,230 |
| බදුකුලී පිරිවැය | (48,450) | - | (48,450) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **7,831,705,610** | **(266,847,481)** | **7,564,858,128** |

ගණකාධිකරණ ප්‍රතිපත්ති හා මෙහි පිටු අංක 73 සිට 95 දක්වා සඳහන් සටහන් මූල්‍ය ප්‍රකාශවල අනුකල අංගයක් වන්නේය. වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා වලින් අඩුකිරීම් දක්වා ඇත.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා | | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතු මඟින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | | |
| බදු පෙර ලාභය | | 2,839,751,855 | 4,390,719,765 |
| ගැලපීම්: | | | |
| පොළී ආදායම් | | (967,301,878) | (801,608,493) |
| ක්ෂය කිරීම් | | 7,056,814 | 6,579,710 |
| ශුද්ධ සාධාරණ වටිනාකම් වෙනස්වීම් | | (177,976,372) | (261,686,342) |
| පෙර වර්ෂයට අදාළ ගැලපීම් | | (555,043,548) | (109,734,409) |
| ස්ථාවර වත්කම් බැහැරකිරීමේ ලාභ/ (අලාභ) | | - | 1,096,675 |
| | | **1,146,486,872** | **3,225,366,907** |
| මෙහෙයුම් වත්කම්වල වෙනස් වීම් | අ | (5,998,105,224) | 80,893,698 |
| මෙහෙයුම් වගකීම් වල වෙනස් වීම් | ආ | 8,098,135,583 | 129,564,810 |
| මෙහෙයුම් කටයුතු මඟින් ජනිත වූ මූල්‍ය ප්‍රවාහ | | 3,246,517,230 | 3,435,825,416 |
| ගෙවූ පාරිතෝෂික | | (229,889) | (646,511) |
| මෙහෙයුම් කටයුතු මඟින් ජනිත වූ ශුද්ධ මුදල් | | 3,246,287,341 | 3,435,178,905 |
| **ආයෝජන කටයුතු මඟින් ජනිත වූ මූල්‍ය ප්‍රවාහ** | | | |
| මූල්‍ය ආයෝජනවල ශුද්ධ ප්‍රතිග්‍රහණ | | (798,871,647) | (1,283,398,847) |
| ලද පොළී | | 967,301,878 | 703,726,452 |
| මෘදු ණය ආපසු අයකරගැනීම් | | 62,163,340 | 58,976,296 |
| දේපල, පිරියත, හා උපකරණ බැහැර කිරීම | | - | 15,500 |
| දේපල, පිරියත, හා උපකරණ ප්‍රතිග්‍රහණය | | (13,375,128) | (4,505,960) |
| ආයෝජන කටයුතු සඳහා යෙදවූ ශුද්ධ මුදල් | | 217,218,443 | (525,186,559) |
| **මූල්‍යකරණ කටයුතු මඟින් ජනිත වූ මූල්‍ය ප්‍රවාහ** | | | |
| ඒකාබද්ධ අරමුදලට මාරුකළ මුදල් | | (3,200,000,000) | (3,000,000,000) |
| මූල්‍යකරණ කටයුතු සඳහා යෙදවූ ශුද්ධ මුදල් | | (3,200,000,000) | (3,000,000,000) |
| මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | ඇ | 263,505,784 | (90,007,654) |
| වර්ෂය මුල පැවති මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ අගය | | 166,785,332 | 256,792,986 |
| වර්ෂය අවසානයේ පැවති මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල අගය | | 430,291,116 | 166,785,332 |
| **මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ සටහන්** | | | |
| **අ. මෙහෙයුම් වත්කම්වල වෙනස් වීම** | | | |
| විලම්බිත කොමිස් (වැඩිවීම)/අඩුවීම | | (61,775,957) | (54,511,252) |
| අයවියයුතු ප්‍රතිරක්ෂණ වාරික (වැඩිවීම)/අඩුවීම | | (5,528,802,851) | - |
| අයවියයුතු රක්ෂණ වාරික (වැඩිවීම)/අඩුවීම | | (279,942,420) | 83,361,009 |
| වෙනත් මූල්‍ය නොවන වත්කම්වල (වැඩිවීම)/අඩුවීම | | (127,583,996) | 52,043,941 |
| | | (5,998,105,224) | 80,893,698 |
| **ආ. මෙහෙයුම් වගකීම්වල වෙනස් වීම** | | | |
| රක්ෂණ ගිවිසුම්ගත වගකීම් (වැඩිවීම)/අඩුවීම | | 6,537,322,393 | 17,654,772 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් (වැඩිවීම)/අඩුවීම | | (1,137,249) | 5,740,215 |
| වෙනත් වගකීම්වල (වැඩිවීම)/අඩුවීම | | 1,561,950,438 | 106,169,823 |
| | | 8,098,135,583 | 129,564,810 |
| **ඇ. මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල වැඩිවීම/(අඩුවීම)** | | | |
| වර්ෂය අවසානයේ පැවති මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ අගය | | 430,291,116 | 166,785,332 |
| අඩුකළා :වර්ෂය මුල පැවති මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ අගය | | 166,785,332 | 256,792,986 |
| මුදල් සහ මුදල් හා සමාන වත්කම්වල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම | | 263,505,784 | (90,007,654) |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

### 1.0 ආයතනික තොරතුරු

#### 1.1 වාර්තා කරනු ලබන ආයතනය

2007 අංක 28 දරන සංශෝධන පනතින් සංශෝධිත ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය (මණ්ඩලය) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කර ඇත. මෙහි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ අංක 97, මරදාන පාර, කොළඹ 10 වන අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ද එම ලිපිනයෙහිම පිහිටා ඇත.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලය ලබාදීමේ දිනය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 ඔක්තෝබර් මස 31 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දී ඇත.

#### 1.3 මව් සමාගම සහ පරම මව් සමාගම

අධ්‍යක්ෂ මණ්ඩලයේ මව් සමාගම සහ පරම මව් සමාගම වන්නේ ශ්‍රී ලංකා රජයයි.

#### 1.4 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වරූපය

මෙම මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම් වනුයේ සාමාන්‍ය රක්ෂණ කටයුතු සහ ප්‍රතිරක්ෂණ කටයුතු ඉටු කිරීම වේ. සමාලෝචිත කාලය තුළ මෙම ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වෙනස්කම් සිදු වී නොමැත.

#### 1.5 මූල්‍ය ප්‍රකාශන සඳහා වන වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි.

#### 1.6 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

අන්‍යාකාරයෙන් දක්වා ඇති අවස්ථාවන්හි දී හැර අන් සෑම විටම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් සකස් කර ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට පහත සඳහන් අයිතමයන් ඇතුළත් වේ:

- වර්ෂ අවසානයේදී මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පැහැදිලි කෙරෙන තොරතුරු ඇතුළත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් (පිටු අංක 69 බලන්න)
- සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු නිරූපනය කරන ලාභ හෝ අලාභ සහ වෙනත් මෙහෙයුම් ආදායම් ඇතුළත් ප්‍රකාශයන් (පිටු අංක 70 බලන්න)
- ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්කම් නිරූපනය වන පරිදි ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශයක් (පිටු අංක 71 බලන්න)
- මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය මගින් මණ්ඩලයට මුදල් සහ මුදල් හා සමාන වත්කම් උත්පාදනය කිරීමටත්, එවැනි මූල්‍ය ප්‍රවාහ උපයෝජනයටත් මණ්ඩලය සතු හැකියාව පිළිබඳ තොරතුරු පරිශීලකයන් වෙත ලබාදෙනු ලබන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයක් (පිටු අංක 72 බලන්න)
- ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ වෙනත් මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු පැහැදිලි කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්. (පිටු අංක 73 සිට 95 දක්වා බලන්න)

#### 1.7 සේවක සංඛ්‍යාව

2016 දෙසැම්බර් 31 දිනට ආයතනයේ කාර්ය මණ්ඩල සංඛ්‍යාව 206 කි (2015-186)

### 2.0 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම්කරන ප්‍රතිපත්ති වල වෙනස්වීම්

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී මෙහි අන්‍යාකාරයකින් සඳහන්කර ඇත්තම් මිස, පහතින් දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීමකින් තොරව අඛණ්ඩව යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

#### 2.1 පිළියෙල කිරීමේ පදනම

##### 2.1.1 අගය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් සකස් කර ඇති අතර විකිණීමට ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම පදනම්ව අගය කිරීම හැරුණු විට අනෙකුත් වත්කම් ඓතිහාසික පිරිවැය පදනම්ව අගය කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ ප්‍රමිති අංක 4 මගින් අවසර දී ඇති පරිදි එම ප්‍රමිතිය පිළිගැනීමට පෙර පැවති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව රක්ෂණ ගිවිසුම් සඳහා වන ගිණුම් ප්‍රමිති පිළිපදිමින් මණ්ඩලය මගින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

මණ්ඩලය මගින් වඩා පුළුල් ලෙස ද්‍රවශීලතාව පදනම්ව මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන සඳහා උද්ධමනය මගින් ඇති කරන බලපෑම සඳහා ගැලපීම් සිදු කර නොමැත.

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙක හිලව් කිරීම් කර ඇති අතර මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශන තුළ ශුද්ධ වටිනාකම පමණක් නිරූපනය කරයි. නෛතිකව ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති බවට තොරතුරු ඇති විටෙක දී හැර වටිනාකම් හඳුනා ගෙන හිලව් කිරීමට අවස්ථාව ඇති විටෙක පමණක් මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කිරීම් කර ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

##### 2.1.2 ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකක

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර සියලුම මූල්‍ය තොරතුරු අන්‍යාකාරයෙන් දක්වා ඇත්නම් මිස, ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්න රුපියලට ගණනය කර ඉදිරිපත් කර ඇත.

##### 2.1.3 ප්‍රමාණාත්මකභාවය හා සමාහරණය

සෑම කුඩා අයිතමයක්ම ප්‍රමාණාත්මකභාවය පිළිබඳ අවධානය යොමු කර ඛාණ්ඩගත කර වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන අවස්ථාවල දී හැර එවැනි සමානතාවයක් නොමැති අයිතමයන් වෙන් වශයෙන් සලකා වාර්තා ගත කර ඇත.

#### 2.2 වාර්තා ගත කරනු ලබන කාලය

වාර්තා ගත කරනු ලබන කාලය 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වේ.

අවශ්‍ය අවස්ථාවලදී අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුම්කරන ප්‍රතිපත්තීන් පහත පැහැදිලි කර ඇත.

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

## 2.3 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දි කළමනාකාරීත්වය මගින් විනිශ්චයන්, ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පනයන් කළ යුතු වන අතර ඒවා ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදා ගැනීම් සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වටිනාකම් හඳුනා ගැනීමට ද බලපෑමක් ඇති කරයි. සත්‍ය තත්ත්වයන් මෙම ඇස්තමේන්තු ගත වටිනාකම් සමඟ වෙනස්වීමට ද හැකියාව ඇත.

ඇස්තමේන්තු සහ පදනම් කරගත් උපකල්පනයන් ඓතිහාසික පිරිවැය මත සහ වෙනත් සාධක මත පදනම් වන අතර ඒවා පවත්නා වෙනත් සාධක සහ තොරතුරු මත පදනම්ව පවතින වත්කම් සහ වගකීම්වල ඉදිරියට ගෙන එනු ලබන වටිනාකම තක්සේරුවට භාජනය කර ඇත. ඇස්තමේන්තු සහ පදනම් කරගත් උපකල්පනයන් අඛණ්ඩ පදනමින් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර ඒ අනුව ගිණුම්කරණ ඇස්තමේන්තු වලට කරනු ලබන සංශෝධනයන් හඳුනා ගනු ලබන්නේ එම ඇස්තමේන්තු සංශෝධනයන් සිදු වූවහොත් සහ එය අනාගත කාලයට බලපෑමක් ඇති කරයි නම් පමණි.

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදා ගැනීමේ දී කරනු ලබන තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු සහ ඒවා සැලකිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වටිනාකම් තුළට බලපෑමක් ඇති කර ඇස්තමේන්තු කිරීම් පහත පරිදි සටහන් මගින් ඉදිරිපත් කර ඇත.

### 2.3.1 රක්‍ෂණ ගිවිසුම්වල වගකීම් තක්සේරුව

සාමාන්‍ය රක්‍ෂණ සහ ප්‍රතිරක්‍ෂණ ගිවිසුම්වලට අදාළව වාර්තා කරනු ලබන දිනට ඉදිරිපත් විය හැකියයි අපේක්ෂිත හිමිකම් පිරිවැය අත්‍යන්ත වටිනාකමට ඇස්තමේන්තු කර ඇති අතර එම ඉදිරිපත් වන හානි පූර්ණ අයදුම්පත්වල ගෙවීමට සිදුවන අත්‍යන්ත වටිනාකම නිශ්චිතව හඳුනා ගැනීමට සැලකියයුතු කාලයක් ගත විය හැක.

විශාල වටිනාකමින් යුතු හානි පූර්ණයන් වෙන් වශයෙන්ම ගෙන සලකා බලා අලාභයන් හි මුහුණත වටිනාකම යළි තක්සේරු කිරීම හෝ සංශෝධනය කිරීම හෝ අනාගත තත්ත්වයන් නිරූපනය වන පරිදි බොහෝ අවස්ථාවල දී අගය කිරීම් කරනු ලැබුව ද උද්ධමනය හෝ අලාභ ලැබීමේ සම්භාවිතාව පදනම්ව පෙර වර්ෂවල හානි ප්‍රතිපූර්ණයන් වල වර්තමාන වටිනාකම තක්සේරුවට භාජනය කරනු ලබයි. උපයා නොමැති වාරික වටිනාකම තක්සේරු කිරීමේ දී ද මේ හා සමාන විනිශ්චයන් ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පනයන් යොදා ගෙන ඇත.

රක්‍ෂණ ආවරණ සහිත තුවාලකරුවන් මත ඉදිරිපත් වන හානි පූර්ණයන්ට අදාළව වටිනාකම් තක්සේරු කිරීමේ දී වැඩි වශයෙන් මෙම විනිශ්චයන් මත පදනම්ව ඇස්තමේන්තු කිරීම් කළ යුතු වේ. මෙහි දී කාලය පිළිබඳ වැඩි අවධානයක් යොමු නොවනු ඇත.

### 2.3.2 විලම්බිත ප්‍රතිග්‍රහන පිරිවැයෙහි අගය අඩු වීම

සෑම වාර්තා කරන දිනකම විලම්බිත ප්‍රතිග්‍රහන පිරිවැය පිළිබඳ අගය අඩු වී ඇතිදැයි සමාලෝචනයක් සිදු කරයි. ඉදිරියට ගෙන ආ වටිනාකමට වඩා අයකරගත හැකි මුදල අඩුනම් එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි අවකරන පාඩුවක් ලෙස හඳුනා ගනී. සමාලෝචිත වර්ෂය තළ එවැනි අගය අඩුවීමක් දක්නට නොතිබිනි. අදාළ කොන්ත්‍රාත් හිලව් කර හෝ අවලංගු කර ඇතිවිට ප්‍රතිග්‍රහන පිරිවැය ඉවත් කරනු ලබයි.

### 2.3.3 අගය අඩු වීම පිළිබඳ තක්සේරු කිරීම

සෑම වාර්තා කරනු ලබන දිනකටම මණ්ඩලය මගින් කිසියම් වත්කමකට හෝ මුදල් උත්පාදන ඒකකයක අගය අඩුවීමකට බලපාන සාධක ඇති බවට හඳුනාගැනීමක් හෝ තත්ත්වය වර්ධනය වීමක් තිබේ නම් ඒ පිළිබඳ තක්සේරුවක් කරනු ලබයි. මේ සඳහා අදාළ වත්කමහේ හෝ මුදල් උපයන ඒකකයෙහි වටිනාකම පිළිබඳ තක්සේරුවක් කළ යුතු වේ. මෙම තක්සේරු කිරීම් සඳහා කළමනාකාරීත්වය මගින් එම වත්කම්වල හෝ මුදල් උත්පාදන ඒකකවල අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමක් සහ ඒවායෙහි වර්තමාන වටිනාකම සොයා ගැනීම සඳහා සුදුසු වට්ටම් ප්‍රතිශතයක් තෝරා ගැනීම ද කළ යුතු වේ. මෙම අගයකිරීම් සඳහා මණ්ඩලය මගින් අනාගත මුදල් ප්‍රවාහ සහ වට්ටම් අනුපාත පිළිබඳ ඇස්තමේන්තු කිරීමක් කළ යුතු වේ. ඒ සඳහා ඔවුන් අවිනිශ්චතතාවන්ට ද මුහුණ දෙනු ඇත.

### 2.3.4 වගකීම් සහ අවදානම් සඳහා ප්‍රතිපාදන

සාමාන්‍ය ව්‍යාපාරික පරිසරය තුළ මණ්ඩලයට නීත්‍යානුකූල හානි ප්‍රතිපූර්ණයන් ඉදිරිපත් කෙරෙයි. කළමනාකාරීත්වය මගින් එම ප්‍රතිපූර්ණයන් සඳහා ඉදිරිපත් වීමට ඇති සම්භාවිතාව පදනම්ව ඒ සඳහා වෙන් කිරීම් කරනු ලබයි. මෙහි දී නෛතික හානි පූර්ණයක් හිමි වීම සඳහා වන කාලය අවිනිශ්චිත වන අතර ඒ නිසා ද ආර්ථික ප්‍රතිලාභයන් ඇති කරයි. නියමිත නෛතික තීරණයන් ලැබීමට ගත වන කාලය සහ ඊට දරණ පිරිවැය අවසාන වශයෙන් රඳා පවතිනුයේ ඒ සඳහා ගත වන කාලය මත වේ.

සමාලෝචිත වර්ෂය තුළ, නඩු කාර්ය ප්‍රතිපාදන වශයෙන් සමස්ත නෛතික හිමිකම් වලින් 15%ක් වෙන් කිරීමට මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

### 2.3.6 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් තක්සේරු කිරීම - පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ ඔප්පු සම්බන්ධයෙන් ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති වගකීම වන්නේ වාර්තා කරන දිනට පවත්නා නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වත්මන් වටිනාකමයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 - කාර්ය මණ්ඩල ප්‍රතිලාභ - ප්‍රමිතියට අනුව වාර්තා කරන දිනට පවතින නිශ්චිත ප්‍රතිලාභ වගකීම සුදුසුකම්ලත් ආයුගණක තක්සේරුකරුවෙකු විසින් ප්‍රක්ෂේපිත ඒකක හර ක්‍රමවේදය (PUC) යොදාගනිමින් ගණනය කරනු ලැබේ. ආයුගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාතය, වැටුප් වර්ධක අනුපාතය හා සේවය කිරීමට ඉතිරිව ඇති කාලය ආදිය පිළිබඳව උපකල්පන සිදුකිරීම අවශ්‍ය වේ.

ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ වගකීම ප්‍රති-ගණනය කිරීමේදී එම වගකීම සමන්විත වන ආයුගණක ලාභ හෝ අලාභ වහාම වෙනත් විස්තීරණ ආදායම් වල ඇතුළත් කරනු ලැබේ.

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයෙකු අඛණ්ඩ වසර පහක සේවා කාලයක් සම්පූර්ණ කළ විට පාරිතෝෂික

ලැබීමට හිමිකම් ලබයි. එහෙත් එසේ පාරිතෝෂික ගෙවීම සඳහා පිටතින් ප්‍රතිපාදන හිමි නොවේ.

2016 වසරේදී විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම තක්සේරු කිරීමේ ගණකාධිකරණ ප්‍රතිපත්තිය වෙනසකට ලක් වූ අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 - කාර්ය මණ්ඩල ප්‍රතිලාභ - මඟින් නිර්දේශිත පරිදි ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමවේදය යොදාගනිමින් ආයුගණක තක්සේරුකිරීමේ ක්‍රමවේදය ප්‍රථමවරට යොදාගැනීම මෙහිදී සිදුවිය.

2015 වසර සඳහා ද එම ක්‍රමවේදය අනුගමනය කරන ලද අතර අදාළ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම හා බැරකම් ප්‍රතිසටහන් කරන ලදුව, විස්තීර්ණ ආදායම කෙරෙහි එමඟින් වූ බලපෑම පහත පරිදි වාර්තා කරන ලදී. 2015. 12. 31 දිනට මූල්‍ය තත්ත්වයේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම හා බැරකම රු. 573,234 කින් අඩුවූ අතර 2015 විස්තීර්ණ ආදායමේ විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය රු. 573,234 කින් අඩුවිය. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීමේ සංචලනය මූල්‍ය තත්ත්වය පිළිබඳ සටහන් 19හි දක්වා ඇත.

**2.3.7 නාමික බදු බැර (රඳවා ගැනීමේ බදු)**

මණ්ඩලය මගින් අනාගත බදු අය කළ හැකි ආදයම තක්සේරු කරනු ලබන අතර ඊට එරෙහිව ගෙවන ලද නාමික බදු බැර හිලව් කිරීම් සඳහා හිමිකම් ඇත. මෙහි දී මණ්ඩලය මගින් ගෙවන ලද නාමික බදු ලාභ අලාභ ගිණුමට සටහන් කරනු ලබන අතර එම නාමික බදු මුදල නුදුරු අනාගතය තුළ මණ්ඩලයට හිලව් කර ගැනීමක් අපේක්‍ෂා කළ නොහැකි. කෙසේ වෙතත් අනාගතයේ දි මණ්ඩලයට බදු අය වන ආදායම් ඉපයීමක දී එය ආපසු ලබා ගෙන එලෙස ලියා හැර ඇති නාමික බදු ප්‍රයෝජනයට ගත හැකි වනු ඇත.

**2.3.8 අඛණ්ඩ පැවැත්ම**

මණ්ඩලයෙහි කළමනාකාරීත්වය මගින් ඇගයීමට ලක් කළ පරිදි මණ්ඩලයට අඛණ්ඩ පැවැත්මකින් යුතුව ව්‍යාපාරික කටයුතු නුදුරු අනාගතයක් දක්වා කර ගෙන යාහැකි අතර එයට එම අවශ්‍යතා සඳහා සියලු සම්පත් ඇති බව ද නිරීක්‍ෂණය කර ඇත. ප්‍රවර්ථන ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් පවත්වාගෙන යෑමේ මණ්ඩලයේ හැකියාව පිළිබද සැලකිය යුතු සැකයක් ඇතිකරන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පිළිබඳව මණ්ඩලයට දැනගැනිමට ලැබී නැත. ඒ හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය පදනම්ව මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

සැලකිය යුතු අවිනිශ්චිතතාවයෙන් යුතු ඇස්තමේන්තු කිරීමේ ප්‍රමාණාත්මක විනිශ්චයන් යොදා ගනිමින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් භාවිතයට ගැනීමේ දී ඒ පිළිබඳ තොරතුරු ගිණුම් වාර්තා සමග ඉදිරිපත් කර ඇති වටිනාකම්වල ඇතුළත් වන අතර ඊට අදාළ තොරතුරු මේ සමඟ ඉදිරිපත් කර ඇත.

## 2.4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

**2.4.1 අස්පෘෂ්‍ය වත්කම්**

වෙන් වෙන් වශයෙන් අත්පත් කරගෙන ඇති අස්පෘෂ්‍ය වත්කම් අගය කිරීම ආරම්භක පිරිවැය පදනම්ව කර ඇති අතර පහත මූලිකවම හඳුනාගත් අස්පෘෂ්‍ය වත්කම් ඉදිරියට ගෙනවිත් ඇත්තේ පිරිවැයෙන් ඉදිරියට ගෙන ආ ලියාහැරීමේ වටිනාකමට අඩු කිරීමෙන් අනතුරුව වන අතර මෙම අස්පෘෂ්‍ය වත්කම් ඒවායෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ අගය අඩුවීමක දී ඒවා එම ජීවිත කාලය තුළ ලියා හරිනු ලබයි. අඩුම තරමින් සෑම වාර්තා කරනු ලබන අවස්ථාවක දීම ලියා හැරීමේ වර්ෂ ගණන සහ ක්‍රමය පිළිබඳ ඇගයීමකට ලක් කරනු ලබන අතර අපේක්‍ෂිත ප්‍රයෝජනවත් ජීව කාලය හෝ බලාපොරොත්තු වන පාරිභෝජන රටාව පදනම්ව එම වත්කම්වල ලියා හරිනු ලබන වටිනාකම තීරණය කරනු ලබන අතර එය සුදුසු පරිදි එම ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙසට ගෙන ගිණුම් ගැලපීම් සිදු කර ඇත. මෙම අස්පෘෂ්‍ය වත්කම්වල ලියා හැරීමේ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනවල එම වත්කම් යොදා ගනු ලබන මෙහෙයුම් කාණ්ඩය යටතේ දක්වා ඇත.

අස්පෘෂ්‍ය වත්කමක් ඉවත් කරනු ලබන විට එම වත්කම ඉවත් කිරීම මඟින් ජනිත වන ලාභය හෝ පාඩුව වශයෙන් ගණනය කරනු ලබන්නේ අදාළ වත්කමේ පොත්වල අගය සහ ශුද්ධ බැහැරකිරීමේ ප්‍රතිෂ්ඨාව අතර වෙනස වන අතර එය ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

මණ්ඩලය විසින් ලබාගත් පරිගණක මෘදුකාංග ඒවායේ පිරිවැයෙන් උපචිත ක්‍රමක්‍ෂය සහ උපචිත අවකරණ පාඩුව අඩුකිරීමෙන් ලැබෙන අගය මත පොත්වල සටහන් කර ඇත

පරිගණනක මෘදුකාංග ක්‍රමක්‍ෂය වසර 04ක් පුරා සිදු කරනු ලබයි.

**2.4.2 දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත සහ උපකරණ සියල්ල ස්පෘෂ්‍ය වත්කම් වේ. ඒවා වර්ෂ එකකට වැඩි කාලයක් ප්‍රයෝජනයට ගැනීමට අදහස් කරනු ලබයි.

පිරියත යන්ත්‍ර සහ උපකරණ වාර්තා ගත කර ඇත්තේ ඒවා මිලට ගැනීමට දරණ ලද පිරිවැයට එම වත්කමින් අපේක්‍ෂිත ප්‍රතිලාභ ලැබීමට සුදුසු බවට පත් කිරීමට දරනු ලබන අනෙකුත් වියදම් ද එකතු කරන ලද පිරිවැයටය.

**2.4.3 ක්‍ෂය කිරීම්**

මණ්ඩලය ස්ථාවර වත්කම් සඳහා ක්‍ෂය කිරීම් පරිහරණයට මිලට ගත් මාසයේ සිට ආරම්භ කර එම වත්කම ඉවත් කරන මාසය තෙක් එය ගණනය කිරීම කරනු ලබයි. ක්‍ෂය වෙන් කිරීම කරනු ලබන්නේ සරල මාර්ග ක්‍රමය පදනම්ව වන අතර එම පිරිවැය අපේක්‍ෂිත ප්‍රයෝජනවත් ජීව කාලය පුරා පහත පරිදි ලියා හැරීම කරනු ලබයි:

| | |
|---|---|
| යන්ත්‍ර සුත්‍ර | වසර 10 ක් සඳහා |
| ලී බඩු සහ සවි කිරීම් | වසර 13.33 ක් සඳහා |
| කාර්යාල උපකරණ | වසර 13.33 ක් සඳහා |
| මෝටර් රථ වාහන | වසර 10 ක් සඳහා |

සෑම වාර්තා කරනු ලබන දිනකදීම වත්කම්වල ලියාහරින ලද වටිනාකම ප්‍රයෝජනවත් ජීව කාලය, ක්‍ෂය කිරීමේ ක්‍රමවේදය සමාලෝචනයට ලක් කර සුදුසු පරිදි අවශ්‍ය සංශෝධන සිදු කරනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

**මුළුමණින් ක්ෂයකර අවසන්වූ නමුත් භාවිතයට යොදාගන්නා දේපල, පිරියත හා උපකරණ**

මුළුමණින් ක්ෂයකර අවසන්වූ නමුත් වාර්තාකරන දින වන විටත් භාවිතයට යොදාගන්නා දේපල, පිරියත හා උපකරණවල මුල් පිරිවැය 88 වන පිටුවේ 08 සටහනේ දක්වා ඇත.

**2.4.4 මූල්‍ය සාධනපත්‍ර**

මණ්ඩලය මගින් එහි මූල්‍ය තත්ත්වය වාර්තා කරනු ලබන දිනට ඇති මූල්‍ය වත්කම් මූල්‍ය වගකීම් හඳුනා ගන්නා ලද්දේ මණ්ඩලය අදාළ මූල්‍ය සාධනපත්‍රවලට අදාළ නෛතික ප්‍රතිපාදන අනුව මණ්ඩලයට හිමිකාරීත්වය ලැබෙන අවස්ථාවේ දීය. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් මූලිකව ඒවායෙහි සාධාරණ වටිනාකම පදනම්ව අගය කර ඇත. සෘජුව හඳුනාගත හැකි හුවමාරුවට අදාළ වියදම් ඇති නම් ඒවා ද සලකා මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් අගය කරනු ලබන අතර ඒවායෙහි සාධාරණ වටිනාකම නිරූපනය කිරීම සඳහා සුදුසු පරිදි මූල්‍ය වත්කම් සහ වගකීම්වලට වටිනාකම එකතු කිරීම හෝ අඩු කිරීම තුළින් අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලබයි. මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් පරිග්‍රහණයට සෘජුව ආරෝපනය වන ගණුදෙනුවට අදාළ පිරිවැය සාධාරණ වටිනාකම පදනම් කර ගනිමින් ආදායම් ප්‍රකාශ තුළ ලාභ හා අලාභ මඟින් වහාම හඳුනාගනු ලැබේ. මූල්‍ය වත්කම් හා වගකීම් හිලව්කර, ශුද්ධ අගය ඉදිරිපත් කරනු ලබන්නේ, අදාළ අගය එසේ හිලව් කිරීමට අධ්‍යක්ෂ මණඩලයට නෛතික අයිතිය හිමි වන්නේ නම් සහ ශුද්ධ පදනමකින් පියවීමට හෝ වත්කම උපලබ්ධිකර ඒ හා සමගම බැරකම පියවීමට අපේක්ෂා කරන්නේ නම් පමණි.

**මූල්‍ය වත්කම්**

**(අ) මූලික හඳුනා ගැනීම සහ අගය කිරීම**

මණ්ඩලය මගින් මූලිකවම සියලුම ණය හා ලැබිය යුතු දෑ හට ගන්නා අවස්ථාවේ දීම හඳුනා ගැනීම සිදු කරනු ලබන අතර අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකවම හඳුනා ගනු ලබන්නේ ඒවායෙහි නෛතික අයිතිය මණ්ඩලය වෙත පැවරෙන අවස්ථාවෙහි දී ය. මූලිකවම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් ඒවායෙහි සාධාරණ වටිනාකමට එම වත්කම් නිකුත් කිරීමට හෝ අත්පත් කර ගැනීමට සෘජුවම දරනු ලබන වියදම් වේ නම් ඒවා ද එකතු කර අගය කරනු ලබයි.

මූලික අදියරෙහි දී ම මූල්‍ය වත්කම් පහත සඳහන් එක් කාණ්ඩයක් යටතේ කාණ්ඩගත කරනු ලැබේ.

- ලාභයක් හෝ අලාභයක් ඇතිව සාධාරණ වටිනාකමට
- විකිණීමට ඇති මූල්‍ය වත්කම්
- අලාභයන් හා ලැබිය යුතු දෑ සහ
- කල් පිරෙන තෙක් රඳවා ගෙන ඇති ආයෝජන.

මණ්ඩලය මගින් එහි ආරම්භක අවස්ථාවේ දී මූල්‍ය වත්කම් වර්ග කිරීම සිදු කරනු ලබයි.

මෙම වර්ග කිරීම අදාළ වත්කම් අත්පත් කර ගැනීමේ අරමුණ පදනම්ව සිදු කිරීමට අවධානය යොමු කරයි. තවද මෙම අගය කිරීම ඒවායෙහි සාධාරණ වටිනාකම අනුව අගය කරනු ලබයි. එම වටිනාකම පදනම්ව ආයෝජන කාණ්ඩයට අදාළ හට ගන්නා ලාභ සහ අලාභ උපක්‍රමිකව හඳුනා ගැනීම කරයි. විකිණීමට ඇති ආයෝජන සහ කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන කාණ්ඩයන් අගය කිරීම හෝ රඳවා ගැනීම ලියා හරින ලද පිරිවැය පදනම්ව සිදු කරයි.

මූල්‍ය වත්කම්වල මිලදී ගැනීම හෝ විකිණීමට අදාළ නිශ්චිත දිනය තීරණය කරනුයේ අදාළ නෛතික අයිතිය හුවමාරු වන දිනය හෝ වෙළඳපොළ ක්‍රමවේදය තුළ පවත්නා නිරවුල් වීමට අදාළ භාවිතයන්ට අනුව එම දිනය තීරණය කරනු ලබයි. එනම් මණ්ඩලය මගින් මිලට ගන්නා / විකුණන මූල්‍ය වත්කම් වලට අදාළ ගෙවීමට ඇති / ලැබිය යුතු මුදල හඳුනා ගැනීම කරනු ඇත. කෙසේ වෙතත් එම ආයෝජන හිමිකාරීත්වය යටතට වර්ග කරනු ලබන අවස්ථාවක දී සාමූහික ණය වල ගනුදෙනු වූ දිනයට (එනම් විකුණූ දිනය) එම වත්කම් අගය කිරීමට හෝ අගය නොකිරීමට එම ආයෝජනවල පිරිවැය සැලකිල්ලට ගනු ලබයි.

මණ්ඩලය සතුව ඇති මූල්‍ය වත්කම් සහ ඒවායෙහි වර්ග කිරීම් පහත දක්වා ඇති වගුව මගින් ඉදිරිපත් කර ඇත.

| කාණඩය | මූල්‍ය වත්කම |
|---|---|
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට | කිසිවක් නැත |
| විකිණීමට ඇති | භාණ්ඩාගාර බැඳුම්කර<br>භාණ්ඩාගාර බිල්පත් |
| ණය සහ ලැබිය යුතු දෑ | ප්‍රතිමිලදී ගැනීම් |
| කල් පිරෙන තෙක් රඳවා ගත් | විදේශ විනිමය<br>සංවර්ධන බැඳුම්කර<br>භාණ්ඩාගාර බැඳුම්කර |

**(ආ) පසුකාලීන අගය කිරීම්**

මූල්‍ය වත්කම්වලට අදාළව පසුව කරනු ලබන අගය කිරීම් පහත පරිදි ඒවායෙහි වර්ග කිරීම් මත පදනම් වනු ඇත.

**ලාභ හෝ අලාභයන් අනුව සාධාරණ වටිනාකමට ඉදිරිපත් කරන මූල්‍ය වත්කම්**

ලාභ හෝ අලාභයන් අනුව මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම මත හඳුනා ගන්නා මූල්‍ය වත්කම් තුළට ගනුදෙනු කිරීමට රඳවා ගන්නා වත්කම් සහ ඒවා මුලාරම්භයේ දී දරණ ලද පිරිවැය පදනම්ව ලාභ / අලාභයන් හඳුනා ගැනීම් සහිතව අගය කරයි. නුදුරු අනාගතයේ දී විකිණීමේ අදහසින් මිලට ගෙන ඇති ආයෝජන මෙම විකිණීමට ඇති වත්කම් කාණ්ඩයට ඇතුළත් වනු ඇත.

ලාභ හෝ අලාභයන් හඳුනා ගැනීමක් සහිතව සාධාරණ වටිනාකමට ආයෝජනය කාණ්ඩ හඳුනා ගැනීමක් සඳහා පහත සඳහන් නිර්ණායකයන් සම්පූර්ණ කළ යුතු වේ.

- වෙනස් වෙනස් වූ පදනම් යොදා ගනිමින් එම වත්කම් සහ වගකීම්වල සාධාරණ වටිනාකමට අගය කිරීමක් සිදු නොවන බවට තහවුරු කර ගන්නා අතරම අඛණ්ඩ පැවැත්මකින් යුතුව එම වත්කම්වල වටිනාකම් ඉවත් කිරීමක් හෝ තක්සේරු වටිනාකම එකතු කිරීමක් කරනු ලැබීම හෝ
- මණ්ඩලයේ ආයෝජන උපායමාර්ග අනුව යමින් එම මූල්‍ය වත්කම් සහ වගකීම් කළමනාකරණය සහ මෙහෙයවීම කරනු ලබන අතර එම මූල්‍ය වත්කම්, වගකීම් හෝ එම දෙවර්ගයට මණ්ඩලයේ මූල්‍ය වත්කම් සහ වගකීම් යටතට ඇතුළත් වේ.

මෙම ආයෝජනයන් මුලිකවම සාධාරණ වටිනාකම පදනම්ව වාර්තා කර ඇත. දෙවනුව ඒවායෙහි මුල් හඳුනා ගත් අගය නැවත අගය කිරීමට භාජනය කර ඒ අනුව සාධාරණ වටිනාකමෙහි ඇතිවන වෙනස්කම ලාභයක් හෝ අලාභයක් ලෙසට හඳුනා ගැනීම කරයි. එය සම්පූර්ණ ආදායම් තත්ත්වය වෙනස්වීම දැක්වෙන ප්‍රකාශනය තුළට ඇතුළත් කර ඇත.

උපචිත හා ගෙවිය යුතු පොළිය පිළිවෙලින් ආයෝජන ආදායම හා මූල්‍ය වියදම් ලෙසට පිළිවෙලින් හඳුනා ගෙන ඉදිරිපත් කර ඇති අතර සඵල පොලී අනුපාතය පදනම් කරගෙන ආයෝජන මත පොළී ලැබීමට හිමිකම ලැබූ විට දී පමණක් ආදායම් ලෙසට හඳුනා ගැනීම සිදු කරයි.

සුදුසු පරිදි නුදුරු අනාගතය තුළ විකිණීමට අදහස් කරයි නම් මණ්ඩලය මගින් මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමකට ලාභයක් අලාභයක් ඇතිව තක්සේරු කරනු ලබයි. තවද කිසියම් විටෙක මණ්ඩලයට පවත්නා වෙළඳපොළ තත්ත්වය තුළ අදාළ මූල්‍ය වත්කම් අපේක්ෂා කරන පරිදි විකුණා ගැනීම සිදු කළ නොහැකි විටක දී ඒ පිළිබඳ තත්ත්වය සලකාබලා එම වත්කම් යළි වර්ගීකරණය කිරීමකට භාජනය කරනු ලබයි. ඒ සඳහා එවකට පවත්නා පොළී අනුපාතයන් සැලකිල්ලට ගනු ලබයි. මෙවැනි ණය සහ ලැබිය යුතු දෑ යලි වර්ගීකරණයට භාජනය කිරීම මගින් විකිණීමට ඇති හෝ කල් පිරෙන තෙක් රඳවා ගන්නා වත්කම් ලෙසට ඒවායෙහි ස්වභාවය අනුව හඳුනා ගැනීම කරනු ලබයි.

**විකිණීමට ඇති මූල්‍ය වත්කම්**

විකිණීමට ඇති මූල්‍ය වත්කම්වලට භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර (රජයේ බැඳුම්කර) ඇතුළත් වන අතර මෙම ආයෝජනයන් කාණ්ඩය නිශ්චිත නොවන කාලයක් සඳහා රඳවා ගනු ලබන ආයෝජනයන් වේ. මෙම ආයෝජනයන් ද්‍රවශීලතා අවශ්‍යතාවන් මත සහ වෙළඳපොළ තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමක් ලෙස ඒවා විකිණීමක් සිදු විය හැකිය. විකිණීමට ඇති මූල්‍ය වත්කම් මූලාරම්භ වටිනාකමට අගයකිරීමෙන් පසුව ඒවා සාධාරණ වටිනාකමට අගය කරනු ලබන අතර එහි දී උප ලබ්ධි නොවූ ලාභය හෝ පාඩුව හඳුනා ගනු ලබයි. මේවා වෙනත් සම්පූර්ණ ආදායම් වර්ගීකරණය යටතේ විකිණීමට ඇති සංචිත ලෙසට හඳුනා ගෙන ඇත.

විකිණීමට ඇති ආයෝජන මත උපයනු ලබන පොළී ආදායම බලාපොරොත්තු වන පොළී අනුපාතය පදනම්ව හඳුනා ගනු ලබන අතර ලියා හරින ලද හිඟ රක්ෂණ වාරික සහ හෝ වට්ටම් කිරීම් විකිණීමට ගෙන ඇති ආයෝජනවලට අදාළව ආදායම් ගිණුම්වල ආයෝජන ආදායම ලෙසට හඳුනාගෙන ඇත්තේ එම පොළිය ලැබීමේ හිමිකම් ලබන අවස්ථාවේදීය. එසේම එම වත්කම්වල අගය අඩුවීමක් සිදු වී ඇති බවට හඳුනා ගන්නා විටකදී ඒ අනුව ආයෝජන ආදායමට සිදු කරනු ලබන ලාභ හෝ අලාභයන් ලෙසට සහ විකිණීමට ඇති සංචිත වටිනාකමට ගැලපීම් ඉවත් කරනු ලබයි.

මණ්ඩලය මගින් විකිණීමට ඇති මූල්‍ය වත්කම් අගය කිරීමේ දී ඒවායේ විකිණීමට ඇති හැකියාව සහ ඒ පිළිබඳ කෙටිකාලීනව ඇති අදහස අනුව වටිනාකම් තීරණය කරනු ලබයි. එසේම මෙම මූල්‍ය වත්කම් පවත්නා වෙළඳපොළ තත්ත්වයන් අනුව විකුණා ගැනීමට නොහැකි බවට කළමනාකාරීත්වයට හැඟී යන්නේ නම් සහ එහි බලපෑම සැලකිය යුතු තරම් වේ නම් එම තත්ත්වය සලකා යළි එම වත්කම් වර්ගීකරණය කිරීමක් කරනු ලබයි. මෙලෙස යළි වර්ගීකරණය කිරීමට ණය සහ ලැබිය යුතු දෑ යන වර්ගීකරණයට හැකියාව ඇත්තේ එම මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයට අයත් වන සහ කළමනාකාරීත්වයේ අදහස සහ නුදුරු අනාගතයේ දී විකිණීමට හෝ කල් පිරීම වන තෙක් රඳවා ගැනීම සම්පූර්ණ අවස්ථාවල දී පමණි. කල් පිරෙන තෙක් රඳවා ගන්නා වත්කම් වර්ගීකරණයට හැකියාව ඇත්තේ ආයතනයට ඒ සඳහා හැකියාවක් සහ කල් පිරෙන තෙක් රඳවා ගැනිටම අදහසක් ද තිබේ නම් පමණි.

මූල්‍ය වත්කම්වල විකිණීමට ඇති වත්කම් යන කාණ්ඩයට අදාළව යළි වර්ගීකරණය නිසා ඇති වන ලාභ හෝ පාඩුව එම වත්කම මත හඳුනා ගනු ලබන අතර එම ප්‍රමාණය අපේක්ෂිත පොළී අනුපාතය යොදා ගනිමින් එම වත්කමෙහි පවත්නා ප්‍රයෝජනවත් ජීව කාලය පුරා යොදා ගැනීමක් කරනු ලබයි. නව ලියා හරින ලද පිරිවැය සහ අනාගත අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් අතර වෙනස අපේක්ෂිත පොලි අනුපාතය යොදා ගනිමින් ලියා හැරීමට භාජනය කරයි. පසුකාලීනව එම වත්කම්වල අගය අඩුවීමක් හඳුනා ගනු ලැබූ විටෙක දී එය හිමිකාරීත්වයට ඇති කරන බලපෑම ආදායම් ප්‍රකාශනවල දැක්වීම කරනු ලබයි.

**ණය සහ ලැබිය යුතු වත්කම්**

ණය සහ ලැබිය යුතු දෑ යන වත්කම් කාණ්ඩය ස්ථිර හෝ නිශ්චිත ගෙවීමක් සහිත වන අතර ඒවා ක්‍රියාකාරී වෙළඳපොළක හුවමාරු කිරීමට නොහැකි වත්කම් කාණ්ඩයකි. මණ්ඩලය මගින් ණයකර ද මෙම කාණ්ඩය යටතේ නම් කිරීමට තීරණය කරන ලද අතර ඊට හේතුව නම් එවැනි උපකරණ මිල ලේඛනයට ඇතුළත් කළද ඒ සඳහා ක්‍රියාකාරී වෙළඳපොළක් නොතිබීමයි.

මෙම ආයෝජනයන් ආරම්භයේ දී පිරිවැයට හඳුනා ගන්නා ලද අතර එම ආයෝජන අත්කර ගැනීම සඳහා සාධාරණ වටිනාකමක් ගෙවීමට සිදු විය. මෙම වත්කම් මිලට ගැනීමට සෘජුවම දරණ ලද පිරිවැයක් තිබේ නම් එම ප්‍රමාණය ද ආයෝජන පිරිවැයට ඇතුළත් කර ඇත. ආරම්භක අගය කිරීමට අනතුරුව ණය සහ ලැබිය යුතු දෑ සඵල පොළි අනුපාතය යොදා ගනිමින් වටිනාකමට අගය කිරීම් කරන අතර එහි දී අගය අඩුවීම් සඳහා ද අඩු කිරීම් කර ඇත.

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

ලියා හරින ලද පිරිවැය ගණනය කිරීමේ දී කිසියම් වට්ටම් කිරීමක් හෝ අධි මිලක් පවතියි නම් එය සැලකිල්ලට ගෙන ඇති අතර අත් කර ගැනීමේ ගාස්තු හෝ වියදමක් වේ නම් එය අපේක්ෂිත පොළී ආදායමට ද ඇතුළත් කර සලකා බලයි. ආදායම් ප්‍රකාශනවල ආයෝජන ආදායම තුළට මෙම අපේක්ෂිත පොලී අනුපාතය යොදා ගනිමින් කරනු ලබන ලියා හැරීම් ගලපා ඇති අතර එම ලියා හැරීමේ ක්‍රියාවලිය තුළ දී එම ආයෝජනයට අදාළව ලාභය හෝ අලාභය හඳුනා ගැනීමක් කරනු ලබයි.

කාර්ය මණ්ඩලයට ලබාදී ඇති ආපදා ණය ප්‍රමාණ වටිනාකම් සැලකිය යුතු ලෙස අඩු බැවින් පොළී අනුපාතය යොදා ගනිමින් අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කර අදාළ ලැබිය යුතු ණය වටිනාකම ගණනය කිරීම් කර හිඟ ණය ශේෂය හඳුනා ගැනීමක් සිදු කර නොමැත.

**කල්පිරෙන තෙක් රඳවා ගන්නා මූල්‍ය වත්කම්**

ගණුදෙනු කිරීම සඳහා යොදා ගැනීමට නොහැකි ස්ථිර හෝ නිශ්චිත ගෙවීම් වටිනාකමක් සහ නිශ්චිත කල් පිරීමක් සහිත ඒවා මෙම කාණ්ඩයට ඇතුළත් වේ. මණ්ඩලයේ අදහස සහ හැකියාව මත මෙම වත්කම් කල් පිරෙන තෙක් රඳවා ගැනීම කරයි. මූලික අගය කිරීමෙන් අනතුරුව එය යොදා ගනිමින් කල් පිරීමට රඳවාගත් මූල්‍ය වත්කම් ලියා හැරීමේ පිරිවැය සලකා බලමින් තක්සේරු කිරීමක් සිදු කරනු ලබයි. විදේශ විනිමය සංවර්ධන බැඳුම්කර මෙම කාණ්ඩය යටතේ වර්ග කර ඇත.

සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ ආයෝජන ආදායම්වල ඇතුළත් කර ඇත.

අයෝජන ඉවත්කරන විට හෝ අවකරනයට ලක්වී ඇති විට හා ක්‍රමක්ෂය ක්‍රියාවලිය මගින් ද ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

**(ඇ) මූල්‍ය වත්කම් හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම**

මූල්‍ය වත්කම් (හෝ අදාළ පරිදි, මූල්‍ය වත්කමක යම් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) සම්බන්ධයෙන් -

- එම වත්කමින් මූල්‍ය ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිවාසිකම් ඉකුත්වූ විට
- මූල්‍ය ප්‍රවාහ ලබා ගැනීමේ ගිවිසුම්ගත අයිතිවාසිකම පවරාදෙනු ලැබූ විට

හෝ

- එම වත්කමින් මූල්‍ය ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිවාසිකම මණ්ඩලය විසින් රඳවාගනු ලැබූ හෝ යම් ගිවිසුමක් යටතේ අදාළ මූල්‍ය ප්‍රවාහ යම් තෙවන පාර්ශ්වයක් වෙත සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව ගෙවීමේ බැඳීමක් ඇතිකර ගනු ලැබූ විට

එසේත් නැතහොත්

අ) මණ්ඩලය විසින් වත්කමට අදාළ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු පරිදි පවරාදෙනු ලැබ හෝ

ආ) වත්කමට අදාළ සියලු අවදානම් සහ ප්‍රතිලාභ මණ්ඩලය විසින් සැලකිය යුතු පරිදි පවරාදෙනු ලැබ හෝ රඳවාගනු ලැබ නොමැති නමුත් වත්කමේ පාලනය පවරාදී ඇත්නම්

එවැනි මූල්‍ය වත්කම් පොත්වලින් ඉවත් කරනු ලැබේ.

මණ්ඩලය විසින් යම් වත්කමකින් මූල්‍ය ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිවාසිකම් පවරාදෙනු ලැබ ඇත්නම් හෝ එසේ කිරීමට එකඟවී ඇත්නම් හෝ වත්කමට අදාළ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු පරිදි පවරාදෙනු ලැබ හෝ රඳවාගනු ලැබ නොමැති නම් හෝ වත්කමේ පාලනය පවරාදී නොමැති නම්, එවැනි වත්කම් පිළිගැනීම කරනු ලබන්නේ එම වත්කම සම්බන්ධයෙන් මණ්ඩලය තවදුරටත් ක්‍රියාකරන ප්‍රමාණයට පමණී.

පවරාදෙන ලද වත්කමක් සම්බන්ධයෙන් වන ඇපකරයක ස්වරූපයෙන් තවදුරටත් කටයුතු කිරීම වත්කමේ මුල් ධාරණ අගය සහ අදාළ බැඳුම්කරය යටතේ ගෙවීමට මණ්ඩලයට නියමවී ඇති උපරිම අගය යන දෙකින් වඩා අඩු අගය මත ඇගයීමට ලක් කරනු ලැබේ. එහිදී, මණ්ඩලය විසින් ඒ හා සම්බන්ධ බැරකම ද පිළිගනු ලැබේ. එසේ මණ්ඩලය රඳවාගෙන ඇති අයිතිවාසිකම් හා බැඳීම් නිරූපණය වන පදනමක් මත පවරාදෙන ලද වත්කම සහ ආශ්‍රිත බැරකම ඇගයීමට ලක් කෙරේ.

**(ඈ) මූල්‍ය වත්කම් වල අගය අඩු වීම**

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම වාර්තාකරන දිනකම යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අවකරනය වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේදැයි සොයා බලනු ලැබේ. යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අවකරනය වී ඇති බවට සලකනු ලබන්නේ එම වත්කම මූලික පිළිගැනීමෙන් (සිදුවූ අලාභයකින්) අනතුරුව සිදුවූ එවැනි එක් සිදුවීමක් හෝ සිදුවීම් කිහිපයක් හේතුවෙන් හටගත් අවකරන පිළිබඳ වාස්තවික සාක්ෂි ඇත්නම් සහ එම අලාභය මඟින් එම මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ ඇස්තමේන්තුගත ඉදිරි මූල්‍ය ප්‍රවාහය කෙරෙහි විශ්වසනීය ආකාරයෙන් තක්සේරුකළ හැකි බලපෑමක් සිදු වන්නේ නම් පමණී. අවකරන පිළිබඳ සාක්ෂි වලට ණයගැතියන් හෝ ණයගැතියන් කණ්ඩායමක් සැලකියයුතු මූල්‍ය දුෂ්කරතාවකට ලක්ව සිටීම පිළිබඳ ඉඟි පහළවීම, පොළිය හෝ මූලික ණය මුදල ගෙවීම පැහැර හැරීම හෝ නොසලකා හැරීම, ඔවුන් බුනවත් වීම හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ලක්වීම සහ නිරීක්ෂණීය දත්ත මඟින් ගෙවීම් පැහැර හැරීම හා සහසම්බන්ධ හිඟ මුදල් හෝ ආර්ථික කොන්දේසි වල වෙනස්කම් ආදී ඇස්තමේන්තුගත ඉදිරි මූල්‍ය ප්‍රවාහවල මැනිය හැකි පහළයාමක් ඇතිවිය හැකි බව විද්‍යමාන වීම ආදිය ඇතුළත් වේ.

**(ඉ) සාධාරණ අගය ගණනය කිරීම**

මණ්ඩලය මගින් වාර්තා කරනු ලබන සෑම දිනකදීම විකිණීමට ඇති වත්කම් යන කාණ්ඩයට අයත් මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගය පිළිබඳ තක්සේරුවක් කර ලාභය හෝ අලාභය හඳුනා ගනු ලබයි. සියලුම වත්කම් හා වගකීම්වල සාධාරණ අගය තක්සේරු කිරීම හෝ හෙළිදරව් කිරීම මූල්‍ය ප්‍රකාශනවල සිදු කරන අතර එම සාධාරණ අගය දැක්වීම අනුපිළිවල පහත පරදි ඉදිරිපත් කරයි. එය සමස්ථයක් ලෙස සාධාරණ අගය ගණනය කිරීමට වැදගත්වන අඩුම යෙදවුම මත පදනම් වේ.

- 1 මට්ටම - මිල කිරීමක් සහිත (වෙන් කිරීමකින් තොරව) හඳුනාගත් වත්කම් හෝ වගකීම්වල ක්‍රියාකාරී වෙළඳපොළ මිල
- 2 මට්ටම - සාධාරණ අගය තක්සේරු කිරීමට වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කල හැකි වීම.
- 3 මට්ටම - සාධාරණ අගය තක්සේරු කිරීමට වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම නිරීක්ෂණය කල නොහැකිවීම.

උපකරණ කාණ්ඩය සාධාරණ අගය කිරීමේ පදනම සාධාරණ අගය කිරීමේ වැදගත්කම සංවර්ධන බැඳුම්කර සඵල අනුපාතය අනුව අගය කර ඇත. මට්ටම 2 භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ ඉපැයීම අනුව අගය කර ඇත. මට්ටම 1 භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ ඉපැයීම අනුව අගය කර ඇත. මට්ටම 1

| සාධනපත්‍ර වර්ගය | සාධාරණ අගය කිරීමේ පදනම | සාධාරණ අගය කිරීමේ වැදගත්කම |
|---|---|---|
| සංවර්ධන බැඳුම්කර | සඵල අනුපාතය අනුව අගය කර ඇත. | මට්ටම 2 |
| භාණ්ඩාගාර බැඳුම්කර | වෙළඳපොළ ඉපැයීම අනුව අගය කර ඇත. | මට්ටම 1 |
| භාණ්ඩාගාර බිල්පත් | වෙළඳපොළ ඉපැයීම අනුව අගය කර ඇත | මට්ටම 1 |

**මූල්‍ය වගකීම්**

**(අ) මූලාරම්භක හඳුනා ගැනීම හා අගය කිරීම**

සියලුම මූල්‍ය වගකීම් ආරම්භයේ දී සාධාරණ වටිනාකමට හඳුනාගනු ලබන අතර ණය සහ ණය ගැනීම් සම්බන්ධයෙන් ඒ සඳහා සෘජුවම දරනු ලබන වියදම් අඩු කරනු ලබයි.

මණ්ඩලයේ මූල්‍ය වගකීම් යටතට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් සහ රක්ෂණ ගෙවීම් සහ බැංකු අයිරා ද ඇතුළත් වේ.

**(ආ) පසුකාලීන අගය කිරීම**

මූල්‍ය වගකීම් පසුකාලීනව අගය කිරීම මත දැක්වෙන පරිදි ඒවා වර්ග කිරීම මත රඳා පවතී:

**ණය සහ ණය ගැනීම්**

මූලාරම්භයේ දී හඳුනාගැනීමෙන් අනතුරුව පොළී ගෙවනු ලබන ණය සහ ණය ගැනීම් පසුකාලීනව අගය කිරීම සඵල පොළී අනුපාතය යොදා ගනිමින් ලියා හැරීමේ පදනමට කරනු ලබයි. සඵල පොළී අනුපාතය යොදා ගනිමින් වගකීම් ලියා හැරීමේ ක්‍රියාවලියේදී හට ගනු ලබන ලාභය හෝ අලාභය මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම කරනු ලබයි. අත්පත් කර ගැනීමේ දී ගෙවනු ලබන අධි මිල හෝ ලැබෙන වට්ටම් ද සලකා ඒවා ද සඵල පොළී අනුපාතයට ගැලපීමෙන් අනතුරුව ලියා හැරීමේ පිරිවැය ගණනය කරයි. එසේම ආදායම් ප්‍රකාශනවල එම ලියා හැරීමේ පිරිවැය මූල්‍ය ණය පිරිවැය යටතේ දක්වා ඇත.

**(ඇ) හඳුනාගැනීමෙන් ඉවත් කිරීම**

මූල්‍ය වගකීම් යටතේ ඇති බැඳීම් නිදහස් කළවිට, අවලංගු කළ විට හෝ කල්ඉකුත්වූ විට මූල්‍ය වගකීමක් ඉවත් කරනු ලබයි.

**(ඈ) ගෙවිය යුතු රක්ෂණ**

ගෙවිය යුතු රක්ෂණයන්ගේ වටිනාකම අදාළ වාරික ගෙවීමට බැඳීමත් සමග හඳුනා ගන්නා අතර එහි වටිනාකම මූලාරම්භයේ දී ඉදිරිපත් වී ඇති වටිනාකමෙහි සාධාරණ අගයෙන් එම ගණුදෙනුව සඳහා දරන ලද පිරිවැය අඩු කරන ලද අගයට තක්සේරු කර ඇත. පසු අවස්ථාවල දී සඵල පොළී අනුපාතය යොදා ගනිමින් ලියා හරින ලද වටිනාකමට අගය කරනු ලබයි.

මෙම ගෙවිය යුතු රක්ෂණ වාරික කිසියම් විටෙක ඒ පිළිබඳ වගකීම නිරවුල් කිරීමක දී වගකීම අවලංගු කළ විට දී හෝ කල් ඉකුත්වීමක දී ඉවත් කරනු ලබයි.

**2.6.4 මූල්‍ය උපකරණ හිලව් කිරීම**

මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනයේ මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙක හිලව් කර ශුද්ධ අගය පමණක් හඳුනා ගෙන දක්වා ඇත. එසේ කරනුයේ වර්තමානයේ බලාත්මක කළ හැකි නෛතික අයිතියක් පවත්නා විට හා එලෙස ශුද්ධ අගයට නිරවුල් කිරීමේ අරමුණක් ද පවතින විටෙකදීය. එසේ නොමැතිනම් වත්කම් උපලබ්ධිවීම සහ වගකීම් නිරවුල් කිරීම එකම අවස්ථාවක දී සිදුවන විටෙක දී ද මෙලෙස ශුද්ධ අගයට වාර්තා කිරීම කරනු ලබයි. විශේෂ වශයෙන් හෙළිදරව් කළ පරිදි මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුව කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක අවශ්‍යතාව පරිදි හෝ ඉඩ ලබාදී ඇති පරිදි හෝ නිර්වචනය කර ඇති පරිදි ආදායම් සහ වියදම් හිලව් කිරීම් කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම් කර ඇත.

**2.6.5 මූල්‍ය නොවන වත්කම් අගය අඩු වීම**

මණ්ඩලය මගින් සෑම වාර්තා කරනු ලබන දිනක දීම කිසියම් වත්කමක අගය අඩුවීම පිළිබඳ ලක්ෂණයන් තිබේද යන්න පිළිබඳව සලකා බලයි. එවැනි ලක්ෂණයක් තිබේ නම් හෝ කිසියම් වත්කම වාර්ෂික අගය අඩුවීම පිළිබඳ පරීක්ෂා කිරීමක් අවශ්‍ය වේ නම් මණ්ඩලය මගින් එම වත්කමෙහි අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලබයි. වත්කමක අය කර ගත හැකි අගය වනුයේ මුදල් උත්පාදන ඒකකයේ සාධාරණ අගයෙන් විකිණීමට දරනු ලබන වියදම සහ එහි පරිහරණයට ඇති වටිනාකම අඩු කළ පසු ඉතිරි අගය වේ. අනෙක් වත්කම් හෝ වත්කම් කාණ්ඩයන්ගෙන් වැඩි වශයෙන් ස්වාධීනව කිසියම් වත්කමක් මුදල් ඉපැයීමක් උත්පාදනය නොකරයි නම් එවිට දී වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම වෙන් වශයෙන් හඳුනා ගැනීමක් කරයි. වත්කමක ඉදිරියට ගෙන ආ අගය හෝ මුදල් උත්පාදන ඒකක වටිනාකම එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම් එම වත්කමේ අගය අඩුවීමක් ඇති බවට සලකයි. එවිට එම එහි අය කර ගත හැකි වටිනාකම අඩු කිරීමක් කරනු ලබයි. වත්කමක පරිහරණයට ගත හැකි වටිනාකම තක්සේරු කිරීමේ දී ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්. බද්දට පෙර වට්ටම් අනුපාතය යොදා ගනිමින් වර්තමාන වටිනාකම සොයා ගැනීම කරයි. සාධාරණ වටිනාකම තීරණය කිරීමේ දී විකිණීමට දැරීමට සිදුවන වියදම

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

අඩු කරනු ලබන අතර තොරතුරු තිබේනම් මෑතකාලීන වෙළඳපොළ ගණුදෙනු විස්තර ද යොදා ගනු ලබයි. එවැනි වෙළඳපොළ තොරතුරු නොමැති විටක දී පවත්නා සුදුසු අගය කිරීමේ ක්‍රමවේදයක් යොදා ගැනීම සිදු කරයි.

අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම්වල අගය අඩුවීමේ අලාභයන් ආදායම් ප්‍රකාශනවල හඳුනා ගන්නා අතරම එම වියදම් කාණ්ඩය එම අගය අඩු වූ වත්කමෙහි ක්‍රියාකාරී ස්වභාවය අනුව වර්ගීකරණය කරනු ලබයි.

**2.6.6 සාමාන්‍ය රක්‍ෂණ ගිවිසුම්ගත වගකීම්**

සාමාන්‍ය රක්‍ෂණ ගිවිසුම්වලට අදාළ වගකීම්වලට හිඟව ඇති හානි ප්‍රතිපූර්ණ මුදල් සහ හිගව ඇති රක්‍ෂණ වාරික සඳහා වන වෙන් කිරීම් හිගව ඇති හානි ප්‍රතිපූර්ණ වෙන් කිරීම් ඇස්තමේන්තුගත අවසාන වශයෙන් දරන ලද එහෙත් වාර්තාගත කරන දිනට නිරවුල් නොවූ සියලුම හානි ප්‍රතිපූර්ණයන් පදනම් කරගෙන ඇති අතර ඊට හානි ප්‍රතිපූර්ණයන් සැකසීමට අදාළ වියදම්, වෙනත් ලැබීම් සහ සුන්බුන් විකිණීමේ ලැබීමට අපේක්‍ෂිත මුදල් අඩු කිරීම ද කරනු ලබයි.

සමහර අවස්ථාවල දී දැනුම්දීමේ ලිපිය හා සමහර වර්ගවල හානි ප්‍රතිපූර්ණයන් ප්‍රමාදවීමක් සිදු විය හැකිය. එම නිසා වාර්තා කරනු ලබන දිනට අවසාන වශයෙන් දරණ වියදම නිශ්චිත කිරීමක් නිශ්චිතවම නොහැකි වනු ඇත. තව ද මුදලේ අගය වෙනස්වීම සඳහා වගකීම්වලට අදාළව ගැලපීම් කර නොමැත. තව ද හානි පූර්ණ ගෙවීමට ඇති වගකීම කල් ඉකුත් වීම, වගකීම ඉවත්වීම හෝ අවලංගු වු විටෙක දී අදාළ වගකීම ද හඳුනා නොගනියි.

වෙන් කිරීම් ශුද්ධ උපයා නොගත් රක්‍ෂණ වාරික හිලව් කර නොගත් ශුද්ධ අත්පත් කර ගැනීම් පිරිවැය සඳහා වෙන් කිරීම් සහ දළ හිග වාරික ගෙවීම සඳහා කළ වෙන් කිරීම් ද ඇතුළත් වේ. උපයා නොගත් රක්‍ෂණ වාරික වටිනාකම හිලව් කර නොගත් වත්කම් අත්කර ගැනීමේ පිරිවැය සහ නිරවුල් නොකළ දළ හානි ප්‍රතිපූර්ණ සඳහා වෙන් කිරීම් යනාදිය රක්‍ෂණ කර්මාන්තයේ සහ යහපත් පරිහරණයන්ට අනුව සිදු කර ඇත.

සෑම වාර්තා කරනු ලබන දිනකදීම මණ්ඩලය මගින් එහි කල් ඉකුත් නොවූ අවදානම් ඇගයීමට ලක් කරන අතර ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කිරීමේ ප්‍රමිති අංක 4 අනුව වගකීම් හඳුනා ගැනීමේ පරික්ෂාව ක්‍රියාත්මක කරනු ලබයි. එමගින් බලාපොරොත්තු වන හානි පූර්ණයන්ගේ සමස්ථ අතිරික්තයක් තිබේද, උපයා නොගත් වාරික අත් කර ගැනීමේ වියදම් ලියා හැරීමේ වියදම් ආදිය සලකා බලයි. මෙම ගණනය කිරීම් සඳහා අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන ඇස්තමේන්තු සලකා බලන අතර ඒ සඳහා සාමාන්‍ය රක්‍ෂණ සඳහා වන ප්‍රතිපාදන වෙන් කිරීම් හා ඒ මත ඇතිව වත්කම්වල බලාපොරොත්තුවන ආයෝජන ප්‍රතිලාභය සැලකිල්ලට ගනු ලබයි. මෙහි දී උපයා නොගත් රක්‍ෂණ වාරිකයන්ගේ වාර්තාගත වටිනාකම (අත්කර ගැනීමේ ඉදිරියට ගෙන ආ අගය අඩු කළ පසු) ප්‍රමාණවත් නොවේ නම්, එම ඌණතාවය රක්‍ෂණ වාරික හිගය ලෙසට හඳුනා ගෙන එය ආදායම් ප්‍රකාශනවල දැක්වීම කරයි.

**හිමිකම් ගෙවීමේ වගකීම**

පසුගිය අත්දැකීම් හා ප්‍රවනතා පදනම් කරගනිමින් අනාගත බැඳීම් වඩාත් තාත්විකව ඇස්තමේන්තු කිරීම තහවුරු කිරීම සඳහා සිදුවූ එහෙත් වාර්තා නොකළ හිමිකම් (IBNR) සහ සිදුවූ එහෙත් ප්‍රමාණවත් පරිදි වාර්තා නොකළ (IBNER) හිමිකම් ප්‍රතිපාදන ආයුගණයට අනුව තක්සේරු කරනු ලැබේ. ආයුගණයට අනුව තක්සේරු කිරීම සෑම මාස තුනකටම වරක් සිදු කරනු ලැබේ.

සිදුවූ එහෙත් වාර්තා නොකළ හිමිකම් සඳහා ප්‍රතිපාදන 2016. 12. 31 දින ප්‍රථම වරට වාර්තා කරන ලද අතර 2016. 12. 31 දිනට පැවති මූල්‍ය තත්ත්වය පිළිබඳ 18 වන සටහනේ ඒ පිළිබඳව එළිදරව් කර ඇත.

**2.6.7 ප්‍රතිරක්‍ෂණය කිරීම**

මණ්ඩලය සිය සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී හට ගන්නා රක්‍ෂණ අවදානම සිය සියලුම ව්‍යාපාරික කටයුතු මඟින් උකහා ගැනීමට අවකාශ සලසා ඇත. ප්‍රතිරක්‍ෂණ වත්කම් ප්‍රතිරක්‍ෂණ සමාගම්වලින් ලැබිය යුතු වටිනාකම් නිරූපනය කරයි. එම ප්‍රතිරක්‍ෂණයන්ගෙන් ලැබිය යුතු වටිනාකම තක්සේරු කිරීම හිගව ඇති හානි ප්‍රතිපූර්නයන් සඳහා වෙන් කිරීම් හෝ ප්‍රතිරක්‍ෂණ ගිවිසුම් අනුව ගෙවීම් කරන ලද ප්‍රතිලාභ අනුව සහ ප්‍රතිරක්‍ෂණ ගිවිසුම් ප්‍රකාරව වනු ඇත. අවකරන අලාභය ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලබයි.

පවරාදුන් ප්‍රතිරක්‍ෂණ ගිවිසුම් මඟින් රක්‍ෂණ ඔප්පුහිමියන් කෙරෙහි ඇති බැඳීමෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලය නිදහස් වීමක් සිදු නොවේ.

ප්‍රතිරක්‍ෂණ බැඳීම් මඟින් ප්‍රතිරක්‍ෂණ සමාගම්වලට ගෙවිය යුතු වටිනාකම් නිරූපනය වේ. එසේ ගෙවිය යුතු මුදල අදාළ ප්‍රතිරක්‍ෂණ ගිවිසුමට අනුකූලව තක්සේරු කරනු ලැබේ.

පවරාදුන් සහ පවරාගත් ප්‍රතිරක්‍ෂණය සඳහා වාරික හා හිමිකම් දළ පදනමක් මත ඉදිරිපත් කර ඇත.

ගිවිසුම්ගත අයිතිවාසිකම් කල්ඉකුත්වීම මඟින් නිරුද්ධ වූ විට හෝ ගිවිසුම වෙනත් පක්‍ෂයකට පවරාදුන් විට ප්‍රතිරක්‍ෂණ වත්කම් හෝ වගකීම් ඉවත් කිරීම කරනු ලැබේ.

**2.6.8 ලැබිය යුතු රක්‍ෂණ වාරික**

ලැබිය යුතු රක්‍ෂණ වාරිකයන් මූලාරම්භයේ දී ලැබිය යුතු හෝ ලැබීමට නියමිත වටිනාකම සාධාරණ අගයට තක්සේරු කර හඳුනා ගැනීම කරයි. කිසියම් රක්‍ෂණයක ඉදිරියට ගෙන එන ලද වටිනාකම කිසියම් සිදුවීමක් හෝ තත්ත්වයන්ගේ වෙනසක් නිසා අගය අඩුවීමක් සිදු වෙයි නම් එය තක්සේරුවට භාජනය කර අගය අඩුවීමේ අලාභයන් ආදායම් ප්‍රකාශන වලට වාර්තා ගත කරනු ලබයි.

ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය විසින් නිකුත්කර ඇති රක්ෂණ වාරික ගෙවීම් පිලිබඳ සහතික කිරීමේ විධිවිදානවලට අනුව එයට යටත්ව නිකුත්කර ඇති රක්ෂණ ඔප්පු දින 60 ක කල්පිරීමේ කාලය මත බේරුම්කර නොතිබුන හොත් අවලංගු කරනු ලබයි.

**2.6.9 මුදල් සහ මුදල් හා සමාන වත්කම්**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුදල් සහ මුදල් හා සමාන වත්කම් වලට බැංකු ශේෂය, අතැති මුදල් ශේෂය සහ ශුද්ධ බැංකු අයිරා ශේෂය ද ඇතුළත් වෙයි.

**2.6.10 විකුණුම් බදු සහ රක්‍ෂණ වාරික බදු**

පහත අවස්ථාවන්හි දී හැර ආදායම්, වියදම් සහ වත්කම් හඳුනා ගැනීමේ දී විකුණුම් බදු සහ රක්‍ෂණ වාරික මත බදු මුදල් හැර ශුද්ධ අගයට හඳුනා ගෙන ඇත.

- වත්කමක් මිලට ගැනීමේ දී හෝ සේවාවක දී ඒ මත ගෙවනු ලබන බදු වටිනාකම ආපසු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් හිලව් කර ගැනීම නොහැකි විටෙක දී එවැනි බදු අදාළ වත්කම් අත් කර ගැනීමේ වියදමෙහි හෝ අදාළ වියදමෙහි කොටස් ලෙස සුදුසු පරිදි හඳුනා ගනු ලබයි.
- ලැබිය යුතු හා ගෙවිය යුතු වටිනාකම් දැක්වීමේ දී විකුණුම් වටිනාකම හෝ රක්‍ෂණ වාරිකවල වටිනාකම අදාළ ගනුදෙනුව මත වන බදු මුදල් ද ඇතුළත් වේ.

විකුණුම් මත හෝ රක්‍ෂණ වාරික මත ගෙවීමට හෝ ලැබීමට ඇති ශුද්ධ බදු ප්‍රමාණය දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවීමට ඇති / ලැබීමට ඇති බදු ලෙස මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශවල දක්වා ඇත.

**2.6.11 විදේශ මුදල් පරිවර්තන ගණුදෙනු සහ ශේෂයන්**

විදේශ ව්‍යවහාර මුදලින් කරන ගණුදෙනු අදාළ ගණුදෙනුව සිදුවන දිනට පැවති ක්‍ෂණයාත්මක විනිමය අනුපාතය මත මූලිකව වාර්තා කරනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදලින් නියෝජනය කෙරෙන මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරනු ලබන දිනට පවත්නා ක්‍ෂණයාත්මක විනිමය අනුපාතය පදනම්ව යළි තක්සේරු කරනු ලබයි.

**2.6.12 විශ්‍රාම ප්‍රතිලාභ පිළිබඳ වගකීම**

**(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිත**

පාරිතෝෂිත යනු නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකි. 1983 අංක 12 දරන පාරිතෝෂිත මුදල් ගෙවීම පිළිබඳ පනතට අනුව මණ්ඩලය පාරිතෝෂිත ගෙවීමට බැඳී සිටින්නේ වසර 5ක අඛණ්ඩ සේවා කාලයක් සපුරා තිබීම මත පමණි. මෙම වගකීම යටතේ සේවය කළ එක් වර්ෂයක කාලයකට මාසික වැටුපෙන් අර්ධය බැගින් සම්පූර්ණ කළ සේවා කාලය මත ගණනය කිරීම කර මූල්‍ය ප්‍රකාශවල දක්වයි. මෙම පාරිතෝෂිත ගණනය කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 "සේවක ප්‍රතිලාභ" ආයුගණක ගණනය කිරීමේ ක්‍රමයට සිදු කර ඇත.

**(ආ) නිශ්චිත දායකත්ව සැලසුම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

අදාළ නීති රෙගුලාසීන්ට අනුව කාර්ය මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට දායකත්වය ලැබීමට හිමිකම් කියයි. මණ්ඩලය කාර්ය මණ්ඩලයේ දළ වැටුපෙන් නිශ්චිත ප්‍රතිශතයක් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දායක වෙයි.

**2.6.13 අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන් කිරීම්**

මණ්ඩලයට වගකීමෙන් බැඳෙන (නෛතික හෝ වෙනයම් ආකාරයට) අවස්ථාවල දී ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් කරන අතර එය පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් සහ ඒ මත ආර්ථික ප්‍රතිලාභයන් හෝ මුදල් ගලා යාමක් ඇති වන අතර එය සාධාරණ ලෙස ඇස්තමේන්තු කර නිරවුල් කළ යුතු වේ. මණ්ඩලය මගින් සමහර හෝ සියලුම වෙන් කිරීම් පියවා ගැනීමට බලාපොරොත්තු වන විටදී එම පියවා ගැනීම වෙනමම වත්කමක් ලෙසට හඳුනා ගනු ලබයි. නමුත් ඒ සඳහා පියවා ගනු ලබන මුදල සෑම ආකාරයෙන්ම නිශ්චිත විය යුතු වේ. කිසියම් වෙන් කිරීමක් සඳහා වන වියදම ආදායම් ප්‍රකාශනවල පියවා ගත හැකි මුදල හිලව් කර ශුද්ධ අගයට දක්වා ඇත. මුදලෙහි වර්තමාන වටිනාකම එතරම් ප්‍රමාණාත්මක නොවන විටදී ප්‍රතිපාදන වෙන් කිරීම් පවත්නා බද්දට පෙර අනුපාතය යොදා ගනිමින් වට්ටම් කර වටිනාකමට එළැඹී ඇත. කිසියම් අවස්ථාවක වට්ටම් කිරීම් යොදා ගන්නා විටෙක කාල පමාව නිසා ප්‍රතිපාදන වෙන් කිරීම් ඉහළ යාමක දී එය මූල්‍ය පිරිවැයක් ලෙසට හඳුනා ගනු ලබයි.

සම්පත් ගලා යාම හඳුනා ගැනීමට නොහැකි අවස්ථාවල දී හැර සියලුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් ලෙසට අනාවරණය කර ඇත.

## 2.7 ආදායම් හඳුනාගැනීම

**2.7.1 දළ වාරික**

දළ ලිඛිත රක්‍ෂණ වාරික සමන්විත වනුයේ ගිණුම් කාලසීමාව තුල ඇතුලත් වූ ගිවිසුම් මගින් සපයන ලද සමස්ත ආවරණ කාල පරිච්ඡේදය සඳහා ලැබිය යුතු මුළු වාරිකයන්ගෙනි. ඒවා ඔප්පුව අනුමත කරන ලද දිනයේ දී හඳුනාගනු ලබයි. පෙර ගිණුම් කාල පරිච්ඡේදයේ සටහන් කරන ලද ව්‍යාපාර කටයුතු වලට අදාලව ලැබිය යුතු වාරික සඳහා වන ගිණුම් කාලපරිච්ඡේදය තුල පැන නැගුනු කවර ගැලපීමක් වුවත් වාරික තුල ඇතුලත් වේ.

නොඉපයූ වාරික යනු වාර්තා කරන දිනයට පසුව අවදානම් කාලයට අදාලව වර්ෂය තුල සටහන් කරන ලද වාරිකවල කොටස්ය. පොදුවේ පිළිගන්නා රක්‍ෂණ හා ප්‍රතිරක්‍ෂණ පරිචයන් අනුව දින 365, 1/24 හෝ දළ වාරික පදනම මත 35% අනුපාතයට නොඉපයූ වාරික ගණනය කරයි. පසුකාලීන කාල පරිච්ඡේදයන්ට ආරෝපණය කෙරෙන අනුපාත නොඉපයූ වාරික සඳහා ප්‍රතිපාදනයක් ලෙස විලම්භනය කෙරේ.

**2.7.2 ගාස්තු හා අනෙකුත් ආදායම්**

ඔප්පු පරිපාලන සේවා ගාස්තු, ඔප්පු ගාස්තු හා අනෙකුත් ගිවිසුම් ගාස්තු වශයෙන් රක්‍ෂණ ගිවිසුම් ඔප්පු ලාභීන්ගෙන් ගාස්තු අය කරයි. මෙම ගාස්තු ලිඛිත පදනම මත ආදායම (අනෙක් ආදායම්) ලෙස හඳුනා ගනු ලැබේ.

**2.7.3 පොලී ආදායම**

පොලී ආදායම උපචිත වන අවස්ථාවේ දීම සඵල පොලී අනුපාත ක්‍රමය භාවිත කරමින් ගණනය කර ආදායම් ප්‍රකාශය තුළ සටහන් කෙරෙනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

### 2.8 ප්‍රතිලාභ, හිමිකම් සහ වියදම් හඳුනාගැනීම

### 2.8.1 දළ ප්‍රතිලාභ හා හිමිකම්

හිමිකම් ඉල්ලීම සම්බන්ධ ක්‍රියාවලිය හා පියවීමට අදාළ අභ්‍යන්තර හා බාහිර හිමිකම් මෙහෙයුම් වලට අදාළව වසර තුළ වාර්තා වන සියළු හිමිකම් ඉල්ලීම්, අබලි වටිනාකම් සහ අනෙකුත් අයවීම් සඳහා වන අඩු කිරීමක් සහ පෙර වසර වල හිගව ඇති හිමිකම් සඳහා වන කවර හෝ ගැලපීම් රක්ෂණ හිමිකම් ඉල්ලීම් හි ඇතුළත් වේ.

### 2.8.2 වියදම් හඳුනා ගැනීම

කාර්යක්ෂම ලෙස මණ්ඩලය පවත්වාගෙන යෑම මෙන්ම දේපල පිරියත උපකරණ නඩත්තු කිරීම මගින් හට ගන්නා සියලු වියදම් ශුද්ධ අතිරික්තය මත ආදායමට අයකර ඇත.

### 2.9 සංසන්දනාත්මක දත්ත

ප්‍රවර්ථන වර්ෂයේ ගිණුම්කරන ප්‍රතිපත්ති හා ඉදිරිපත් කිරීම් සඳහා අනුකූලවනසේ අවශ්‍ය පරිදි මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති සංසන්දනාත්මක මූල්‍ය තොරතුරු යලි සඳහන් කර ඇත.

### 2.10 ප්‍රාග්ධන කැපකිරීම්

ශේෂපත්‍ර දිනට කිසිදු ප්‍රාග්ධන බැඳීමක් නොතිබුණි.

### 2.11 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

අනියම් ක්‍රමවේදය භාවිත කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

### 2.12 සම්බන්ධිත පාර්ශ්වකාර ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්වල දක්වා ඇති අන්තර් දෙපාර්තමේන්තු ගනුදෙනු හැරුණුවිට සම්බන්ධිත පාර්ශවකාර ගනුදෙනු සිදුවී නොමැත.

### 2.13 පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම්

සියලුම ප්‍රමාණාත්මක පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම් සලකා බලා ඇති අතර යෝග්‍ය පරිදි ගැලපීම් හෝ අනාවරණයන් මූල්‍ය ප්‍රකාශයේ අදාළ සටහන්වල දක්වා ඇත.

### 2.14 අවිනිශ්චිතතා

මණ්ඩලයේ මතය අනුව සාමාන්‍ය ව්‍යාපාර කටයුතු හේතුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදලට එරෙහිව ගොනුකරනු ලදුව දැනට විභාගවන නඩු කටයුතු වාර්තාකර ඇති මූල්‍ය ප්‍රතිපත්තිවලට හෝ මණ්ඩලයේ අනාගත මෙහෙයුම්වලට සැලකියයුතු බලපෑමක් ඇති නොකරයි.

### 2.15 හඳුන්වාදුන් එහෙත් තවමත් බලාත්මක නොවූ ප්‍රමිතීන්

හඳුන්වාදෙනු ලැබුවද, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා බලාත්මක නොකළ පහත සඳහන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර.) මණ්ඩලයේ මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී අදාළ කර නොගන්නා ලදී. එම ප්‍රමිති ඒවායේ බලාත්මක කරනු ලබන දිනයේ පටන් මූල්‍ය ප්‍රකාශයන්ට යම් මූල්‍යමය බලපෑමක් සිදුකළ හැකිව තිබුණි.

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. අංක 9 - මූල්‍ය උපකරණ වර්ගීකරණය හා ඇගයීම:

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. අංක 9 නිකුත් කිරීම ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අංක 39 ඉවත්කොට ඒ වෙනුවට පෙරකී ප්‍රමිති අංක 9 ආදේශ කිරීමේ මූලික පියවරක් ලෙස සැලකිය හැකි අතර මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණයට හා ඇගයීම සම්බන්ධයෙන් එම ප්‍රමිති අංක 9 අදාළ වෙයි.

මෙම ප්‍රමිතීන් බලාත්මක වූයේ 2018 ජනවාරි 01 දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදයන්ටය.

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. අංක 9 යොදා ගැනීම මගින් මණ්ඩලයේ මූල්‍ය වත්කම් වර්ගීකරණයට හා තක්සේරු කිරීමට බලපෑමක් ඇතිවිය හැකි නමුත් මණ්ඩලයේ මූල්‍ය වගකීම් වර්ගීකරණය හා තක්සේරු කිරීමට එයින් බලපෑමක් ඇති නොකරයි.

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 15 - පාරිභෝගිකයින් සමග ඇති ගිවිසුම්වලින් ලැබෙන ආදායම

කුමන අවස්ථාවක කොපමණ ප්‍රමාණයකින් ආදායම හඳුනාගත යුතුද යන්න තීරණය කිරීම සඳහා ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 15 මගින් විස්තීර්ණ රාමුවක් ස්ථාපිත කරයි.

මෙම ප්‍රමිතීන් බලාත්මක වූයේ 2018 ජනවාරි 01 දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදයන්ටය.

ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 4 විෂය පථයෙන් රක්ෂණ ගිවිසුම් ඉවත්කර ඇති බැවින් මෙම ප්‍රමිතිය මගින් රක්ෂණ ගනුදෙනු සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති වී තිබිය නොහැක.

## 1. ශුද්ධ වාරික

### 1.1 දළ ලිඛිත වාරික

ප්‍රධාන රක්ෂණ ව්‍යාපාර වර්ග වලට අදාළව වසර තුළ වාරික ආදායම පහත පරිදි වේ.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ප්‍රතිරක්ෂණයෙන් ලද වාරික | 2,397,372,589 | 1,737,839,949 |
| වැව.කැ.කෝ.සි.අ.ත්‍රස්. වාරික | 3,533,324,423 | 3,018,417,937 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | 382,196,410 | 242,090,517 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ නොවන | 182,864,533 | 36,599,503 |
| සාමාන්‍ය රක්ෂණය - ආපදා කළමනාකරණ | 300,000,000 | |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | 18,000,000 | 27,737,796 |
| | **6,813,757,955** | **5,062,685,701** |

### 1.2 අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය සඳහා රැස්කළ දායක මුදල්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| සාමාජිකයන්ගේ දායකත්වය | 1,450,866,802 | 1,236,567,419 |
| මහා භාණ්ඩාගාරයේ දායකත්වය | 550,000,000 | 400,000,000 |
| විශ්‍රාමිකයන් සඳහා වන රක්ෂණ යෝජනාක්‍රමය | 3,569,800 | - |
| | **2,004,436,602** | **1,636,567,419** |

## 2. ගාස්තු හා කොමිස් ආදායම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ඔප්පු හිමියන්ට අදාළ පරිපාලන ගාස්තු | 4,704,803 | 6,596,760 |
| **මුළු ගාස්තු සහ කොමිස් ආදායම** | **4,704,803** | **6,596,760** |

## 3. ආයෝජන හා වෙනත් ආදායම්

### 3.1 ණය හා ලැබියයුතු දෑ මත පොළී ආදායම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ප්‍රතිමිලදී ගැණීමේ ගිවිසුම් වලින් ලද පොළී ආදායම් | 322,526,043 | 230,199,663 |
| ණයකර වලින් ලද පොළී ආදායම් | - | 88,394,975 |
| | **322,526,043** | **318,594,638** |

### 3.2 විකිණීම විකිණීම සඳහා වන ආයෝජන මත පොළී ආදායම්

| | | |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් වලින් ලද පොළී ආදායම් | 308,587,706 | 215,631,288 |
| භාණ්ඩාගාර බැඳුම්කර වලින් ලද පොළී ආදායම් | 328,758,699 | 264,371,922 |
| | **637,346,405** | **480,003,210** |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

### 3.3 කල්පිරෙන තෙක් තබා ඇති ආයෝජන මත පොළී ආදායම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මත පොළී ආදායම් | 7,429,430 | 3,010,646 |
| | 7,429,430 | 3,010,646 |
| **ආයෝජන වලින් ලද මුළු ආදායම** | **967,301,878** | **801,608,493** |

### 3.4 වෙනත් ආදායම්

| | | |
|---|---|---|
| මෘදු ණය මත පොළී | 2,078,808 | 3,110,618 |
| කාර්ය මණ්ඩල ආපදා ණය මත පොළී | 747,028 | 730,037 |
| වෙනත් | 13,856,663 | 44,337,661 |
| | 16,682,499 | 48,178,316 |
| **මුළු ආදායම** | **983,984,377** | **849,786,808** |

### 4. ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| **(අ) දළ ප්‍රතිලාභ හා හිමිකම් ගෙවීම්** | | |
| ප්‍රතිරක්ෂණ | (2,882,078,138) | (715,790,744) |
| වැව.කැ.කෝ.සි.අ.ත්‍රස්. අරමුදල (SRCC & TR) | 250,927 | (2,967,351) |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | (142,640,392) | (111,147,284) |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ නොවන | (49,937,952) | (30,195,877) |
| ආපදා කළමනාකරණ | (757,620,458) | |
| විශා රක්ෂණය | (68,646,391) | (685,994,044) |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | (16,416,373) | (19,087,311) |
| අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | (1,844,329,088) | (1,661,957,508) |
| | (5,761,417,865) | (3,227,140,119) |
| **(ආ) ප්‍රතිරක්ෂකයන්ට පැවරූ හිමිකම්** | | |
| ප්‍රතිරක්ෂණය | 3,557,320,000 | - |
| ආපදා කළමනාකරණ | 3,310,860,969 | - |
| | 6,868,180,969 | - |
| **(ඇ) ගිවිසුම්ගත වගකීම්වල දළ වෙනස** | | |
| ප්‍රතිරක්ෂණය | (3,295,980,074) | (527,238,148) |
| වැව.කැ.කෝ.සි.අ.ත්‍රස්. අරමුදල (SRCC & TR) | (33,928,163) | 2,187,114 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | 23,812,239 | (59,771,021) |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ නොවන | (5,617,254) | (3,084,534) |
| ආපදා කළමනාකරණ | (3,003,240,511) | |
| විශා රක්ෂණය | (148,125,925) | 489,137,093 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | | |
| අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | (186,838,115) | 100,332,409 |
| | (6,649,917,802) | 1,562,913 |
| **ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්** | **(5,543,154,699)** | **(3,225,577,206)** |

### 5. ප්‍රාරක්ෂණය සහ ප්‍රතිග්‍රහන පිරිවැය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ප්‍රතිග්‍රහන පිරිවැය | (1,124,410,583) | (1,001,143,846) |
| නොඉපයූ කොමිස් සංචිත වෙනස - SRCC | 43,841,952 | 10,769,720 |
| නොඉපයූ කොමිස් සංචිත වෙනස - ප්‍රතිරක්ෂණ | 8,374,401 | 43,741,532 |
| නොඉපයූ කොමිස් සංචිත වෙනස - GI | 3,873,350 | - |
| | **(1,068,320,881)** | **(946,632,594)** |

### 6. වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 180,000 | 180,000 |
| සේවක ප්‍රතිලාභ පිරිවැය | 164,253,318 | 131,921,282 |
| පරිපාලන සහ ආයතන පිරිවැය | 107,673,497 | 83,592,545 |
| ප්‍රතිලාභ කොමිස් පිරිවැය | 105,387,928 | - |
| විකිණුම් පිරිවැය | 1,388,925 | 1,609,680 |
| දේපල, පිරියත හා උපකරණ ක්ෂය | 7,056,814 | 6,579,710 |
| නෛතික ගාස්තු | 868,495 | 346,864 |
| අනුග්‍රාහකත්ව | 1,159,220 | 709,600 |
| **වෙනත් මෙහෙයුම් හා පරිපාලන වියදම්** | **387,968,196** | **224,939,681** |

#### 6.1 සේවක ප්‍රතිලාභ පිරිවැය

| | | |
|---|---|---|
| ප්‍රසාද දීමනා හා දිරිදීමනා ඇතුළු වැටුප් හා වේතන | 114,058,912 | 93,336,158 |
| නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය | | |
| සේවක අර්ථසාධක අරමුදල | 13,515,405 | 11,135,836 |
| සේවක භාර අරමුදල | 3,563,451 | 2,785,459 |
| වෙනත් පෞද්ගලික පිරිවැය | 29,511,905 | 18,923,614 |
| විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය | 3,603,644 | 5,740,215 |
| **මුළු සේවක ප්‍රතිලාභ පිරිවැය** | **164,253,318** | **131,921,282** |

#### 6.2 පරිපාලන හා ආයතන පිරිවැය

| | | |
|---|---|---|
| වෘත්තීයවේදී ගාස්තු | 2,519,047 | 671,327 |
| විදුලිය | 7,174,592 | 6,688,632 |
| දුරකථන | 2,554,839 | 1,739,178 |
| දුරකථන මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 7,950,542 | 7,241,377 |
| තැපැල් ගාස්තු | 2,249,064 | 2,275,342 |
| කාර්යාල කුලීය | 21,331,434 | 21,758,234 |
| ජාතිය ගොඩනැගීමේ බදු පිරිවැය | 12,587,904 | |
| වෙනත් පරිපාලන හා ආයතන පිරිවැය | 51,306,076 | 43,218,455 |
| **මුළු පරිපාලන හා ආයතන පිරිවැය** | **107,673,497** | **83,592,545** |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

## 7. අස්පෘශ්‍ය වත්කම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| **පිරිවැය** | | |
| 2015 ජනවාරි 1 දිනට | 6,542,073 | 6,542,073 |
| එකතුකිරීම් | | |
| 2016 දෙසැම්බර් 31 දිනට | 6,542,073 | 6,542,073 |
| **සමුච්චිත ක්‍රමක්ෂය සහ අවකරන** | | |
| 2015 ජනවාරි 1 දිනට | 6,542,073 | 6,542,073 |
| ක්‍රමක්ෂය | - | - |
| 2016 දෙසැම්බර් 31 දිනට | 6,542,073 | 6,542,073 |
| **ධාරණ අගය** | | |
| 2014 දෙසැම්බර් 31 දිනට | - | - |
| 2015 දෙසැම්බර් 31 දිනට | - | - |

සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරනු ලැබූ නමුත් වාර්තා කරනු ලබන දිනටත් භාවිතට ගෙන ඇති අස්පෘශ වත්කම්වල ආරම්භක පිරිවැය පහත දැක්වේ:

| දෙසැම්බර් 31 දිනට | 2016 | 2015 |
|---|---|---|
| මෘදුකාංග | 6,542,073 | 6,542,073 |

## 8. දේපල, පිරියත හා උපකරණ

| සමාගම | මෝටර් රථ<br>රු. | කාර්යාල උපකරණ<br>රු. | ගෘහභාණ්ඩ හා සවිකිරීම්<br>රු. | විවිධ වත්කම්<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | |
| 2016 ජනවාරි 1 දිනට | 34,628,245 | 36,436,039 | 8,251,301 | 23,338 | 79,338,922 |
| එකතුකිරීම් | - | 11,057,998 | 2,317,130 | - | 13,375,128 |
| පැවරුම් | - | - | - | - | |
| බැහැර කිරීම් | - | - | - | - | - |
| **2016 දෙසැම්බර් 31 දිනට** | **34,628,245** | **47,494,037** | **10,568,431** | **23,338** | **92,714,050** |
| **සමුච්චිත ක්ෂය** | | | | | |
| 2016 ජනවාරි 1 දිනට | 25,448,531 | 16,183,106 | 3,558,150 | 23,338 | 45,213,125 |
| ක්ෂය කිරීම් | 3,121,170 | 3,219,833 | 715,811 | - | 7,056,814 |
| බැහැරකිරීම් | - | - | | | |
| පෙර වර්ෂයට අදාළ ගැලපීම් | - | (2,474,459) | (139,972) | - | (2,614,431) |
| **2016 දෙසැම්බර් 31 දිනට** | **28,569,701** | **16,928,480** | **4,133,989** | **23,338** | **49,655,508** |
| **ධාරණ අගය** | | | | | |
| **2015 දෙසැම්බර් 31 දිනට** | **9,179,714** | **20,252,932** | **4,693,151** | - | **34,125,797** |
| **2016 දෙසැම්බර් 31 දිනට** | **6,058,543** | **30,565,557** | **6,434,442** | - | **43,058,542** |

**සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලදුව, භාවිත කරනු ලබන දේපල, පිරියත හා උපකරණ**

සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලදුව, වාර්තා කරනු ලබන දිනටත් භාවිතට ගෙන ඇති දේපල, පිරියත හා උපකරණවල ආරම්භක පිරිවැය පහත දැක්වේ:

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| විවිධ වත්කම් | 23,338 | 23,338 |

## 9. මූල්‍ය වත්කම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| ණය හා ලැබිය යුතු දෑ | 9.1 | 2,433,292,966 | 4,268,076,752 |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම් | 9.2 | 8,701,092,379 | 5,890,404,632 |
| කල්පිරෙන තෙක් තබා ඇති මූල්‍ය වත්කම් | 9.3 | 53,459,028 | 230,491,342 |
| | | **11,187,844,373** | **10,388,972,726** |

### 9.1 ණය හා ලැබිය යුතු දෑ

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ණය හා ලැබිය යුතු දෑ | 2,433,292,966 | 4,268,076,752 |
| **සමස්ත මූල්‍ය සාධනපත්‍ර** | **2,433,292,966** | **4,268,076,752** |
| **ණය හා ලැබිය යුතු දෑ** | | |
| රජයේ සුරැකුම්පත් - ප්‍රතිගැණුම් ආයෝජන | 2,433,292,966 | 4,268,076,752 |
| කොටස් වෙළඳ පොලේ ලැයිස්තුගත නොකළ ණයකර | | |
| **ක්‍රමක්ෂය කළ පිරිවැය මත මුළු ණය හා ලැබිය යුතු මුදල** | **2,433,292,966** | **4,268,076,752** |

### 9.2 විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වක්කම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| රජයේ සුරැකුම්පත් - භාණ්ඩාගාර බැඳුම්කර | 5,304,469,505 | 2,898,681,590 |
| රජයේ සුරැකුම්පත් - භාණ්ඩාගාර බිල්පත් | 3,396,622,874 | 2,991,723,042 |
| | **8,701,092,379** | **5,890,404,632** |

### 9.3 කල් පිරෙන තෙක් තබා ඇති මූල්‍ය වත්කම්

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 53,459,028 | 230,491,342 |
| | **53,459,028** | **230,491,342** |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

## 10. ලැබිය යුතු වාරික

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| **වාරික ලැබිය යුත්තේ** | | |
| සෘජු පාර්භෝගිකයන්ගෙන් | 702,493,693 | 507,851,102 |
| තැරැව්කරුවන්ගෙන් | 638,346,753 | 553,046,924 |
| | **1,340,840,446** | **1,060,898,025** |

### 10.1 සෘජු පාර්භෝගිකයන්ගෙන් ලැබිය යුතු වාරික

| | | |
|---|---|---|
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | 119,222,251 | 39,682,591 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ නොවන | 144,840,641 | 5,033,772 |
| ලබාගත් ප්‍රතිරක්ෂණ වාරික | 424,430,802 | 446,043,246 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන රක්ෂණ යෝජනාක්‍රමය | 14,000,000 | 17,091,493 |
| | **702,493,693** | **507,851,102** |

## 11. මෘදු ණය

| | | |
|---|---|---|
| මෘදු ණය | 67,081,271 | 129,244,611 |

## 12. වෙනත් මූල්‍ය නොවන වත්කම්

| | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| අත්තිකාරම් හා පෙරගෙවුම් | 5,996,509 | 4,725,187 |
| ආපසු ගෙවනු ලබන තැන්පතු | 4,980,250 | 6,780,250 |
| කාර්යමණ්ඩල ආපදා ණය | 21,739,991 | 17,418,397 |
| කෘෂි රක්ෂණ මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් | 40,598,099 | - |
| විලම්භනය කළ ප්‍රතිරක්ෂණ වාරික | 67,502,500 | - |
| ආපදා කළමනාකරණයෙන් ලැබිය යුතු මුදල් | 15,738,250 | - |
| ආර්ථික සේවා ගාස්තුව | 2,554,923 | 2,554,923 |
| ලැබිය යුතු ආපසු හරවායැවූ චෙක්පත් | 780,912 | 828,681 |
| | **159,891,434** | **32,307,438** |

## 13. විලම්බිත කොමිස්

| | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ජනවාරි 1 දිනට | 421,132,952 | 366,621,700 |
| වර්ෂය තුළ සලසාදෙනු ලැබූ /(මුදා හළ) ප්‍රතිපාදන | 61,775,957 | 54,511,252 |
| **දෙසැම්බර් 31 දිනට** | **482,908,909** | **421,132,952** |

## 14. මුදල් සහ මුදල් හා සමාන වත්කම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| සුළු මුදල් | 185,363 | 159,002 |
| බැංකුවේ ඇති මුදල් | 705,020,364 | 166,626,330 |
| අතැති හා බැංකුවේ ඇති මුදල් | 705,205,727 | 166,785,332 |
| බැංකු අයිරා | (274,914,611) | - |
| **මුළු මුදල සහ මුදල් හා සමාන වත්කම්** | **430,291,116** | **166,785,332** |

*සටහන - ගෙවීම් කිරීමට ඇති ප්‍රතිරක්ෂණ හේතුවෙන් පොත්වල පමණක් පෙන්වනු ලබන අයිරාවකි.

## 15. වෙනත් වගකීම්

| | සටහන් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| වෙනත් මූල්‍ය වගකීම් | 15.1 | 586,787,527 | 193,756,079 |
| වෙනත් මූල්‍ය නොවන වගකීම් | 15.2 | 1,278,745,909 | 109,826,918 |
| | | **1,865,533,436** | **303,582,998** |

### 15.1 වෙනත් මූල්‍ය වගකීම්

| | | |
|---|---|---|
| හිමිකම් චෙක්පත්/හරවා එවූ ගෙවියයුතු SLIPS | 6,052,738 | 5,369,830 |
| රැස්කරගත් මෝටර්රථ රක්ෂණ වාරික අත්තිකාරම් | 15,319,066 | 29,328,516 |
| ගෙවිය යුතු කොමිස් - ප්‍රතිරක්ෂණය | 42,442,577 | 56,796,368 |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ වාරික | 350,451,671 | - |
| ගෙවිය යුතු වාර්ෂික ගාස්තු හා සෙස් බදු | 8,480,878 | 28,431,933 |
| ගෙවිය යුතු වාරික ආපසු ගෙවීම | 46,715,161 | 53,670,950 |
| ගෙවිය යුතු ප්‍රතිලාභ කොමිස් | 89,809,561 | - |
| උපචිත වියදම් | 6,910,129 | 7,838,761 |
| ගෙවිය යුතු වෙනත් වියදම් | 20,605,746 | 12,319,721 |
| | **586,787,527** | **193,756,079** |

### 15.2 වෙනත් මූල්‍ය නොවන වගකීම්

| | | |
|---|---|---|
| ගෙවිය යුතු ආදායම් බදු | 569,137,650 | 19,659,524 |
| ගෙවිය යුතු අගය එකතුකළ බදු | 83,354,811 | 66,805,113 |
| ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු | 26,260,698 | 23,351,532 |
| ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු මුදල් | 600,000,000 | - |
| ගෙවිය යුතු රඳවාගැනීමේ බදු | (7,250) | 10,750 |
| | **1,278,745,909** | **109,826,918** |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

## 16. ආංශික තොරතුරු

ඉහත එක් එක් රක්‍ෂණ වර්ගයට අදාළ දළ ලිඛිත වාරික සිට ප්‍රාරක්‍ෂණ ප්‍රතිඵලය දක්වා තොරතුරු පහත දැක්වේ.

| | 2016 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| වාරික | මෝටර්රථ රු. | මෝටර්රථ නොවන රු. | ආපදා කළමනාකරණ රු. | ප්‍රතිරක්‍ෂණ රු. | වැ..කැ.කෝ. සි.අ.ත්‍ර.ක්‍රි රු. | සෞඛ්‍ය අග්‍රහාර/ප.ම. යෝජනාක්‍රමය | වගා යෝජනාක්‍රමය රක්‍ෂණ | එකතුව රු. |
| දළ ලිඛිත වාරික | 382,196,410 | 182,864,533 | 300,000,000 | 2,397,372,589 | 3,533,324,423 | 18,000,000 | - | 6,813,757,955 |
| අග්‍රහාර සඳහා ලද දායක මුදල | - | - | - | - | - | 2,004,436,602 | - | 2,004,436,602 |
| රැස්කළ වගා රක්‍ෂණ බදු | - | - | - | - | - | - | 1,511,302,032 | 1,511,302,032 |
| පවරාදුන් වාරික | - | - | (508,506,900) | (252,045,973) | - | - | - | (760,552,873) |
| **දළ ලිඛිත වාරික** | **382,196,410** | **182,864,533** | **(208,506,900)** | **2,145,326,616** | **3,533,324,423** | **2,022,436,602** | **1,511,302,032** | **9,568,943,716** |
| උපයානොගත් ශුද්ධ වාරික සංචිතයේ ශුද්ධ වෙනස | (33,597,156) | (120,334,798) | (73,972,603) | (230,836,424) | (259,027,791) | (668,493) | - | (718,437,265) |
| **උපයාගත් ශුද්ධ වාරික (A)** | **348,599,255** | **62,529,734** | **(282,479,503)** | **1,914,490,192** | **3,274,296,632** | **2,021,768,108** | **1,511,302,032** | **8,850,506,451** |
| ප්‍රතිරක්‍ෂණ කොමිස් ආදායම් | - | - | - | | | | | |
| විලම්බිත ප්‍රතිරක්‍ෂණ කොමිස් ආදායම් වෙනස්වීම | - | - | - | | | | | |
| **ශුද්ධ ප්‍රතිරක්‍ෂණ කොමිස් ආදායම (B)** | - | - | - | - | - | - | - | - |
| ගාස්තු ආදායම් | 4,608,854 | 95,949 | - | - | - | - | - | 4,704,803 |
| **මුළු ප්‍රාරක්‍ෂණ ආදායම ( A + B + C)** | **353,208,109** | **62,625,683** | **(282,479,503)** | **1,914,490,192** | **3,274,296,632** | **2,021,768,108** | **1,511,302,032** | **8,855,211,254** |
| ප්‍රතිග්‍රහන පිරිවැය | (1,812,906) | - | - | (557,479,855) | (509,028,120) | - | - | (1,068,320,881) |
| විලම්බිත ප්‍රතිග්‍රහණ පිරිවැයේ වෙනස්වීම | - | | | | | | | |
| **ශුද්ධ ප්‍රතිග්‍රහණ පිරිවය (D)** | **(1,812,906)** | - | - | **(557,479,855)** | **(509,028,120)** | - | - | **(1,068,320,881)** |
| පිරිවැය දළ හිමිකම් | (174,536,371) | (53,655,469) | (3,760,860,969) | (6,093,990,370) | 1,286,187 | (1,966,584,869) | (68,646,391) | (12,116,988,251) |
| ප්‍රතිරක්‍ෂණ අයකරගැනීම් | - | - | 3,310,860,969 | 3,557,320,000 | - | - | - | 6,868,180,969 |
| **IBNR පෙර පියවූ ශුද්ධ හිමිකම් (E)** | **(174,536,371)** | **(53,655,469)** | **(450,000,000)** | **(2,536,670,370)** | **1,286,187** | **(1,966,584,869)** | **(68,646,391)** | **(5,248,807,283)** |
| වෙනත් තාක්‍ෂණික සංචිතවල දළ වෙනස්වීම - IBNR | 55,708,218 | (1,899,737) | - | (84,067,842) | (34,963,423) | (80,998,707) | (148,125,925) | (294,347,416) |
| **පිරිවැය ශුද්ධ හිමිකම් (E)** | **(118,828,153)** | **(55,555,206)** | **(450,000,000)** | **(2,620,738,212)** | **(33,677,236)** | **(2,047,583,576)** | **(216,772,316)** | **(5,543,154,699)** |
| **පරිපාලන වියදම් (F)** | **(48,658,073)** | **(12,164,518)** | - | **(24,329,036)** | **(144,677,831)** | **(145,974,219)** | **(12,164,518)** | **(387,968,196)** |
| මුළු ප්‍රාරක්‍ෂණ පිරිවැය (D + E + F) | (169,299,132) | (67,719,724) | (450,000,000) | (3,202,547,104) | (687,383,187) | (2,193,557,795) | (228,936,834) | (6,999,443,775) |
| **ප්‍රාරක්‍ෂණ ප්‍රතිඵලය** | **183,908,977** | **(5,094,041)** | **(732,479,503)** | **(1,288,056,911)** | **2,586,913,445** | **(171,789,686)** | **1,282,365,198** | **1,855,767,478** |
| වසරේ ආයෝජන හා වෙනත් ආදායම | 62,840,376 | 8,196,862 | - | 247,093,959 | 599,542,870 | 2,039,484 | 64,270,827 | 983,984,377 |
| **බදු පෙර ලාභය** | **246,749,353** | **3,102,821** | **(732,479,503)** | **(1,040,962,953)** | **3,186,456,315** | **(169,750,202)** | **1,346,636,024** | **2,839,751,856** |

## 17. රක්ෂණ ගිවිසුම්ගත වගකීම්

| (අ) රක්ෂණ ප්‍රතිපාදනය | සටහන් | 2016 මෝටර්රථ රක්ෂණ ගිවිසුම් වගකීම් රු. | මෝටර්රථ නොවන ගිවිසුම් වගකීම් රු. | ප්‍රතිරක්ෂණ ගිවිසුම් වගකීම් රු. | SRCC ගිවිසුම් වගකීම් රු. | වගා ගිවිසුම් වගකීම් රු. | අග්‍රහාර ගිවිසුම් වගකීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|
| ඔප්පු හිමියන් විසින් වාර්තාකර ඇති | - | - | - | - | - | - | - | |
| හිමිකම් සඳහා ප්‍රතිපාදන IBNR | | (55,708,218) | 1,899,737 | 84,067,842 | - | 148,125,925 | 80,998,707 | 259,383,993 |
| නොගෙවූ හිමිකම් සඳහා ප්‍රතිපාදන | 17.1 | 151,746,931 | 3,005,945,239 | 3,326,836,134 | 35,934,660 | 605,196 | 105,839,408 | 6,626,907,568 |
| උපයානොගත් වාරික සඳහා ප්‍රතිපාදන | 17.2 | 105,650,425 | 215,227,193 | 839,080,406 | 1,701,990,624 | 12,032,877 | - | 2,873,981,525 |
| **සමස්ත රක්ෂණ ගිවිසුම් වගකීම්** | | **201,689,138** | **3,223,072,169** | **4,249,984,382** | **1,737,925,284** | **160,763,998** | **186,838,115** | **9,760,273,086** |

| (ආ) තාක්ෂණික ප්‍රතිපාදන | සටහන් | 2016 මෝටර්රථ රක්ෂණ ගිවිසුම් වගකීම් රු. | මෝටර්රථ නොවන ගිවිසුම් වගකීම් රු. | ප්‍රතිරක්ෂණ ගිවිසුම් වගකීම් රු. | SRCC ගිවිසුම් වගකීම් රු. | වගා ගිවිසුම් වගකීම් රු. | අග්‍රහාර ගිවිසුම් වගකීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|
| ඔප්පු හිමියන් විසින් වාර්තා කළ හිමිකම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | - | - | - | |
| හිමිකම් සඳහා ප්‍රතිපාදන IBNR | | (55,708,218) | 1,899,737 | 84,067,842 | - | 148,125,925 | 80,998,707 | 259,383,993 |
| නොගෙවූ හිමිකම් සඳහා ප්‍රතිපාදන | 17.1 | 151,746,931 | 3,005,945,239 | 3,326,836,134 | 35,934,660 | 605,196 | 105,839,408 | 6,626,907,568 |
| උපයානොගත් වාරික සඳහා ප්‍රතිපාදන | 17.2 | 105,650,425 | 215,227,193 | 839,080,406 | 1,701,990,624 | 12,032,877 | - | 2,873,981,525 |
| **සමස්ත රක්ෂණ ගිවිසුම් වගකීම** | | **201,689,138** | **3,223,072,169** | **4,249,984,382** | **1,737,925,284** | **160,763,998** | **186,838,115** | **9,760,273,086** |

### 17.1 නොගෙවූ හිමිකම් සඳහා ප්‍රතිපාදන

| | සටහන් | 2016 මෝටර්රථ රක්ෂණ ගිවිසුම් වගකීම් රු. | මෝටර්රථ නොවන ගිවිසුම් වගකීම් රු. | ප්‍රතිරක්ෂණ ගිවිසුම් වගකීම් රු. | SRCC ගිවිසුම් වගකීම් රු. | වගා ගිවිසුම් වගකීම් රු. | අග්‍රහාර ගිවිසුම් වගකීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි 1 දිනට | | 128,991,910 | 3,084,534 | 774,923,902 | 39,324,019 | 65,000,000 | 91,045,492 | 1,102,369,856 |
| ප්‍රතිපාදන ඉහළයාම/පහළයාම | | 22,755,021 | 3,002,860,705 | 2,551,912,232 | (3,389,359) | (64,394,804) | 14,793,916 | 5,524,537,712 |
| **දෙසැම්බර් 31 දිනට** | | **151,746,931** | **3,005,945,239** | **3,326,836,134** | **35,934,660** | **605,196** | **105,839,408** | **6,626,907,568** |

### 17.2 නොඉපයූ වාරික මත වෙන් කිරීම

| | 2016 මෝටර්රථ රක්ෂණ ගිවිසුම් වගකීම් රු. | මෝටර්රථ නොවන ගිවිසුම් වගකීම් රු. | ප්‍රතිරක්ෂණ ගිවිසුම් වගකීම් රු. | SRCC ගිවිසුම් වගකීම් රු. | පාර්ලිමේන්තු මන්ත්‍රී ගිවිසුම් වගකීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| ජනවාරි 1 දිනට | 72,053,269 | 20,919,792 | 608,243,982 | 1,442,962,833 | 11,364,384 | 2,155,544,260 |
| වර්ෂය තුළ උපයාගත් වාරික | 33,597,156 | 194,307,401 | 230,836,424 | 259,027,791 | 668,493 | 718,437,265 |
| **දෙසැම්බර් 31 දිනට** | **105,650,425** | **215,227,193** | **839,080,406** | **1,701,990,624** | **12,032,877** | **2,873,981,525** |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

## 18. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීමේ ප්‍රවර්ථන අගයේ සචලතාවන් පහත දැක්වෙන පරිදි වේ:

| | | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| වර්ෂයේ ආරම්භක ශේෂය | | 16,458,008 | 11,364,304 |
| එකතුකළා: විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය | 18.1 | (1,137,249) | 5,740,215 |
| අඩුකළා : වර්ෂය තුළ ගෙවන ලද ප්‍රතිලාභ | | (229,889) | (646,511) |
| **වර්ෂය අවසානයේදී ශේෂය** | | **15,090,870** | **16,458,008** |

### 18.1 විශ්‍රාම පාරිතෝෂික පිරිවැය

| | | |
|---|---|---|
| ප්‍රවර්ථන සේවා පිරිවැය | 3,603,644 | 5,740,215 |
| පොළී පිරිවැය ආයුගණක | - | - |
| ආයුගණක (ලාභය)/අලාභය | (4,740,893) | - |
| | **(1,137,249)** | **5,740,215** |

## 19. ආපදා කළමනාකරණය

### 19.1 හැඳින්වීම

මණ්ඩලය අලාභයන්ට මුහුණ දීම අවම කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග අවදානම් කළමනාකරණය මගින් විද්‍යාමාන වේ. මණ්ඩලය පහත සඳහන් අවදානම් වලට පාත්‍ර වෙයි:

**රක්ෂණ අවදානම** ජීවිත නොවන රක්ෂණ හා ලැබෙන ප්‍රතිරක්ෂණ ගිවිසුම් ප්‍රතිරක්ෂණය

**මූල්‍ය අවදානම** වෙළඳපල අවදානම
ද්‍රවශීලතා අවදානම
ණය අවදානම
මෙහෙයුම් අවදානම

**රක්ෂණ හා මූල්‍ය අවදානම**

**(අ) රක්ෂණ අවදානම**

රක්ෂණ ගිවිසුම් යටතේ මණ්ඩලය මුහුණ දෙන ප්‍රධාන අවදානම වන්නේ සත්‍ය හිමිකම් ඉල්ලීම හා ප්‍රතිලාභ ගෙවීම් හෝ ඒවා ගෙවීමට ගතවන කාලය අපේක්ෂා කරන මට්ටමට වඩා වෙනස් වීමයි. නිරන්තරයෙන් ඉල්ලීම් ඉදිරිපත් වීම සහ ඉල්ලීම් වල බරපතලකම සහ ගෙවනු ලබන සත්‍ය ප්‍රතිලාභ මෙම තත්ත්වයට හේතු වේ. එබැවින්, මණ්ඩලයේ අරමුණ වනුයේ මෙකී වගකීම් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් සංචිත පවත්වා ගැනීමට කටයුතු කිරීමයි. රක්ෂණ ගිවිසුම් විශාල සංඛ්‍යාවක් හරහා විවිධාංගීකරණය මගින් මේ අවදානම් තත්ත්වය අවම කරගැනීමට කටයුතු කරනු ලබයි. සැලකිලිමත් තෝරා ගැනීම සහ ප්‍රාරක්ෂණ උපායමාර්ගික මඟපෙන්වීම් මගින් අවදානම් විචල්‍යතාව ද පාලනය කෙරේ.

මණ්ඩලය මූලික වශයෙන් මෝටර් වාහන, සමුද්‍ර උවදුරු, ගිනි, ඉංජිනේරු හා විවිධ රක්ෂණ වර්ග වැනි සාමාන්‍ය රක්ෂණ වර්ග නිකුත් කරයි. සෞඛ්‍ය රක්ෂණය මගින් ඔප්පු හිමියන් සඳහා වෛද්‍ය වියදම් ආවරණ සපයයි. රක්ෂණ ඔප්පු යටතේ වන අවදානම සාමාන්‍යයෙන් මාස දොළහක කාලයකට ආවරණ සපයයි.

ලබාගන්නා ප්‍රතිරක්ෂණයන් ඇතුළු සාමාන්‍ය රක්ෂණයන් සඳහා වඩාත් ම කැපීපෙනෙන අවදානම පැන නගිනුයේ කාලගුණික වෙනස්කම්, ස්වභාවික විපත් සහ ත්‍රස්තවාදී ක්‍රියා මගිනි. පියවීම සඳහා සැලකිය යුතු දීර්ගකාලයක් ගතවන හිමිකම් සඳහා උද්ධමන අවදානමක් ද පවතී. සෞඛ්‍ය රක්ෂණ ගිවිසුම් සඳහා වඩාත්ම වැදගත් අවදානම පැන නගින්නේ ජීවන රටාවේ වෙනස්කම්, වසංගත සහ වෛද්‍ය මෙන්ම තාක්ෂණයේ ද ඇතිවන දියුණුව මගිනි.

මණ්ඩලය විසින් රක්ෂණය කරනු ලබන අවදානම් වල පිහිටීම, රක්ෂණය කරනු ලබන අවදානම් වර්ගය සහ අදාළවන කර්මාන්තය අනුව අවදානම් වල කැපී පෙනෙන වෙනසක් නොමැත.

රක්ෂණ ගිවිසුම් විශාල සංඛ්‍යාවක් මගින් විවිධාංගීකරණය කිරීම හරහා ඉහත සඳහන් අවදානම් නිරාවරණය අවම කරගනී. රක්ෂිත ප්‍රතිලාභ මට්ටම හා අවදානම් වර්ගය අනුව අවදානම් විවිධාංගීකරණයට ලක්වන බවට සහතික වන සේ නිර්මාණය කර ඇති ප්‍රතිරක්ෂණ උපායමාර්ගයන් ක්‍රියාත්මක කිරීම මගින් සහ සැලකිලිමත් තෝරා ගැනීම මගින් අවදානම් විචලනය ද පාලනය කරනු ලබයි. කර්මාන්ත අංශයන් හි විවිධාංගීකරණය හරහා විශාල වශයෙන් මෙය ලඝාකර ගනී. තවද මණ්ඩලය නිරාවරණය විය හැකි අවදානම් අවම කරනු පිණිස අලුත් සහ දැනට පවත්නා සියළුම හිමිකම් ඉල්ලීම් තක්සේරු කිරීම පිණිස හිමිකම් සමාලෝචනය සඳහා දැඩි ප්‍රතිපත්ති හිමිකම් ඉල්ලීම සඳහා කටයුතු කරන හිමිකම් පිළිබඳ දිනපතා සවිස්තරාත්මක සමාලෝචන, වියහැකි වංචා සඳහා වන නිරන්තර විමර්ශණ වලට අදාල ප්‍රතිපත්ති හා පටිපාටි නිසි පරිදි යොදාගැනේ. ව්‍යාපාරය සඳහා නිශේධාත්මක ලෙස බලපෑ හැකි කල්තබා කිව නොහැකි තත්ත්වයන්ට මණ්ඩලය ගොදුරු වීම අවම කිරීම පිණිස මණ්ඩලය තවදුරටත් හිමිකම් ඉල්ලීම් සක්‍රියව කළමනාකරනය කිරීම පිණිස සහ කඩිනම් පසු විපරම් කිරීමට අදාළව ප්‍රතිපත්තියක් බලාත්මක කරයි.

මෙම ප්‍රාරක්ෂණ ක්‍රමෝපායයන්හි අරමුණ වන්නේ, කළමනාකාරීත්වය විසින් තීරණය කරනු ලබන පරිදි මණ්ඩලයට දැරිය හැකි අවදානම් ප්‍රමාණය මත පදනම්ව එහි අවදානම් පාත්‍රතාව අවම කර ගැනීමයි.

**හිමිකම් ඉල්ලීම් නිරන්තරයෙන් ඉදිරිපත්වීම හා ඒවායේ තීව්‍රභාවය**
හිමිකම් ඉල්ලීම් නිරතුරු ඉදිරිපත්වීම හා ඒවායේ බරපතලකම සාධක කිහිපයක් මත රඳා පවතියි. මණ්ලඩය ප්‍රධාන වශයෙන් දේපල, ඉංජිනේරුමය, මෝටර් රථ, විවිධ අනතුරු, නාවික, වෛද්‍ය සහ පුද්ගල අනතුරු වර්ගයන් සඳහා ප්‍රාරක්ෂණය කරනු ලබයි. මෙවැනි රක්ෂණ වර්ගයන් සාමාන්‍යයෙන් කෙටිකාලීන රක්ෂණ ගිවිසුම් වේ. මේවායෙහි හානි ප්‍රතිපූර්ණයන් සඳහා වන්දි ගෙවීම් සාමාන්‍යයෙන් කෙටිකාල පරාසයක් තුළ සිදු වේ. මෙය රක්ෂණ අවදානම අඩු කිරීමට හේතු වේ.

**දේපල**
දේපල රක්ෂණ ගිවිසුම්වලට අදාළව ප්‍රධාන කාණ්ඩය වනුයේ ගිණි රක්ෂණය වේ. ඊට අනුරූපව එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපාරික කටයුතු අඩපන වීම ද ඇතුළත් වේ.

මෙම ගිවිසුම් යළි ස්ථාපන කිරීම් වටිනාකම හෝ හානි ප්‍රතිපූර්ණ පදනමින් ප්‍රාරක්ෂණය කිරීමක් සිදු කරයි. හානියට පත් දේපල යළි ගොඩනැගීම හෝ අළුත්වැඩියා කිරීමට යන වියදම ඒ දේපල පෙර තිබූ තත්ත්වයට පත් කිරීමට ගත වන කාලය හා ඒ තුළ ව්‍යාපාරික කටයුතු අඩාල වීම යන කරුණු ආවරණය වන පරිදි හානි පූර්ණ වන්දි ඉල්ලීම් කරයි.

**ඉංජිනේරුමය කාර්යයන්**
ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ රක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් වන අවදානම ප්‍රධාන අංගයන් වන්නේ රක්ෂිත ව්‍යාපෘති කාර්යයනට සිදුවිය හැකි අලාභ හා හානි මෙන්ම එහි ප්‍රතිඵළයක් ලෙස උද්ගතවන තුන්වන පාර්ශවයීය වගකීම්, රක්ෂිත පිරියත දේපල හා උපකරණවලට හානි හෝ පාඩු සිදුවීම සහ එහි ප්‍රතිඵලයක් ලෙසට ව්‍යාපාර කටයුතු ඇන හිටීම හා පාඩු සිදුවීමයි. අලාභයේ හෝ හානියේ ප්‍රමාණය ඒ සම්බන්ධයෙන් ඉදිරිපත වන ඉල්ලීම කෙරෙහි බලපාන ප්‍රධානතම සාධකයයි.

## 20. රක්ෂණ හා මූල්‍ය අවදානම

**මෝටර් වාහන**
මෝටර් වාහන රක්ෂණ ගිවිසුමක දී ප්‍රධාන අවදානම් හට ගැනීම වනුයේ මරණයට පත්වීම හෝ ශාරීරික හානි හා තුන්වන පාර්ශ්වයේ දේපල හානි ද ඇතුළත්ව රක්ෂිත වාහනයට සිදුවන අලාභයන් වේ. මරණයක දී හෝ ශාරීරික හානියක දී ලැබිය හැකි උසාවි නියෝග හා පාර්ශ්වකරුවන්ට සිදු වී ඇති හානියේ තරම අනුව හානි පූර්ණ වන්දිය තීරණය වේ.

**විවිධ අනතුරු**
විවිධ අනතුරු රක්ෂණයේ දී මුදල් නැති වීම, සේවක විශ්වාසය කඩවීම, පුද්ගල අනතුරු, සේවක වන්දි ගෙවීම්, විදේශ ගමන්, සාමාන්‍ය තුන්වන පාර්ශ්වීය වගකීම හා වෘත්තීයමය වගකීමෙන් මිදීම වැනි දෑ සම්බන්ධයෙන් හදිසි අනතුරු රක්ෂණ පන්තිය යටතේ ප්‍රාරක්ෂණය සිදුකරයි.
අදාළ අලාභයේ හෝ හානියේ තරම සහ අපේක්ෂිත උසාවි නියෝග මෙම විවිධ වර්ගයේ වගකීම් කාණ්ඩ යටතේ ගෙවිය යුතු වන්දි ප්‍රමාණය තීරණය වීමට ප්‍රධාන වශයෙන් බලපායි.

**මුහුදු රක්ෂණය**
මුහුදු රක්ෂණයේ දී ප්‍රධාන අවදානම් සාධකය වනුයේ සම්පූර්ණ හෝ කොටසක් වශයෙන් හිමිකම් අහිමිවීමට හේතුවන පාඩු හෝ රක්ෂිත යාත්‍රාවට හානි සිදුවීමයි. හිමිකම් ඉල්ලීම්වල ප්‍රමාණයට බලපාන ප්‍රධාන සාධකය වන්නේ පාඩුවේ හෝ හානියේ ප්‍රමාණයයි.

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

**වෛද්‍ය හා පුද්ගල අනතුරු**

වෛද්‍ය රක්ෂණයට අදාළ ප්‍රධාන අවදානම් වන්නේ ලෙඩ රෝග හා අනතුරු තත්ත්වයන් හා ඊට අදාළ සෞඛ්‍ය පිරිවැයයි. පුද්ගල අනතුරුවලට අදාළව ප්‍රධාන අවදානම් නම් මරණය හෝ ස්ථිර හෝ අර්ධ දුබලතා තත්වයන් වෙනුවෙන් පැන නගින හිමිකම් ඉල්ලීම් වේ.

**අවදානම් පිළිබඳ භූගෝලීය සංකේන්ද්‍රණය**

රක්ෂණ ගිවිසුම් මගින් පැන නගින රක්ෂණ අවදානම මූලිකවම ශ්‍රී ලංකාවේ භූගෝලීය සීමාව තුළට පමණක් සීමාවේ.

**(ආ) මූල්‍ය අවදානම**

**i. ණය අවදානම**

ණය අවදානම වනුයේ මූල්‍ය සාධනපත්‍රයකට අදාළව එක් පාර්ශ්වයක් විසින් එකී සාධනපත්‍රය යටතේ වන යම් බැඳීමක් ඉටුකිරීමට අපොහොසත් වීම මත අනෙක් පාර්ශ්වයට මූල්‍ය අලාභයක් සිදු වීමයි. පහත ක්‍රියාවලින් / ක්‍රියාකාරකම් මගින් මූල්‍ය සාධනපත්‍රවල ණය අවදාම අඩු කරනු ලබයි.

- මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ හා මඟපෙන්වීම් මත ණය අවදානම් ප්‍රතිපත්තිය පදනම් වී තිබීම. ආයෝජන රජයේ සුරැකුම්පත් සඳහා පමණක් සීමා වී ඇත.
- මණ්ඩලයේ නිරන්තර සමාලෝචනය මඟින් ද ණය අවදානම අවම වී ඇත.

### 21. රක්ෂණ හා මූල්‍ය අවදානම

**ලැබිය යුතු වාරික**

සියලුම වෙළඳ ණය මෙහෙයුම් අංශ මගින් අඛණ්ඩ පදනමකින් සුපරීක්ෂණය කරනු ලබයි.
වාර්තා කරනු ලබන දිනට ණය අවදානම කෙරෙහි උපරිම පාත්‍රතාව පහත පරිදි වේ.

| | සටහන් | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|
| ණය හා ලැබිය යුතු මුදල් | 9.1 | 2,433,292,966 | 4,268,076,752 |
| විකිණීම සඳහා තබාඇති මූල්‍ය වත්කම් | 9.2 | 8,701,092,379 | 5,890,404,632 |
| ලැබිය යුතු වාරික | 10 | 1,340,840,446 | 1,060,898,025 |
| මෘදු ණය | 11 | 67,081,271 | 129,244,611 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 14 | 705,205,727 | 166,785,332 |
| | | **13,247,512,789** | **11,515,409,352** |

**ii. ද්‍රවශීලතා අවදානම**

මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් උපයෝජනය මඟින් පියවනු ලබන මූල්‍ය වගකීම් සහ මූල්‍ය සාධනපත්‍ර හා බැඳි වගකීම නිරවුල් කිරීම සම්බන්ධයෙන් දුෂ්කරතාවන්ට මුහුණදීමට සමාගමකට සිදුවීම ද්‍රවශීලතා අවදානම ලෙස හැඳින්විය හැක.

ද්‍රවශීලතා අවශ්‍යතා මාසික පදනමින් සුපරීක්ෂණය කරනු ලබන අතර පැන නැගිය හැකි ඕනෑම වගකීමක් නිරවුල් කිරීමට එම සමාගමේ ප්‍රමාණවත් අරමුදල් පවතින බව එහි කළමනාකාරීත්වය විසින් සහතික කරගනී.

මණ්ඩලයේ ද්‍රවශීලතා අවදානම් පාත්‍රතාව අවමකර ගැනීම පිණිස පහත සඳහන් ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ක්‍රියාවට නංවා ඇත:

- කළමනාකාරීත්වය විසින් ද්‍රවශීලතා අවශ්‍යතා මාසික පදනමින් සුපරීක්ෂණය කර, පැන නගින ඕනෑම වගකීමක් නිරවුල් කිරීමට ප්‍රමාණවත් ද්‍රවශීල අරමුදල් පවතින බව සහතික කරගනී.
- හදිසි අරමුදල් අවශ්‍යතා ආවරණය කිරීම සඳහා හදිසි අරමුදල් සැලසුමක් ක්‍රියාත්මක කර ඇත.

## 22. රක්ෂණ හා මූල්‍ය අවදානම

### iii. වෙළඳපොළ අවදානම

වෙළඳපොළ මිල මට්ටම් වෙනස්වීම, විදේශ විනිමය අනුපාත වෙනස්වීම සහ පොළී අනුපාත වෙනස්වීම වැනි තත්ත්වයන් තුළ මණ්ඩලයේ ආදායම හෝ මූල්‍ය වත්කම්වල අගය වෙනස්වීම පිළිබඳ අවදානම වෙළඳපොළ අවදානම නම් වෙයි. මෙම වෙළඳපොළ අවදානම් කළමනාකරණයේ අරමුණ වන්නේ උපරිම ප්‍රතිලාභයක් ලබා ගන්නා අතරම පිළිගත හැකි සීමාවන් තුළ වෙළඳපොළ අවදානම් සඳහා නිරාවරණය වීමයි.

**අ පොළී අනුපාත අවදානම**

වෙළඳපොළ පොළී අනුපාතය වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය උපකරණයන් මගින් උත්පාදනය කරනු ලබන අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වටිනාකම වෙනස්වීමට ඇති අවදානම පොළී අනුපාත පිළිබඳ අවදානම නම් වෙයි. පාවෙන අනුපාත උපකරණයන් මෙම මුදල් ප්‍රවාහ පොළී අනුපාත අවදානම නිරාවරණය වන උපකරණ වන අතර, ස්ථිර පොළී අනුපාත සහිත උපකරණයන් සාධාරණ අගය පිළිබඳ පොළී අනුපාත අවදානමට නිරාවරණය වෙයි. මණ්ඩලය ස්ථිර පොළී අනුපාත යටතේ රජයේ සුරැකුම්වල ආයෝජනය කර ඇත. ඒ හේතුවෙන් වෙළඳපොළ පොළී අනුපාත වෙනස්වීම තුලින් විශාල අවදානමක් ඇතිවීම වළක්වා ගෙන ඇත.

**ආ විදේශ විනිමය අවදානම**

විදේශ විනිමය අනුපාතයෙහි ඇති වන වෙස්කම් නිසා මූල්‍ය උපකරණයන්ගේ වටිනාකම් වෙනස්වීම පිළිබඳව ඇති අවදානම විදේශ විනිමය අවදානම නම් වේ. මෙම අවදානමට මණ්ඩලය මුහුණ දෙන්නේ එය විදේශ විනිමය යොදා ගනිමින් අනෙකුත් රක්ෂකයින් සමඟ කරනු ලබන අන්තර්නම්‍ය ප්‍රතිරක්ෂණ ව්‍යාපාරික කටයුතුවල දීය.

විදේශ විනිමය අනුපාතික උච්චාවචනය හේතුවෙන් සැලකිය යුතු අලාභ සිදුවීමේ අවදානම ඉතා අවම වන්නේ යයි කළමනාකාරීත්වය විශ්වාස කරන අතර එයින් සිය විදේශ විනිමය පාත්‍රතාව සීමා කිරීමට මණ්ඩලය කටයුතු නොකරයි.

# වසර එකොළහක අප ආ ගමන්මග

## මූල්‍ය කාර්යසාධනය

**(සියලුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2016 | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | | | | | | | |
| උපයාගත් ශුද්ධ වාරික ආදායම | 8,850,506,451 | 7,931,485,679 | 8,015,628,345 | 5,452,318,662 | 3,886,183,341 | 3,606,365,031 | 3,926,469,856 | 4,019,486,220 | 3,427,950,662 | 2,654,902,681 | 318,902,642 |
| **ප්‍රතිලාභ, අලාභ සහ පිරිවැය** | | | | | | | | | | | |
| රක්ෂණ හිමිකම් සහ | | | | | | | | | | | |
| ප්‍රතිග්‍රහන පිරිවැය | (6,611,475,579) | (4,172,209,800) | (3,899,969,969) | (1,763,476,689) | (2,281,470,751) | (1,879,486,696) | (2,292,072,983) | (2,075,936,806) | (1,736,355,732) | (1,423,044,038) | (242,465,993) |
| | 2,239,030,872 | 3,759,275,879 | 4,115,658,376 | 3,688,841,974 | 1,604,712,590 | 1,726,878,335 | 1,634,396,873 | 1,943,549,415 | 1,691,594,930 | 1,231,858,643 | 76,436,649 |
| **වෙනත් ආදායම්** | | | | | | | | | | | |
| ආයෝජන ආදායම් | 967,301,878 | 801,608,493 | 624,075,269 | 691,492,020 | 615,813,544 | 723,412,241 | 798,117,037 | 1,364,459,074 | 1,205,463,441 | 528,264,787 | |
| මෘදු ණය මත පොළී | 2,078,808 | 3,110,618 | 11,937,931 | 5,915,955 | 7,278,316 | 10,163,846 | 16,982,331 | 15,125,027 | 19,424,829 | 38,713,576 | |
| වෙනත් ආදායම් | 19,308,494 | 51,664,458 | 3,902,584 | 4,165,001 | 18,886,182 | 743,614 | 1,006,353 | 471,787 | 917,841 | | |
| | 988,689,180 | 856,383,568 | 639,915,785 | 701,572,977 | 641,978,043 | 734,319,701 | 816,105,721 | 1,380,055,889 | 1,225,806,111 | 566,978,363 | - |
| **වියදම** | | | | | | | | | | | |
| කාර්ය මණ්ඩලය ආශ්‍රිත පිරිවැය | 164,253,318 | 132,494,516 | 84,790,542 | 76,487,490 | 72,006,709 | 56,000,854 | 42,326,032 | 33,124,615 | 21,470,147 | 11,500,953 | 1,333,806 |
| පරිපාලන පිරිවැය | 223,714,879 | 93,018,399 | 88,128,033 | 64,621,143 | 74,402,484 | 68,915,550 | 45,136,006 | 49,246,381 | 28,264,346 | 14,142,950 | 1,508,940 |
| මූල්‍ය හා වෙනත් වියදම් | - | - | - | 8,459,075 | 17,258,273 | 21,581,925 | 32,425,697 | 38,401,103 | 5,380,035 | 3,385,205 | 138,170 |
| **සමස්ත පිරිවැය** | **387,968,196** | **225,512,915** | **172,918,575** | **149,567,708** | **163,667,466** | **146,498,329** | **119,887,735** | **120,772,099** | **55,114,528** | **29,029,109** | **2,980,916** |
| **බදුකරණය** | | **(86,822,200)** | | | | | | | | | |
| **වියදම ඉක්මවූ ආදායම** | **2,839,751,856** | **4,303,324,332** | **4,582,655,585** | **4,240,847,242** | **2,083,023,167** | **2,314,699,707** | **2,330,614,859** | **3,202,833,205** | **2,862,286,513** | **1,769,807,897** | **73,455,733** |

සටහන - 2015 වර්ෂයේදී ගණකාධිකරණ ප්‍රතිපත්තිවල සිදුවූ වෙනස්වීම හේතුවෙන් පාර්තෝෂික ප්‍රතිස්ථාපිත කිරීමක් සිදුකර ඇත.

## මූල්‍ය තත්ත්වය

(ශ්‍රී ලංකා රුපියල් වලින්)

| දෙසැම්බර් 31 දිනට | 2016 | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 43,058,543 | 34,125,797 | 26,251,881 | 19,317,968 | 24,739,202 | 29,606,877 | 36,096,011 | 43,603,504 | 44,659,781 | 25,240,465 | 1,461,388 |
| මූල්‍ය ආයෝජන | 11,187,844,373 | 10,388,972,726 | 9,105,573,879 | 6,667,518,021 | 5,375,914,672 | 4,444,546,262 | 5,574,107,463 | 8,550,206,721 | 7,749,178,616 | 5,449,343,240 | |
| | **11,230,902,916** | **10,423,098,523** | **9,131,825,761** | **6,686,855,988** | **5,400,653,874** | **4,474,153,140** | **5,610,203,474** | **8,593,810,225** | **7,793,838,397** | **5,474,583,705** | **1,461,388** |
| **ජංගම වත්කම්** | | | | | | | | | | | |
| ලැබිය යුතු මුදල් | 7,096,616,002 | 1,222,450,075 | 1,416,831,322 | 1,686,049,990 | 1,664,647,836 | 1,927,814,565 | 1,945,815,895 | 2,079,570,419 | 1,988,501,988 | 2,221,955,826 | 511,844,970 |
| මුදල් සහ මුදල් හා සමාන වත්කම් | 705,205,727 | 166,785,332 | 278,096,913 | 305,495,813 | 103,641,397 | 3,542,969,945 | 3,594,104,553 | 110,173,003 | 239,795,258 | 560,259,122 | 13,357,202 |
| **ජංගම වත්කම්** | **7,801,821,729** | **1,389,235,407** | **1,694,928,235** | **1,991,545,803** | **1,768,289,233** | **5,470,784,510** | **5,539,920,448** | **2,189,743,421** | **2,228,297,246** | **2,782,214,948** | **525,202,172** |
| **මුළු වත්කම්** | **19,032,724,645** | **11,812,333,930** | **10,826,753,995** | **8,678,381,792** | **7,168,943,107** | **9,944,937,649** | **11,150,123,923** | **10,783,553,646** | **10,022,135,643** | **8,256,798,953** | **526,663,560** |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා ස්කන්ධ ප්‍රාග්ධන ආධිපත්‍යය** | | | | | | | | | | | |
| සමුච්චිත අරමුදල | 7,564,858,128 | 8,655,511,761 | 7,723,034,946 | 6,950,664,274 | 5,912,918,517 | 8,497,449,707 | 9,695,467,155 | 9,364,852,783 | 8,412,019,580 | 6,583,508,929 | 94,102,009 |
| | **7,564,858,128** | **8,655,511,761** | **7,723,034,946** | **6,950,664,274** | **5,912,918,517** | **8,497,449,707** | **9,695,467,155** | **9,364,852,783** | **8,412,019,580** | **6,583,508,929** | **94,102,009** |
| **තාක්ෂණික සංචිත** | | | | | | | | | | | |
| උපයානොගත් වාරික | 2,873,981,525 | 2,155,544,260 | 2,128,642,612 | 1,622,656,295 | 1,059,398,308 | 963,443,837 | 821,564,804 | 1,046,825,276 | 1,063,317,772 | 877,695,727 | |
| විලම්බිත කොමිස් | (482,908,910) | (421,132,953) | (366,621,700) | (199,173,169) | (176,532,688) | (161,486,715) | (139,745,300) | (200,139,536) | (206,999,340) | (161,317,228) | |
| | **2,391,072,615** | **1,734,411,307** | **1,762,020,912** | **1,423,483,126** | **882,865,620** | **801,957,122** | **681,819,505** | **846,685,740** | **856,318,432** | **716,378,499** | |
| **වගකීම්** | | | | | | | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | | | | | | | |
| රජයේ ප්‍රදාන | - | - | - | 66,960 | 66,960 | 142,150 | 284,330 | 719,190 | 719,190 | 719,190 | 719,190 |
| ගෙවියයුතු ප්‍රතිලාභ කොමිස් | 89,809,561 | - | - | 12,287,375 | 12,287,375 | 12,287,375 | 12,287,375 | 63,762,150 | 113,635,474 | 83,722,067 | |
| | **89,809,561** | | | **12,354,336** | **12,354,336** | **12,429,525** | **12,571,705** | **64,481,340** | **114,354,664** | **84,441,257** | **719,190** |
| **ජංගම වගකීම්** | | | | | | | | | | | |
| ගෙවියයුතු හිමිකම් | 6,921,254,984 | 1,102,369,856 | 1,111,616,732 | 273,060,335 | 286,078,050 | 392,410,772 | 518,000,207 | 329,499,921 | 333,321,632 | 602,777,397 | |
| ගෙවියයුතු වෙනත් වගකීම් | 2,065,729,357 | 320,041,006 | 230,081,405 | 18,819,722 | 74,726,585 | 240,690,522 | 242,265,350 | 178,033,863 | 306,121,335 | 269,692,571 | 431,842,361 |
| | **8,986,984,341** | **1,422,410,862** | **1,341,698,137** | **291,880,056** | **360,804,635** | **633,101,294** | **760,265,557** | **507,483,784** | **639,442,967** | **872,469,968** | **431,842,361** |
| **සමස්ත ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | **19,032,724,645** | **11,812,333,930** | **10,826,753,995** | **8,678,381,792** | **7,168,943,108** | **9,944,937,649** | **11,150,123,921** | **10,783,553,647** | **10,022,135,643** | **8,256,798,653** | **526,663,560** |

සටහන - 2015 වර්ෂයේදී ගණකාධිකරණ ප්‍රතිපත්තිවල සිදුවූ වෙනස්වීම හේතුවෙන් පාර්තෝෂික ප්‍රතිස්ථාපිත කිරීමක් සිදුකර ඇත.

# සටහන්

# සටහන්

# සමායතන තොරතුරු

### ආයතනයේ නම
ජාතික රක්ෂණ භාර අරමුදල

### නෛතික තත්ත්වය
2006 අංක 28 දරණ ජාතික රක්ෂණ අරමුදල් පනතින් ස්ථාපිත කළ ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

### ලියාපදිංචි කාර්යාලය
අංක 97, මරදාන පාර,
කොළඹ 10,
ශ්‍රී ලංකාව.

### ඇමතුම් විස්තර
දුරකථන අංකඃ +94 11 4873900-5, +94 11 2026600
ෆැක්ස් අංකයඃ +94 112338778
විද්‍යුත් තැපෑලඃ mail@nitf.lk
ආයතනයේ නිල වෙබ් අඩවියඃ http://www.nitf.lk

### අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්
මංජුල ද සිල්වා මයා (සභාපති)
කේ.ඒ. විමලේන්තිරරාජා මයා
එන්.එම්.ඩී. නවරත්න මයා
ට්‍රෙවින් ප්‍රනාන්දුපුල්ලේ මයා
අසේන්ද්‍ර සිරිවර්ධන මයා
පී.පී.එස්. රෝහණ ද සිල්වා මයා
චන්දන කුමාරසිංහ මයා

### මණ්ඩල ලේකම්
උදාරි රන්හොට්ගමගේ මිය

### බාහිර විගණක
විගණකාධිපති
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

### බැංකුකරුවන්
මහජන බැංකුව
ලංකා බැංකුව
ජාතික ඉතිරි කිරීමේ බැංකුව

බලය